# නිර්මාණාත්මක

# බයිබල් අධ්‍යයන ක්‍රමවේද

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඩමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඩමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම්, මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදි මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඩමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . I
කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . II
හැඳින්වීම . . . . . . . 1
පාඨමාලාවේ අරමුණු . . . . . . . 3

## පළමු කොටස: අධ්‍යයනය කරන විෂය

1. බයිබලය හැඳින්වීම . . . . . . . . 4
2. බයිබලයේ පොත් . . . . . . . . 16
3. බයිබලයේ අනුවාද . . . . . . . . 36

## දෙවන කොටස : අධ්‍යයනය සඳහා සූදානම්වීම

4. ඔබ ආරම්භ කිරීමට පෙර . . . . . . . . 41
5. බයිබල් අධ්‍යයන උපකරණ . . . . . . . . 52
6. අර්ථ විවරණ මූලධර්ම . . . . . . . . 61
7. බයිබලයේ පසුබිම . . . . . . . . 68
8. සැකිල්ලක් සෑදීම, ලකුණු කිරීම, වගුගත කිරීම . . . . . 81

## තුන්වන කොටස : නිර්මාණාත්මක බයිබල් අධ්‍යයනය

9. බයිබලය තුළින් බයිබලය අධ්‍යයනය කිරීම . . . . . . 88
10. භාවනා බයිබල් අධ්‍යයනය . . . . . . . . 100
11. පොතක් අධ්‍යයනය කිරීම . . . . . . . . 109
12. පරිච්ඡේද අධ්‍යයනය . . . . . . . . 116
13. ඡේද අධ්‍යයනය කිරීම . . . . . . . . 126
14. බයිබල් පද අධ්‍යයනය . . . . . . . 137
15. වචන පද අධ්‍යයනය . . . . . . . . 143
16. මාතෘකානුකූල බයිබල් අධ්‍යයනය . . . . . . 154
17. චරිතාපදාන අධ්‍යයනය . . . . . . . 160
18. දේව ධර්මානුකූල ක්‍රමය . . . . . . . . 169
19. බයිබලීය කාව්‍ය අධ්‍යයනය . . . . . . . . 181
20. බයිබලීය අනාගතවාක්‍ය අධ්‍යයනය. . . . . . . 187
21. සංකේතාත්මක ක්‍රමය . . . . . . . . 203

උපග්‍රන්ථය . . . . . . . . . 212
ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු . . . . . . . 216

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේවි

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-පරීක්ෂණය අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ජේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ජේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ජේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවති.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා:** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ජේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-පරීක්ෂණ:** ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-පරික්ෂණ පුනරීක්ෂණය කරන්න (ස්වයං-පරික්ෂණවල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය:** ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරික්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරික්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය : නියෝජනය**
**පාඨමාලාව : නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම**

# හැඳින්වීම

නව ගිවිසුමේ අනාගතවක්තෘවරයා වන යොහන් බව්තිස්ත දේව වචනය ප්‍රකාශ කරන කල ඔහුව හඳුන්වනු ලැබුවේ “පාළුකරයේ මොරගසන හඬ” යනුවෙනි. ඔහුගේ පණිවුඩය නැවුම්, බලවත් හා ඔහුගේ කාලයේ ආත්මික අවශ්‍යතාවයන්ට අදාළ වූ එකක් විය.

අද දවසේ බොහෝ මනුෂ්‍යයන් තමන් වටා සිටින අයගෙන් ඇසෙන ආත්මික සත්‍යතාවයන්ගේ දෝංකාරයක් බවට පත්ව තිබේ. ඔව්හු දෙවියන්වහන්සේ තම පණිවුඩය එළිදරව් කරන්නාවූ හඬක් නොව, අන් අයගෙන් ඔවුන්ට ඇසෙන්නාවූ දේවල්වල දෝංකාරයක් පමණි. “මාගේ වචන සොරකම් කරගෙන කියන ප්‍රෝපේතවරයෙක් යනුවෙන් දෙවියන්වහන්සේ හැඳින්වූ දිවැසිවරුන්ට සමානය” (යෙරෙමියා 23:30).

දේව වචනය කතා කිරීම සඳහා පළමුව ඔබ දෙවියන්වහන්සේ විසින් පවසා ඇති දේ දැනගත යුතුය. මෙම පාඨමාලාවේ පරමාර්ථය දේව වචනය තේරුම්ගැනීම සඳහා ඔබව බලගැන්වීමය. “නිර්මාණාත්මක බයිබල් අධ්‍යයනය ක්‍රම” නමැති මෙම පාඨමාලාව අධ්‍යයනය කිරීම සඳහා ඔබට අවශ්‍ය වනුයේ මෙම අත්පොතත්, බයිබලයත්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීමත් පමණි.

ක්‍රමයක් යනු යමක් ළඟා කර ගැනීම සඳහා වූ සංවිධානාත්මක ක්‍රමයකි. එය ක්‍රමානුකූල සැලැස්මකි. බයිබල් අධ්‍යයන ක්‍රම යනු දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය අධ්‍යයනය කිරීම සඳහා වූ සංවිධානාත්මක සැලැස්මයි. “නිර්මාණාත්මක” යන වචනයේ අර්ථය “අලුත් දෙයක් නිපදවීමට ඇති හැකියාවයි”. දේව වචනය තනිව අධ්‍යයනය කරන ආකරය මෙම පාඨමාලාවෙන් ඔබට උගන්වයි. දේව වචනය පිළිබඳව ඔබගේම අධ්‍යයනයන් මත පදනම්ව ඔබට බයිබල් අධ්‍යයනයන් ගොඩනඟාගත හැකිවනු ඇති බැවින් අන් අයගේ සමීක්ෂණ මත රඳා පැවතීමට අවශ්‍ය නොවනු ඇත.

බයිබල් අධ්‍යයන ක්‍රම නිසි ලෙස ඉගෙන ගැනීම තුළින් ආත්මිකව කුසගින්නෙහි සිටින්නාවූ ලෝකයට දෙවියන්වහන්සේගේ වචනය කතා කරන්නාවූ හඬ බවට පත්වීමට ඔබට හැකිවනු ඇත. ඔබ තවදුරටත් අන් අයගෙන් ඇසෙන්නාවූ දේවල්වල දෝංකාරයක් පමණක් නොවනු ඇත.

*“නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම”* තුළ බයිබලය සැබෑවූ එකම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය වශයෙන් ඉදිරිපත් කරයි. බයිබලයේ බෙදීම්, අනුවාද, පරිවර්තන හා අනුවර්තන ඉන් ඉදිරිපත් කරයි. පළමුව, බයිබලය තුළ ඒ පිළිබඳව පවසා ඇති දේවල් අධ්‍යයනය කිරීමට පාඨමාලාව ඔබට මගපෙන්වයි. ඉන්පසුව නිර්මාණාත්මක අධ්‍යයන ක්‍රම විස්තර කර ඇති අතර සාකච්ඡා කර ඇති එක් එක් ක්‍රමය භාවිත කිරීමට ඔබට අවස්ථාව දී තිබේ.

දළ සැලැස්මක් සාදා ගන්නා ආකාරය, අධ්‍යයන සටහන් සාදාගැනීම, පහසුව පිණිස ඔබගේ බයිබලය ලකුණු කිරීම, හා දීර්ඝ බයිබල් කොටස් වගු ලෙස කෙටි කර දක්වන ආකාරය පාඨමාලාව තුළින් උගන්වයි. දේව වචනය නිසි ලෙස අර්ථ නිරූපණය කර අදාළ කර ගැනීමට පාඨමාලාව ඔබට මගපෙන්වයි. සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ ගුරුවරයා වන ශුද්ධාත්මයාණන්ට සවන් දීමට එය මගපෙන්වයි. ඉදිරිපත් කර ඇති උපදෙස් ඔබ අනුගමනය කළහොත්, ඔබ තුළින් අලුත් නිර්මාණාත්මක ආත්මික ජිවිතයක් ගලා යන ආකාරය ඔබ අත්දකිනු ඇත.

ශුද්ධාත්මයාණන් විසින් ඉගැන්වීම යන්න වෙනුවට කිසිදු බයිබල් අධ්‍යයන ක්‍රමයක් ආදේශ කළ නොහැකිය. ක්‍රමයකට නිර්මාණාත්මක බලය ඇතුළු කරගන්නාවූ ආත්මික බලවේගය උන්වහන්සේය. නව ආත්මික ජිවිතයක් ගලායාමට සලස්වන්නාවූ දේව වචනයේ සත්‍යතාවයන් උන්වහන්සේ මනුෂ්‍යයාගේ ආත්මයට රහසින් පවසන සේක.

අධ්‍යයන ක්‍රමය ඉගෙන ගැනීම එහි කෙළවර නොවේ. එය අවසාන ඉලක්කය නොවේ. අධ්‍යයන ක්‍රමය යනු දේව වචනය අධ්‍යයනය කිරීම යන ඉලක්කය සපුරා ගැනීමට ඇති මාර්ග පමණි. මෙම ක්‍රම ඉගෙන ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. දේව වචනය අධ්‍යයනය කිරීමටත් ඒවා ඔබගේ ජිවිතයට හා සේවයට අදාළ කරගැනීමටත් ඔබ විසින් ඉගෙනගත් දේවල් ඔබ යොදාගත යුතුවේ.

ඔබ මෙම අත්පොතෙහි ඇති පාඩම් සම්පූර්ණ කළද, යථාර්ථය නම් ඔබට කිසිදාක මෙම පාඨමාලාව සම්පූර්ණ කළ නොහැකි බවයි. දේව වචනයේ ඇති ආත්මික සත්‍යතාවයන් කිසිදා අවසන් නොවන බැවින් දේව වචනය පිළිබඳ ඔබගේ අධ්‍යයනය කිසිදා අවසන් නොවනු ඇත.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් ඔබට

- බයිබලය බිහිවූ ආකාරය පැහැදිලි කිරීමට
- ගිවිසුම්, ප්‍රධාන බෙදීම් හෝ පොත් වශයෙන් බයිබලය සංවිධානය වී ඇති ආකාරය විස්තර කිරීමට
- බයිබලයේ මූලික ඉතිහාසය හා කාලවකවානු සාරාංශ කිරීමට
- බයිබලයේ ඇති ඒකත්වය හා විවිධත්වය පැහැදිලි කිරීමට
- බයිබලයේ විවිධ පරිවර්තනයන් බිහිවූ ආකාරය පැහැදිලි කිරීමට
- නිසි පරිදි බයිබලය අර්ථ නිරූපණය කිරීමේ නිති රීති බයිබලයට අදාළ කිරීමට
- බයිබලය පිළිබඳව බයිබලය තුළින් උගන්වන දේවල් සාරාංශ කිරීමට
- බයිබල් අධ්‍යයනය සඳහා පූර්ව අවශ්‍යතාවයන් හඳුනාගැනීමට
- අන්තර්ගතය මතක තබා ගැනීමට ඔබට උපකාර කරන පරිදි සටහන්, වගු, සාරාංශ හා කොටස් ලකුණු කිරීම් ආදිය සිදු කිරීමට.
- දේව වචනය පිළිබඳ ඔබගේ අධ්‍යයනයේදී නිර්මාණාත්මක ක්‍රමවේද අදාළ කර ගැනීමට
- බයිබල් අධ්‍යයන උපකරණ පාවිච්චි කිරීමට හැකිවනු ඇත.

පළමු කොටස: අධ්‍යයනය කරන විෂය

# පළමු වන පරිච්ඡේදය

# බයිබලය හැඳින්වීම

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- මතකයෙන් ප්‍රධාන පදය ලිවීමට
- "බයිබලය" යන වචනය නිර්වචනය කිරීමට
- "ශුද්ධ ලියවිල්ල" යන වචනය නිර්වචනය කිරීමට
- බයිබලයේ මූලාරම්භය පැහැදිලි කිරීමට
- බයිබලයේ ප්‍රධාන පරමාර්ථ හඳුනාගැනීමට
- බයිබලයේ ප්‍රධාන බෙදීම් දෙක ලෙස පැරණි ගිවිසුම හා නව ගිවිසුම හඳුනාගැනීමට
- පැරණි ගිවිසුමේ පොත්වල බෙදීම් හතර නම් කිරීමට
- නව ගිවිසුමේ පොත්වල බෙදීම් හතර නම් කිරීමට
- බයිබලයේ "ඒකත්වය හා විවිධත්වය" යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- ගිවිසුම් දෙකෙන්ම හෙළිදරව් වීම කේන්ද්‍රවන්නේ කවර තැනැත්තාදැයි හඳුනාගැනීමට

හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

**දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ.** (2 තිමෝති 3:16-17)

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය, එකම සැබෑ දෙවියන් වහන්සේගේ වචනය වන බයිබලය හඳුන්වා දෙයි. "බයිබලය" යන වචනයේ තේරුම "පොත්" වේ. බයිබලය වෙන් වශයෙන් ඇති පොත් 66 ක එකතුවකි.

දේව වචනය හැඳින්වීමට "ශුද්ධ ලියවිල්ල" යන වචනයද භාවිත කෙරේ. මෙම වචනය "ලිවීම" යන තේරුම ඇති ලතින් වචනයකින් ලැබුණකි. ශුද්ධ ලියවිල්ල යන වචනය ඉංග්‍රීසියෙන් Scripture ලෙස ලියන විට S අකුර කැපිටල්වලින් ඇතිවිට ඉන් අදහස් වන්නේ එය එකම සැබෑ දෙවිඳුන්ගේ ශුද්ධලියවිලි බවය. "බයිබලය" යන වචනය බයිබලයෙහි භාවිත කර නොමැත. එය සම්පූර්ණ දේව වචනය වෙනුවෙන් මිනිසුන් විසින් තෝරාගනු ලැබූ වචනයකි.

## බයිබලයේ මූලාරම්භය

බයිබලය දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය වේ. උන් වහන්සේ බයිබලයේ ඇති වචන දේවානුභාවයෙන් ලබාදුන් අතර උන් වහන්සේගේ වචන ලිවීම සඳහා දළ වශයෙන් විවිධ මනුෂ්‍යයන් 40 දෙනෙකු පමණ යොදාගෙන ඇත. මේ අය අවුරුදු 1500 ක පමණ කාලයක් තුළ ලියූහ. මෙම ලේඛකයන්ගේ පූර්ණ එකඟත්වයෙන් පෙන්නුම් කෙරෙන්නේ ඔවුන් සියලු දෙනාටම

එකම කර්තෘ කෙනෙකු මගපෙන්වන්නට ඇති බව වේ. මෙම කර්තෘවරයාණෝ දෙවියන් වහන්සේ වන සේක.
ඇතැම් ලේඛකයෝ දෙවියන් වහන්සේ පැවසූ දේ එලෙසම ලියූහ.

> **නුඹ අකුළන පොතක් රැගෙන, යොෂියාගේ දවස්වලදී මා නුඹට කතා කළදා පටන් අද දවස දක්වා ඉශ්‍රායෙල්වරුන්ද යුදාවරුන්ද සියලු ජාතීන්ද ගැන මා විසින් නුඹට කී සියලුම වචන එහි ලියන්න. (යෙරෙමියා 36:2)**

අනෙකුත් ලේඛකයන් ලියුවේ ඔවුන් අත්දුටු දේ හෝ අනාගතය පිළිබඳව දෙවියන් වහන්සේ එළිදරව් කළ දේ හෝ වේ.

> **එබැවින් නුඹ දුටු දේද දැන් තිබෙන දේද මින්පසු සිදුවන්ට තිබෙන දේද වන, (එළිදරව් 1:19)**

සියලුම ලේඛකයන් දෙවියන් වහන්සේගේ ආනුභාවය යටතේ අප වෙනුවෙන් ඇති උන් වහන්සේගේ පණිවුඩය ලියන ලදී.

## බයිබලයේ පරමාර්ථය

බයිබලයම එහි ප්‍රධාන පරමාර්ථය ලියා ඇත.

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16-17)**

ශුද්ධ ලියවිල්ල දේව ධර්මය ඉගැන්වීමටද, නපුරට තර්ජනය කිරීමට හා එය නිවැරදි කරගැනීමට ද ධර්මිෂ්ඨකම ඉගැන්වීමට ද යොදා ගනු ලැබේ. ඔබට නිවැරදිව ජීවත්වීමට ද දෙවියන් වහන්සේ වෙනුවෙන් වැඩ කිරීමට අවශ්‍ය දේ සැපයීමට ද එය ඔබට උපකාරී වේ.

## ප්‍රධාන බෙදීම්

බයිබලය පැරණි ගිවිසුම හා නව ගිවිසුම වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. "ගිවිසුම" යනු එකඟවීමකි. පැරණි ගිවිසුම සඳහන් වන්නේ දෙවියන් වහන්සේ මිනිසා සමග ඇතිකරගත් මුල් ගිවිසුම හෙවත් එකඟවීම වේ. නව ගිවිසුමේ සඳහන් වන්නේ දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඇතිකරගත් අලුත් ගිවිසුමයි.

මේ ගිවිසුම් දෙකෙහි විෂය කරුණු මොනවාද? ඒ දෙකෙන්ම සිතා බැලෙන්නේ පාපී මනුෂ්‍යයා, දෙවියන් වහන්සේ සමග නිවැරදි සබඳතාවක් නැවත ඇතිකරගැනීම පිළිබඳවය. පාපයට කමාව දිය හැක්කේ ලේ වැගිරීමෙන් පමණක් බවට නියමයක් දෙවියන් වහන්සේ දී ඇත.

> **. . . ලේ වැගිරීමක්ද නැතුව ක්ෂමාකිරීමකුත් නැත. (හෙබ්‍රෙව් 9:22)**

පැරණි ගිවිසුමේ, දෙවියන් වහන්සේගේ එකඟතාවට අනුව පාපයෙන් කමාව ලැබීම සඳහා මිනිසා සත්වයන්ගේ ලේ පූජා කළේය. මෙය, දෙවියන් වහන්සේ සමග ඇතිකරගනු ලබන නව එකඟතාවට අනුව ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරන්නාවූ ලේ පූජාවේ සංකේතයකි. ජේසුස් වහන්සේගේ ඉපදීම, ජීවිතය, මරණය හා උත්ථානවීම තුළින් පාපය සඳහා අවසාන පූජාව සිදු කෙරිණි.


> **නුමුත් ක්‍රිස්තුස්වහන්සේ මතු පැමිණෙන්නාවූ යහපත් දේවල උත්තම පූජකයෙක්ව පැමිණ, වඩා උතුම්වූ වඩා සම්පූර්ණවූ අතින් නොසෑදුවාවූ, එනම් මේ (භූමික) මැවිල්ලට අයිති නොවන්නාවූ මණ්ඩපය මැදින්, එළුවන්ගේත් වස්සන්ගේත් ලේ කරණකොටගෙන නොව තමන්ගේම ලේ කරණකොටගෙන, අප උදෙසා සදාකාල මිදීම ලබාගෙන එකම වරක් ශුද්ධස්ථානයට ඇතුල්වූසේක. මක්නිසාද එළුවන්ගේත් ගොනුන්ගේත් ලේවලින්ද අශුද්ධවී සිටින්නන්ට එළනැම්බියකුගේ අළු ඉසීමෙන්ද මාංසය පවිත්‍රවෙන හැටියට පිරිසිදු කරනු ලබන්නේ නම්,**

**කැලලක් නැතුව සදාකාල ආත්මයාණන් කරණකොටගෙන තමන්ම දෙවියන්වහන්සේට පූජාවුණාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් ජීවමාන දෙවියන්වහන්සේට සේවය කරන පිණිස, මළ ක්‍රියාවලින් නුඹලාගේ හෘදයසාක්ෂිය කොපමණ වැඩියෙන් පිරිසිදුකරනු නොලබන්නේද? (හෙබ්‍රෙව් 9:11-15)**

ගිවිසුම් දෙකම දෙවියන් වහන්සේගේ වචනය වන අතර දෙවියන් වහන්සේගේ පණිවුඩය අවබෝධ කරගැනීම සඳහා මේ දෙකම අප අධ්‍යයනය කළ යුතුය. "පැරණි" හා "නව" ගිවිසුම යන පද භාවිත කර ඇත්තේ, ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණට පෙර හා පසුව දෙවියන් වහන්සේ මනුෂ්‍යයා සමග කරන ලද ගිවිසුම් අතර වෙනස දැක්වීමටය. පැරණි ගිවිසුම "පැරණි" නිසා අප එය නොසලකා හරින්නේ නැත.

## තවදුරටත් ඇති බෙදීම්

බයිබලය තවදුරටත් පොත් 66 කට බෙදා තිබේ. පැරණි ගිවිසුමේ පොත් 39 ක් ද නව ගිවිසුමේ පොත් 27 ක් ද ඇත. සෑම පොතක්ම පරිච්ඡේද හා පදවලට බෙදා ඇත. සෑම පොතකම අන්තර්ගතය දේව වචනය වුවද, පරිච්ඡේද හා පදවලට කර ඇති බෙදීම් සුවිශේෂ කොටස් දැක්වීම පහසු වීම සඳහා මිනිසා විසින් කරන ලද්දකි. සියලුම පොත් එක් දිගු ජේදයක් ලෙස තිබිණි නම්, කොටසක් සොයා ගැනීම ඉතා අසීරු වනු ඇත.




## බයිබලයේ ඒකත්වය

බයිබලයේ ඒකත්වය පිළිබඳව අප කතාකරන විට, ඉන් කරුණු දෙකක් අදහස් වේ.

### 1. බයිබලයේ අන්තර්ගතය එකගතාවයෙන් යුක්ත වේ

බයිබලය ලේඛකයන් බොහෝ දෙනෙක් වසර ගණනාවක් තුළ ලියන ලද්දක් වුවද එහි අන්තර්ගතයේ පරස්පර විරෝධී දේ නොමැත. එක් කර්තෘවරයෙක් වෙනත් කිසිම කර්තෘවරයෙකු හා පරස්පර විරෝධී නොවේ.

බයිබලයේ මතභේදකාරී විෂයයන් (මතභේදකාරී විෂයයන් යනු එකිනෙකට වෙනස් මත ඇති කරන ඒවා වේ) සිය ගණනක් අන්තර්ගය. එහෙත් බයිබල් ලේඛකයන් එම විෂයන් ගැන කතාකර ඇත්තේ, පළමු පොතවන උත්පත්ති සිට අවසාන පොත වන එළිදරව්ව දක්වා, එකඟතාවෙන් යුතුව වේ. ඊට හේතුව එහි සැබෑ කර්තෘවරයාණෝ එක් කෙනෙක් බැවිනි. ඒ දෙවියන් වහන්සේ වන සේක. මේ ලේඛකයන් කර ඇත්තේ උන් වහන්සේගේ මගපෙන්වීම හා ආනුභාවය ඇති පණිවුඩය වාර්තා කිරීම පමණි. මේ හේතුව නිසා බයිබලයේ අන්තර්ගතය එකගතාවයෙන් යුක්ත වේ.

## 2. බයිබලය තේමාවෙන් එකගතාවයෙන් යුක්ත වේ

බයිබලය, විවිධ විෂයන් පිළිබඳ එකිනෙකට වෙනස් පොත් 66 ක එකතුවක් ලෙස සමහරු සිතති. බයිබලය එක් ප්‍රධාන තේමාවකින් එක්සත් කර ඇති බව ඔව්හු නොදනිති. ආරම්භයේ සිට අවසානය දක්වා, එපිස පොතෙහි සැකිල්ල කර දක්වා ඇති පරිදි දෙවියන් වහන්සේගේ විශේෂ පරමාර්ථය බයිබලය එළිදරව් කරයි.

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය.**
> (එපිස 1:9-11)

බයිබලය, දෙවියන් වහන්සේගේ සැලැස්මේ අබිරහස වන එක්සත් කිරීමේ තේමාව එළිදරව් කරයි. එය පාපී මනුෂ්‍ය වර්ගයාගේ ගැළවුම්කරු ලෙස ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ එළිදරව් කිරීම වේ. පැරණි ගිවිසුම තමන්වහන්සේ කේන්ද්‍රිය කර ගෙන ඇති බව ජේසුස් වහන්සේ පැහැදිලි කළ සේක.

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ විය යුතුයයි මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේයයි කීසේක. (ලූක් 24:44)**

මෙම හැඳින්වීම අනුව ජේසුස් වහන්සේ තවදුරටත් මෙසේ පවසන සේක.

> **එවිට උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: අඥානයෙනි අනාගතවක්තෘවරුන් විසින් කියනලද සියල්ල විශ්වාසකරන්ට ප්‍රමාද සිත් ඇත්තෙනි, (ලූක් 24:25)**

ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගැනීමට ජේසුස් වහන්සේ ඔවුන්ට දුන් ප්‍රධාන දෙය කුමක්ද? එහි ප්‍රධාන තේමාව තමා වෙත අවධානය යොමු කර ඇති බවය.

> **. . . මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත් යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය. (ලූක්** 24:46-48)

පැරණි හා නව ගිවිසුම් දෙකම පවසන්නේ ජේසුස් වහන්සේ පිළිබඳ කතාන්දරය වේ. මේ සිදුවීමට පැරණි ගිවිසුම අප සූදානම් කරන අතර එය සිදුවූ ආකාරය නව ගිවිසුම පවසයි. මෙමගින් බයිබලය එක් ප්‍රධාන තේමාවකට එක්සත් කරයි. පැරණි ගිවිසුම යටතේ ජේසුස් වහන්සේ වෙත බලා සිටි සෙනඟ දෙවියන් වහන්සේගේ පොරොන්දුව තුළ ඇති ඇදහිල්ල මගින් ඔවුන්ගේ පාපයෙන් ගැළවීම ලැබූහ. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ එය ඉටුවූවා ලෙස ආපසු හැරී බලන සැම කෙනෙක්ම ඒ ආකාරයෙන්ම ගැළවීම ලබති. දෙවියන් වහන්සේ පොරොන්දු වූ ආකාරයට ඇදහිල්ල තුළින් එය සිදුවිය.

## බයිබලයේ විවිධත්වය

බයිබලයේ "විවිධත්වය" ගැන අප කතාකරන විට ඉන් අදහස් වන්නේ බයිබලයේ නොයෙකුත් දේ ඇති බවය. දෙවියන් වහන්සේ මිනිසුන් සමග ක්‍රියා කළ විවිධ ආකාරයන් හා මිනිසුන් ඊට ප්‍රතිචාර දැක්වූ විවිධ ආකාරත් එහි වාර්තා කර ඇත.

බයිබලය විවිධ චිත්ත ස්වභාවයන්ගෙන් ලියා ඇත. ඇතැම් කොටස් ප්‍රීතිය ප්‍රකාශ කරන අතර තවත් කොටස් ප්‍රකාශ කරන්නේ කනගාටුව වේ. බයිබලයේ විවිධාකාර ලිවීම් ද ඇත. එහි ඉතිහාසය, කවි, අනාවැකි, හසුන්, නිර්හිත ක්‍රියා, උපමා, හාස්කම් හා ප්‍රේම කතා ආදිය අන්තර්ගතය. එහි විවිධත්වය නිසා එය තවදුරටත් ප්‍රධාන පොතේ කාණ්ඩවලට බෙදා තිබේ.

# පැරණි ගිවිසුමේ බෙදීම්

පැරණි ගිවිසුමේ පොත් ප්‍රධාන කාණ්ඩ හතරකට බෙදා තිබේ. ඒ ව්‍යවස්ථාව , ඉතිහාසය, කාව්‍ය, හා අනාවැකි වශයෙනි.

## ව්‍යවස්ථාව පිළිබඳ පොත්

ව්‍යවස්ථා පොත් පහක් ඇත. මේවා නම් වශයෙන් මෙසේ වේ.

උත්පත්ති
නික්මයාම
ලෙවී කථාව
ගණන් කථාව
ද්විතීය කථාව

මේ පොත්වල වාර්තා වී ඇත්තේ දෙවියන් වහන්සේ විසින් මිනිසා හා ලෝකය මවනු ලැබීම හා මිනිසාගේ මුල් ඉතිහාසය වේ. ඒවායින් පැවසෙන්නේ දෙවියන් වහන්සේ තමන් වහන්සේම ලෝකයේ ජාතීන් වෙත එළිදැරව් කිරීමට හැකිවන පිණිස ඉශ්‍රායෙල් ජාතිය සෙනඟක් ලෙස එසවූ ආකාරය වේ.

මෙම පොත් දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවන් වාර්තා කරයි. මේවා අතුරින් ඉතාමත්ම ප්‍රසිද්ධ කොටස් වන්නේ දස පනත (නික්ම. 20:3-17), ශ්‍රේෂ්ඨතම ආඥාව (ද්වි. 6:5), හා දෙවැනි ශ්‍රේෂ්ඨතම ආඥාව වේ (ලෙවී. 19:18).

ඔබගේ බයිබලය පෙරලා පැරණි ගිවිසුමේ ඇති ව්‍යවස්ථා පොත් සොයා ගන්න. ඉහත සඳහන් පද තුන සොයාගෙන ඒවා කියවන්න. මේවා මේ පොත්වල සඳහන් දෙවියන් වහන්සේගේ ආඥා සඳහන් නිදසුන් වේ.

## ඓතිහාසික පොත්

ඓතිහාසික පොත් 12 ක් පැරණි ගිවිසුමේ තිබේ. මේවා නම්:

යෝෂුවා
විනිශ්චයකාරයා
රූත්,
1 හා 2 සාමුවෙල්
1 හා 2 රාජාවලිය
1 හා 2 ලේකම්
එස්රා
නෙහෙමියා
එස්තර්ය

ඔබගේ බයිබලයේ මේවා සොයාගන්න. මේවා ඇත්තේ ව්‍යවස්ථා පොත්වලට පසුව වේ. ඉතිහාස පොත් දෙවියන් වහන්සේගේ සෙනඟගේ එනම් ඉශ්‍රායෙල්හි දහස් වසරක ඉතිහාසය ආවරණය කරයි. මේවා සිදුවූ සියල්ල පවසන්නේ නැත. එහෙත් ඒවායේ ප්‍රධාන සිද්ධීන් වාර්තාකර ඇති අතර දෙවියන් වහන්සේගේ නීති අනුගමනය කිරීමේ හා කඩ කිරීමේ ප්‍රතිඵලය පෙන්වයි.

## කාව්‍ය පොත්

කාව්‍ය පොත් පහක් ඇත. මේවා නම්:

යෝබ්
ගීතාවලිය
හිතෝපදේශ
දේශනාකාරයා
සලමොන්ගේ ගීතිකාව

මේවා දෙවියන් වහන්සේගේ සෙනඟගේ එනම්, ඉශ්රායෙල්හි නමස්කාර පොත් වේ. අද වුවද ඇදහිලිවන්තයන් නමස්කාරය සඳහා මෙම පොත් භාවිත කරති. ගීතාවලිය 23 පෙරලා කියවන්න. මෙය මේ පොත්වල අඩංගු අත්‍යලංකාර නමස්කාරය පද්‍යයක් සඳහා නිදසුනකි.

## අනාවැකි පොත්

පැරණි ගිවිසුමේ දිවැස්වැකි පොත් චූල හා මහා ලෙස කාණ්ඩ දෙකකට බෙදා ඇත. මහා දිවැසිවරුන් චූල දිවැසිවරුන්ට වඩා වැදගත් යයි මින් අදහස් නොවේ. මේ ග්‍රන්ථ නාම භාවිත කර ඇත්තේ මහා දිවැස්වැකි පොත් චූල ඒවාට වඩා දිග බැවිනි. පැරණි ගිවිසුමේ දිවැස්වැකි පොත් 17 ක් ඇත. මේවා නම්:

**මහා දිවැසිවරුන්**

යෙසායා
යෙරමියා
විලාප ගී
එසකියෙල්,
දානියෙල්

**චූල දිවැසිවරුන්**

හොෂෙයා
යෝවෙල්
ආමොස්
ඔබදියා
යෝනා
මීකා
නාහුම්
හබක්කුක්
ශෙපනියා
හග්ගයි
සෙකරියා
මලාකි

මෙම පොත් අනාගත සිදුවීම් පිළිබඳව දෙවියන් වහන්සේ තම සෙනඟට දුන් පණිවුඩ වේ. මේ බොහෝ අනාවැකි දැනටමත් ඉටු වී ඇති අතර තවත් සමහර ඒවා අනාගතයේ දී ඉටුවනු ඇත. මෙම දිවැස්වැකි පොත් ඔබගේ බයිබලයෙන් සොයා ගන්න. ඒවා පැරණි ගිවිසුමේ අවසාන පොත් වේ.

# නව ගිවිසුමේ බෙදීම්

නව ගිවිසුම ද කාණ්ඩ හතරකට බෙදා ඇත. ශුභාරංචිය, ඓතිහාසික, හසුන් හා දිවැස්වැකි පොත් ලෙසය.

## ශුභාරංචි

ශුභාරංචි පොත් හතරක් ඇත. මේවා නම්:

මතෙව්
මාක්
ලූක්
යොහන්

මෙම පොත් ජේසුස් වහන්සේගේ ජීවිතය, මරණය හා උත්ථානය ගැන පවසයි. මේවායේ පරමාර්ථය වන්නේ උන් වහන්සේ, දේව පුත්‍රයා, ක්‍රිස්තුස්වහන්සේ බවට ඔබට විශ්වාස කිරීමට මගපෙන්වීම සඳහා වේ. ඔබගේ බයිබලයේ මේ පොත් සොයා ගන්න. මේ පරමාර්ථය සඳහන් ජොහන් 20:31 ඉන්පසු කියවන්න.

## ඓතිහාසික ග්‍රන්ථය

නව ගිවිසුමේ ඓතිහාසික පොත් එකක් ඇත. ඒ ක්‍රියා පොත වේ. මෙම පොතෙන් පැවසෙන්නේ සභාව ආරම්භ වූ ආකාරය හා ලොව මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීමේ ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කළ ආකාරය වේ. ඔබගේ බයිබලයේ මෙම පොත සොයාගන්න.

## හසුන්

නව ගිවිසුමේ හසුන් 21 ක් ඇත. ඒවා නම්:

| | |
|---|---|
| රෝම | තිතස් |
| 1 හා 2 කොරින්ති | පිලෙමොන් |
| එපිස | හෙබ්‍රෙව් |
| පිලිප්පි | යාකොබ් |
| කොලොස්සි | 1 හා 2 ජේතෘස් |
| 1 හා 2 තෙසලෝනික | 1, 2 හා 3 යොහන් |
| 1 හා 2 තිමෝති | යූද් |

මෙම ලිපි සියලුම ඇදහිලිවතුන්ට යොමු කර ඇත. ඒවායේ පරමාර්ථය වන්නේ ජීවත්වීමට මගපෙන්වීමට හා ජේසුස් වහන්සේ පැවසූ දේ කිරීමට උපකාර වීම වේ. රෝම 12 ඒවායේ ඉගැන්වීම් පිළිබඳ හොඳ නිදසුනකි. මේ පරිච්ඡේදය පෙරලාගෙන කියවන්න. මෙම හසුන් ඇතැම් විට "යැවුම් පත්‍ර" ලෙසද හැඳින්වේ.

## අනාවැකි

අනාවැකි පිළිබඳව නව ගිවිසුමේ ඇති එකම පොත එළිදරව්ව වේ. ජේසුස් වහන්සේගේ හා උන් වහන්සේගේ සෙනඟගේ අවසාන ජයග්‍රහණය ඉන් පවසයි. එහි පරමාර්ථය වන්නේ යුගයේ අවසාන දක්වා කිතුනුවෙකු ජීවත් විය යුතු ආකාරයට ජීවත්වීමට ඔබ දිරිගැන්වීම වේ. එහි පණිවුඩය එළිදරව් 2:10 හි සාරාංශ කර ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________

______________________________

______________________________

______________________________

2. "බයිබලය" යන වචනයේ අර්ථය කුමක්ද? ______________________________

3. "ශුද්ධ ලියවිල්ල" යන වචනයේ අර්ථය කුමක්ද? ______________________________

4. බයිබලය බෙදා ඇති ප්‍රධාන කොටස් දෙක කවරේද?

______________________ ______________________

5. බයිබලයේ පොත් කීයක් තිබේද?______________________

6. පරණ ගිවිසුම බෙදා ඇති ප්‍රධාන ඛාණ්ඩ හතර නම් කරන්න.

______________________ ______________________

______________________ ______________________

7. නව ගිවසුම බෙදා ඇති ප්‍රධාන ඛාණ්ඩ හතර නම් කරන්න.

______________________ ______________________

______________________ ______________________

8. "ගිවිසුම" යන වචනයේ අර්ථය කුමක්ද?

______________________________

______________________________

9. බයිබලයේ ප්‍රධාන පරමාර්ථයන් හතර මොනවාද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් පදයක් ඉදිරිපත් කරන්න.

______________________________

______________________________

______________________________

______________________________

10. “බයිබලයේ ඒකත්වය” යනු කුමක්ද?

______________________________________________

11. “බයිබලයේ විවිධත්වය” යනු කුමක්ද?

______________________________________________

12. පහත ප්‍රකාශ කියවන්න. එය සත්‍යයක් නම් ඉදිරියේ ඇති හිදැස මත T අකුර යොදන්න. එය අසත්‍යයක් නම් ඉදිරියේ ඇති හිඩැසෙහි F අකුර යොදන්න.

අ. ____________ බයිබලය යනු සැබෑවූ එකම දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයයි.

ආ. ____________බයිබලය දේවානුභාවය යටතේ ලිවීම පිණිස දෙවියන්වහන්සේ මනුෂ්‍යයා යොදාගත් සේක.

ඇ. ____________බොහෝ කතුවරු ගණනක් බොහෝ කාලයක් පුරා රචනා කළ බැවින් බයිබලයේ පරස්පරතාවයන් බොහෝය.

ඈ. ____________බයිබලයේ ඒකීය තේමාවක් නොමැත. එය විවිධ විෂයන් පිළිබඳව ලියැවුණු පොත්වල එකතුවක් පමණි.

ඉ. ____________පරණ ගිවිසුමේ ප්‍රධාන දිවැසිවරු සුළු දිවැසිවරුන්ට වඩා වැදගත්වේ.

13. ගිවිසුම් දෙකෙහිම ඇති එළිදරව් කිරීමේ කේන්ද්‍රගත වී ඇති පුද්ගලයා කවුරුන්ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් පදයක් ඉදිරිපත් කරන්න. ____________
බයිබල් පදය. ____________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

ඊළඟ පිටුවේ ඇති සලකුණු බයිබලයේ ප්‍රධාන බෙදීම් මතක තබාගැනීම සඳහා ඔබට උපකාර වනු ඇත. ඒවා බෙදාවෙන් කරන ඉරි දිගේ කපා ඉවත් කර ඔබගේ බයිබලය තුළට දමන්න. මෙම සළකුණ තැබිය යුතු ස්ථානය සොයාගැනීම ඔබට අපහසු වේ නම්, ඔබගේ බයිබලයේ ඉදිරියේ ඇති පටුන උපකාර කරගන්න. බයිබලයේ පොත් ඇති පිළිවෙළට ඒ තුළ පොත් වල නම් සඳහන් වේ. එසේම එක් එක් පොත පටන් ගන්නා පිටුවේ අංකය ද එහි දක්වා තිබේ.

**පරණ ගිවිසුම**

උත්පත්ති පොත පටන්ගන්නා ස්ථානයේ 1 වන සළකුණ යොදන්න.

යෝෂුවා පොත පටන්ගන්නා ස්ථානයේ 2 වන සළකුණ යොදන්න.

යෝබ් පොත පටන්ගන්නා ස්ථානයේ 3 වන සළකුණ යොදන්න.

යෙසායා පොත පටන් ගන්නා ස්ථානයේ 4 වන සළකුණ යොදන්න.

**නව ගිවිසුම**

මතෙව් පොත පටන් ගන්නා ස්ථානයේ 5 වන සළකුණ යොදන්න.

ක්‍රියා පොත පටන් ගන්නා ස්ථානයේ 6 වන සළකුණ යොදන්න.

රෝම පොත පටන් ගන්නා ස්ථානයේ 7 වන සළකුණ යොදන්න.

එළිදරව් පොත පටන් ගන්නා ස්ථානයේ 8 වන සළකුණ යොදන්න.

දැන් ඔබ බයිබලයේ ප්‍රධාන බෙදීම් සළකුණු කර තිබේ. මතකයෙන් මෙම බෙදීම් පවසමින් ඒවා සොයාගත හැකි වන තුරු මෙම සළකුණු භාවිත කරන්න.

<table>
<tr>
<td>පැරණි ගිවිසුමේ<br>ව්‍යවස්ථා ග්‍රන්ථ<br>(1)<br><br>උත්පත්ති<br>නික්මයාම<br>ලෙවී කථාව<br>ගණන් කථාව<br>ද්විතිය කථාව</td>
<td>පැරණි ගිවිසුමේ<br>ඉතිහාස ග්‍රන්ථ<br>(2)<br><br>යෝෂුවා<br>විනිශ්චයකාරයා<br>රූත්<br>1 සාමුවෙල්<br>2 සාමුවෙල්<br>1 රාජාවලිය<br>2 රාජාවලිය<br>1 ලේකම්<br>2 ලේකම්<br>එස්රා<br>නෙහෙමියා<br>එස්තර්</td>
<td>පැරණි ගිවිසුමේ<br>කාව්‍ය ග්‍රන්ථ<br>(3)<br><br>යෝබ්<br>ගීතාවලිය<br>හිතෝපදේශ<br>දේශනාකාරයා<br>සලමොන්ගේ ගීතිකා</td>
</tr>
<tr>
<td>පැරණි ගිවිසුමේ<br>දිවැසිවර ග්‍රන්ථ<br>(4)<br><br>ප්‍රධාන දිවැසිවරු :<br><br>යෙසායා<br>යෙරෙමියා<br>විලාප ගී<br>එසකියෙල්<br>දානියෙල්<br><br>සුළු දිවැසිවරු :<br><br>හොෂෙයා<br>යෝවෙල්<br>ආමොස්<br>ඔබදියා<br>යෝනා<br>මීකා<br>නාහුම්<br>හබක්කුක්<br>ශෙපනියා<br>හග්ගයි<br>සෙකරියා<br>මලාකි</td>
<td colspan="2">පැරණි ගිවිසුමේ පොත් සළකුණු</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| **නව ගිවිසුමේ ශුභාරංචි ග්‍රන්ථ**<br>(5)<br><br>මතෙව්<br>මාර්ක්<br>ලූක්<br>යොහන් | **නව ගිවිසුමේ ඉතිහාස ග්‍රන්ථ**<br>(6)<br><br>ක්‍රියා | **නව ගිවිසුමේ යැවුම් පත්‍ර**<br>(7)<br><br>රෝම<br>1 කොරින්ති<br>2 කොරින්ති<br>ගලාති<br>එපීස<br>පිලිප්පි<br>කොලොස්සි<br>1 තෙසලෝනික<br>2 තෙසලෝනික<br>1 තිමෝති<br>2 තිමෝති<br>තීතස්<br>පිලෙමොන්<br>හෙබ්‍රෙව්<br>යාකොබ්<br>1 පේතෘස්<br>2 පේතෘස්<br>1 යොහන්<br>2 යොහන්<br>3 යොහන්<br>යූද් |
| **නව ගිවිසුමේ දිවැසිවර ග්‍රන්ථ**<br>(1)<br><br>එළිදරව් | | |

නව ගිවිසුමේ පොත් සළකුණු

# දෙවන පරිච්ඡේදය

# බයිබලයේ පොත්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුමේ ඇති පොත් සංඛ්‍යාව හඳුනාගැනීමට
- නව ගිවිසුමේ ඇති පොත් සංඛ්‍යාව හඳුනාගැනීමට
- බයිබලය කියවීම සඳහා ක්‍රමවත් සැලැස්මක් තිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- සාර්ථකව බයිබලය කියවීම සඳහා යෝජනා හතරක් දැනගැනීමට

ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**ස්වාමිනි මාගේ මොරගැසීම ඔබ ඉදිරියට පැමිණේවා, ඔබගේ වචනය පරිද්දෙන් මට නුවණ දුන මැනව, (ගීතාවලිය 119:169)**

## හැඳින්වීම

බයිබලය යනු දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය බව පසුගිය පරිච්ඡේදයෙන් අපි ඉගෙන ගතිමු. පැරණි හා නව ගිවිසුම් ලෙස එය කොටස් දෙකකට බෙදා ඇති බවද ඔබ ඉගෙන ගත්තෙහිය. ඔබ පැරණි ගිවිසුමේ පොත්වල බෙදීම් හතර ද ඉගෙන ගත්තෙහිය.

ව්‍යවස්ථාව
ඉතිහාසය
කව්‍ය
අනාවැකි

නව ගිවිසුමේ බෙදීම් හතර ද ඉගෙන ගත්තෙහිය.

ශුභාරංචි
ඉතිහාසය
හසුන්
අනාවැකි

බයිබලය පිළිබඳව ඔබ මෙතෙක් උගත් දේ පහත දැක්වෙන සටහනින් සංක්ෂේප කෙරේ.

බයිබලය

|

දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය

|

පොත් 66 කි

| පැරණි ගිවිසුම් බෙදීම් | නව ගිවිසුම් බෙදීම් |
| --- | --- |
| ව්‍යවස්ථාව, ඉතිහාසය, කාව්‍ය, අනාවැකි | ශුභාරංචි, ඉතිහාසය, හසුන්, අනාවැකි |

මෙම පරිච්ඡේදයේ අන්තර්ගත වන්නේ, ප්‍රධාන ලෙස පැරණි හා නව ගිවිසුම් ලෙස බෙදා ඇති බයිබලයේ පොත් 66 සෑම පොතකම සාරාංශයකි. එය ගිවිසුම් දෙකෙහිම අන්තර්ගතයට හැඳින්වීමක් සපයයි. බයිබලය සාර්ථකව කියවීම සඳහා යෝජනා හතරක් ද ඇති අතර දේව වචනය කියවීම ආරම්භ කිරීමට ඔබ ක්‍රමවත් සැලැස්මක් තෝරා ගත යුතුය.

## පැරණි ගිවිසුමේ පොත්

(පොත් 39 කි)

### ව්‍යවස්ථාව පිළිබඳ පොත් :

උත්පත්ති : විශ්වයේ, මිනිසාගේ, සබත් දවසේ, විවාහයේ, පාපයේ, පූජාවන්ගේ, ජාතීන්ගේ හා රජයේ ආරම්භය වාර්තා කරන අතර ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් හා ජෝසෙප් වැනි දෙවියන් වහන්සේගේ ප්‍රධාන මනුෂ්‍යයන් ගැන ද වාර්තා කරයි.

නික්මයාම : මෝසෙස් නායකයා වශයෙන් ඉශ්රායෙලය ජාතියක් වූ ආකාරය විස්තර කරයි. මිසරයේ වහල්බවින් ඉශ්රායෙලය මුදාගනු ලබන අතර දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව දෙන ලද සීනයි කන්ද වෙත ගමන් කරයි.

ලෙවී කථාව : මෙම පොත ඉශ්රායෙල්වරුන්ගේ නමස්කාරය සඳහා අත්පොතකි. එය ආගමික නායකයන්ට උපදෙස් සපයන අතර, පාපී මිනිසුන්ට ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු වෙතට යා හැකි ආකාරය පැහැදිලි කරයි. ලෝකයේ පව් දුරුකරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියා වන ජේසුස් වහන්සේගේ පැමිණීමට එය සම්බන්ධ කරයි.

ගණන් කථාව : දෙවියන් වහන්සේට අකීකරුවීමේ ප්‍රතිඵලයක් ලෙස පාළුකරයේ අවුරුදු 40 ක් ඉශ්රායෙල් ගිය ගමන මෙහි වාර්තා වී ඇත. මේ පොතෙහි මාතෘකාව මේ දිගු ගමනේ දී ගත් ගණන් ගැනීම් දෙකක් නිසා වේ (ජනගහන සංගණනයන්).

ද්විතිය කථාව : මෝසෙස්ගේ ජීවිතයේ අවසාන දවස් වාර්තා කර ඇති අතර නික්මයාමේ හා ලෙවී ව්‍යවස්ථාවේ දී ඇති නීති පුනරීක්ෂණය කරයි.

## ඓතිහාසික පොත්

යෝෂුවා : මෝසෙස්ගේ අනුප්‍රාප්තිකයා වූ යෝෂුවා, ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශය වූ කානාන් වෙත ගිය ආකාරය විස්තර කරයි. මෙහි යුද්ධ ව්‍යාපාර හා සෙනඟ අතර දේශය බෙදූ ආකාරය වාර්තාකර ඇත.

විනිශ්චයකාරයා : යෝෂුවාගේ මරණයෙන් පසු ඉශ්රායෙලය දෙවියන්වහන්සේ වෙතින් ඈත් විය. ඔවුන් නැවත නැවත කළ පාප පිළිබඳ කනගාටුදායක කතාව හා දෙවියන් වහන්සේ නැගිටවූ වීරයන් සතුරු බලවේගවලින් ඔවුන් මුදාගත් ආකාරය මෙම පොතේ වාර්තා වේ.

රූත්ගේ කථාව : රූත් ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේට සේවය කිරීමට තෝරාගත් මෝවබ් නම් අන්‍ය දේශිය කාන්තාවකි. ඇය දාවිත්ගේ මී මිත්තනිය වූවාය.

1 සාමුවෙල් : මෙම පොත පුද්ගලයන් තිදෙනෙකු පිළිබඳව වේ. ඉශ්රායෙල්හි අවසාන වීරවරයා වූ සාමුවෙල්, ඉශ්රායෙල්හි පළමු රජු වූ සාවුල් හා සාවුල්ට පසු රජකමට පත් දාවිත් ඒ අය වේ.

2 සාමුවෙල් : දාවිත් රජුගේ අනර්ඝ 40 අවුරුදු පාලනය මෙම පොතෙහි වාර්තා කර ඇත.

1 රාජාවලිය : මෙම පොතෙහි විෂයන් වන්නේ සලමොන් රජුගේ පාලන සමය හා උතුරෙහි ආහබ් ද දකුණෙහි ජෙහෝෂාපාට් ද වශයෙන් බෙදුනු රාජ්‍යයේ පාලන පිළිබඳව වේ.

2 රාජාවලිය : ඉශ්රායෙල්හි හා ජුදාහි රාජ්‍යයන්ගේ වැටීම ගැන මෙම පොතෙහි සඳහන් වේ. දෙවියන් වහන්සේගේ සෙනඟ බොහෝ සේ පාපයට වැටුනෝය.

1 ලේකම් : දාවිත්ගේ පාලන සමය හා දේව මාලිගාව ගොඩනැඟිමේ සූදානම මෙම පොතේ වාර්තා කර ඇත. මෙම පොත ද 2 සාමුවෙල් යුගයම වේ.

2 ලේකම් : දකුණු රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කරමින් සලමොන්ගේ පාලන සමයේ ඉතිහාසය තවදුරටත් මෙහි වාර්තා කර ඇත. මෙය අවසන් වන්නේ බබිලෝනියේ සිට යෙරුසලමට පැමිණීමට අවසර දීමේ සයිරස් රජුගේ ප්‍රකාශයෙනි.

එස්රා : යුදෙව්වරුන් බබිලෝනියේ සිට ආපසු පැමිණීම මෙහි විස්තර කර ඇත.

නෙහෙමියා : නෙහෙමියාගේ මඟපෙන්වීම යටතේ ජෙරුසලමේ පවුර නැවත ගොඩනැඟිම මෙම පොතේ සඳහන් වේ. එස්රා සෙනඟ සමග  ජෙරුසලමට පැමිණීමෙන් වසර 14 කට පමණ පසු මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරුණි.

එස්තර් : මෙම පොතෙහි විෂය වන්නේ එස්තර් හා මෝර්දෙකයි මගින් දෙවියන් වහන්සේ ජුදෙව්වන් මුදාගැනීම පිළිබඳව වේ.

## කාව්‍යමය පොත්

යෝබ්ගේ කථාව : ආබ්‍රහම්ගේ කාලයේ ජීවත් වූ ජෝබ් නැමැත්තෙකු පිළිබඳ කතාව මෙහි වාර්තා වේ. මෙහි තේමාව වන්නේ ධර්මිෂ්ඨ මිනිසුන් දුක්විඳින්නේ මන්ද යන ප්‍රශ්නය වේ.

ගීතාවලිය : බයිබලයේ යාච්ඤා හා ප්‍රශංසා පොතය.

හිතෝපදේශ : දෛනික ජිවිතයේ ප්‍රායෝගික ප්‍රශ්නවලට දිව්‍යමය ප්‍රඥාව.

දේශනාකාරයා : දෙවියන් වහන්සේගෙන් වෙන්වූ ජිවිතයක නිෂ්ඵලතාව පිළිබඳ සාකච්ඡාවකි.

සලමොන්ගේ ගිතිකා : සලමොන් හා ඔහුගේ මනාලිය අතර ප්‍රේම කතාව මෙහි ඇත. ඉශ්රායෙල් කෙරෙහි දෙවියන් වහන්සේගේත් සභාව කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේත් ප්‍රේමය මෙම කතාවෙන් දැක්වේ.

## අනාවැකි පොත්

මෙම පොතේ බොහොමයක් ලියා ඇත්තේ ඉශ්රායෙලය, ඉශ්රායෙල් හා ජුදා දේශය ලෙස වෙනම රාජ්‍යයන් දෙකකට බෙදුණු පසුව වේ.

යෙසායා : දෙවියන් වහන්සේට විරුද්ධව කෙරෙන පාප නිසා ජුදා දේශයට විරුද්ධව පැමිණෙන විනිශ්චයන් පිළිබඳව අනතුරු ඇඟවීමකි.

යෙරෙමියා : ජුදාහි පසුකාලීන පිරිහීම හා වැටීම සිදු වූ කාලයේ ලියන ලද්දකි. පැමිණීමට නියමිත විනිශ්චයයන් පවසා නෙබුකද්නෙශර්ට යටත්වන ලෙස ඉල්ලන ලදී.

විලාප ගී : බබිලෝනිය විසින් ජෙරුසලම විනාශ කිරීම පිළිබඳව යෙරමියාගේ විලාප ගී (කනගාටුව ප්‍රකාශ කෙරෙන) වේ.

එසකියෙල් : පළමුව යෙරුසලමේ ඉදිරි වැටීම පිළිබඳව පවසන අතර ඉන්පසු අනාගතයේ දී නැවත ප්‍රකෘතිමත් වන බවට අනාවැකි පළ කරයි.

දානියෙල් : යුදා දේශය වැටලූ මුල් අවදියේ දිවැසිවර දානියෙල් අල්ලා ගෙන බබිලෝනියට ගෙනයන ලදී. බයිබල් අනාවැකි අවබෝධ කරගැනීමට වැදගත් වන ඓතිහාසික හා අනාවැකි පිළිබඳ ඉගැන්වීම් මෙම පොත සපයයි.

හොෂෙයා : මෙම පොතෙහි තේමාව වන්නේ ඉශ්රායෙල්වරුන්ගේ අවිස්වාසකම, ඔවුන් ලද දඬුවම හා දෙවියන් වහන්සේ ඔවුන් නැවත ප්‍රකෘතිමත් කිරීම ගැන වේ.

යෝවෙල් : අනාගත විනිශ්චයන් පෙන්නුම් කරන සාගතයන් ගැන කියවේ.

ආමොස් : ද්‍රව්‍යමය සමෘද්ධිය තිබුණ ද සදාචාරාත්මක පිරිහීමක් ඇති අවධියේ, ආමොස් ඉශ්රායෙලයටත් අවට ජාතීන්ටත් ඔවුන්ගේ පාප නිසා පැමිණෙන දෙවියන් වහන්සේගේ විනිශ්චය ගැන අනතුරු අඟවයි.

ඔබදියා : මළ මුහුදට දකුණින් පිහිටි දුෂ්ට ජාතියක් වන ඒදොම්ට විරුද්ධ දෙවියන් වහන්සේගේ විනිශ්චය ගැන සඳහන් වේ.

යෝනා : අසිරියන් අධිරාජ්‍යයේ අගනුවර වූ නිනිවයෙහි දී පශ්චාතාපවීම ගැන දේශනා කළ දිවැසිවර ජෝනා පිළිබඳ කතාව වේ. අන්‍ය ජාතීන් කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා පශ්චාතාපවීමේ සැලැස්ම මෙම පොතෙන් එළිදරව් වේ.

මීකා : ඉශ්රායෙල්හි පාපයට විරුද්ධ තවත් අනාවැකියකි. ජේසුස් වහන්සේ උපදින ස්ථානය ගැන අවුරුදු 700 කට පෙර සඳහන් කරයි.

නාහුම් : ජෝනාගේ දේශනාවන් නිසා අවුරුදු 150 කට පමණ පෙර විනාශයෙන් බේරී තිබූ නිනිවයේ ඉදිරි විනාශය ගැන පවසයි.

හබක්කුක් : පාපී දේශයක් ඊටත් වඩා පාපී දේශයක් මගින් විනාශ කිරීමට ඇති දෙවියන් වහන්සේගේ සැලැස්ම එළිදරව් කරයි. “දැහැමි අය ඇදහිල්ලෙන් ජීවත් වෙති”යි යන්න උගන්වයි.

ශෙපනියා : ජුදා දේශයේ විනිශ්චය හා පුනරුත්ථාපනය

හග්ගයි : සතුරු උවදුරු නිසා දේවමාලිගාව නැවත ගොඩනැඟීම වසර 15 ක් පමණ ප්‍රමාද වී තිබූ බැවින් එය නැවත ආරම්භ කිරීමට ජුදෙව්වන්ගෙන් ඉල්ලා සිටී.

සෙකරියා : දේවමාලිගාව සම්පූර්ණ කරන ලෙස හා ආත්මික කැපවීම අලුත් කරන ලෙස ඉල්ලා සිටී. ජේසුස් වහන්සේගේ පළමු හා දෙවන පැමිණීම පිළිබද අනාවැකි පළ කරයි.

මලාකි : ආත්මික නොගැඹුරු බව ගැන අනතුරු අඟවන අතර ස්නාවක ජොහන්ගේ හා ජේසුස් වහන්සේගේ පැමිණීමට ගැන අනාවැකි පවසයි.

## නව ගිවිසුම
(පොත් 27 කි)

### ශුභාරංචි

ශුභාරංචි ලෙස හැඳින්වෙන පොත් හතරෙහි ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය, ජීවිතය, සේවය, ඉගැන්වීම්, මරණය හා උත්ථානය ගැන සඳහන් වේ. එක් එක් පොතෙහි ප්‍රවේශය එකිනෙකට වෙනස් වේ.

මතෙව් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ රජෙකු ලෙස අවධාරණය කෙරෙන අතර විශේෂයෙන්ම ලියා ඇත්තේ ජුදෙව්වන්ටය.

මාක් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන් වහන්සේගේ සේවකයා ලෙස අවධාරණය කෙරෙන අතර විශේෂයෙන්ම ලියා ඇත්තේ රෝමවරුන්ටය.

ලූක් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ "මනුෂ්‍ය පුත්‍රයා" ලෙසද, උන් වහන්සේ පරිපූර්ණ මනුෂ්‍යයා ලෙස හා අසම්පූර්ණ මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරු ලෙස ඉදිරිපත් කරයි.

ජොහන් : ජේසුස් වහන්සේ දේව පුත්‍රයා ලෙස ඇති උන් වහන්සේගේ තනතුරෙන් ඉදිරිපත් කරයි.

### ඓතිහාසික පොත

ක්‍රියා : නව ගිවිසුමේ එකම ඉතිහාස පොතේ වාර්තා කර ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේ ආපසු ස්වර්ගයට යෑමේ අවස්ථාවේ සිට පාවුලුතුමා රෝමයේ සිරගත වූ අවස්ථාව දක්වා කිතුනු ආගමේ මුල් වර්ධනය වේ. අවුරුදු 33 ක පමණ කාලයක් මින් ආවරණය කෙරන අතර ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාවන් අවධාරණය කරයි.

### හසුන් :

රෝම : ඇදහිල්ල මගින් ගැළවීම ලැබීම අවධාරණය කෙරෙන ලෙස ශුභාරංචිය ඉදිරිපත් කිරීමකි.

1 කොරින්ති : ප්‍රාදේශිය කිතුනු සභාවේ කිතුනු හැසිරීමේ වැරදි නිවැරදි කිරීමට ලියන ලද්දකි.

2 කොරින්ති : ශුභාරංචියේ, ගබඩාකාරිත්වයේ හා පාවුලුතුමාගේ අපොස්තලික ආධිපත්‍යයේ සැබෑ සේවය ගැන කතා කරයි.

ගලාති : ව්‍යවස්ථාව හා ඇදහිල්ල මිශ්‍ර කිරීමේ වරද පිළිබඳව කරුණු දක්වයි. මෙහි තේමාව වන්නේ ඇදහිල්ල පමණක් මගින් ධර්මිෂ්ඨ කිරීම වේ.

එපීස : ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති තම තත්වය ගැන ඇදහිලිවතුන්ව දිරිමත් කරයි.

පිලිප්පි : කිතුනුවන්ගේ එක්සත් බවේ ප්‍රීතිය අවධාරණය කරයි.

කොලොස්සි : ජේසුස් වහන්සේ දේවපුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා බව ප්‍රතික්ෂේප කරන ව්‍යාජ ඉගැන්වීමක් වන "ඥානවාදයේ" වරද පිළිබඳව කටයුතු කරයි. ජේසුස් වහන්සේ සභාවේ ප්‍රධානියා බවද මෙම පොත අවධාරණය කරයි.

1 තෙසලෝනික : කිතුනු දිවි පෙවෙත ගැන උපදෙස් දෙන අතර ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම අවධාරණය කරයි.

2 තෙසලෝනික : ස්වාමීන්වහන්සේගේ නැවත පැමිණීම ගැන තවදුරටත් උපදෙස් සපයන අතර මේ දැනුම එදිනෙදා ජීවිතයට බලපාන අයුරු පවසයි.

1 තිමෝති : නිවැරදි දේව ධර්මයත්, ක්‍රමවත් සභා පාලනයත් හා ඉදිරි වසරවල සභාවට මගපෙන්වීම සඳහා මූලධර්ම පිළිබඳව අවධාරණය කෙරේ.
2 තිමෝති : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ සේවකයා පිළිබඳව විස්තර කරයි. එමෙන්ම දැනටමත් ආරම්භ වී ඇති භක්තිය හැර යාම ගැන ද (ආත්මිකත්වය අඩුවීම) එය අනතුරු අඟවයි. දේව වචනය, සියලු වැරදි නිවැරදි කිරීමේ ක්‍රමයක් ලෙස එය පෙන්වයි.

තීතස් : මෙය ක්‍රීත දූපතේ සේවය කරමින් සිටි තීතස් නමැති තරුණ සේවකයාට පාවුලුතුමා යැවූ හසුනකි. දේවධර්මය හා භක්තිමත් ජීවිතය අවධාරණය කර ඇත.

පිලමොන් : කොලොස්සියේ ධනවත් කිතුනුවකු වෙතින් පලාගිය වහල් දාසයෙකු වෙනුවෙන් පාවුලුතුමාගේ මැදිහත්වීමකි. වරක් පාපයට වහල්ව සිටි ඇදහිලිවතුන් වෙනුවෙන් ජේසුස් වහන්සේගේ මැදිහත්වීම මින් පිළිබිඹු කෙරේ.

හෙබ්‍රෙව් : ජුදා ආගමට වඩා කිතුනු ආගමේ උසස් බව පැහැදිලි කෙරේ. ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨ උත්තම පූජකයා ලෙස හා මිනිසා හා දෙවියන් වහන්සේ අතර මැදහත්කරු ලෙස මෙහි ඉදිරිපත් කර ඇත.

යාකොබ් : ගැළවීම, ඇදහිල්ලෙන් පමණක් වුවද, සැබෑ ඇදහිල්ල ක්‍රියාවන්ගෙන් පෙනෙන බව උගන්වයි.

1 ජේතෘස් :විශේෂයෙන්ම සභාවට පිටත සිටින නොඇදහිලිවතුන් මගින් එල්ල කෙරෙන ආත්මික ප්‍රහාරවලින් දුක්විඳින ඇදහිලිවතුන් දිරිමත් කරන ලිපියකි.

2 ජේතෘස් : අභ්‍යන්තරයෙන් පැමිණෙන ආත්මික ප්‍රහාරවලට එරෙහි අනතුරු ඇඟවීමකි. නිදසුනක් ලෙස දැනටමත් සභාවට “රිංගා” ඇති ව්‍යාජ ගුරුවරුන්ගෙන් එන ප්‍රහාර පිළිබඳ ලිපියකි.

1 යොහන් : දේව පුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා ලෙස ක්‍රිස්තුස්වහන්සේට ඇති තැන ලබා නොදෙන ඥානවාදය හා සටන් කිරීමට මෙය ලියා ඇත. මෙම පොත, ඇදහිලිවතුන් අතර සහභාගිකම අවධාරණය කරන අතර සැබෑ ඇදහිලිවතුන්ට සදාතන ජීවනය සහතික කරයි.

2 යොහන් : දේවධාර්මික වැරදි සමග එකඟතාවකට පැමිණීම ගැන අනතුරු අඟවයි. සත්‍යය, සැබෑ ප්‍රේමයෙන් රැකගත යුතු බවට අවධාරණය කරයි.

3 යොහන් : සැබෑ ඇදහිලිවතුන් සමග සහභාගිකම ප්‍රතික්ෂේප කරන අයගේ පාපය ගැන අනතුරු අඟවයි.

යූද් : භක්තිය හැර යෑම හා ව්‍යාජ ධර්මය පිළිබඳ තවත් අනතුරු ඇඟවීමකි. මෙහි තේමාව ජේදුරුගේ තේමාවට සමාන වේ.

## අනාවැකි පිළිබඳ පොත

එළිදරව්ව : ලෝක ඉතිහාසයේ අනාගත සිදුවීම් ගැන මෙම අනාවැකි පොත පවසයි. එය අනාගත සැලැස්මේ තිබූ දේ, දැන් තිබෙන දේ හා තිබෙන්නට යන දේ ගැන පවසයි (එළිදරව් 4:22).

# සාර්ථක බයිබල් කියවීම

බයිබලය අවබෝධ කරගන්නේ හා අර්ථනිරූපණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබ මෙම පාඨමාලාවෙන් බොහෝ දේ ඉගෙන ගන්නවා ඇත. එපමණක් නොව බයිබල් අධ්‍යයනය පිළිබඳ නිර්මාණාත්මක ක්‍රම ද ඔබ ඉගෙන ගන්නෙහිය. එහෙත් බයිබලය අවබෝධ කරගැනීමේ පළමු පියවර වන්නේ එය කියවීම ආරම්භ කිරීම වේ. දේව වචනය කියවීම ආරම්භ කිරීමට උපකාර කිරීමක් ලෙස අප විවිධ කියවීම් සැලසුම් සැකිල්ලක් දී ඇත. මේවා අතර ආරම්භ කළ අය සඳහා සැලැස්මක් මෙන්ම දේව වචනය අධ්‍යයනය සම්බන්ධව වඩාත් උසස් දැනුමක් ඇති අය සඳහා සැලැස්මක් ද අන්තර්ගත වේ.

පළමුව, සාර්ථක බයිබල් කියවීමක් සඳහා යෝජනා හතරක් පහත දැක්වේ.

## 1. දිනපතාම කියවන්න

**ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රිතිවන්නාවූ උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල් මෙනෙහිකරන්නාවූ මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය. (ගීතාවලිය 1:2).**

දෙවියන් වහන්සේ ඔබගේ ශරීරය මවා ඇත්තේ, සෞඛ්‍ය සම්පන්නව සිටීම සඳහා, දිනපතාම ආහාර ගත යුතු ලෙසට වේ. මේ ආකාරයෙන්ම ඔබ ආත්මිකව සෞඛ්‍ය සම්පන්නව සිටීම සඳහා ඔබගේ ආත්මයට දිනපතාම දේව වචනය නමැති ආහාරය දිය යුතුය.

**යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින් මනුෂ්‍යයා රොටී පමණකින් ජිවත් නොවන්නේය කියා ලියා තිබේයයි කීසේක. (ලූක් 4:4).**

## 2. තෝරාගෙන කියවන්න

දේව වචනයේ “කිරි” පළමුව කියවන්න. මේවා දේව වචනයේ සරල සත්‍යයන් වේ.

**ආත්මිකවූ අමිශ්‍රවූ කිරිවලින්, නුඹලා ගැළවීම සඳහා වර්ධනය වන පිණිස අලුත උපන් බිළිඳුන් මෙන් එයට බොහෝ ආශාවෙන්න. (1 පේතෘස් 2:3).**

පසුව ඔබ ආත්මිකව පරිණත වනවා ඇත. එවිට ඔබට දේව වචනයේ “මාංශ” අනුභව කළ හැකිය. මින් අදහස් වන්නේ ඔබට බයිබලයේ වඩාත් අසීරු ඉගැන්වීම් අවබෝධ කරගත හැකි බව වේ.

**ඉතින් කිරිබොන සැමදෙනාම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දැඩි ආහාර ඕනෑවන්නේ යහපත හා අයහපත විමසා බලන්ට නිරාහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ තැනැත්තන්ටය. (හෙබ්‍රෙව් 5:13-14).**

**මම නුඹලා දැඩි කෑමෙන් නොව කිරෙන් පෝෂණය කළෙමි. එසේ කළේ නුඹලා ඒවා දරන්ට බැරිව සිටි නිසාය. එසේය දැනුත් බැරිය. (1 කොරින්ති 3:2).**

## 3. යාච්ඤාවෙන් යුතුව කියවන්න.

**එස්රා ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාව සොයන්ටත්, පවත්වන්ටත් ඉශ්‍රායෙල්හි පනත්ද විනිශ්චයන්ද උගන්වන්ටත් තමාගේ සිත යොමු කරගත්තේය. (එස්රා 7:10).**

කියවීම ආරම්භ කිරීමට පෙර දෙවියන් වහන්සේට යාච්ඤා කර, උන් වහන්සේ උන් වහන්සේගේ ලිඛිත වචනයෙන් ඔබට දී ඇති පණිවුඩය අවබෝධ කරගැනීමට උපකාර අයැදින්න. ඔබගේ යාච්ඤාව දාවිත් ගීතිකාකාරයාගේ මෙන් විය හැකිය.

**ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යවත් දේ දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව. (ගීතාවලිය 119:18).**

## 4. ක්‍රමානුකූලව කියවන්න.

ඇතැම් අයට දේව වචනය අවබෝධ නොවන්නේ ඔවුන්ට කියවීම සඳහා ක්‍රමානුකූල සැලැස්මක් නොමැති බැවිනි. ඔවුහු එතැනින්-මෙතැනින් පරිච්ඡේදය බැගින් කියවා ඒවා එකිනෙකට ගැළපෙන්නේ කෙසේද යන්න තේරුම් ගැනිමට අසමත් වෙති. මෙය ඖෂධ පිළිබඳ පෙළ පොතකින්, තැන් තැන්වල පිටු කීපය බැගින් කියවා වෛද්‍යවරයෙකු වීමට දරන උත්සාහයක් වැනිය. “ශුද්ධ ලියවිල්ල හදාරන්නයැ”යි (ජොහන් 5:39) බයිබලය පවසයි. මින් අදහස් වන්නේ පරෙස්සමෙන් අධ්‍යයනය කිරීම වේ. බයිබලය පාසලේ භාවිත කරන පෙළ පොතක් වැනිය. එහි අන්තර්ගතය අවබෝධ කරගැනීමට ඔබ එය ක්‍රමානුකූලව කියවිය යුතුය. පහත දැක්වෙන කියවීමේ සැලැස්මක් තෝරාගෙන ඔබගේ බයිබලය කියවීම ආරම්භ කරන්න.

# නවකයින්ට

ඔබ කිසි දිනක බයිබලය කියවා නොමැති නම් අලුත් ගිවිසුමේ ජොහන්ගේ පොතෙන් පටන් ගන්න. මෙම පොත ලියා ඇත්තේ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වන ජොහන් විසිනි. ඔහු ජේසුස් වහන්සේ පිළිබඳ කතාන්දරය තේරුම් ගැනීමට පහසුවන ආකාරයෙන් සරලව ලියා ඇත.
බයිබලයේ සඳහන් අනුපිළිවෙළ අනුව දවසකට එක පරිච්ඡේදය බැගින් ජොහන්ගේ පොත කියවන්න. ඔබ කියවන අතර පහත දැක්වෙන සටහනෙහි ලකුණු කරන්න.

**යොහන් ශුභාරංචිය**

| | | | | |
|---|---|---|---|---|
| **_________ 1** | **_________ 5** | **_________ 9** | **_________ 13** | **_________ 17** |
| **_________ 2** | **_________ 6** | **_________ 10** | **_________ 14** | **_________ 18** |
| **_________ 3** | **_________ 7** | **_________ 11** | **_________ 15** | **_________ 19** |
| **_________ 4** | **_________ 8** | **_________ 12** | **_________ 19** | **_________ 20** |

# කෙටි සැලැස්ම

බයිබලය කියවීමේ කෙටි සැලැස්මේ සැලසුම් කර ඇත්තේ, ශුද්ධ ලියවිල්ලේ තෝරාගත් කොටස් මගින් බයිබලය පිළිබඳ මූලික දැනුමක් ලබා දීමට වේ. ඒවා ලයිස්තු ගත කර ඇති අනුපිළිවෙළ අනුව තෝරාගත් කොටස් කියවන්න. ඔබ කියවීම අවසන් කරන විට සටහනෙහි එය ලකුණු කරන්න.

## නව ගිවිසුම

______ යොහන්

______ මාක්

______ ලූක්

______ ක්‍රියා

______ රෝම

______ 1 තෙසලෝනික

______ 1 කොරින්ති

______ රෝම

______ පිලෙමොන්

______ පිලිප්පි

______ එපීස

______ 2 තිමෝති

______ 1 පේතෘස්

______ 1 යොහන්

______ එළිදරව් 1-5, 19:6-22:21

## පැරණි ගිවිසුම

______ උත්පත්ති

______ නික්මයාම 1-20

______ ගණන්කථාව 10:11-21:35

______ ද්විතිය කථාව 1-11

______ යෝෂුවා 1-12, 22-24

______ විනිශ්චයකාරයා 1-3

______ 1 සාමුවෙල් 1-3,9-10,13.15-18,31

______ 2 සාමුවෙල් 1

______ 1 රාජාවලිය 1-11

______ නෙහෙමියා

______ ආමොස්

______ යෙසායා 1-12

______ යෙරමියා 1-25, 39-33

______ රූත්

______ යෝනා

______ ගීතාවලිය 1-23

______ යෝබ් 1-14, 38-42

______ හිතෝපදේශ 1-9

______ දානියෙල් 1-6

## දිගු සැලැස්ම

මෙම කියවීමේ සැලැස්ම කෙටි සැලැස්මට වඩා ගැඹුරින් බයිබලය ආවරණය කරයි. එහෙත් මුළු බයිබලයම ආවරණය නොකරයි.

### නව ගිවිසුම

______ මාර්ක්

______ මතෙව්

______ යොහන්

______ ලූක්

______ ක්‍රියා

______ 1 තෙසලෝනික

______ 2 තෙසලෝනික

______ 1 කොරින්ති

______ 2 කොරින්ති

______ ගලාති

______ රෝම

______ පිලෙමොන්

______ කොලොස්සි

______ පිලිප්පි

______ එපීස

______ 2 තිමෝති

______ තිතස්

______ 1 තිමෝති

______ 1 පේතෘස්

______ හෙබ්‍රෙව්

______ යාකොබ්

______ 1 යොහන්

______ 2 යොහන්

______ 3 යොහන්

______ යූද්

______ 2 පේතෘස්

______ එළිදරව් 1-5 සහ 19:6-22:21

## පරණ ගිවිසුම

______ උත්පත්ති

______ නික්මයාම (1-24)

______ ලෙවී ව්‍යවස්ථාව 1-6:7

______ ගණන් කථාව 10:11-21:35

______ ද්විතීය කතාව 1-11 සහ 27-34

______ යෝෂුවා 1-12 සහ 22-24

______ විරාවලිය 1-16

______ 1 සාමුවෙල්

______ 2 සාමුවෙල්

______ 1 රාජාවලිය

______ 2 රාජාවලිය

______ 1 ලේකම්

______ 2 ලේකම්

______ එස්රා

______ නෙහෙමියා

______ ආමොස්

______ හොෂෙයා

______ මීකා

______ යෙසායා 1-12

______ ශෙපනියා

______ යෙරමියා 1-25 සහ 30-33

______ නාහුම්

______ හබක්කුක්

______ එසකියෙල් 1-24 සහ 33-39

______ ඔබදියා

______ විලාප ගී

______ යෙසායා 40-66

______ සෙකරියා 1-8

______ මලාකි

______ යෝවෙල්

______ රූත්

______ යෝනා

______ ගීතාවලිය

______ යෝබ්

______ හිතෝපදේශ 1-9

______ ප්‍රේම ගී

______ දේශනාකාරයා

______ එස්තර්

______ දානියෙල්

## සම්පූර්ණ සැලැස්ම

සම්පූර්ණ බයිබල් කියවීමේ සැලැස්ම අවුරුද්දක් ඇතුළත මුළු බයිබලයම කියවීමට සැලසුම් කර ඇත.

| | ජනවාරි |
|---|---|
| ______1. | උත්පත්ති 1-2 |
| ______2. | උත්පත්ති 3-5 |
| ______3. | උත්පත්ති 6-9 |
| ______4. | උත්පත්ති 10-11 |
| ______5. | උත්පත්ති 12-15 |
| ______6. | උත්පත්ති 16-19 |
| ______7. | උත්පත්ති 20-22 |
| ______8. | උත්පත්ති 23-26 |
| ______9. | උත්පත්ති 27-29 |
| ______10. | උත්පත්ති 30-32 |
| ______11. | උත්පත්ති 33-36 |
| ______12. | උත්පත්ති 37-39 |
| ______13. | උත්පත්ති 40-42 |
| ______14. | උත්පත්ති 43-46 |
| ______15. | උත්පත්ති 47-50 |
| ______16. | යෝබ් 1-4 |
| ______17. | යෝබ් 5-7 |
| ______18. | යෝබ් 8-10 |
| ______19. | යෝබ් 11-13 |
| ______20. | යෝබ් 14-17 |
| ______21. | යෝබ් 18-20 |
| ______22. | යෝබ් 21-24 |
| ______23. | යෝබ් 25-27 |
| ______24. | යෝබ් 28-31 |
| ______25. | යෝබ් 32-34 |
| ______26. | යෝබ් 35-37 |
| ______27. | යෝබ් 38-42 |
| ______28. | නික්මයාම 1-4 |
| ______29. | නික්මයාම 5-7 |
| ______30. | නික්මයාම 8-10 |
| ______31. | නික්මයාම 11-13 |

| | පෙබරවාරි |
|---|---|
| ______1. | නික්මයාම 14-17 |
| ______2. | නික්මයාම 18-20 |
| ______3. | නික්මයාම 21-24 |
| ______4. | නික්මයාම 25-27 |
| ______5. | නික්මයාම 28-31 |
| ______6. | නික්මයාම 32-34 |
| ______7. | නික්මයාම 35-37 |
| ______8. | නික්මයාම 38-40 |
| ______9. | ලෙවී කථාව 1-4 |
| ______10. | ලෙවී කථාව 5-7 |
| ______11. | ලෙවී කථාව 8-10 |
| ______12. | ලෙවී කථාව 11-13 |
| ______13. | ලෙවී කථාව 14-16 |
| ______14. | ලෙවී කථාව 17-19 |
| ______15. | ලෙවී කථාව 20-23 |
| ______16. | ලෙවී කථාව 24-27 |
| ______17. | ගණන් කථාව 1-3 |
| ______18. | ගණන් කථාව 4-6 |
| ______19. | ගණන් කථාව 7-10 |
| ______20. | ගණන් කථාව 11-14 |
| ______21. | ගණන් කථාව 15-17 |
| ______22. | ගණන් කථාව 18-20 |
| ______23. | ගණන් කථාව 21-24 |
| ______24. | ගණන් කථාව 25-27 |
| ______25. | ගණන් කථාව 28-30 |
| ______26. | ගණන් කථාව 31-33 |
| ______27. | ගණන් කථාව 34-36 |
| ______28. | ද්විතීය කථාව 1-3 |

## මාර්තු

______1. ද්විතිය කථාව 4-6
______2. ද්විතිය කථාව 7-9
______3. ද්විතිය කථාව 10-12
______4. ද්විතිය කථාව 13-16
______5. ද්විතිය කථාව හය 17-19
______6. ද්විතිය කථාව 20-22
______7. ද්විතිය කථාව 23-25
______8. ද්විතිය කථාව 26-28
______9. ද්විතිය කථාව 29-31
______10. ද්විතිය කථාව 32-34
______11. යෝෂුවා 1-3
______12. යෝෂුවා 4-6
______13. යෝෂුවා 7-9
______14. යෝෂුවා 10-12
______15. යෝෂුවා 13-15
______16. යෝෂුවා 16-18
______17. යෝෂුවා 19-21
______18. යෝෂුවා 22-24
______19. විනිශ්චයකාරයා 1-4
______20. විනිශ්චයකාරයා 5-8
______21. විනිශ්චයකාරයා 9-12
______22. විනිශ්චයකාරයා 13-15
______23. විනිශ්චයකාරයා 16-18
______24. විනිශ්චයකාරයා 19-21
______25. රූත් 1-4
______26. 1 සාමුවෙල් 1-3
______27. 1 සාමුවෙල් 4-7
______28. 1 සාමුවෙල් 8-10
______29. 1 සාමුවෙල් 11-13
______30. 1 සාමුවෙල් 14-16
______31. 1 සාමුවෙල් 17-20

## අප්‍රේල්

______1. 1 සාමුවෙල් 21-24
______2. 1 සාමුවෙල් 25-28
______3. 1 සාමුවෙල් 29-31
______4. 2 සාමුවෙල් 1-4
______5. 2 සාමුවෙල් 5-8
______6. 2 සාමුවෙල් 9-12
______7. 2 සාමුවෙල් 13-15
______8. 2 සාමුවෙල් 16-18
______9. 2 සාමුවෙල් 19-21
______10. 2 සාමුවෙල් 22-24
______11. ගීතාවලිය 1-3
______12. ගීතාවලිය 4-6
______13. ගීතාවලිය 7-9
______14. ගීතාවලිය 10-12
______15. ගීතාවලිය 13-15
______16. ගීතාවලිය 16-18
______17. ගීතාවලිය 19-21
______18. ගීතාවලිය 22-24
______19. ගීතාවලිය 25-27
______20. ගීතාවලිය 28-30
______21. ගීතාවලිය 31-33
______22. ගීතාවලිය 34-36
______23. ගීතාවලිය 37-39
______24. ගීතාවලිය 40-42
______25. ගීතාවලිය 43-45
______26. ගීතාවලිය 46-48
______27. ගීතාවලිය 49-51
______28. ගීතාවලිය 52-54
______29. ගීතාවලිය 55-57
______30. ගීතාවලිය 58-60

**මැයි**

______1. ගීතාවලිය 61-63
______2. ගීතාවලිය 64-66
______3. ගීතාවලිය 67-69
______4. ගීතාවලිය 70-72
______5. ගීතාවලිය 73-75
______6. ගීතාවලිය 76-78
______7. ගීතාවලිය 79-81
______8. ගීතාවලිය 82-84
______9. ගීතාවලිය 85-87
______10. ගීතාවලිය 88-90
______11. ගීතාවලිය 91-93
______12. ගීතාවලිය 94-96
______13. ගීතාවලිය 97-99
______14. ගීතාවලිය 100-102
______15. ගීතාවලිය 103-105
______16. ගීතාවලිය 106-108
______17. ගීතාවලිය 109-111
______18. ගීතාවලිය 112-114
______19. ගීතාවලිය 115-118
______20. ගීතාවලිය 119
______21. ගීතාවලිය 120-123
______22. ගීතාවලිය 124-126
______23. ගීතාවලිය 127-129
______24. ගීතාවලිය 130-132
______25. ගීතාවලිය 133-135
______26. ගීතාවලිය 136-138
______27. ගීතාවලිය 139-141
______28. ගීතාවලිය 142-144
______29. ගීතාවලිය 145-147
______30. ගීතාවලිය 148-150
______31. 1 රාජාවලිය 1-4

**ජූනි**

______1. හිතෝපදේශ 1-3
______2. හිතෝපදේශ 4-7
______3. හිතෝපදේශ 8-11
______4. හිතෝපදේශ 12-14
______5. හිතෝපදේශ 15-18
______6. හිතෝපදේශ 19-21
______7. හිතෝපදේශ 22-24
______8. හිතෝපදේශ 25-28
______9. හිතෝපදේශ 29-31
______10. දේශනාකාරයා 1-3
______11. දේශනාකාරයා 4-6
______12. දේශනාකාරයා 7-9
______13. දේශනාකාරයා 10-12
______14. සලමොන්ගේ ගී 1-4
______15. සලමොන්ගේ ග5-8
______16. 1 රාජාවලිය 5-7
______17. 1 රාජාවලිය 8-10
______18. 1 රාජාවලිය 11-13
______19. 1 රාජාවලිය 14-16
______20. 1 රාජාවලිය 17-19
______21. 1 රාජාවලිය 20-22
______22. 2 රාජාවලිය 1-3
______23. 2 රාජාවලිය 4-6
______24. 2 රාජාවලිය 7-10
______25. 2 රාජාවලිය 11-14:20
______26. යෝවෙල් 1-3
______27. 2 රාජාවලිය 14:21-25, යෝනා 1-4
______28. 2 රාජාවලිය 14:26-29, ආමොස් 1-3
______29. ආමොස් 4-6
______30. ආමොස් 7-9

**ජුලි**

______1. 2 රාජාවලිය 15-17
______2. හොෂෙයා 1-4
______3. හොෂෙයා 5-7
______4. හොෂෙයා 8-10
______5. හොෂෙයා 11-14
______6. 2 රාජාවලිය 18-19
______7. යෙසායා 1-3
______8. යෙසායා 4-6
______9. යෙසායා 7-9
______10. යෙසායා 10-12
______11. යෙසායා 13-15
______12. යෙසායා 16-18
______13. යෙසායා 19-21
______14. යෙසායා 22-24
______15. යෙසායා 25-27
______16. යෙසායා 28-30
______17. යෙසායා 31-33
______18. යෙසායා 34-36
______19. යෙසායා 37-39
______20. යෙසායා 40-42
______21. යෙසායා 43-45
______22. යෙසායා 46-48
______23. යෙසායා 49-51
______24. යෙසායා 52-54
______25. යෙසායා 55-57
______26. යෙසායා 58-60
______27. යෙසායා 61-63
______28. යෙසායා 64-66
______29. මීකා 1-4
______30. මීකා 5-7
______31. නාහුම් 1-3

**අගෝස්තු**

______1. 2 රාජාවලිය 20-21
______2. ශෙපනියා 1-3
______3. හබක්කුක් 1-3
______4. 2 රාජාවලිය 22-25
______5. ඔබදියා/ජෙරමියා 1-2
______6. යෙරමියා 3-5
______7. යෙරමියා 6-8
______8. යෙරමියා 9-12
______9. යෙරමියා 13-16
______10. යෙරමියා 17-20
______11. යෙරමියා 21-23
______12. යෙරමියා 24-26
______13. යෙරමියා 27-29
______14. යෙරමියා 30-32
______15. යෙරමියා 33-36
______16. යෙරමියා 37-39
______17. යෙරමියා 40-42
______18. යෙරමියා 43-46
______19. යෙරමියා 47-49
______20. යෙරමියා 50-52
______21. විලාප ගී 1-5
______22. 1 ලේකම් 1-3
______23. 1 ලේකම් 4-6
______24. 1 ලේකම් 7-9
______25. 1 ලේකම් 10-13
______26. 1 ලේකම් 14-16
______27. 1 ලේකම් 17-19
______28. 1 ලේකම් 20-23
______29. 1 ලේකම් 24-26
______30. 1 ලේකම් 27-29
______31. 2 ලේකම් 1-3

**සැප්තැම්බර්**

______1. 2 ලේකම් 4-6
______2. 2 ලේකම් 7-9
______3. 2 ලේකම් 10-13
______4. 2 ලේකම් 14-16
______5. 2 ලේකම් 17-19
______6. 2 ලේකම් 20-22
______7. 2 ලේකම් 23-25
______8. 2 ලේකම් 26-29
______9. 2 ලේකම් 30-32
______10. 2 ලේකම් 33-36
______11. එසකියෙල් 1-3
______12. එසකියෙල් 4-7
______13. එසකියෙල් 8-11
______14. එසකියෙල් 12-14
______15. එසකියෙල් 15-18
______16. එසකියෙල් 19-21
______17. එසකියෙල් 22-24
______18. එසකියෙල් 25-27
______19. එසකියෙල් 28-30
______20. එසකියෙල් 31-33
______21. එසකියෙල් 34-36
______22. එසකියෙල් 37-39
______23. එසකියෙල් 40-42
______24. එසකියෙල් 43-45
______25. එසකියෙල් 46-48
______26. දානියෙල් 1-3
______27. දානියෙල් 4-6
______28. දානියෙල් 7-9
______29. දානියෙල් 10-12
______30. එස්තර් 1-3

**ඔක්තෝබර්**

______1. එස්තර් 4-7
______2. එස්තර් 8-10
______3. එස්රා 1-4
______4. හග්ගයි 1-2/සෙකරියා 1-2
______5. සෙකරියා 1-2
______6. සෙකරියා 3-6
______7. සෙකරියා 7-10
______8. එස්රා 5-7
______9. එස්රා 8-10
______10. නෙහෙමියා 1-3
______11. නෙහෙමියා 4-6
______12. නෙහෙමියා 7-9
______13. නෙහෙමියා 10-13
______14. මලාකි 1-4
______15. මතෙව් 1-4
______16. මතෙව් 5-7
______17. මතෙව් 8-11
______18. මතෙව් 12-15
______19. මතෙව් 16-19
______20. මතෙව් 20-22
______21. මතෙව් 23-25
______22. මතෙව් 26-28
______23. මාර්ක් 1-3
______24. මාර්ක් 4-6
______25. මාර්ක් 7-10
______26. මාර්ක් 11-13
______27. මාර්ක් 14-16
______28. ලූක් 1-3
______29. ලූක් 4-6
______30. ලූක් 7-9
______31. ලූක් 10-13

**නොවැම්බර්**

______1. ලූක් 14-17
______2. ලූක් 18-21
______3. ලූක් 22-24
______4. යොහන් 1-3
______5. යොහන් 4-6
______6. යොහන් 7-10
______7. යොහන් 11-13
______8. යොහන් 14-17
______9. යොහන් 18-21
______10. ක්‍රියා 1-2
______11. ක්‍රියා 3-5
______12. ක්‍රියා 6-9
______13. ක්‍රියා 10-12
______14. ක්‍රියා 13-14
______15. යාකොබ් 1-2
______16. යාකොබ් 3-5
______17. ගලාති 1-3
______18. ගලාති 4-6
______19. ක්‍රියා 15-18:11
______20. 1 තෙසලෝනික 1-5
______21. 2 තෙසලෝනික 1-3
______22. 1 කොරින්ති 1-4
______23. 1 යොහන් 3-5
______24. 2 යොහන්, 3 යොහන්
______25. එළිදරව් 1-3, යූද්
______26. එළිදරව් 4-6
______27. එළිදරව් 7-9
______28. එළිදරව් 10-12
______29. එළිදරව් 13-15
______30. එළිදරව් 16-18
______30. එළිදරව් 19-22

**දෙසැම්බර්**

______1. රෝම 5-8
______2. රෝම 9-11
______3. රෝම 12-16
______4. ක්‍රියා 20:3-22
______5. ක්‍රියා 23-25
______6. ක්‍රියා 26-28
______7. එපිස 1-3
______8. එපිස 4-6
______9. පිලිප්පි 1-4
______10. කොලොස්සි 1-4
______11. හෙබ්‍රෙව් 1-4
______12. හෙබ්‍රෙව් 5-7
______13. හෙබ්‍රෙව් 8-10
______14. හෙබ්‍රෙව් 11-13
______15. පිලෙමොන්/1 පේතෘස් 1-2
______16. 1 පේතෘස් 3-5
______17. 2 පේතෘස් 1-3
______18. 1 තිමෝති 1-3
______19. 1 තිමෝති 4-6
______20. තිතස් 1-3
______21. 2 තිමෝති 1-4
______22. 1 යොහන් 1-2, ක්‍රියා 18:12-19:10
______23. 1 කොරින්ති 5-8
______24. 1 කොරින්ති 9-12
______25. 1 කොරින්ති 13-16
______26. ක්‍රියා 19:11-20, 2 කොරින්ති 1-3
______27. 2 කොරින්ති 4-6
______28. 2 කොරින්ති 7-9
______29. 2 කොරින්ති 10-13
______30. ක්‍රියා 20:2/රෝම 1-4

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පැරණි ගිවිසුමේ ඇති පොත් ගණන කොපමණද?

3. නව ගිවිසුමේ ඇති පොත් ගණන කොපමණද?

4. බයිබලය කියවීම සඳහා ක්‍රමවත් සැලැස්මක් තිබීමට හේතුව කුමක්ද?

5. සාර්ථක බයිබල් කියවීමක් සඳහා දී ඇති යෝජනා හතර කවරක්ද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

- බයිබලයේ සෑම පොතක් සඳහාම, මෙම පරිච්ඡේදයේ දී ඇති විස්තරය නැවත කියවන්න.
- බයිබලයේ සෑම පොතකම නම පහත ලියන්න.
- සෑම පොතකම නම ඇසුරෙන්, එහි අන්තර්ගතය, වචන තුන හතරකින් ලියන්න.
- පළමු දෙක නිදසුන් වශයෙන් ඔබට අනුගමනය කිරීම සඳහා දක්වා ඇත.

(මේ ආකාරයෙන් ඒවා කැටිකර දැක්වීමෙන් මුළු බයිබලයේම අන්තර්ගතය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඔබට ලබාගත හැකිය)

| **පොතේ නම** | **අන්තර්ගතය** |
|---|---|
| උත්පත්ති | පටන් ගැනීම පිළිබඳ පොත |
| නික්මයාම | මිසරයෙන් නික්මයාම |

# තුන් වන පරිච්ඡේදය

# බයිබලයේ අනුවාද

## අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බයිබලය ලියා තිබූ භාෂා තුන නම් කිරීමට
- "අනුවාදය" යන වචනය නිර්වචනය කිරීමට
- බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස දැක්වීමට
- හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

**සමිඳුණෝ අණ දුන් සේක. බොහෝ දූතයෝ ආරංචිය පතුරුවා හළහ (ගීතාවලිය 68:11)**
(නව අනුවාදය)

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය, බයිබලය ලියන ලද මුල් භාෂාවන් හඳුන්වා දෙන අතර ශුද්ධ ලියවිල්ල වෙනත් භාෂාවලට පරිවර්තනය කළ අයුරු විස්තර කරයි. බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස ද ඔබ ඉගෙන ගන්නවා ඇත. බයිබලයේ විවිධ අනුවාද සඳහා උදාහරණ සපයා තිබේ.

### භාෂා තුන

බයිබලය මුලින්ම භාෂා තුනකින් ලියන ලදී. පැරණි ගිවසුමේ බොහෝ කොටස්, දානියෙල් හා නෙහෙමියා පොත්වල ඇතැම් කොටස් හැරුණු විට හෙබ්‍රෙව් භාෂාවෙන් ලියා ඇත. අනෙක් කොටස් ලියන ලද්දේ අරාමිය භාෂාවෙනි. නව ගිවිසුම ග්‍රීක භාෂාවෙන් ලියා තිබිණි.

බයිබලයේ මුල් අත්පිටපත් කිසිවක් දැන් නොපවතී. මුල් ඒවායේ පිටපත් කීපයක් වන හොඳ අත්පිටපත් අද තිබේ. අනුවාද යනු මෙම මුල් අත්පිටපත්වල පරිවර්තන වේ. මුල් අවදියේ සිටම, සෑම කෙනෙකුටම තම භාෂාවෙන් බයිබලය කියවීමට හැකිවන පරිදි බයිබලය පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව පෙණිනි.

කිසිදු භාෂා දෙකක් සෑම අතකින්ම එක සමාන නොමැති බැවින් පරිවර්තන කිසිවක් එකිනෙකට සමාන නොවේ. බයිබලයේ ඇති සමහර වචන බොහෝ භාෂාවල නොපවතී. නිදසුනක් ලෙස දකුණු ඇමරිකාවේ එක්වදෝර්හි අවුකා ඉන්දියානුවන් ලෙස හැඳින්වෙන ගෝත්‍රයක් තිබේ. මිෂනාරිවරුන්ට ඔවුන් මුලින්ම හමුවූ විට මේ ඉන්දියානුවෝ ලියන්නට හෝ කියවන්නට හෝ නොදැන සිටියහ. "ලිවීම" හෝ "පොත" යන්නට ඔවුන්ගේ භාෂාවෙන් වචන නොතිබිණි.

අවුකා ඉන්දියන්වරුන්ට, ඔවුන්ගේ දේපළවල හඳුනාගැනීමේ ලකුණක් කැටයම් කිරීමේ සම්ප්‍රදායක් තිබිණි. ඔවුන්ගේ භාෂාවේ ශුද්ධ ලියවිල්ල, ලිවීම හෝ පොත යන ඒවාට වචන නොතිබූ නිසා, බයිබලය පරිවර්තනය කරන විට මේවා "දෙවියන් වහන්සේගේ කැටයම්" ලෙස හැඳින්විනි. මින් පෙන්නුම් කළේ ඒවා දෙවියන් වහන්සේට අයිති යම් දෙයක් ලෙස වේ. බයිබලය විවිධ භාෂාවලට පරිවර්තනය කිරීමේදී මුහුණ පෑමට සිදුවන අසීරුතාවන් සඳහා මෙය එක් නිදසුනකි.

## පරිවර්තන හා අර්ථෝද්ධාර

බයිබලයේ විවිධ අනුවාද තිබේ. "අනුවාද" යන වචනයෙහි තේරුම, එම බයිබලය ලියා ඇත්තේ, දේව වචනය මුලින් ලියූ භාෂාවට වඩා වෙනස් භාෂාවකින් යන්න වේ. බයිබලයේ අනුවාදවල ප්‍රධාන වර්ග දෙකකි. පරිවර්තන හා අර්ථෝද්ධාර වශයෙනි.

### පරිවර්තන

පරිවර්තනයක් යනු ග්‍රීක්, හෙබ්‍රෙව් හා අරාමීය වචන සැබවින්ම පවසන දෙය ප්‍රකාශ කිරීමට දක්වන වෑයමකි. එය හැකි පමණින් වචනාර්ථයෙන්ම, වචනයක් පාසා වචනයක පරිවර්තනයක් ලබා දෙයි. වැඩිපුර වචන ඇතුළත් කර ඇත්තේ එහි තේරුම පාඨකයාට අවබෝධ කරගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක පමණි.

### අර්ථෝද්ධාර

අර්ථෝද්ධාර වචනයෙන් වචනය පරිවර්තනය කිරීමට උත්සාහ නොකරයි. එය සිතිවිල්ලක් පාසා සිතිවිල්ලක් පරිවර්තනය කරයි. අර්ථෝද්ධාර යනු යම් කොටසක අදහස තම වචනවලින් දැක්වීමකි. මෙවැනි අනුවාදයක් තේරුම් ගැනීමට පහසුය. මන්ද එය ලියා ඇත්තේ වර්තමාන වාග්මාලාවෙන් හා ව්‍යාකරණවලින් බැවිනි. එහෙත් ඒවා දේව වචනයේ සමානම පරිවර්තනයක් නොවේ.

මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටසෙහි ඔබට සංසන්දනය කිරීම සඳහා ඉංග්‍රීසි අනුවාදවලින් නිදසුන් කීපයක් සපයා ඇත. මේවායින් පරිවර්තනය හා අර්ථෝද්ධාර අතර වෙනස පෙන්නුම් කෙරේ.

## අධ්‍යයනය සඳහා බයිබලයක් තෝරා ගැනීම

මෙම පාඩමාලාවේ හා බයිබල් අධ්‍යයනයේ පරමාර්ථයන් සඳහා බයිබලයේ KJV අනුවාදය අපි අනුමත කරමු. ඒ සඳහා හේතු කීපයක් ඇත.

### පළමුවැන්න

KJV බයිබලය ගැඹුරු අධ්‍යයනය සඳහා ඉතා නිවැරදි, හොඳ පරිවර්තනයක්. අර්ථෝද්ධාර අනුවාදයක් ශුද්ධ ලියවිල්ලේ වචනයක් පාසා වචනයක සමාන පරිවර්තනයක් නොවේ.

### දෙවැන්න

KJV සඳහා අධ්‍යයනය කිරිම සදහා ආම්පන්න බොහොමයක් ඇත. KJV බයිබලයට ලියන ලද සමපද අකරාදි, ශබ්ද කෝෂ හා විවරණ බොහොමයක් තිබේ.

### තෙවැන්න

වෙනත් කිසිදු අනුවාදයකට වඩා KJV බොහෝ භාෂාවලින් ලබාගත හැකිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලා ලොව මුළුල්ලේම පවත්නා බැවින් අපි බයිබලයේ මෙම අනුවාදය තෝරා ගතිමු. මන්ද එය බොහෝ භාෂාවලින් ඇති බැවිනි. තමාගේම භාෂාවෙන් බයිබලයක් තිබීම වැදගත් වේ. මන්ද ඔබ හිතන්නේ හා ඔබට වඩාත් හොඳින් තේරුම්ගත හැක්කේ ඔබගේම භාෂාවෙන් බැවිනි.

ඔබට බයිබලයේ KJV පිටපතක් නොමැති නම්, American Bible Society, P.O. Box 5601, Grand central Station , New York, 10164, USA යන ලිපිනයට ලියන්න. ඔවුන් ළඟ බයිබලයේ KJV අනුවාදය ඇති සියලුම භාෂාවන් පිළිබඳ ලයිස්තුවක් ඇත. ඔබගේ භාෂාවෙන් KJV අනුවාදයක් නොමැති නම් හෝ බයිබලයක් ලබා ගැනීමේ අපහසුතාවක් ඇත්නම් හෝ United Bible societies, Bible House, P.O. Box 755, Stuttgart 1, Germany යන ලිපිනයට ලියන්න. ඔව්හු "ලෝකයේ ඇති ශුද්ධ ලියවිලි" පිළිබඳ ලයිස්තුවක් පවත්වාගෙන යති. එක් බයිබලයක් හෝ ප්‍රසිද්ධ කර ඇති සියලුම භාෂාවන් ගැන ඔව්හු දනිති.

ඔබට ඉංග්‍රීසි කියවිය හැකිනම්, එහෙත් ඔබට ඇත්තේ සීමිත වාග්මාලාවක් නම් ඔබ "Bible in Basic English" පිටපතක් ලබා ගැනීමට කැමති විය හැකිය. මෙය මුළු පැරණි හා නව ගිවිසුම වන අතර එය ලියා ඇත්තේ මූලික ඉංග්‍රීසි වචන 1000 ක් පමණ භාවිතයෙනි. මේ පිළිබඳව Cambridge University Press, New York, USA ට ලියන්න.

(සිංහල භාෂාවෙන් පැරණි හා නව අනුවාදයන් ඇත)

## රතු අකුරු මුද්‍රණය

බයිබලයේ බොහෝ අනුවාද "රතු අකුරු මුද්‍රණය" යන්නෙන් ලබා ගත හැකිය. මේවායේ ජේසුස් වහන්සේ කතා කළ වචන රතු අකුරින් මුද්‍රණය කර තිබේ. අනෙක් පාඨ මුද්‍රණය කර ඇත්තේ කළු වර්ණයෙනි.

ඔබගේ භාෂාවෙන් රතු අකුරු මුද්‍රණයක් ඇත්නම් එය ලබා ගැනීමට අපි යෝජනා කරමු. ජේසුස් වහන්සේ ඉගැන්වූ දේ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලා පුහුණුවේදී අවධාරණය කරනු ලැබේ. රතු අකුරු මුද්‍රණයෙන් උන් වහන්සේගේ ඉගැන්වීම් අවධාරණය කරයි.

## සාරාංශය

බයිබලයේ විවිධ අනුවාද වර්ධනය වූ ආකාරය පහත දැක්වෙන සටහන සාරාංශ කරයි.

බයිබලය, දේවානුභාවය තිබේ.

|

ශුද්ධවූ මනුෂ්‍යයන්ට එළිදරව් කෙරිනි. ඔව්හු දේව වචනය ග්‍රීක්, හෙබ්‍රෙව්,

|

විවිධ භාෂාවලට පරිවර්තනය කෙරිනි. එහි ප්‍රතිඵලය වූයේ
බයිබලයේ නියම පරිවර්තන හා අර්ථෝද්ධාර අනුවාද වේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. "අනුවාදය" යන වචනයේ තේරුම කුමක්ද?

3. බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස කුමක්ද?

4. මෙම පාඨමාලාවේ භාවිත වන්නේ බයිබලයේ කිනම් අනුවාදයද?

5. බයිබලයේ නියම පරිවර්තනයක් නොමැත්තේ මන්ද?

6. බයිබලය මුලින්ම ලියූ භාෂා තුන කුමක්ද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

යොහන් 3:16 පදය, විවිධ ඉංග්‍රීසි අනුවාදවලින් පහත දැක්වේ. ඒවා අතර වෙනස ඔබට දැකගත හැකිය.

**King James Version:** For God so loved the world that He gave his only begotten Son that whosoever believeth in Him should not perish but have everlasting life.

**New King James Version:** For God so loved the world that He gave His only begotten Son, that whoever believes in Him should not perish but have everlasting life.

**Revised Standard Version:** For God so loved the world that He gave His only Son, that whoever believes in Him should not perish but have eternal life.

**Living Bible:** For God loved the world so much that He gave His only Son so that anyone who believes in Him shall not perish but have eternal life.

**New American Standard Bible:** For God so loved the world, that He gave His only begotten Son, that whoever believes in Him should not perish, but have eternal life.

**New English Bible:** God loved the world so much that He gave His only Son, that everyone who has faith in Him may not die but have eternal life.

**Amplified Version:** For God so greatly loved and dearly prized the world that He (even) gave up His only-begotten (unique) Son, so that whoever believes in (trusts, clings to, relies on) Him shall not perish-come to destruction, be lost-but have eternal (everlasting) life.

**Phillips:** For God loved the world so much that He gave His only Son, so that everyone who believes in Him should not be lost, but should have eternal life.

**Wurst:** For in such a manner did God love the world, insomuch that His Son, the uniquely-begotten One, He gave, in order that everyone who places his trust in Him may not perish but may be having life eternal.

**Moffat:** For God loved the world so dearly that He gave up His only Son, so that everyone who believes in Him may have eternal life instead of perishing.

**සිංහල භාෂාවෙන් නම්**

**පැරණි අනුවාදය :** මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙනතරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.

**නව අනුවාදය :** දෙවියන්වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කළ සේක්ද කිවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය.

**දෙවන කොටස : අධ්‍යයනය සඳහා සූදානම්වීම.**

# හතර වන පරිච්ඡේදය

# ඔබ ආරම්භ කිරීමට පෙර

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඵලදායි බයිබල් අධ්‍යයනයක පූර්ව අවශ්‍යතා හඳුනාගැනීමට
- දේව වචනය අධ්‍යයනය කිරීම සඳහා දෙවියන්වහන්සේ විසින් සපයා දී ඇති ආකාර දෙකක් හඳුනාගැනීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඉගැන්වීමේ මෙහෙය හඳුනාගැනීමට
- දේව වචනයේ ඇති කිරි හා මාංශ අතර වෙනස පැහැදිලි කිරීමට
- දේව වචනයේ කිරි වැනි කොටස්වල සිට මාංසමය කොටස් වෙත මාරුවීමේ පියවර තුන හඳුනාගැනීමට
- දේව වචනය අධ්‍යයනය කිරීමේ ප්‍රායෝගික යෝජනා තුනක් ලැයිස්තුගත කිරීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය:

> **දෙවියන්වහන්සේගෙන්වූ තැනැත්තේ දෙවියන්වහන්සේගේ වචන අසයි. නුඹලා දෙවියන්වහන්සේගෙන් නොවන බැවින් ඒවා අසන්නේ නැතැයි කීසේක. (යොහන් 8:47)**

## හැඳින්වීම

බොහෝ පුද්ගලයෝ වෙනත් පොත් අධ්‍යයනය කරන ආකාරයෙන්ම බයිබලයද අධ්‍යයනය කිරීමට උත්සාහ කරති. ඔව්හු තම බයිබලය ගෙන එය පෙරළා කියවීමට පටන් ගනිති. එහෙත් බොහෝවිට ඔවුන්ගේ අධ්‍යයනය වැඩිකල් පවතින්නේ නැත. තමන් කියවන දෙය තමන්ට තේරුම් ගැනීමට නොහැකි බව ඔවුන්ට වැටහෙති. බයිබලය දිනපතා ජීවිතයට අදාළවන ආකාරය ගැන ඔවුන්ට නොවැටෙහෙන අතර එය නිරස පොතක් යැයි ඔවුන්ට හැඟෙයි. දේව වචනය තේරුම්ගත හැක්කේ ඇතැම් නිශ්චිත පුද්ගලයන්ට පමණක් යැයි බයිබලය පැහැදිලි කරයි. බයිබලය අධ්‍යයනය කිරීමේදී මනුෂ්‍යයන් අසමර්ථ වීමට හේතුව ඔව්හු එම අධ්‍යයනය සඳහා ආත්මිකව සූදානම්ව නොසිටීමයි.

බයිබලය යනු දේව අභිමුඛය කරා මඟපෙන්වන දොරටුවක් වැනිය. එම දොරටුව පිටුපස අගනා ආත්මික වස්තූන් සැඟවී තිබේ. එහෙත් එම දොරටුව විවර කිරීමේ යතුර ඔබ සතු විය යුතුය. එසේත් නොමැතිව කිසිදාක එයට ඇතුළු වී මෙම වස්තූන් සොයාගැනීමට ඔබට නොහැකි වනු ඇත. දේව වචනය තේරුම්ගත යුතු ආකාරය බයිබලය එළිදරව් කරයි. ආත්මික වටහාගැන්ම යන දොරටුව විවර කිරීමට අවශ්‍ය යතුර එයින් සපයා දෙයි.

## බයිබලය අධ්‍යයනය කිරීමේ පූර්ව අවශ්‍යතා

පූර්ව අවශ්‍යතාවක් යනු යම් දෙයක් කිරීමට පෙර ඔබ විසින් කළ යුතු දෙයකි. බයිබලය යනු දේව වචනයයි. එය වෙනත් පොතක් හා සමාන නොවන අතර බයිබලය වෙනත් පොත් අධ්‍යයනය කරන පරිදි ඔබට අධ්‍යයනය කළ නොහැකිය. දෙවියන්වහන්සේ හා සම්බන්ධ ගැඹුරු ආත්මික කරුණු තේරුම්ගැනීමට නම් ඔබ විසින් සැපිරිය යුතු පූර්ව අවශ්‍යතා එනම් කලින් කළ යුතු දේවල් තිබේ.
ඔබට බයිබලය අධ්‍යයනය කිරීමට අවශ්‍යය නම් මුලින්ම එහි කතුවරයා ගැන දැනගත යුතුය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **දෙවියන්වහන්සේගෙන්වූ තැනැත්තේ දෙවියන්වහන්සේගේ වචන අසයි. නුඹලා දෙවියන්වහන්සේගෙන් නොවන බැවින් ඒවා අසන්නේ නැතැයි කීසේක. (යොහන් 8:47)**

දෙවියන්වහන්සේ දැනගැනීමෙන් තොරව ඔබට උන්වහන්සේගේ වචනය තේරුම්ගත නොහැකිය. ඔබ දෙවියන්වහන්සේ දැනගන්නේ කෙසේද? ඉශ්‍රායෙල් ජාතියේ ආත්මික නායකයෙක්වූ නිකොදේමුස් හට යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි- යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක. (යොහන් 3:3)**

යමෙකු උගත් සංස්කෘතියකට අනුව හැඩගැසුණු හා ආගමික අයෙකු විය හැකි නමුත්, නැවත ඉපදීම තුළින් ඔහුගේ ආත්මික ඇස් විවර වන තුරු, ශුද්ධ ලියවිල්ල වටහා ගැනීමට ඔවුන්ට නොහැකි වනු ඇත.

“මේ දේවල් සිදුවන්නේ කෙසේද?” නිකොදේමුස් යේසුස්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්වහන්සේ විසින් අදහස් කළ දෙය ඔහුට වැටහුණේ නැත. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින් මෙසේ පැවසූ සේක.

> **යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින්: නුඹ ඉශ්‍රායෙල්හි ගුරුවරයාව සිටියදීත් මේ දේවල් දන්නේ නැද්ද? (යොහන් 3:10)**

නිකොදේමුස් ඉශ්‍රායෙල්හි ආගමික නායකයෙක් වූ නමුත්, නැවත උත්පාදනය ලැබීම ගැන ඔහු දැන සිටියේ නැත. සැබවින්, ඔහු මෙසේ ඇසුවේය . . .

> **නිකොදේමුස් උන්වහන්සේට කථාකොට: මනුෂ්‍යයෙක් මහලුව සිටියදී උපදින්ට පුළුවන් කොහොමද? දෙවෙනි වර මවුකුසට ඇතුල්ව උපදින්ට පුළුවන්දැයි උන්වහන්සේට කීවේය. (යොහන් 3:4)**

තමන්වහන්සේගේ අදහස් කළ නැවත ඉපදීම යනු ආත්මික උත්පත්තියක් බව යේසුස්වහන්සේ නිකොදේමුස් හට පැහැදිලි කර දුන් සේක. මෙම අලුත් ඉපදීමේ අත්දැකීම ලැබෙනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහීම තුළිනි. ඔබ පව්කරුවෙකු බව ඔබ ප්‍රකාශ කළ යුතුය. යේසුස්වහන්සේ ඔබගේ පව් උදෙසා මැරුණු බව විශ්වාස කරමින්, ඔබගේ පව්වලට සමාව ඉල්ලා උන්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගත යුතුය.

නැවත ඉපදීම ලබා නැති පුද්ගලයෙකුට දේව වචනයේ සත්‍යතාවන් ලබාගත නොහැකිය.

> **නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

ගැළවීම නොලත් මනුෂ්‍යයා බයිබලයේ ඇති සාහිත්‍යමය අලංකාරය හා අගය නිසා එය පිළිගනු ඇත. ඓතිහාසිකව හා භූගෝලීය වශයෙන් ඔහු එය අධ්‍යයනය කරනු ඇත. එහෙත් ඔහු තම පව්වලට සමාව ලබාගන්නා තුරු එහි ඇති ආත්මික සත්‍යතාවන් ඔහුගෙන් සැඟවී තිබේ.

**අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී නුඹලා දෝෂ රහිතව සිටින පිණිස උන්වහන්සේ අන්තිම දක්වා නුඹලා ස්ථිර කරනසේක. (1 කොරින්ති 1:8)**

## දෙවියන්වහන්සේගේ සැපයීම

යේසුස්වහන්සේ ඔබ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගෙන නව ආත්මික උපත අත්දුටු මොහොතේ සිටම, දේව වචනයේ ඇති ආත්මික සත්‍යතාවන් තේරුම් ගැනීමට ඔබට හැකිවනු ඇත. ස්වභාවික ලෝකයේ අලුත උපන් දරුවෙකුට ආහාරපාන වලින් ස්වභාවික පෝෂණය අවශ්‍යවන සේම, ආත්මිකව නැවත ඉපදුනු පුද්ගලයෙකුට ද පෝෂණය අවශ්‍ය වේ. මෙම ආත්මික වර්ධනය හා සංවර්ධනය උදෙසා ඔවුන්ට අවශ්‍ය ආහාරය වනුයේ දේව වචනයයි. දේව වචනය අධ්‍යයනය කිරීම සඳහා ඔබට උපකාර කිරීමට දෙවියන්වහන්සේ මාර්ග දෙකක් සපයා දී තිබේ.

### ගුරුවරු:

සමහර ඇදහිලිවතුන් නායකයන් ලෙස දෙවියන්වහන්සේ තෝරා ගනු ලැබේ. එම නායකත්ව තනතුරු වලින් විශේෂ තනතුරක් වන්නේ දේව වචනය උගන්වන ගුරුවරුන් වේ.

**මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටවූ සේක. (1 කොරින්ති 12:28)**

**උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. එසේ දුන්නේ ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්, ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනයවීම පිණිසත්ය. (එපිස 4:11-13)**

දේව වචනය ඔබට පැහැදිලි කිරීමටත් ආත්මික පරිණතබව කරා ඔබට මඟපෙන්වීමටත් දෙවියන්වහන්සේ ගුරුවරු සපයා තිබේ.

### විශේෂ ගුරුවරයෙක් :

ඔබට දේව වචනය ඉගෙන ගැනීම පිණිස දෙවියන්වහන්සේ විසින් සලසා දුන් තවත් මාර්ගයක් ඇත. ඔබටම එය අධ්‍යයනය කරන ලෙස උන්වහන්සේ අණ කර තිබේ.

**නුමුත් ඔව්හු විනිත භාවයෙන් යුක්තව, ඇදහිල්ලෙහිත් ප්‍රේමයෙහිත් ශුද්ධකමෙහිත් පවතින්නෝ නම්, දරුවන් බිහිකිරීමේදී ගැළවෙනවා ඇත. (1 තිමෝති 2:15)**

ඔබ දේව වචනය අධ්‍යයනය කරන කල ඔබට උපකාර කිරීම සඳහා දෙවියන්වහන්සේ විශේෂ ගුරුවරයෙකු සපයා දී තිබේ. යේසුස්වහන්සේ මේ ලෝකයේ සිටි කාලයේදී උන්වහන්සේ තම අනුගාමිකයන්ට දෙවියන්වහන්සේගේ සත්‍යතාවයන් පෞද්ගලිකවම ඉගැන්වූ සේක. එහෙත් තමන්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් පසුව තමන්වහන්සේ ස්වර්ගයට යන බව යේසුස්වහන්සේ දැන සිටි අතර දේව වචනය තේරුම් ගැනීමට උපකාර වනු පිණිස විශේෂ ගුරුවරයෙකු පැමිණෙනු ඇති බවට උන්වහන්සේ තම අනුගාමිකයන්ට පොරොන්දු වූ සේක. එම ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේය :

**නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියනලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහන් 14:26)**

**එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආකල, උන්වහන්සේ මුළු සත්‍ය කරා නුඹලාට මගපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරන සේක. (යොහන් 16:13)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීම ක්‍රියා 2 වන පරිච්ඡේදයේ වාර්තා කර තිබේ. ඔබගේ බයිබලයේ මෙම පරිච්ඡේදය කියවන්න. දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබද මේ ආකාරයෙන්ම ඔබ ශුද්ධාත්ම පූර්ණත්වය ලබා ගැනීමය.[1] ශුද්ධාත්ම පූර්ණත්වය තුළින් දේව වචනය තේරුම් ගැනීමට විශේෂ හැකියාවක් ඔබට ලැබේ:

> **නුඹලා ගැන වනාහි, නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය. යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනෑකරන්නේ නැත. එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්නූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ පැවතෙන්න.** (1 යොහන් 2:27)

ශුද්ධාත්මයාණන්වහන්සේ නිර්මාණශිලි බලවේගයකි. මනුෂ්‍යයා තුළට ජිවනයේ හුස්ම හෙළූ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් උන්වහන්සේය (උත්පත්ති 2:7). යේසුස්වහන්සේ මරණයෙන් නැගිටෙවූ ආත්මය ද උන්වහන්සේය (රෝම 8:11). දේව වචනය පිළිබඳ සාමාන්‍ය අධ්‍යයනයක් ගෙන එය නිර්මාණාත්මක අධ්‍යයනයක් බවට හරවන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිර්මාණශිලි බලයයි.

නිර්මාණශිලි බව යනු අලුත යමක් සෑදීම බව මෙම පාඨමාලාවේ හැඳින්වීමේදී අපි ඉගෙන ගන්නෙමුව. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඉගැන්වීම් නව ආකාරයක ආත්මික දැනගැනීමක් නිර්මාණය කරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් බයිබලය අලුත් කරයි. නැවුම් කරයි. එසේම ඔබගේ ජිවිතයට අදාළ කරයි.

## දේව වචනය : කිරි හා මාංස

දේව වචනයේ ආත්මික ගැඹුරෙහි මට්ටම් දෙකකි. මේවා "කිරි" මට්ටම හා "මාංශ" මට්ටම ලෙස අපි හඳුන්වමුව. "කිරි" යනුවෙන් හැඳින්වනුයේ දේව වචනයේ ඇති දරුවකුට පවා තේරුම්ගත හැකිවූ ගැළවීමේ සැලැස්ම වැනි සරල සත්‍යතාවයන් වේ. "මාංස" යනුවෙන් හඳුන්වනුයේ දේව වචනයේ ඇති තේරුම්ගැනීමට අපහසු වූ ගැඹුරු ආත්මික සත්‍යතාවයන්ය.

ඇතැම් පුද්ගලයෝ යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ පූර්ණත්වය ලබා ඇති නමුත්, දේව වචනය පිළිබඳ වැටහිම තුළ ඔව්හු වර්ධනය වන බවක් නොපෙනේ. ඔව්හු තවමත් දේව වචනයේ "කිරි" වැනි කොටස්වලින් පෝෂණය වේ.

ස්වභාවික ලෝකය තුළ අලුත උපන් දරුවෙක් කිරි පානය කිරීමේ කිසිදු වරදක් නැත. ආත්මික ලෝකය තුළද එය එසේම වේ. ඔබ නැවත ඉපදීම ලැබූ මුල් කාලයේදී දේව වචනයේ කිරිවලට ඔබ ආශා කළ යුතුය.

> **ස්වාමින්වහන්සේ යහපත් බව නුඹලා රසබලා දැනගත්තහු නම්,** (1 පේතෘස් 2:2)

එහෙත් ස්වභාවික ලෝකය තුළ දරුවකු ශාරීරිකව පරිණත වීම සඳහා ඔහු ඝන ආහාර ගත යුතු කාලයක් එළඹේ. ආත්මික ලෝකය තුළද එය එසේම වේ. දේව වචනයේ කිරි වැනි කොටස්වල සිට මාංස දක්වා මාරු විය යුතු කාලයක් තිබේ.

> **ඉතින් කිරි බොන හැමදෙනම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දෘඪ ආහාර ඕනෑවන්නේ යහපත සහ අයහපත විමසා බලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ තැනැත්තන්ටය.** (හෙබ්‍රෙව් 5:13-14)

ඇදහිලිවතුන් කිරි සිට මාංශ ආහාර දක්වා මාරු විය යුතු කාලයේදීත් ඇතැමුන් ඊට සූදානම් නැති බව පාවුල් පවසයි.

[1] ඔබ ශුද්ධාත්ම පූර්ණත්වය ලබා නැතිනම්, ("ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය" නමැති හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව ඇණවුම් කරන්න.)

**මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව තිබියදීත්, දෙවියන්වහන්සේගේ වාක්‍යවල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ. නුඹලා දෑඩි ආහාර නොව කිරි ඕනෑකරන අයව සිටින්නෝය. (හෙබ්‍රෙව් 5:12)**

මෙසේ සිදුවන්නේ ඇයි? ඇතැම් ඇදහිලිවතුන් බයිබලය මතුපිටින් පමණක් තේරුම්ගැනීමෙන් ඔබ්බට නොයා සිටියදී ඇතැමුන් දේව වචනයේ ගැඹුරට යන්නේ මන්ද? ඇතැම් පුද්ගලයන් දේව වචනයේ "ගැඹුරු දේවල්" ආගා කරනවා මිස අත්නොදකින්නේ මන්ද? පාවුල් මෙසේ ලීවේය:

**සහෝදරයෙනි, ආත්මිකයන්ට මෙන් නුඹලාට කථාකරන්ට නොහැකිව, මාංසිකයන්ටත් ක්‍රිස්තුස්වහන්සේ තුළ බිළිඳුන්ටත් මෙන් කථා කළෙමි. මම නුඹලා දෑඩි කෑමෙන් නොව කිරෙන් පෝෂණය කළෙමි. එසේ කළේ නුඹලා ඒවා දරන්ට බැරිව සිටි නිසාය. එසේය. දෑනුත් බැරිය. මක්නිසාද නුඹලා තවම මාංසිකය. නුඹලා අතරෙහි ඊර්ෂ්‍යාවද විවාදයද ඇති බැවින්, නුඹලා මාංසිකව මනුෂ්‍ය ප්‍රකාරයෙන් හැසිරෙනවා නොවේද? (1 කොරින්ති 3:1-3)**

ඔවුන්ට කිරි සිට මාංග දක්වා ගමන් කළ නොහැකි වූයේ ඔව්හු ලෞකික කිතුනුවන් වූ බැවිනි. මෙහි අදහස ඔව්හු ආත්මිකව පරිණත නොවී සිටිමයි. ඔවුන්ගේ ජීවිත තුළ සතුරුකම. තරඟය. බෙදීම හා තවත් පාපයන් විය. කිතුනුවකු ලෞකික වන විට ඔහුට දේව වචනයේ ඇති ගැඹුරු සත්‍යතාවන් වටහාගත නොහැකිය. ඔහු පසුතැවිලි වී මාංසමය ආහාර දිරවිය හැකි තරම් ආත්මිකව වර්ධනය වන තුරු කිරිවල රැඳී සිටිනු ඇත.

ඔබ දේව වචනයේ කිරිවල සිට මාංග දක්වා ගමන් කරනු දෑකීම දෙවියන්වහන්සේගේ ආශාවයි. දේව වචනය පිළිබඳ ඔබගේ දෑනුම ඔබ වර්ධනය කරගන්නේ මෙසේය:

**උන්වහන්සේ දෑනගැන්ම උගන්වන්නේ කාටද? පණිවිඩය තේරුම්කරදෙන්නේ කාටද? කිරි වැරුවන්ට සහ තනෙන් වෙන්වුණ දරුවන්ටද? (යෙසායා 28:9)**

දෙවියන්වහන්සේ තම ආත්මය වගුරනුයේ ආත්මිකව පරිණත කිතුනුවන් මත වන බැවින් ඔබ කිරිවල සිට මාංස වෙත ගමන් කිරීම වැදගත් වේ.

**උන්වහන්සේ දෑනගැන්ම උගන්වන්නේ කාටද? පණිවිඩය තේරුම්කරදෙන්නේ කාටද? කිරි වැරුවන්ට සහ තනෙන් වෙන්වුණ දරුවන්ටද? මක්නිසාද අණ පිට අණය. අණ පිට අණය. පනත පිට පනතය. පනත පිට පනතය. මෙහි ටිකක්ය, එහි ටිකක්ය. එසේය, උන්වහන්සේ වියවුල් තොල්වලින්ද වෙන භාෂාවකින්ද මේ සෙනඟට කථාකරනවා ඇත. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: නිවාඩුව මේය, වෙහෙසවූ අයට නිවාඩු දෙන්න, නිෂ්කලංකයත් මේයයි කීසේක. එහෙත් ඔව්හු අසන්ට අකමැතිවූහ. (යෙසායා 28:9-12)**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ මහත් වැගිරීමකින් තම සෙනඟ ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය විය. ඔවුන් නැවත ප්‍රණවත් කර ඔවුන්ට ආත්මිකව විශ්‍රාමය ලබාදීමට උන්වහන්සේට අවශ්‍ය විය. එහෙත් ඔව්හු උන්වහන්සේගේ වචනවලට සවන් දී නොතිබූ බැවින් ඔවුන්ට ඊට ඇතුළුවීමට නොහැකි විය. ඔව්හු දේව වචනයේ කිරි ආහාර වලින් ඉවත්ව නොතිබූ බැවින් ඔවුන්ට ආත්මික මාංග වෙත ගමන් කළ නොහැකි විය.

## කිරි සිට මාංග වෙත මාරුවන්නේ කෙසේද?

දෑන්, පැන නැඟී ඇති ප්‍රධානතම ප්‍රශ්නය වනුයේ . . . නැවත ඉපදීම ලද කිතුනුවෙක් දේව වචනයේ කිරි වැනි කොටස්වල සිට මාංග වෙත මාරුවන්නේ කෙසේද? යනුයි.

### කිරිවලට ආගා කරන්න:

පළමුව ඔබ දේව වචනයේ කිරිවලට ආගා කළ යුතුය. දේව වචනයේ මූලික ප්‍රතිපත්ති ඔබ විසින් වටහාගත යුතුය.

**ස්වාමින්වහන්සේ යහපත් බව නුඹලා රසබලා දෑනගත්තහු නම්, (1 පේතෘස් 2:2)**

ඔබට ආත්මික මාංශ වලින් ආරම්භ කළ නොහැකිය. පළමුව ඔබ ආත්මික කිරිවලට ආගා කර ඒවා ජීර්ණය කරගත යුතුය.

## දේව වචනයට කීකරුවන්න:

මෙය ඉතාම වැදගත් පියවරයි. ලෞකික කිතුනුවෝ දේව වචනයේ කිරි වැනි කොටස්වලදී ඉගෙනගත් දේවල් වලට කිකරු නොවෙති. එබැවින් මාංශ දක්වා පරිණත වීමට ඔවුන්ට නොහැකිය. උන්වහන්සේගේ වචන ඇසීම පමණක් ප්‍රමාණවත් නොවන බව බයිබලය පවසයි. ඔබ කිකරුවිය යුතුය. ඔබ වචනය "අසන්නෙක්" පමණක් නොවී එය "ක්‍රියාවට නංවන" කෙනෙක් විය යුතුය.

**නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙයල්ලා. (යාකොබ් 1:22)**

ආත්මික දැනගැන්ම වර්ධනය වනුයේ දේව වචනය මෙනෙහි කිරීම හා එයට කිකරුවීම තුළිනි. අප කිරි සිට මාංශ වෙත මාරුවන්නේ මෙසේය. දාවිත් මෙසේ ලියුවේය.

**මාගේ සියලු ගුරුවරුන්ට වඩා මට නුවණ ඇත්තේය. මක්නිසාද මාගේ භාවනාව ඔබගේ ශික්ෂා ගැනය. මා ඔබගේ නියෝග රක්ෂාකළ බැවින් වැඩිමහල්ලන්ට වඩා මට තේරුම් ඇත්තේය. ඔබගේ වචනය පවත්වන පිණිස සියලු නපුරු මාර්ගවලින් මාගේ පාද වළක්වාගතිමි. ඔබගේ විනිශ්චයන්ගෙන් ඉවත්ව නොගියෙමි. මක්නිසාද ඔබ මට ඉගැන්වූසේක. ඔබගේ වචන මාගේ දිවට කොපමණ මිහිරිද! එසේය, ඒවා මාගේ කටට මීපැණිවලට වඩා මිහිරිය. ඔබගේ නියෝගවලින් මට නුවණ ලැබේ. එබැවින් සියලු වංක මාර්ග නුරුස්සා හරිමි. (ගීතාවලිය 119:99-104)**

දාවිත් දෙවියන්වහන්සේගේ නියෝග පැවැත්වූ බැවින් හා වචනය ක්‍රියාවට නැංවූ අයෙක් බැවින්, ඔහුගේ දැනගැන්ම වර්ධනය විය. දේව වචනයේ කිරි වැනි කොටස් වලදී ඔබ ඉගෙනගත් දේවල් අනුව ඔබ ක්‍රියා කර නැතිනම් දෙවියන්වහන්සේ ඔබව ගැඹුරු එළිදරව් කිරීම් වෙත ගෙන නොයනු ඇත.

## මාංශය සොයන්න :

ස්වභාවික ලෝකය තුළ මස් ආහාරයට ගැනිම සඳහා කිරි පානය කරනවාට වඩා වෙහෙසක් දැරිය යුතුය. ආත්මික ලෝකය තුළද එය එසේමය. දේව වචනයේ මාංසමය කොටස් සොයා යාම සඳහා එහි කිරි වැනි කොටස් මත රැඳී සිටිනවාට වඩා වෙහෙසක් දැරිය යුතුය.

මාංශමය කොටස් සොයා යා යුතු ආකාරය හිතෝපදේශ 2 වන පරිච්ඡේදයෙන් පවසයි :

**මාගේ පුත්‍රය නුඹ මාගේ කීම් පිළිගෙන, මාගේ ආඥා නුඹ වෙත තබාගෙන, ප්‍රඥාවට ඇහුම්කන්දී, ඥානයට නුඹේ සිත යොමුකරන්නෙහි නම්, එසේය, නුඹ නුවණට හඬගසා, ඥානයට නුඹේ ශබ්දය නගන්නෙහි නම්, නුඹ රිදී මෙන් ඇය සොයා, නිධාන ගැන මෙන් ඇය ගැන විභාගකරන්නෙහි නම්, නුඹ ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීම තේරුම්ගන්නෙහිය. දෙවියන්වහන්සේ හැඳිනගැනීමට ද පැමිණෙන්නෙහිය. (හිතෝපදේශ 2:1-5)**

දේව වචනයේ දැනගැන්ම සොයා තේරුම් ගැනීමේ පියවරයන් මෙසේය:

1. මාගේ කීම් පිළිගන්න : ඔබ ඉගෙන ගැනීමට සූදානම් විය යුතුය.

2. මාගේ ආඥා නුඹ තුළ සඟවා තබාගන්න. ඔබ වචනය පිළිගෙන එය ඔබේ ජීවිතයේත් ආත්මයෙත් කොටසක් කරගත යුතුය. ඔබගේ ජීවන රටාවට සරිලන පරිදි වචනය වෙනස් කිරීමට උත්සාහ නොකරන්න.

3. ප්‍රඥාවට ඇහුම්කන් දෙන්න : දේව වචනය තුළින් දෙවියන්වහන්සේ ඔබට පවසන්නාවූ දෙයට සැබවින්ම සවන් දෙන්න. සවන්දීම යන්නට පෙන්වා දෙන ලද ස්ථානවලදී ජිවන රටාව වෙනස් කර ගැනීමට අන්තර්ගත වේ.

4. තේරුම් ගැනිමට නුඹේ සිත යොමු කරන්න : දේව වචනය තේරුම් ගැනිම (අර්ථ නිරූපණය කිරීම) කෙරෙහි සුපරික්ෂාකාරීව සිත යොමු කරන්න.

5. රිදී මෙන් ඇය සොයා නිධාන ගැන මෙන් ඇය ගැන විභාග කරන්න : ඔබට අයිති දේපළක සැඟවූ නිධානයක් ඇතැයි යමෙක් ඔබට පැවසුවහොත් ඔබ කුමක් කරන්නෙහිද? ඔබ එය කැණීමට පටන් ගනු ඇත. එම නිධානය හමුවන තුරු ඔබ ක්‍රමානුකූලව එය සොයනු ඇත. එය ඔබගේ ජිවිතයේ ප්‍රමුඛස්ථානය ගනු ඇත.

දේව වචනයට ඔබ ප්‍රමුඛතාවය දි, ක්‍රමානුකූලව උන්වහන්සේගේ ප්‍රඥාව සෙවීමට පටන්ගත් විට එය ඔබට හමුවනු ඇත. නමුත් එය ඔබගේ ජිවිතයේ ප්‍රමුඛස්ථානය ගත යුතුය. ඔබ නිධානයක් සොයන කලක මෙන් උද්‍යෝගයෙන් හා කැපවීමෙන් ඊට ප්‍රවේශ විය යුතුය.

මෙම උපදෙස් අනුගමනය කරමින් ඔබ දේව වචනයේ මාංගමය කොටස් සොයා ගියහොත් එහි ප්‍රතිඵල මේවාය :

1. නුඹ ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීම තේරුම් ගන්නෙහිය (5 පදය)
2. දෙවියන්වහන්සේ හැඳිනගැනීමටද පැමිණෙන්නෙහිය. (5 පදය)
3. එවිට නුඹ ධර්මිෂ්ඨකමද, යුක්තියද, ඍජුකමද, එසේය සියලු යහපත් මාවත්ද තේරුම් ගන්නෙහිය. (9 පදය)
4. එය ඔබගේ ආත්මයට ප්‍රසන්න වන්නේය. (ඔබ තෘප්තියට පත්වනු ඇත) 10 පදය
5. සිහිය නුඹ රැකවල් කරන්නේය : සිහිය යනු නිවැරදි විනිශ්චය හා තීරණ ගැනීමේ හැකියාවයි. 11 පදය
6. ඥානය නුඹ ආරක්ෂා කරන්නේය. 11 පදය
7. සියලු නපුරෙන් නුඹ ගළවනු ලබන්නේය. 12 පදය

## ප්‍රායෝගික යෝජනා කිපයක්

බයිබල් අධ්‍යයනය සඳහා ප්‍රායෝගික යෝජනා කිහිපයක් පහත දැක්වේ.

### විශේෂ වේලාවක් වෙන් කර ගන්න :

සෑම දිනකදීම ඔබට අධ්‍යයනය සඳහා වෙනම වේලාවක් වෙන් කර ගන්න. ඔබ තෝරාගන්නා වේලාව ඔබගේ පෞද්ගලික කාල සටහන හා කැමැත්ත මත පදනම් වනු ඇත. තමන් නැවුම්ව හා විවේකීව සිටින අලුයම් වේලෙහි අධ්‍යයනය කිරිමට ඇතැම් අය කැමතිය. තම නිවසේ අන් සියලු දෙනා විවේක ගන්නා රාත්‍රි කාලයේ අධ්‍යයනය කිරිමට ඇතැමුන් කැමති වේ. ඔබ කුමන වේලාවක් තෝරාගත්තද එය දිනපතා දේව වචනය අධ්‍යයනය කිරීම උදෙසා වෙන් කර තබා ගන්න.

### විශේෂ ස්ථානයක් තෝරාගන්න :

හැකිතරම් ශබ්ද හා බාධාවන්ගෙන් තොර ස්ථානයක් තෝරාගන්න. ඔබගේ ඇස්වලට අපහසුතාවයක් නොමැතිව කියවිය හැකි තරම් ආලෝකය ඇති ස්ථානයක් තෝරාගන්න. හැකියාවක් ඇත්නම් ඔබ අධ්‍යයනය සඳහා භාවිත කරන ඔබගේ බයිබලය, පැන්සලය, කඩදාසි හා ඔබ සතු විය හැකි අධ්‍යයන ග්‍රන්ථ ආදිය තබාගත හැකි ස්ථානයක් තෝරාගන්න. එසේ කිරීමෙන් දිනපතා ඔබගේ අධ්‍යයනයට පෙර මේවා රැස් කරමින් කාලය ගත කිරීම අවශ්‍ය නොවනු ඇත.

## විශේෂ ආකාරයකින් පටන් ගන්න :

සෑම අධ්‍යයන සැසිවාරයක්ම යාච්ඤාවෙන් ආරම්භ කරන්න. ඔබට දේව වචනය ලබාගත හැකිවන පිණිස ඔබගේ දැනගැන්ම විවෘත කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. ගීතිකාකරු වූ දාවිත් මෙසේ යාච්ඤා කළේය.

> **ස්වාමිනි, මාගේ මොරගැසීම ඔබ ඉදිරියට පැමිණේවා. ඔබගේ වචනය පරිද්දෙන් මට නුවණ දුන මැනව. (ගීතාවලිය 119:169)**

## ස්වයං අධ්‍යයනය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. බයිබලය අධ්‍යයනය කිරීමේදී බොහෝ අය අසමත් වන්නේ ඇයි?

3. "පූර්ව අවශ්‍යතා" යන වචනයේ අර්ථය කුමක්ද?

4. බයිබලය තේරුම් ගැනීමේ ප්‍රධාන පූර්ව අවශ්‍යතාව කුමක්ද?

5. දේව වචනය අධ්‍යයනය කිරීමට දෙවියන්වහන්සේ ඔබට සපයා ඇති මාර්ග දෙක ලයිස්තුගත කරන්න.

6. යේසුස්වහන්සේ ස්වර්ගයට යාමෙන් පසු දෙවියන්වහන්සේ විසින් එවන ලද ශ්‍රේෂ්ඨ ගුරුවරයා කවුරුන්ද?

7. දේව වචනයේ "කිරි" යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?

8. දේව වචනයේ "මාංස" යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?

9. දේව වචනයේ “කිරි” සිට “මාංස” දක්වා ඇදහිලිවන්තයෙකු ගෙන යන පියවරයන් තුන ලියා දක්වන්න.

______________________________________________

______________________________________________

______________________________________________

10. මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කරන ලද දේව වචනය අධ්‍යයනය කිරීමේ ප්‍රායෝගික යෝජනා තුන ලියා දක්වන්න.

______________________________________________

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඔබගේ බයිබලයේ 1 කොරින්ති 3:1-3 ට පෙරළන්න. ලෞකික කිතුනුවන් විස්තර කිරීමට පාවුල් යොදාගත් වචන තුනක් ලියා දක්වන්න.

2. හිතෝපදේශ 2:1-5 හි සඳහන් දේව වචනයේ මාංසමය කොටස් සෙවීමේ පියවරයන් පහක් ලියා දක්වන්න.

3. හිතෝපදේශ 2:5-12 අධ්‍යයනය කරන්න. දේව වචනය අධ්‍යයනයේදී මෙම පියවර අදාළ කරගැනීමේ ප්‍රතිඵල හතක් ලියා දක්වන්න.

# පස් වන පරිච්ඡේදය

# බයිබල් අධ්‍යයන උපකරණ

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සමපද අකරාදියක ප්‍රයෝජන තුනක් පැහැදිලි කිරීමට
- සමපද අකරාදියක් භාවිත කිරිමට
- බයිබල් ශබ්ද කෝෂයක් භාවිත කිරීමට
- තේමා සහිත පෙළ පොතක් භාවිත කිරිමට.
- බයිබල් විශ්වකෝෂයක් භාවිත කිරීමට
- බයිබල් විවරණ ග්‍රන්ථයක් භාවිත කිරිමට
- බයිබල් සිතියම් පොතක් භාවිත කිරිමට
- බයිබල් අත්පොතක් භාවිත කිරිමට හැකිවනු ඇත.

## ප්‍රධාන පද

> **ඔබගේ ආඥා මාගේ සතුරන්ට වඩා මා නැණවත් කරයි. මක්නිසාද ඒවා නිතර මා සමගය. මාගේ සියලු ගුරුවරුන්ට වඩා මට නුවණ ඇත්තේය. මක්නිසාද මාගේ භාවනාව ඔබගේ ශික්ෂා ගැනය. මා ඔබගේ නියෝග රක්ෂාකළ බැවින් වැඩිමහල්ලන්ට වඩා මට තේරුම් ඇත්තේය. (ගීතාවලිය 119:98-100)**

### හැඳින්වීම

බයිබලය අධ්‍යයනය කිරීමේදී උපකාරි වන්නාවූ විශේෂ ග්‍රන්ථ බයිබල් විශාරදයන් විසින් ලියා ඇත. බයිබල් අධ්‍යයනය සඳහා වූ මෙම උපකරණ භාවිත කරන ආකාරය මෙම පරිච්ඡේදයෙන් විස්තර කරයි. බයිබලය අධ්‍යයනය කිරීම සඳහා මෙම පොත් ඔබ සතුව තිබීම අත්‍යවශ්‍ය නොවේ. ඒවා මිළදී ගැනිමට හෝ ලබාගැනිමට ඔබට හැකියාවක් නැතිනම් ඒ ගැන නොසිතන්න. ඔබ විසින්ම බයිබලය අධ්‍යයනය කළ හැකි ආකාරය මෙම පාඨමාලාවෙන් ඔබට උගන්වයි. ඔබ සතුව තිබිය යුතු එකම දෙය බයිබලය පමණි.

මෙම උපකරණ මේ වන විට ඔබ සතුව නැති වුවත් කවරාකාරයේ අධ්‍යයන ආධාරක පවතී දැයි ඔබ විසින් දැනගැනිම තවදුරටත් වැදගත් වේ. බයිබල් අධ්‍යයන උපකරණ පිළිබඳව මෙම පරිච්ඡේදය අප විසින් ඇතුළත් කර ඇත්තේ මේ හේතුවෙන්ය. ඔබට බයිබල් අධ්‍යයන උපකරණ ලබාගැනිමේ හැකියාවක් තිබේ නම්, ඒවා ඔබට උපකාරි වනු ඇති බැවින් ඔබ විසින් ඒවා භාවිත කරන ආකාරය දැනගැනිම අපගේ කැමැත්ත වේ. එවැනි පොත් ඔබට ලබාගත හැකි ආකාර කිහිපයක් තිබේ. කිතුනු පොත් හලකින් හෝ ප්‍රකාශකයෙකුගෙන් ඔබට ඒවා මිළදී ගත හැකි වේ. ඔබට ඒවා මිළදී ගැනීමේ හැකියාවක් නොමැති නම්, භාවිත කර ආපසු ලබා දෙන පිණිස ඔබට ඒවා ලබාගත හැකිය. ඔබ කිතුනු බයිබල් විද්‍යාලයක් අසල ජිවත් වන්නේ නම්, ඔවුන්ගේ පුස්තකාලය භාවිත කිරිමට ඔබට හැකිවනු ඇත. ඇතැම් විට ඔබගේ නිවස සමීපයේ ජිවත් වන කිතුනු සේවකයෙකු හෝ මිතුරෙකු සතුව මේවායින් ඇතැම් පොත් ඇත්නම්, ඒවා භාවිත කිරීමට ඔවුන් ඔබට ඉඩ දෙනු ඇත.

බයිබල් අධ්‍යයන උපකරණ වැදගත් වන නමුත් බයිබලය අධ්‍යයනය කිරීම වෙනුවට ඒවා අදේශ කළ නොහැකිය. ඔබ විසින් මෙම උපකරණ භාවිත කළ යුත්තේ ඔබේම බයිබල් අධ්‍යයනයක් කිරිමෙන් අනතුරුව පමණි. ඔබ විසින් බයිබලය අධ්‍යයනය කිරිමට පෙර බයිබල් අධ්‍යයන ග්‍රන්ථ කියවීමෙන් ඔබ දේව වචනය අධ්‍යයනය කිරිමට පෙර මනුෂ්‍යයාගේ අදහස් ඔබගේ මනසට

බලපෑම් ඇති කරයි. බයිබල් විවරණ ග්‍රන්ථ රචනා කළ පුද්ගලයන් තමන් සතු කරුණු බයිබලයෙන් ලබාගෙන ඇත්තේ අන් ඕනෑම ශිෂ්‍යයෙකුට කළ හැකි ආකාරයෙනි.

අන් අයගේ සමීක්ෂණ මත රඳා පැවතිමේ අවශ්‍යතාවයක් නැත. ඔබ සතුව බයිබල් අධ්‍යයන උපකරණ නොමැති නම් බලාපොරොත්තු කඩකර නොගනින්න. ඔබ තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිර්මාණශිලි බලය වාසය කරයි. සියලු සත්‍යයන් වෙත ඔබට මගපෙන්වන පිණිස දෙවියන්වහන්සේ විසින් එවන ලද විශේෂ ගුරුවරයා ශුද්ධාත්මයාණන්වහන්සේය. මනුෂ්‍යයා විසින් නිපදවන ලද සියලුම බයිබල් අධ්‍යයන උපකරණ වලට වඩා එය යහපත් වේ. මෙම උපකරණ ලබාගත හැකි නම්, දේව වචනය පිළිබඳව ඔබේම අධ්‍යයනයට අතිරේකයක් වශයෙන් ඒවා යොදාගන්නා ආකාරය ඉගෙන ගන්න. එහෙත් ඒවා මත රඳ පැවතිමෙන් වළකින්න. ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිර්මාණාත්මක එළිදරව්ව මත රඳ පවතින්න.

## බයිබල් අකාරාදිය

බයිබල් අකාරාදියක් තුළ බයිබලයේ සඳහන් ප්‍රධාන වචන ඒවායේ ආසන්න සන්දර්භයන් සමග හෝඩිය පිළිවෙළට සඳහන් වේ. මෙම උපකරණ මිළදී ගැනිම සඳහා ඔබට ඇත්තේ සීමිත මුදල් ප්‍රමාණයක් නම්, බයිබලය අධ්‍යයනය සඳහා ඉතාම වැදගත් උපකරණය මෙය වන බැවින් එය ඔබගේ මුල්ම තෝරාගැනිම විය යුතුය.

ඉංග්‍රිසි භාෂාවේ ප්‍රයෝජනවත් අකරාදීන් දෙකක් නම් :

The Analytical Concordance to the Bible by Robert Young published by Eerdmans Publishing Company, Grand Rapids, Michigan, U.S.A.

Exhaustive Concordance of the Bible by James Strong published by Abingdon Press, Nashville, Tennessee, U.S.A. (Strong's is used for the following study explaining the use of a concordance)

**සිංහල භාෂාවෙන් ඇත්තේ,**

ශුද්ධ බයිබලයේ සමපද අකාරාදිය තිස්ස විරසිංය කල්වාරි මුදණාලය කොළඹ 6, ශ්‍රි ලංකාව

අකරාදියක් අකාර තුනකින් උපකාරී වේ :

1. **එක් වචනයක් සඳහන් වන සියලුම ස්ථානය බලා ගැනිම සඳහා.**

උදාහරණයක් වශයෙන් ඔබට "දේවදූතයා" යන වචනය අධ්‍යයනය කිරීමට අවශ්‍ය වන්නේ නම්, අකරාදියකින් ඔබට "දේවදූතයා" හෝ "දේව දූතයන්" යන වචන කියවා බැලිය හැකිය. බයිබලයේ මෙම වචනය භාවිත කර ඇති ස්ථාන පිළිබඳ සම්පූර්ණ ලයිස්තුවක් ඔබට හමුවනු ඇත. මෙම විෂය පිළිබඳව සඳහන් වන සෑම ස්ථානයක්ම සොයා ගැනිමට මෙය ඔබට උපකාරී වනු ඇත. අකරාදිය යොදා ගනිමින් බයිබලයේ සඳහන් නම් සොයා බලා චරිත අධ්‍යයනයක් කිරීමටද ඔබට හැකිය. උදාහරණයක් වශයෙන්, ඔබ "මෝසෙස්" යන නම සොයා බැලුවහොත් ඔහු ගැන සඳහන් වන සියලුම බයිබල් පද මෙහි ලයිස්තුගත කර තිබෙනු ඇත.

වචනයක් ගැන සඳහන් වන සෑම බයිබල් පදයකම අදාළ වචනය එහි පළමු අකුරින් සඳහන් කර තිබේ.

| ඒකජාතක /දාව/ ඉපදෙව්වේ/උපදින/ජනිත | |
|---|---|
| සෙත් උපන්නාට ...... දවස් අවුරුදු 800 විය. ඔහුට දාව | උත් 5:4 |
| නුඹේ පියාට දාව උපන්නාවූ | ලෙවි. 18:11 |
| ඔවුන් ඉපදෙව්වේ මමද | ගණන්. 11:12 |
| ඔවුන්ට උපදින දරුවන්ට | ද්විතිය. 23:8 |
| දාව උපන් පුත්‍රයෝ | විනි. 8:30 |
| පිනි බින්දු ඉපදෙව්වේ කවුද? | යෝබ් 38:28 |
| අද නුඹ ජනිත කළෙමි | ගීතා. 2:7 |
| මොවුන් මට ඉපදෙව්වේ කවුද? | යෙසා. 49:21 |
| අවජාතක දරුවෝ ඔවුන්ට ඉපද සිටිති | හොෂෙ. 5:7 |
| දෙවියන්වහන්සේගෙන් උපන්නෝය. | යොහ. 1:13 |
| ........ ඒකජාතක පුත්‍රයාණන්වහන්සේම | යොහ. 1:18 |
| ස්වකීය ඒකජාතක පුත්‍රයා දෙනතරම් | යොහ. 3:16 |
| දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය | යොහ. 3:18 |
| අද නුඹ ජනිත කළෙමි | ක්‍රියා 13:33 |

**2. විශේෂිත බයිබල් කොටසක් සොයා ගැනිමට.**

ඇතැම් විට ඔබට යම් බයිබල් පදයක් සොයා ගැනිමට අවශ්‍ය වන නමුත් ඔබට මතක තිබෙන්නේ ඉන් වචන කිහිපයක් පමණක් විය හැකිය. බයිබල් පදය සොයාගැනිම සඳහා ඔබට මතක ඇති වචන යොදා ගන්න. උදාහරණ වශයෙන්, "දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක" යන පදයේ ඔබට මතක ඇත්තේ ඒක ජාතක යන වචනය පමණක් යැයි සිතන්න. ඔබට අකරාදියක් ගෙන ඒකජාතක යන වචනය සොයා බැලිය හැකිය. "ඒකජාතක" යන වචනය සඳහන් සියලුම බයිබල් පද ලයිස්තුවක් එහිදී ඔබට හමු වනු ඇත. "දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක" යන ඔබ විසින් සොයාගන්නා වූ පදය හමුවන තුරු ලයිස්තුව කියවා බලන්න. මෙම පදය ඇත්තේ යොහන් 3:16 හි බව අකරාදිය භාවිතා කර ඔබට සොයාගත හැකි වේ. දැන් ඔබට බයිබලයෙන් මෙම පදය සොයාගත හැකිය.

**3. වචනයක අර්ථය සොයාගනු පිණිස :**

අකරාදියක වචනයක් පිළිබඳව ඇති සෑම ලයිස්තුවක් අවසානයේම අංකයක් සඳහන් වේ. අකරාදිය පිටුපස ශබ්දකෝෂ දෙකක් තිබේ. එකක් පරණ ගිවිසුම ලියා ඇති භාෂාව වන හෙබ්‍රෙව් භාෂාවෙන් වේ. අනෙක් ශබ්ද කෝෂය ඇත්තේ නව ගිවිසුම ලියවී ඇති ග්‍රීක් භාෂාවෙනි. මෙම ශබ්දකෝෂ භාවිත කිරීමට ඔබ ග්‍රීක් භාෂාව හෝ හෙබ්‍රෙව් භාෂාව දැන සිටීම අවශ්‍ය නොවේ. අකරාදියේ ලයිස්තුව අධ්‍යයනයේ ඇති අංකය භාවිත කරන්න. මෙම අංක අදාළ වන්නේ ඉංග්‍රිසි භාෂාවේ අකරාදියකට පමණි.

*Jo 3:16 that he gave his only b son….3439*

## බයිබල් ශබ්දකෝෂය

බයිබල් ශබ්දකෝෂයක් තුළ බයිබලයේ සඳහන් වචන හෝඩිය පිළිවෙළට සඳහන් වන අතර එහි අර්ථයද විස්තර කර තිබේ. බයිබල් ශබ්දකෝෂයක් සාමාන්‍ය ශබ්දකෝෂයක් හා සමාන නොවේ. සාමාන්‍ය ශබ්දකෝෂයක වචන වල අර්ථය ඉදිරිපත් කර ඇත්තේ ඒවා වර්තමානයේ යෙදෙන ආකාරය අනුවයි. බයිබල් ශබ්දකෝෂයක් තුළ වචනයක් නිර්වචනය කර ඇත්තේ මුල් ශුද්ධ

ලියවිලි තුළ ඒවා යොදා ඇති සන්දර්භය අනුව වේ. බයිබල් ශබ්දකෝෂයකින් ගත් උදාහරණයක් පහත දැක්වේ.

| |
|---|
| රැවුළ, ආසියානුවන් අතර පුරුෂයන්ගේ ගෞරවය පෙන්වන ලකුණක් වන නමුත්, හිස හා මුහුණේ කෙස් ඉවත් කරන ඊජිප්තුවන් අතර තත්වය ඊට ප්‍රතිවිරෝධී වේ. වැලපීමේ ලකුණක් ලෙස එය උගුලා දැමීම හෝ කපා දැමීම සිරිතක් විය. රැවුලේ කොන් කපා දැමීම අන්‍යජාතීන්ගේ ලකුණක් ලෙස සැලකූ බැවින් ඉශ්‍රායෙල් සෙනඟට එසේ කිරීම තහනම් විය. (ලෙවී. 19:27). පුද්ගලයෙකුට තම රැවුල කපා දැමීමට බල කිරීම ඔහුට ලැජ්ජාව ගෙන දෙන දඬුවමක් විය. (2 සාමුවෙල් 10:4) |

ඉංග්‍රීසි භාෂාවේ නිර්දේශිත බයිබල් ශබ්දකෝෂ පහත දැක්වේ.

Unger's Bible Dictionary by Merrill Unger, Published by Moody Press, Chicago, Illinois, U.S.A.

Zonderân Pictorial Bible Dictionary by Merrille C Tenney, Published by Zondervan Publishing House, Grand Rapids, Michigan,U.S.A.

සිංහල භාෂාවෙන් බයිබල් ශබ්දකෝෂ තවම නැත.

## වචන අධ්‍යයන ග්‍රන්ථ

වචන අධ්‍යයන ග්‍රන්ථ මූලික බයිබල් ශබ්ද කෝෂයකට එහා යමින් බයිබලයේ භාවිත කර ඇති වචන නිර්වචනය කරයි. ඒවා ග්‍රීක් හා හෙබ්‍රෙව් වචන ඉදිරිපත් කරන අතර එකම වචනයට ඇති විවිධ අර්ථයන් ඉදිරිපත් කරයි. වචනය භාවිත කර ඇති බයිබල් පද ද වචන අධ්‍යයන ග්‍රන්ථ වලින් ඉදිරිපත් කරයි. වචන අධ්‍යයන ග්‍රන්ථයකින් ලබාගත් උදාහරණයක් පහත දැක්වේ.

| |
|---|
| පොරොව : AXINE යන වචනයෙහි, පොරොව (axe), kin to agumi, කඩා දැමීම මතෙව් 3:10 හා ලූක් 3:9 හි හමු වේ. |

මෙම ලයිස්තුව තුළ ග්‍රීක් වචනයද එයට සම්බන්ධ වෙනත් වචනයක්ද (agumi) ඉදිරිපත් කර ඇති අතර වචනයේ අර්ථය ද බයිබලයේ එය භාවිත කර ඇති ස්ථානයන් ද එහි දක්වා තිබේ.

ඉංග්‍රීසි භාෂාවෙන් පහත සඳහන් වචන අධ්‍යයන ග්‍රන්ථ නිර්දේශ කළ හැකිය :

An Expository Dictionary of New Testament words and An Expository Dictionary of Old Testament words , both by W.E Vine published by Fleming H. Revell Company, Old Tappan, New Jersey, U.S.A.

සිංහල භාෂාවෙන් වචන අධ්‍යයන ග්‍රන්ථයක් තවම නැත.

## බයිබල් විශ්වකෝෂය

බයිබල් විශ්වකෝෂයක් තුළද බයිබලයේ සඳහන් විවිධ විෂයන් හා වචන හෝඩියේ පිළිවෙළට ඉදිරිපත් කරන අතර ඒවා නිර්වචනය කරයි. නමුත් ඒ තුළ ශබ්දකෝෂයකට වඩා දීර්ඝ විස්තර ඇතුළත් වේ.

බයිබල් විශ්වකෝෂයකින් ලබාගත් උදාහරණයක් පහත දැක්වේ :

| |
|---|
| ඒකජාතක/දාව උපන් හෙබ්‍රෙව්. Yalad (ලෙවි: 18:11 ; යෝබ් 38:28 ; ගීතා. 2:7 ආදිය) ; ග්‍රීක්.Yennao (ක්‍රියා 13:33; හෙබ්‍රෙව් 1:5; 5:5) ; හි "පියා" ; "ඔබගේ පියා බවට පත්වීම", ආදිය RSV හි මෙම පදය බොහෝ විට යොදා ඇත්තේ දෙවියන්වහන්සේ තම පුත්‍ර වූ ක්‍රිස්තුස්වහන්සේ බිහි කිරීමේ කාර්ය ඇඟවීම සඳහා වේ; "නුඹ මාගේ පුත්‍රයාය අද නුඹ ජනිත කළෙමි" (ගීතාවලිය 2:7) යන්න උන්වහන්සේගේ උත්සාහය හා සම්බන්ධ කරමින් ක්‍රියා 13:33 හි උපුටා දක්වයි (රෝම 1:4) ක්‍රිස්තුස්වහන්සේ දැරූ ගෞරවය ඇඟවීම පිණිස හෙබ්‍රෙව් 1:5 හිද මෙය උපුටා දක්වා ඇත. "උන්වහන්සේ විසින් ලබාගෙන ඇති නාමය දේව දූතයන්ගේ නම්වලට වඩා අනර්ඝ" බව පවසමින් දේවදූතයන් වෙනස්කර පෙන්වයි; පුත්‍රයාගේ නාමය; නැවතත් (5:5) පූජක තනතුරේ මහිමය දෙවියන්වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේ මත තැබීම. |

ඉංග්‍රීසි භාෂාවෙන් නිර්දේශිත බයිබල් විශ්වකෝෂ පහත දැක්වේ :

Wycliffe Bible Encyclopedia by C.F.Pfeiffer, V.F.Vos,and John Rea; published by Moody Press, Chicago, Illinois, U.S.A.

The Zondervan Pictorial Encyclopedia, ( Five volumes) Published by Zondervan Publishing House, Grand Rapids, Michigan,U.S.A.

**සිංහල භාෂාවෙන් ඇත්තේ,**

*ශුද්ධ බයිබලය විශ්ව කෝෂය (කාණ්ඩ 1-7 දක්වා)* පී.පී.වී සෝමරත්න, (කොළඹ දේවධර්ම ශාස්ත්‍රලය, කොහුවල)

## බයිබල් විවරණ ග්‍රන්ථ

විවරණ ග්‍රන්ථයක් යනු බයිබලයේ සඳහන් ශුද්ධ ලියවිලි පිළිබඳව විස්තර ඉදිරිපත් කරන ග්‍රන්ථ වේ. බයිබලයේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට, පදයෙන් පදයට එහි විස්තර ඉදිරිපත් කර තිබේ. තේරුම් ගැනීමට අපහසු පරිච්ඡේද විස්තර කිරීමේදී විවරණ ග්‍රන්ථ වැදගත් වේ. එහෙත් මෙහි ඇත්තේ ශුද්ධ ලියවිල්ලෙහි අර්ථය පිළිබඳව පුද්ගලයෙකුගේ අදහස් බව මතක තබාගන්න. විවරණ ග්‍රන්ථ යනු මනුෂ්‍යයාගේ අදහස් පමණි. වෙනත් අයගේ අදහස් මත පමණක් යැපීමෙන් වැළකී ඔබ විසින්ම බයිබලය අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ මේ හේතුවෙනි.

විවිධ බයිබල් විවරණ ග්‍රන්ථ තිබේ. ඇතැම් විවරණ ග්‍රන්ථ සම්පූර්ණ බයිබලයම ආවරණය කරන්නාවූ එක් වෙළුමකින් සමන්විත වේ. ඇතැම් ග්‍රන්ථ බයිබයේ එක් පොතක් සඳහා එක් වෙළුමක් වෙන්කර තිබේ.

ඉංග්‍රීසි භාෂාවෙන් යෝජිත විවරණ ග්‍රන්ථ :

The Wycliffe Bible Commentary by Charles.F.Pfeiffer and Everett F Harrison published by Moody Press, Chicago, Illinois, U.S.A.

Matthew Henry's Commentary of the Whole Bible Published by Zondervan Publishing House, Grand Rapids, Michigan,U.S.A.

**සිංහල භාෂාවෙන් ඇත්තේ,**

*බයිබල් අවබෝධන විවරණය* (වෙළුම් 1-7 දක්වා) (කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කොහුවල)

## බයිබල් සිතියම් පොත්

**බයිබල් සිතියම් පොතක් හෝ භූගෝලීය ග්‍රන්ථයක් බයිබලයේ සඳහන් දේශයන් පිළිබඳ සිතියම් හා තොරතුරු ඉදිරිපත් කරයි. බයිබලයේ සඳහන් සිදුවීම් සිදුවූ ස්ථානයන් සොයාගෙන ඒවායේ භූගෝලීය පසුබිම තේරුම් ගැනීමට එය ඔබට උපකාර කරයි.**

**ඉංග්‍රීසි භාෂාවෙන් පහත සඳහන් සිතියම් පොත් නිර්දේශ කළ හැකිය.**

Compact Bible Atlas with Gazetter published by Baker Book House, Grand Rapids, Michigan,U.S.A.

Hammond's Atlas of the Bible Lands by Harry T Frank published by Scripture Press, Wheaton, Illinois, U.S.A.

Oxford Bible Atlas by Herbert G. May published by Oxford University Press, New York, U.S.A.

The Macmillan Bible Atlas published by Macmillan Publishing Company, New York, New York, U.S.A.

**සිංහල භාෂාවෙන් ඇත්තේ,**

බයිබල් සිතියම් ලංකා බයිබල් විද්‍යාලය 1996

## මාතෘකානුකූල පෙළ පොත්

**මාතෘකානුකූල පෙළ පොතක් යනු ප්‍රධාන තේමාවන්ට අනුව බයිබලය සංවිධානය කර මෙම තේමාවන් සාකච්ඡා කරන බයිබල් පද ඉදිරිපත් කරන්නාවූ පොතකි. මාතෘකානුකූල පෙළ පොතකින් උදාහරණයක් පහත දැක්වේ.**

| |
|---|
| ගිඩියොන්. දේව දූතයෙකු මඟින් කැඳවනු ලැබීම, විනි. 6:11,14. ඔහුගේ නිදහසට කරුණු, විනි. 6:15. ස්වාමින්වහන්සේගේ පොරොන්දුව. විනි 6:16. හාස්කමක් මඟින් දේව දූතයා කැඳවීම සහතික කිරීම, විනි. 6:21-24. බාල්ගේ අල්තාරය විනාශ කර ස්වාමින්වහන්සේට අල්තාරයක් ගොඩනැගීම, විනි. 6:25-27. ඔහුගේ යාච්ඤා පරීක්ෂණය, විනි. 6:36-40. මිදියන්වරුන්ට විරුද්ධව හමුදාවක් මෙහෙයවා ඔවුන් පරාජය කිරීම, විනි. 6:33-35; 7; 8:4-12 මිදියන්වරුන්ට විරුද්ධ සටනට තමන්ව නොකැඳවීම ගැන එප්‍රායිම්වරු මොරගැසීම, විනි. 8:1-3. සුක්කොත්හි සෙනඟ ඉදිරියේ දී තමන්ටම දඬුවම් කර ගැනීම, විනි. 8:14-17. ඉශ්‍රායෙල් සෙනඟ ඔහුව රජ ලෙස පත් කර ගැනීමට ආශා කිරීම, ඔහු එය ප්‍රතික්ෂේප කිරීම, විනි. 8:22-23. ඉශ්‍රායෙල් සෙනඟගේ මලපත බවට පත් වූ ඒපොද් සැට්ටයක් සෑදීම, විනි. 8:24-27. පුත්‍රයන් සැත්තෑදෙනෙක් සිටී, විනි. 8:30, ඔහුගේ මරණය, විනි 8:32; ඔහුගේ ඇදහිල්ල, හෙබ්‍රෙ. 11:32 |

ඉංග්‍රීසි භාෂාවෙන් නිර්දේශිත මාතෘකානුකූල පෙළ පොත් පහත දැක්වේ:

Nave's Topical Bible lists 20,000 topics with 100,000 Bible references. It was written by Orville J Nave and published by Guardian Press, Grand Rapids, Michigan,U.S.A.

Zondervan Topical Bible lists 21,000 topics with over 100,000 Scripture references. Published by Zondervan Publishing House, Grand Rapids, Michigan,U.S.A.

**සිංහල භාෂාවෙන් ඇත්තේ,**

*බයිබලීය මාතෘකානුගත සමපද අකාරාදිය*, ගෞ. ඩබ්ලිව්. ජේ.ටී. ස්මෝල් දේවගැති තුමා (ශ්‍රී ලංකා බයිබල් සංගමය 2004)

## බයිබල් අත්පොත්

බයිබල් අත්පොතක් යනු බයිබලය පිළිබඳ තෝරාගත් තොරතුරු ඇතුළත් එක් වෙළුමකින් සමන්විත පොතකි. ඒ තුළ වැදගත් සිතියම් හා වගු, නිර්වචන, බයිබලයේ සඳහන් කාලයන් පිළිබඳ තොරතුරු හා බයිබලයේ සඳහන් පොත් පිළිබඳ නිර්වචන ඇතුළත් වේ. බයිබල් අත්පොතක් බයිබලය පිළිබඳ පොදු විස්තරයක් ඉදිරිපත් කරයි.

ඉංග්‍රීසි භාෂාවෙන් පහත සඳහන් බයිබල් අත්පොත් යෝග්‍ය වේ :

Unger's Bible Handbook, by Moody Press, Chicago, Illinois, U.S.A.

Eerdman's Handbook to the Bible, Eerdmans Publishing Company, Grand Rapids, Michigan,U.S.A.

සිංහල භාෂාවෙන් බයිබල් අත්පොතක් තවම නැත.

## අන්තර්ජාලය

පරිගණක සාක්ෂරතාව සහිත හා අන්තර්ජාලයට ප්‍රවේශවිමේ හැකියාව ඇති අයට බයිබල් අධ්‍යයන උපකරණ ලබාගැනීම සඳහා එය හොඳ මුලාශ්‍රයකි. මෙම පරිච්ඡේදයේ දක්වා ඇති බොහෝමයක් අධ්‍යයන උපකරණ මේ වන විට අන්තර්ජාලය හරහා ලබාගත හැකිවේ. “Bible Study resources” හෝ “Bible Studies” යන වචන ඇතුළත් කරන්න. ඔබ සොයන්නාවූ අධ්‍යයන ආධාරකයේ නමද ඔබට ඇතුළත් කළ හැකිය. උදාහරණයක් ලෙස “Nave's Topical Bible” යන වචනය යෙදීමෙන් ඔබට එය සොයාගත හැකිය.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙක් ලියන්න.

________________________________________

________________________________________

________________________________________

2. අකරාදියක ප්‍රධාන භාවිතයන් තුන කවරේද?

____________________ ____________________

____________________

3. පළමු ලයිස්තුවේ ඇති වචන හා දෙවන ලයිස්තුවේ ඇති නිර්වචන සලකා බලන්න. එක් එක් වචනය හොඳින්ම පැහැදිලි කරන නිර්වචනයේ අංකය වචනය ඉදිරියේ ඇති හිස්තැන මත ලියන්න.

| පළමු ලයිස්තුව | දෙවන ලයිස්තුව |
|---|---|
| _____ තේමානුකූල පෙළපොත | 1. පදයෙන් පදය, පරිච්ජේදයෙන් පරිච්ජේදය බයිබලය පිළිබඳ විවරණ ඉදිරිපත් කරයි. |
| _____ බයිබල් ශබ්දකෝෂය | 2. සාමාන්‍ය ශබ්දකෝෂයක් හා සමාන වේ. නමුත් නූතනයේ වචන භාවිත වන ආකාරය වෙනුවට බයිබලයේ භාවිත කර ඇති ආකාරය අනුව වචන නිර්වචනය කරයි. |
| _____ බයිබල් විශ්වකෝෂය | 3. සිතියම් හා බයිබලය පිළිබඳ භූගෝලීය පසුබිම ඉදිරිපත් කරයි. |
| _____ විවරණ ග්‍රන්ථ | 4. බයිබලයේ ඇති මාතෘකා හා එයට අදාළ ශුද්ධ ලියවිලි පාඨ ඉදිරිපත් කරයි. |
| _____ බයිබල් සිතියම් පොත් | 5. බයිබල් ශබ්දකෝෂයකට වඩා සවිස්තරාත්මකව වචනවලට පැහැදිලිකිරීම් ඉදිරිපත් කරයි. |
| _____ වචන අධ්‍යයන ග්‍රන්ථ | 6. බයිබලය පිළිබඳ සාමාන්‍ය තොරතුරු ඉදිරිපත් කරයි. පසුබිම, ඉතිහාසය ආදිය. |

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

බයිබල් අධ්‍යයන උපකරණ ලබාගැනීමේ හැකියාවක් ඔබට තිබේ නම්, පහත අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

1. පහත සඳහන් පදය සොයාගැනීමට අකාරාදියක් භාවිත කරන්න. පදය සම්පූර්ණ කර බයිබල් කොටස ලියා දක්වන්න.

   "මක්නිසාද පුරාණ කාලයේ මේ දඬුවමට නියමකොට තැබුවාවූද

   ______________________________________________"

   බයිබල් පදය :______________________

2. අකාරාදියක්, බයිබල් ශබ්දකෝෂයක් හා වචන අධ්‍යයන ග්‍රන්ථයක් යොදා ගනිමින් "සල්ලාලකම" යන වචනය අධ්‍යයනය කරන්න. එහි අර්ථය සාරාංශ කර දක්වන්න.

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

3. බයිබල් විවරණ ග්‍රන්ථයකින් යූද් 1:4 පිළිබඳව කියවා ඒ ගැන ඉදිරිපත් කර ඇති අදහස් කවරේදැයි බලන්න. ඔබ ඉගෙන ගත් දේ සාරාංශ කරන්න.

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

# හය වන පරිච්ඡේදය

# අර්ථ විවරණ මූලධර්ම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට.
- සැබෑවේ වචනය "හරි ආකාර පහදා දීම" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට.
- බයිබලය නිසි ලෙස අර්ථ විවරණය කිරීමේ රීතීන් හයක් ලයිස්තුගත කිරීමට.
- මෙම රීතීන් හයෙන් එක් එක් රීතිය නිර්වචනය කිරීමට,
- වාචික හා පූර්ණ ආනුභාවය යනු කුමක්දැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **සැබෑවේ වචනය හරි ආකාර පහදාදෙන්නාවූ, ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තුවුණාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරන්න.**
> (2 තිමෝති 2:15)

## හැඳින්වීම

ප්‍රධාන පදය නැවත කියවන්න. මෙහි ඇති "හරි ආකාර පහදා දීම" යන වචනය පරණ ගිවිසුමේ පූජාවන් ඔප්පු කිරීමේ රීතීන් වලින් ලබාගත් එකක් වන අතර එහි අදහස "කෙලින් කැපීම" යනුයි. පරණ ගිවිසුමේදී පුද්ගලයෙකු පාපය උදෙසා පූජාවක් ගෙන ආ කල, එම සත්වයා කොටස් තුනකට බෙදන ලදී. එක් කොටසක් දෙවියන්වහන්සේට ඔප්පු කරන ලදී. තවත් කොටසක් පූජාව ගෙන ආ තැනැත්තාට දෙන ලදී. තුන්වන කොටස පූජකයන්ට දෙන ලදී. "නිසි ලෙස බෙදීම" යන පුරුද්ද වර්ධනය වූයේ මේ තුළිනි. එහි අදහස නම් "එකිනෙකාට අයිති කොටස ඔවුන්ට දීම" යනුයි.

බයිබල් අධ්‍යයනයේදී දේව වචනය නිසි ලෙස බෙදාගැනීම වැදගත් වේ. මෙහිදී අදහස නම් පවසා ඇති දෙය හා එය පවසා ඇත්තේ කවුරුන් හටද යන වග ඔබ දැනගත යුතු බවයි. ඔබ විසින් අදහස නිසි ලෙස අර්ථ විවරණය කර අදාළ කරගත යුතුවේ.

දේව වචනය කතා කරන්නාවූ ප්‍රධාන කාණ්ඩයන් තුනක් ඇත 1 කොරින්ති 10:32 හි මේවා දක්වා තිබේ.

> **මම මාගේම ප්‍රයොජනය නොසොයා, බොහෝ දෙනෙක් ගැළවෙන පිණිස ඔවුන්ගේ ප්‍රයෝජනය සොයා, සියලු දේවලදී යම්සේ සියල්ලන් ප්‍රසන්න කරම්ද, (1 කොරින්ති 10:32)**

සියලු ශුද්ධ ලියවිලි අප උදෙසා දී ඇති නමුත්, සියලු බයිබල් පද අප වෙත යොමු කර නැත. උදාහරණයක් වශයෙන්, දෙවියන්වහන්සේ නෝවාට කතා කර නැවක් සාදන්න යයි පැවසූ සේක. එම කතාන්දරය වාර්තා කර ඇත්තේ ඔබට ආත්මික සත්‍යතාවයන් ඉගෙනගත හැකි ආකාරයේ උදාහරණයක් වශයෙන් මිස ඔබ විසින් නැවක් සෑදිය යුතු යැයි එයින් අදහස් නොවේ. බයිබලයේ ඇතැම් කොටස් යුදෙව්වන් වෙත ලියා ඇත. තවත් කොටස් අන්‍යජාතීන් (යුදෙව්වන් නොවන වෙනත් ජාතීන්) වෙත ලියා ඇත. තවත් කොටස් සභාව (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සැබෑ ලෙස අදහන්නාවූ සියල්ලන්) වෙත ලියා තිබේ.

බයිබලය තුළින් නිසි අර්ථය සොයා ගැනීම සඳහා එය නිසි ලෙස බෙදා වෙන් කරන ආකාරය ඔබ විසින් ඉගෙන ගත යුතුවේ. මේ සඳහා යොදාගත හැකි තවත් වචනයක් වනුයේ "අර්ථ විවරණයයි" එහි අදහස නම් යමකට නිසි අර්ථයක් ලබා දීමයි. සෑම ශුද්ධ ලියවිලි කොටසකම

නිසි අර්ථය වෙත ළඟා වන ආකාරය ඔබ විසින් ඉගෙන ගත යුතු වේ. යේසුස්වහන්සේ තම කාලයේ සිටි ආගමික නායකයන්ට මෙසේ පැවසූ සේක:

> **. . . නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන, වරද්දාගනිහුය (මතෙව් 22:29)**

ආත්මික වැරදීම් යනු දේව වචනය නොදැන සිටීමේ ප්‍රතිඵලයයි. නිසි ලෙස බයිබලය අර්ථ විවරණය කිරිම සඳහා ඔබ විසින් අනුගමනය කළ යුතු මුලධර්ම කිහිපයක් තිබේ. දේව වචනය "හරි ආකාර පහදා දීම" සඳහා ඔබට උපකාර කරන්නාවූ බයිබලය අර්ථ විවරණය කිරිමේ මූලික රීතීන් හයකි.

## දිව්‍යමය ආධිපත්‍යය පිළිබඳ රීතිය

දිව්‍යමය ආධිපත්‍යය පිළිබඳ රීතිය යනු අප විසින් බයිබලය පරම අධිකාරිය වශයෙන් පිළිගැනීමයි. උත්පත්ති සිට එළිදරව් දක්වා මුළු බයිබලයම දේවානුභාවයෙන් ලියවී ඇති බව අපි විශ්වාස කරමුව.

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**
>
> **ලියවිල්ලෙහි කිසි අනාගතවාක්‍යයක් යමෙකුගේ අභිප්‍රායෙන්ම හට නොගන්න බව පළමුකොට දැන, අලුයම පැමිණ පහන් තාරකාව නුඹලාගේ සිත් තුළෙහි පායනතුරු අඳුරු තැනක බබළන පහනක්මෙන් එය සලකන්නහු නම් යහපත්ය. මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය. (2 පේතෘස් 1:19-21)**

ආනුභාවය ආකාර දෙකකි : වාචික හා පූර්ණ ආනුභාවය.

වාචික ආනුභාවය යනුවෙන් අප අදහස් කරනුයේ මුල් පිටපත් වල ඇති සෑම වචනයක්ම දෙවියන්වහන්සේගේ ආනුභාවයෙන් ලියවී ඇති බවයි. පූර්ණ ආනුභාවය තුළින් අප අදහස් කරනුයේ කොටස් වශයෙන් නොව සියලු ශුද්ධ ලියවිලි දේවානුභාවයෙන් ලියවී ඇති බවයි. බයිබලයේ සෑම කොටසක්ම දේවානුභාවයෙන් ලියවී තිබේ.

දිව්‍යමය ආධිපත්‍ය පිළිබඳ රීතිය අප විසින් පිළිගන්නා විට, බයිබලය හා ඉතිහාසය හෝ විද්‍යාව අතර ගැටුමක් නොමැත. යම් ගැටුමක් ඇති සේ පෙනේ නම් එසේ විමට හේතුව නම් :

1. ඉතිහාසය හෝ විද්‍යාව තේරුම්ගැනීමට අප අසමර්ථ වී තිබීම

   හෝ

2. නූතන විද්‍යාත්මක දැනුම නිවැරදි නොවීම. බයිබලය දෙවියන්වහන්සේගේ දිව්‍යමය ආනුභාවයෙන් ලියවී ඇති වචන වන බැවින් ගැටුමක් ඇති වූ විට බයිබලයේ සඳහන් දෙය අවසන් අධිකාරිය බවට පත්වේ. පෙර කාලවල බයිබලය හා ඉතිහාසය හෝ විද්‍යාව අතර යම් ගැටුමක් ඇතිවූ සෑම අවස්ථාවකදීම, බයිබලය නිවැරදි බව පසුකාලින පරීක්ෂණවලින් ඔප්පු වී තිබේ.

## වචනාර්ථයෙන් අර්ථ විවරණය පිළිබඳ රීතිය

වචනාර්ථයෙන් බයිබලය අර්ථ විවරණය කිරීම යනු බයිබලයෙන් පැවසෙන දෙයම එයින් අදහස් කර ඇති බව විශ්වාස කිරීමයි. සන්දර්භය තුළින් පැහැදිලිවම වෙනත් යමක් පෙන්නුම් නොකරන සෑම අවස්ථාවකදීම බයිබලයේ වචනාර්ථයෙන් අර්ථ විවරණයට ලක් කරන්න. ඉශ්‍රායෙල් සෙනඟ යෝර්දාන් ගඟ හරහා වියළි බිම මතින් ගමන් කළ බව බයිබලයේ පවසන විට, එය ඒ ආකාරයෙන්ම පිළිගන්න. යෙරිකෝවේ පවුරු කඩා වැටුණු ආකාරය ගැන බයිබලයේ පවසා ඇති විට, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් වාර්තා කර ඇති ආකාරයෙන්ම එය පිළිගන්න.

බයිබලය තුළ විවිධ "සංකේත" අන්තර්ගත වේ. ඇතැම් පුද්ගලයන්, ස්ථාන හෝ සිදුවීම් සැබෑවටම වාචිකව සත්‍ය වන අතර අනාගතයේ සිදුවන යමක්ද එයින් සංකේතවත් කරයි. මේවා නිසි ලෙස සංවිධානය කර ගැනීමට මෙම පාඨමාලාවේ විසි එක්වන පරිච්ඡේදය ඔබට උපකාරී වනු ඇත.

බයිබලයේ සංකේත ද භාවිත කර තිබේ. සංකේතයක් එහි සාමාන්‍ය අදහසට අමතරව ඊට එක් කරන ලද අදහසක් වෙනුවෙන්ද පෙනී සිටී. උදාහරණ වශයෙන්, මාර්ක් 14:22 හි මිදි යුෂ යොදාගෙන ඇත්තේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයේ සංකේතයක් වශයෙනි. (ඔව්හු සැබවින්ම රුධිරය පානය කළේ නැත). බයිබලය තුළ අනාගතවාක්‍ය වලදී බොහෝවිට සංකේත භාවිත වේ. උදාහරණ වශයෙන් දානියෙල් පොතෙහි නෙබුකද්නෙශර් සිහිනෙන් දුටු විශාල රූපයට සංකේතාත්මක වැදගත්කමක් තිබේ. එම රූපයේ සෑම කොටසක්ම අනාගතයේ ලෝකයේ ඇතිවන රාජධානීන් සංකේතවත් කළේය (දානියෙල් 2). බයිබලයේ සංකේත යොදාගෙන ඇති විට සාමාන්‍යයෙන් ඒවා පැහැදිලි කිරීමක් ද සිදු කරයි. උදාහරණයක් වශයෙන් මෙම සංකේතාත්මක රූපය දානියෙල් අර්ථ විවරණය කළ ආකාරය දානියෙල් 2:31-45 හි වාර්තා කර තිබේ.

යේසුස්වහන්සේ උගන්වන කල උන්වහන්සේ බොහෝවිට උපමා කතා භාවිත කළ සේක. උපමා කතාවක් යනු ආත්මික සත්‍යතාවයක් ඉදිරිපත් කරනු පිණිස ලියන ලද කතාවකි. යේසුස්වහන්සේ උපමා කතාවක් යොදාගත් සෑම අවස්ථාවකදීම ඒ බව බයිබලයේ සඳහන් කර තිබේ. උපමා කතාවක් බව දක්වා නොමැතිනම් එවිට එම කතන්දරය සැබෑ සිදුවීමක් ලෙස පිළිගත යුතු වේ.

## සන්දර්භය සැලකිල්ලට ගැනීමේ රීතිය

බයිබලයේ සෑම පදයක්ම එහි සන්දර්භය තුළ සිට අධ්‍යයනය කළ යුතුවේ. මෙහි අර්ථය නම් ඊට පෙර හා පසුව ඇති පද සමග මෙන්ම බයිබලයේ ඉතිරි සෑම කොටසකටම සම්බන්ධවන ආකාරයෙන් එය අධ්‍යයනය කළ යුතුය යන්නයි. බොහෝ වැරදි ඉගැන්වීම් හා ව්‍යාජ ධර්මයන් බිහිවී ඇත්තේ පදයක් හෝ පදයක කොටසක් ඒවායේ සන්දර්භයෙන් වෙන් කිරීම හේතුවෙනි.

උදාහරණ වශයෙන් දෙවිකෙනෙක් නැතැයි බයිබලය පවසයි. ඔබට එය හමුවී තිබේද? ගීතාවලිය 14:1 හි ඔබට මෙය හමුවේ. ඒ ස්ථානයේ "දෙවිකෙනෙක් නැත" යනුවෙන් සඳහන් වේ. එහෙත් අප මුළු කොටසම කියවූ විට අපට මෙය හමුවේ.

> **අඥානයා දෙවිකෙනෙක් නැතැයි සිතින් කීය, ඔව්හු දුෂ්චරිතයෙහි සිටිති, ඔව්හු පිළිකුල් ක්‍රියා කළෝය. යහපත කරන්නෙක් නැත. (ගීතාවලිය 14:1)**

සම්පූර්ණ පදය එහි සන්දර්භය තුළදී ඉදිරිපත් කරන අදහස ඉන් කොටසක් සන්දර්භයෙන් වෙන් කළ විට ලැබෙන අදහසට වඩා බොහෝ සෙයින් වෙනස් වේ.

බයිබල් පදයක් එහි සන්දර්භය තුළ අධ්‍යයනය කිරීම සඳහා පහත සඳහන් ප්‍රශ්න ඔබගෙන්ම අසන්න.

1. **මෙය පවසන්නේ හෝ ලියන්නේ කවුරුන්ද?**

සමස්ත බයිබලයම දෙවියන්වහන්සේගේ වචනය වුවද, එය ලිවීමට හා පැවසීමට විවිධ පුද්ගලයන් පාවිච්චි කර තිබේ.

2. **පවසා ඇත්තේ මොනවාද?**

කථිකයා හෝ රචකයා විසින් පවසා ඇති දෙයෙහි ප්‍රධාන කරුණු සාරාංශගත කරන්න.

3. **එය පවසා ඇත්තේ කාටද?**

ඉශ්‍රායෙල්ටද? අන්‍ය ජාතීන්ටද? සභාවටද? විශේෂිත තනි පුද්ගලයෙකුටද?

4. එය පවසන ලද්දේ ඇයි?

කොටසේ පරමාර්ථය කුමක්ද? බයිබලයේ ඇතැම් පොත් හා කොටස්වල පරමාර්ථ ඒවායේම දක්වා තිබේ.

> **මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් යේසුස්වහන්සේ ගෝලයන් ඉදිරියෙහි කළසේක. නුමුත් මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:30-31)**

අනෙකුත් බයිබල් කොටස් ලිවීමේ හේතුව පැහැදිලිව දක්වා නැත. පණිවුඩය දක්වා ඇත්තේ ඇයිදැයි නිර්ණය කිරීම සඳහා සන්දර්භය ඉතා සමීපව පරීක්ෂා කර බැලිය යුතුවේ.

5. එය පවසන ලද්දේ කවදාද?

ඇතැම් ශුද්ධ ලියවිලි ලියන ලද කාලය හා තත්වයන් එහි අර්ථය වටහාගැනීමට අපට උපකාරී වේ. උදාහරණ වශයෙන්, කොරින්තියේ සභාවේ දේව මෙහෙයන් පවත්වන පිළිවෙළ සම්බන්ධයෙන් වියවුල්කාරී තත්වයන් ඇතිවූ විට. පාවුල් විශේෂ ශුද්ධ ලියවිලි කොටසක් ලියුවේය. සභාවේ කාන්තාවන්ට නිහඬව සිටින ලෙස පාවුල් පැවසුවේය. මෙහි අදහස සභාවේ කාන්තාවන්ට හඬනගා ගායනා කිරීමට, යාච්ඤා කිරීමට. ඉගැන්වීමට හෝ නමස්කාර කිරීමට නොහැකි බවද?

මේ සඳහා පිළිතුර සොයාගැනීමට, මෙය පවසා ඇති කාලය, හේතුව හා කවුරුන් හටද යන වග අප සොයාබැලිය යුතුවේ. යුදෙව් දේව මෙහෙයන්වලදී කාන්තාවන් එක් පසෙකද පුරුෂයන් වෙනත් පසෙකද හිඳගත්හ. කොරින්තියේ කාන්තාවන් අනෙක් පස සිටි තම පුරුෂයන්ගෙන් හඬනගා ප්‍රශ්න අසමින් දේව මෙහෙයට බාධා කළහ. පාවුල් පහත සඳහන් ලෙස ලිවිය යුතුයැයි සිතන ලද්දේ මෙවැනි අවස්ථාවකදීය.

> **ස්ත්‍රීහු සභාවලදී නිශ්ශබ්දව සිටිත්වා, මක්නිසාද කථාකරන්ට ඔවුන්ට අවසර නැත, ව්‍යවස්ථාවෙන් කියා තිබෙන ලෙස ඔව්හු යටත්ව සිටිත්වා. (1 කොරින්ති 14:34)**

ශුද්ධ ලියවිලි එහි සන්දර්භය තුළ අර්ථ විවරණය කිරීමෙන් බයිබල් කොටසක අර්ථ පැහැදිලි කිරීමට උපකාරී වේ. පදයක් එහි සන්දර්භයෙන් ඉවතට ගැනීමේ ප්‍රතිඵලය වැරදි වැටහීමක් ඇති වීම විය හැකිය. බොහෝවිට බයිබල් කොටසකම සන්දර්භය එය අර්ථ විවරණය කරයි. මේ සඳහා හොඳ උදාහරණයක් වන්නේ මතෙව් 13:1-9 හි සඳහන් වපුරන්නාගේ උපමාවයි. ඔබ එහි සන්දර්භය කියවාගෙන ගියහොත් 18-23 දක්වා පද වල මෙම උපමාව අර්ථ විවරණය කර තිබේ. බොහෝ අවස්ථාවලදී මේ හා සමානවම බයිබලයේ සන්දර්භය තුළින්ම එය අර්ථ නිරූපණය කරයි. සන්දර්භය සැලකිල්ලට ගැනීම වැදගත් වනුයේ මේ හේතුවෙන්ය.

## පළමුව සඳහන් කරන ලද අවස්ථාව පිළිබඳ රීතිය

පළමුව සඳහන් කරන ලද අවස්ථාව පිළිබඳ රීතිය මේ ආකාර වේ. බයිබලයේ යම් වචනයක්, වාක්‍ය ඛණ්ඩයක්, වස්තුවක් හෝ සිදුවීමක් ගැන සඳහන් වන පළමු අවස්ථාවේදී එය සඳහන්වන අනෙකුත් අවස්ථාවලදී එහි අර්ථය පිළිබඳව ප්‍රධාන කරුණක් ඉදිරිපත් කරයි.

උදාහරණ වශයෙන් උත්පත්ති 3 හි පළමු වරට අත්තික්කා කොළ ගැන සඳහන් වේ. මෙහිදී තමන්ගේ පාපය හා නිර්වස්ත්‍රකම වසා ගැනීමට තමන් විසින්ම ගත් උත්සාහයක් වශයෙන් ආදම් අත්තික්කා කොළ භාවිත කළේය. අත්තික්කා කොළවලින් දක්වනුයේ ස්වධර්මිෂ්ටකම, දෙවියන්වහන්සේගේ ප්‍රතිකර්ම ප්‍රතික්ෂේප කිරීම හා දෙවියන්වහන්සේ ඉදිරියේ කෙනෙක්ව ධර්මිෂ්ට කර ගැනීමට උත්සාහ කිරීම ආදියයි.

මින් අනතුරුව බයිබලයේ අත්තික්කා කොළ ගැන සඳහන් වන සෑම අවස්ථාවකදීම එයින් අදහස් වන්නේ මෙයයි. උදාහරණ ලෙස අවසන් වරට අත්තික්කා කොළ ගැන සඳහන් කරනුයේ මතෙව් 21 හා මාර්ක් 11 හා 13 හි යේසුස්වහන්සේ විසිනි. මෙහිදී කොළ සහිත නමුත් ඵල නැති අත්තික්කා ගසක් ගැන කතා කරයි. යේසුස්වහන්සේ එයට ශාප කළ අතර එය වියළී ගියේය. මෙම ක්‍රියාව තේරුම්ගැනීම සඳහා අප පළමුව සඳහන් කළ අවස්ථාව පිළිබඳ රීතිය මතක තබාගෙන උත්පත්ති 3 වෙත ගමන් කළ යුතු වේ. අත්තික්කා කොළවලින් සංකේතවත් කරනුයේ

දෙවියන්වහන්සේගේ ප්‍රතිකර්මය මනුෂ්‍යයා විසින් ප්‍රතික්ෂේප කිරීම සහ තමන්ව සාධාරණීකරණය කිරීම උදෙසා ගන්නා ලද ස්ව-ධර්මිෂ්ටකමේ උත්සාහයකි. අත්තික්කා ගසෙන් සංකේතවත් කරනුයේ යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කළාවූ ස්ව-ධර්මිෂ්ට ඉශ්‍රායෙල් ජාතියයි. ඔව්හු උන්වහන්සේ රජු ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අතර පාපයෙන් ගැළවීම උදෙසා වූ උන්වහන්සේගේ සැලැස්ම පිළිනොගත්හ. තමන්ගේම උත්සාහයන් තුළින් ධර්මිෂ්ට වීමට ඔව්හු උත්සාහ කළහ.

## නැවත නැවත පැවසීමේ රීතිය

මුළු බයිබලයම දිව්‍යමය ආනුභාවයෙන් ලියවී තිබේ. බයිබලයේ අනවශ්‍ය කොටස් නොමැත. සෑම වචනයක්ම ආනුභාවයෙන් ලියවී ඇති අතර සියල්ලම අවශ්‍ය වේ. මේ හේතුවෙන් ශුද්ධ ලියවිලි තුළ යමක් නැවත නැවත පවසා ඇති විට එසේ කර ඇත්තේ විශේෂයෙන් අවධානය යොමු කිරීම උදෙසා වේ. එහි අදහස නම් නැවත නැවත පැවසීමට තරම් එම සත්‍යතාවය ඉතා වැදගත් වන බවයි.

යොහන් 3 හි මෙම නැවත නැවත පැවසීමේ රීතිය දැකිය හැකිය. යේසුස්වහන්සේ නැවත ඉපදීම ලැබීමේ අත්දැකීමේ වැදගත්කම ගැන නිකොදේමුස්ට පැවසූ අතර තුන්වතාවක් එය නැවත නැවත පැවසූ සේක.

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි - යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක. (යොහන් 3:3)**
>
> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි - යමෙක් වතුරෙන්ද ආත්මයෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය. (යොහන් 3:5)**
>
> **නුඹලා අලුතෙන් උපදින්ට ඕනෑයයි මා කීවාට පුදුම නොවන්න. (යොහන් 3:7)**

මතක තබාගන්න : බයිබලයේ යමක් නැවත නැවත පවසා ඇතිනම්, "නැවතී මේ දෙස හොඳින් බලන්න" යනුවෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පවසන්නාවූ ආකාරය එය වේ.

## සමස්ත එළිදරව්ව පිළිබඳ රීතිය

මෙම රීතිය සැබවින්ම බයිබලයේ දක්වා තිබේ.

> **අලුයම පැමිණ පහන් තාරකාව නුඹලාගේ සිත් තුළෙහි පායනතුරු අඳුරු තැනක බබළන පහනක්මෙන් එය සලකන්නහු නම් යහපත්ය. මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය. (2 පේතෘස් 1:20-21)**

ස්කොෆීල්ඩ් පරිවර්තනයේ එය මෙසේ දක්වා ඇත.

> **ශුද්ධ ලියවිල්ලෙහි ඇති කිසිදු අනාගත වාක්‍යයක් තනිව අර්ථ නිරූපණය කළ නොහැකිය. එනම් දේව වචනයේ අන් ස්ථානවල පවසා ඇති සියල්ලෙන් එය වෙන්වී නැත.**

සමස්ත එළිදරව්ව පිළිබඳ රීතිය නම් මෙයයි : යම් විෂයක් පිළිබඳව දේව වචනයේ ඇති සම්පූර්ණ සත්‍යය තනි බයිබල් කොටසකින් ලබාගත යුතු නොවේ. සම්පූර්ණ බයිබලයම අදාළ සත්‍යය පිළිබඳව ලබාදී ඇති මුළු එළිදරව්ව සලකා බැලිය යුතුය. මෙය "සමස්ත" එළිදරව්ව පිළිබඳ රීතිය යනුවෙන් හඳුන්වනුයේ මේ හේතුවෙනි"

යම් විෂයක් පිළිබඳව හුදෙකලා බයිබල් කොටස් මත පදනම්ව ඔබගේ ධර්මතාවයන්, ඉගැන්වීම් හෝ විශ්වාසයන් ගොඩනගාගැනීමට ඔබට නොහැකිය. ඔබගේ අර්ථ විවරණය සමස්ත ශුද්ධ ලියවිල්ලෙන්ම සමන්විත වන තුරු ඔබ අධ්‍යයනය කළ යුතුය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________

______________________________

______________________________

2. සැබෑවේ වචනය "හරි ආකාර පහදා දීම" යන්නෙහි අර්ථය කුමක්ද?

______________________________

3. බයිබලයේ "වාචික" ආනුභාවය යනු කුමක්ද?

______________________________

4. බයිබලයේ පූර්ණ ආනුභාවය යනු කුමක්ද?

______________________________

5. මෙම පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති එක් එක් අර්ථ විවරණ රීතීන් ලයිස්තුගත කරන්න. සෑම රීතියකටම පසුව එහි අදහස සාරාංශගත කරන්න.

1 වන රීතිය : ______________ එහි අදහස ______________

2 වන රීතිය : ______________ එහි අදහස ______________

3 වන රීතිය : ______________ එහි අදහස ______________

4 වන රීතිය : ______________ එහි අදහස ______________

5 වන රීතිය : ______________ එහි අදහස ______________

6 වන රීතිය : ______________ එහි අදහස ______________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

දේව වචනයේ දේවානුභාවය තහවුරු කරන්නාවූ බයිබල් කොටස් කිහිපයක් තිබේ. එක් එක් කොටස ඔබගේ බයිබලයෙන් කියවා එය සාරාංශ කරන්න.

| ශුද්ධ ලියවිලි පාඨය | සාරාංශය |
|---|---|
| හෙබ්‍රෙව් 1:1 | |
| 1 තෙසලෝනික 2:13 | |
| 2 තිමෝති 3:16 | |
| 1 කොරින්ති 14:37 | |
| 1 කොරින්ති 2:7-13 | |
| 1 කොරින්ති 11:23 | |
| ගලාති 1:11, 12, 16, 20 | |
| එපීස 3:1-10 | |
| 1 පේතෘස් 1:10, 11, 21 | |
| 2 පේතෘස් 3:16 | |

# හත් වන පරිච්ඡේදය

# බයිබලයේ පසුබිම

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බයිබලයේ ඇති ප්‍රධාන ඓතිහාසික කාලච්ඡේද හඳුනාගැනීමට
- බයිබලයේ සඳහන් කාලයේ දෛනික ජීවිතය විස්තර කිරීමට
- බයිබල් පුරාවිද්‍යාව නිර්වචනය කිරීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

**ඔබගේ ශික්ෂා සදාකාලේටම පිහිටෙවු බව පෙර සිට එයින් දැනගතිමි.**
**(ගීතාවලිය 119:152)**

## හැඳින්වීම

බයිබලයේ සෑම කොටසක්ම ඉතිහාසයේ යම් නිශ්චිත කාලයක් තුළ නිශ්චිත සංස්කෘතික සන්දර්භයක් තුළ සිදුවී තිබේ. බයිබල් කොටසක් නිසි ලෙස තේරුම් ගැනීම බොහෝවිට මෙම කරුණු හා සම්බන්ධ වේ. මෙම පරිච්ඡේදය බයිබලයේ ඉතිහාසය කෙටියෙන් විස්තර කරන අතර බයිබලය ලියවුණු කාලවල දෛනික ජීවිතය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.

## කාලානුක්‍රමික ඉතිහාසය

ඉතිහාසයේ යම් සිදුවීමක් සිදුවූ කාලය කාලානුක්‍රමික ඉතිහාසය මගින් පෙන්නුම් කරයි. “කාලානුක්‍රමික” යනු යමක් සිදුවූ පිළිවෙළ හෝ වාර ගණනයි. කාලානුක්‍රමික ඉතිහාසය ඉතිහාසයේ සිදුවූ අතීත සිදුවීම් නිසි පිළිවෙළට සංවිධානය කරයි.

ලෝකයේ බොහෝ ස්ථානවල දින වකවානු ප්‍රධාන කාලපරිච්ඡේද දෙකකට බෙදා තිබේ. වර්ෂයට අදාළ අංකයට පෙර යොදන මුලකුරුවලින් මෙම කාලපරිච්ඡේද දෙක පෙන්නුම් කෙරේ.

> ක්‍රි.පූ. (B.C) මෙම මුලකුරු සමග යෙදෙන අංකවලින් පවසා සිටිනුයේ මෙම සිදුවීම ක්‍රිස්තුස්වහන්සේගේ උපතට පෙර සිදුවූ බවයි.
>
> ක්‍රි.ව. (A.D) මෙම මුලකුරු සමග යෙදෙන අංකවලින් පවසා සිටිනුයේ, මෙම සිදුවීම ක්‍රිස්තුස්වහන්සේගේ උපතින් පසුව සිදුවූ බවයි.

යම් සිදුවීමක් කි.පූ. 250 දී සිදුවූයේ යැයි පවසන විට, එහි අදහස නම් ක්‍රිස්තුස්වහන්සේ ඉපදීමට වසර 250 කට පෙර එය සිදුවූ බවයි. යම් සිදුවීමක් ක්‍රි.ව. 700 දී සිදුවූයේ යැයි පවසන විට, එහි අදහස නම් ක්‍රිස්තුස්වහන්සේගේ උපතින් වසර 700 කට පසු එය සිදුවූ බවයි. යම් අංකයකට පසුව ක්‍රි.පූ යන අකුරු ඇති විට අංකය විශාල වන තරමටම දිනය පැරණි වේ. යම් අංකයකට පසුව ක්‍රි.ව. යන අකුරු ඇති විට අංකය විශාල වන තරමටම දින වඩා මෑත වේ.

දින පිළිබඳව තේරුම් ගැනීමට මෙම වගුව ඔබට උපකාරී වනු ඇත.

| ක්‍රි.පූ. | ක්‍රි.ව |
|---|---|
| ක්‍රි.පූ. 500, ක්‍රි.පූ. 300 ක්‍රි.පූ. 100 | ක්‍රි.ව. 100 ක්‍රි.ව 300 ක්‍රි.ව. 500 |
| අදාළ දිනය ක්‍රිස්තුස්වහන්සේගේ මරණයෙන් වසර 500 කට පෙර සිදුවූ බැවින් වඩා පැරණි වේ. | මෙම දිනය ක්‍රිස්තුස්වහන්සේගෙන් වසර 500 කට පසු යෙදෙන බැවින් එය වඩා ආසන්න වේ. |

බයිබලයේ සඳහන් සිදුවීම්වල කාලානුක්‍රමික ඉතිහාසය දැනගත හැකි ආකාරයන් කීපයකි.

1. ඇතැම් සිදුවීම් වල දිනයන් බයිබලයේම දක්වා තිබේ.

2. ඉතිහාසඥයන්ගේ වාර්තාවන් දින වකවානු දක්වයි.

3. ඓතිහාසික දේවල් පිළිබඳ අධ්‍යයනය වන, පුරාවිද්‍යාව තුළින්. ඉන් අදහස් වන්නේ ඉතිහාසයෙන් ඉතිරි වී ඇති දේවල් ඇසුරෙන් එම කාලයන් පිළිබඳව කරන්නාවූ අධ්‍යයනයකි. බයිබල් පුරාවිද්‍යාව යනු බයිබලයේ සඳහන් දේශයන්හි ඉතිරි වී ඇති දේවල් ඇසුරෙන් කරන්නාවූ අධ්‍යයනයයි. බයිබලයේ සඳහන් ඇතැම් ඓතිහාසික වාර්තාවන් සොයාගෙන ඇත්තේ මෙම සුන්බුන් වල දින වකවානු ඇසුරෙනි.

## බයිබලයේ කාලානුක්‍රමික ඉතිහාසය

බයිබලයේ කාලානුක්‍රමික ඉතිහාසය ඉතා පහසුවෙන් ප්‍රධාන කාලපරිච්ඡේද දොළහකට බෙදා තිබේ. වර්ෂ අනුපිළිවෙළ අනුව බයිබලය බෙදා ඇති ප්‍රධාන කාලපරිච්ඡේද දොළහ පළමු වගුවෙන් පෙන්නුම් කරයි. වගුවේ දෙවන තීරුව දෙස බලන්න. “මැවීමේ සිට ආබ්‍රහම් දක්වා” යන්නෙන් පටන්ගෙන “ශුභාරංචිය ව්‍යාප්තවීම” දක්වා වූ බයිබලයේ ප්‍රධාන කාලච්ඡේද 12 ඉන් පෙන්නුම් කරයි.

පළමු හා තුන්වන තීරුවෙන් පෙන්වන්නේ බයිබලයේ ඇති පොත් ලියවී ඇති කාලයයි. පරණ ගිවිසුමත් නව ගිවිසුමත් අතර කිසිඳු පොතක් නොලියවුණු වසර 386 ක කාලයක් ඇති බව සැලකිල්ලට ගන්න. ඔබ විසින් බයිබලය අධ්‍යයනය කරන කල මෙම කාලවකවානු සැලකිල්ලට ගන්න. සිදුවීම් සිදුවූ කාලය තීරණය කිරීමට එය ඔබට උපකාරී වනු ඇත.

## පළමු වගුව බයිබලයේ කාලානුක්‍රමික ඉතිහාසය

| පළමු තිරුව | දෙවන තිරුව | තෙවන තිරුව |
|---|---|---|
| උත්පත්ති | 1. මැවීමේ සිට ආබ්‍රහම් දක්වා | |
| | 2. ආබ්‍රහම් සිට මෝසෙස් දක්වා | |
| | 3. නික්මයාම | |
| නික්මයාම | | |
| ලෙවීකථාව | | |
| ගණන්කථාව | | |
| ද්විතිය කථාව | | |
| යොෂුවා | 4. ජයගැනීම | |
| විනිශ්චයකාරයා | 5. විනිශ්චයකාරයා | |
| රූත් | | |
| | | යෝබ් |
| | 6. රාජධානිය | |
| | | ගීතාවලිය |
| | | හිතෝපදේශ |
| | | දේශනාකාරයා |
| | | සලමොන්ගේ ගීතිකාව |
| 1 සාමුවෙල් | | |
| 2 සාමුවෙල් | | යෙසායා |
| | | යෙරෙමියා |
| | | විලාප ගී |
| 1 රාජාවලිය | | එසකියෙල් |
| 2 රාජාවලිය | | දානියෙල් |
| | | හොෂෙයා |
| | | යෝවෙල් |
| 1 ලේකම් | | ආමොස් |
| | 7. රාජධානීන් දෙක | |
| 2 ලේකම් | 8. යුදය තනිවීම | |
| | | ඔබදියා |
| | | යෝනා |
| | | මීකා |
| | | නාහුම් |
| | | හබක්කුක් |
| | 9. වහල්භාවය | ශෙපනියා |
| එස්රා | | |
| නෙහෙමියා | | |
| මලාකි | 10. ප්‍රතිස්ථාපනය | හග්ගයි |
| | | සෙකරියා |

(පළමු වගුව තවදුරටත්)

ගිවිසුම් දෙක අතර කාලය

| පළමු තිරුව | දෙවන තිරුව | තෙවන තිරුව |
|---|---|---|
| මතෙව්<br>මාර්ක්<br>ලූක්<br>යොහන් | 11. ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය | |
| ක්‍රියා | 12. ශුභාරංචිය ව්‍යාප්ත වීම | රෝම<br>1 හා 2 කොරින්ති<br>ගලාති<br>එපීස<br>පිලිප්පි<br>කොලොස්සි<br>1 හා 2 තෙසලෝනික<br>1 හා 2 තිමෝති<br>පිලෙමොන්<br>තීතස්<br>හෙබ්‍රෙව්<br>යාකොබ්<br>1 හා 2 පේතෘස්<br>1, 2 හා 3 යොහන්<br>යූද්<br>එළිදරව් |

බයිබල් ඉතිහාසයේ මෙම සිදුවීම් සිදුවූ ප්‍රධාන කාලච්ඡේද 12 පිළිබඳව වූ විස්තරය කියවා බලන්න.

## 1. මැවීමේ සිට ආබ්‍රහම් දක්වා (මැවීමේ සිට ක්‍රි.පූ. 2000 දක්වා)

විශ්වයේ මැවීම, මනුෂ්‍යයා පාපයට වැටීම, කායින් විසින් ආබෙල් මරාදැමීම නෝවා සහ ජල ගැල්ම, බාබෙල් කොත මෙම කාලපරිච්ඡේදයේ සිදුවූ ප්‍රධාන සිදුවීම් වලින් කීපයකි.

## 2. ආබ්‍රහම් සිට මොසෙස් දක්වා (ක්‍රි.පූ. 2000-1500 දක්වා)

මෙම කාලපරිච්ඡේදය ආසන්න වශයෙන් වසර 500 ක පමණ කාලයක් ආවරණය කරයි. මෙම කාලච්ඡේදයේ අවධානය යොමුවී ඇත්තේ තනි පුද්ගලයෙක් වූ ආබ්‍රහම් හා ඔහුගෙන් පැවත එන්නන්ගේ අත්දැකීම් වෙත වේ. ලෝකයේ ජාතීන්ට තමන්වහන්සේ එළිදරව් කරනු පිණිස ආබ්‍රහම් තුළින් දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය නැගිටෙවූ සේක. ආබ්‍රහම්ගේ පුත් ඊසාක්ගේ හා ඊසාක්ගේ පුත් යාකොබ්ගේ කතන්දර මෙම කාලච්ඡේදය තුළ ඇතුළත් වේ. මෙම කාලපරිච්ඡේදයේ උච්චස්ථානය හිමි වන්නේ ඊජිප්තුවේ වහල්කමට විකුණනු ලැබ ශ්‍රේෂ්ඨ පාලකයකු බවට

පත්වන්නාවූ යාකොබ්ගේ පුත් යෝසෙප්ගේ කතාන්දරයට වේ. යාකොබ් හා ඔහුගේ පවුල පසුව ඊජිප්තුවට ගොස් යෝසෙප් හා එක් විය.

### 3. නික්මයාම (ක්‍රි.පූ. 1500-1460 දක්වා)

උත්පත්ති පොතේ අවසානයත් නික්මයාම පොතෙහි ආරම්භයත් අතර පරතරය ආසන්න වශයෙන් වසර 100 ක් පමණ වේ. මේ කාලය අතරතුරදී යාකොබ්ගේ පවුල ඉශ්‍රායෙල් ජාතිය දක්වා වැඩි වර්ධනය විය. ඉශ්‍රායෙල් සෙනඟගේ වේගවත් වර්ධනය දැක ඊජිප්තු වැසියන් බියට පත්වූ අතර සැබවින් ඔව්හු ඔවුන්ගේ වහලුන් බවට පත්කර ගත්හ. මෝසෙස් නැගිටුවනු ලැබූ අතර ඔහුගේ නායකත්වය යටතේ ඉශ්‍රායෙල් සෙනඟ පුදුමාකාර ලෙස ඊජිප්තුවෙන් පිටතට පැමිණියහ. සිනයි කන්ද අසල වසරක කාලයක් ගත කිරීමෙන් අනතුරුව, ඔව්හු වසර 38 ක් කාන්තාරයේ සැරිසරමින් සිටියහ. මෝසෙස්ගේ මරණයත් සමග මෙම කාලපරිච්ජේදය අවසන් වූ අතර ඉශ්‍රායෙල් සෙනඟගේ නායකත්වය යොෂුවා නම් මනුෂ්‍යයෙක් වෙත පැවරෙන ලදී.

### 4. කානාන් දේශය අත්පත් කරගැනීම (ක්‍රි.පූ. 1460-1450)

මෙම කාලපරිච්ජේදය අතරතුරදී දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට පොරොන්දු වූ දේශය අත්පත් කර ගැනීම පිණිස යොෂුවා ඔවුන්ට කානාන් දේශය තුළට යාමට නායකත්වය දුන්නේය. මෙම ප්‍රදේශයේ සිටි දේව අභක්තික සෙනඟ යුද්ධ කර අත්පත් කර ගැනීමෙන් අනතුරුව, දේශය ඉශ්‍රායෙල් ගෝත්‍ර 12 අතර බෙදා දෙන ලදී. මෙම වසර 10 ක කාලය යොෂුවා පොතෙහි වාර්තා කර තිබේ.

### 5. විනිශ්චයකාරයෝ (ක්‍රි.පූ. 1450-1102)

ඉශ්‍රායෙල් ජාතිය පාලනය කරනු පිණිස දෙවියන්වහන්සේ විසින් විනිශ්චයකාරයන් නඟා සිටෙවූ කාලපරිච්ජේදය මෙයයි. මෙය ආත්මිකව අසමර්ථ වූ කාලයක් වූ බැවින් ඉශ්‍රායෙල් ඉතිහාසයේ අඳුරු යුගයක් විය. මෙම කාලය වසර 348 ක් පුරා පැවතිණි.

### 6. රාජධානිය (ක්‍රි.පූ. 1102-982)

ඉශ්‍රායෙල්හි අවසන් විනිශ්චයකාරයා වූ සාමුවෙල්, ඉශ්‍රායෙල් රාජධානිය පිහිටුවා සාවුල් රජ ලෙස ආලේප කළේය. සාවුල්, දාවිත් හා සලමොන් යන රජවරු වසර 40 බැගින් රජකම් කළෝය. මේ කාලය තුළදී ඉශ්‍රායෙල් ජාතිය තම ඉතිහාසයේ ඉහළම ගෞරවය අත්පත් කරගත්හ. ආණ්ඩුව ස්ථිර ලෙස පිහිටුවා තිබූ අතර ඉශ්‍රායෙල් දේශයේ සීමාවන් ද පුළුල් විය. මීට පසුව එළඹෙන කාලපරිච්ජේද තුනෙහි මෙන්ම මෙම කාලපරිච්ජේදයෙහි කතන්දරයද 1 හා 2 සාමුවෙල්, 1 හා 2 රාජාවලිය හා 1 හා 2 ලේකම් පොත්වල සඳහන් වේ. එක් රාජධානියක් ලෙස වසර 120 ක් පුරා පැවතුණු අතර ඉන්පසුව රාජධානිය බෙදා වෙන් විය.

### 7. රාජධානින් දෙක (ක්‍රි.පූ. 982-722)

සාලමොන්ගේ නපුරු පුත්‍රයා වූ රෙහෙබෝවම් රාජ්‍යත්වයට පත් වීමෙන් අනතුරුව, උතුරේ ගෝත්‍ර කැරලි ගසන්නට විය. ඔවුහු වෙනම ඉශ්‍රායෙල් රාජ්‍යයක් පිහිටුවා ගත්හ. දකුණු රාජධානිය යුදා රාජධානිය ලෙස හඳුන්වන්නට විය. වසර 259 ක පමණ කාලයක් ඉශ්‍රායෙල් දේශය රාජධානින් දෙකකට බෙදී තිබුණි.

### 8. යුදය කියවීම (ක්‍රි.පූ. 722-587)

ක්‍රි.පූ. 722 දී ඉශ්‍රායෙලය, එනම් උතුරු රාජධානිය අසරියන්වරු විසින් අල්ලා ගන්නා ලදී. සෙනඟ වහල්බවට ගෙනයන ලදී. ඉශ්‍රායෙලයේ වැටීමෙන් අනතුරුව දකුණු රාජධානිය වූ යුදය වසර 135 ක් පැවතුණි. යුදයේ රජවරු දෙවියන්වහන්සේට වඩා පක්ෂපාතිබවක් පෙන්වූ අතර සෙනඟ ගැඹුරු ලෙස පාපයට වැටී සිටියේ නැත.

## 9. වහල්කම (ක්‍රි.පු. 587 - 538)

අනාගතවක්තෘන්ගේ අනතුරු ඇඟවීම් නොසලකාහරිමින් යුදය අවසානයේ ගැඹුරු ලෙස පාපයට වැටුණු අතර නෙබුකද්නෙශර් විසින් ඔවුන්ව අල්ලාගෙන බබිලෝනියේ වහල්කමට ගෙනයනු ලැබීමට දෙවියන්වහන්සේ ඉඩ හළ සේක. යෙරුසලම් නගරය විනාශ කර දමනු ලැබූ අතර, මීට වසර කිහිපයකට පෙර පුදුමසහගත ලෙස යොර්දාන් නදිය තරණය කළා වූ දෙවියන්වහන්සේගේ සෙනඟ, දැන් දම්වැල් ඇතිව ගමන් කළහ.

## 10. ප්‍රතිස්ථාපනය (ක්‍රි.පු. 538-391)

සයිරස් නැමති රජු බබිලෝනියේ රජ වූ පසු, නැවත යෙරුසලමට ගොස් යෙරුසලම හා තමාගේ නමස්කාර කළ දේවමාලිගය ගොඩනැගීමට ඔහු දෙවියන්වහන්සේගේ සෙනඟට අවසර දුන්නේය. පොරොන්දු දේශයේ යළි පදිංචිමට ගිය අයට නායකත්වය දුන්නේ සෙරුබ්බාබෙල්ය. මෙම කාලය පිළිබඳ වාර්තාවන් එස්රා, නෙහෙමියා හා එස්තර් යන පොත්වල දැකිය හැකිය. මෙම ප්‍රතිස්ථාපන කාලපරිච්ජේදය වසර 147 ක් පුරා පැවතුණි.

## ගිවිසුම් දෙක අතර කාලය (ක්‍රි.පු. 391-5)

පරණ ගිවිසුම අවසන් වනුයේ දෙවියන්වහන්සේගේ සෙනඟ වූ ඉශ්‍රායෙල් කානන් දේශයේ යළි පිහිටුවීමත් සමඟ වේ. ඉන් පසුව පරණ ගිවිසුමත් නව ගිවිසුමත් අතර වූ වසර 400ක කාලය ආරම්භ වේ. මෙම කාලය තුළ බයිබලයේ කිසිදු පොතක් ලියැවී නැති අතර තොරතුරු ලබාගත හැක්කේ ලෞකික ලියවිලි වලිනි.

මේ කාලය තුළදී පර්සියන්වරු (ක්‍රි.පු. 536-333), ග්‍රීක්වරු (ක්‍රි.පු. 333-323) ඊජිප්තුවැසියන් (ක්‍රි.පු. 323-204) සිරියන්වරු (ක්‍රි.පු. 204-165), මකබිවරු (ක්‍රි.පු. 165-63) හා රෝමවරු (ක්‍රි.පු. 63 සිට ක්‍රිස්තුස්වහන්සේගේ කාලය දක්වා) විසින් පලස්තිනය පාලනය කරන ලදී.

## 11. ක්‍රිස්තුස්වහන්සේගේ ජිවිතය (ක්‍රි.පු. 5 - ක්‍රි.ව. 28)

වසර 400කට පසු, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම උදෙසා මාර්ගය සකස් කරනු පිණිස දෙවියන්වහන්සේ විසින් යොහන් බව්තිස්ත නැගිටුවනු ලැබූ සේක. යේසුස්වහන්සේ පව්කාර මනුෂ්‍ය වර්ගයාගේ ගැළවුම්කරු වීමට තිබුණු සේක. මෙම ගැළවීමේ සැලැස්ම පිළිබඳව මුල් වරට පොරොන්දු වුයේ මනුෂ්‍යයා මුල් වරට පාපයට වැටුණාවූ ඒදන් උයනේදිය (උත්පත්ති 3:15) යේසුස්වහන්සේ භාස්කමක් කරණකොටගෙන කන්‍යාවකගෙන් උපත ලැබ, මෙසියස්වහන්සේ වශයෙන් තමන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට එළිදරව් කර, ප්‍රතික්ෂේප කරනු ලැබූ මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා කුරුසපත් කරනු ලැබ, දෙවියන්වහන්සේගේ බලයෙන් නැවත නැඟිටවනු ලැබූ සේක. මෙම වසර 33ක කාලය මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත්වල වාර්තා වේ.

## 12. ශුභාරංචිය ව්‍යාප්ත වීම (ක්‍රි.ව. 28-100)

ක්‍රිස්තුස්වහන්සේ මරණයෙන් නැගිටුණු පසු උන්වහන්සේ ස්වර්ගස්ථවීමෙන් අනතුරුව සිදු වූ සිදුවීම් මෙම කාලච්ජේදයෙන් ආවරණය කරයි. යෙරුසලමේ සිට යුදය, සමාරිය සහ ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත වූ ආකාරය එහි වාර්තා කරයි.

### දෙවන වගුව: ඉශ්‍රායෙලයේ විනිශ්චයකරුවන්

ඉශ්‍රායෙලය විනිශ්චයකරුවන් අතින් පාලනය වන කල සිදු වූ බොහෝ සිදුවීම් පරණ ගිවිසුමේ වාර්තා කරයි. ඉශ්‍රායෙලයට රජවරු සිටීමට පෙර එය පාලනය කළේ විනිශ්චයකරුවන් විසිනි. විනිශ්චයකරුවන් පිළිබඳ කතන්දර විනිශ්චයකාරයා පොතෙහි වාර්තා කර තිබේ. විනිශ්චයකරුවන්ගේ යුගයේදී අදාළ සිදුවීම් සිදු වූ කාලයන් හඳුනාගැනීමට ඔබට උපකාරයක් ලෙස මෙම වගුව පාවිච්චි කරන්න.

| බයිබල් කොටස | නම | දින වකවානුව | වර්ෂ ගණන |
|---|---|---|---|
| විනිශ්චයකාරයා 3:7-11 | ඔත්නියෙල් | 1400-1360 | 40 |
| විනිශ්චයකාරයා 3:12-31 | ඒහුද් | 1360-1280 | 80 |
| විනිශ්චයකාරයා 3:12-31 | ෂම්ගර් | 1280 | 1 |
| විනිශ්චයකාරයා 4-5 | දෙබෝරා | 1280-1240 | 40 |
| විනිශ්චයකාරයා 6-8:32 | ගිඩියොන් | 1240-1200 | 40 |
| විනිශ්චයකාරයා 9 | අබිමෙලෙක් | 1200-1197 | 3 |
| විනිශ්චයකාරයා 10:1-2 | තෝලා | 1197-1174 | 23 |
| විනිශ්චයකාරයා 10:3-5 | යායිර් | 1174-1152 | 22 |
| විනිශ්චයකාරයා 10:6-12 | යෙප්තා | 1152-1146 | 6 |
| විනිශ්චයකාරයා 10:6-12 | ඉබ්ශාන් | 1146-1138 | 8 |
| විනිශ්චයකාරයා 10:6-12 | ඒලොන් | 1138-1128 | 10 |
| විනිශ්චයකාරයා 10:6-12 | අබ්දොන් | 1128-1121 | 7 |
| විනිශ්චයකාරයා 13-16 | සම්සොන් | 1121-1101 | 20 |

## තුන්වන වගුව : ඉශ්‍රායෙලයේ හා යුදයේ රජවරු

පරණ ගිවිසුමේ බොහෝ සිදුවීම් වාර්තා කර ඇත්තේ ඉශ්‍රායෙලයේ හා යුදයේ විවිධ රජවරුන්ගේ රාජ්‍ය කාලය තුළදී සිදුවූ බවට වේ. මෙම සිදුවීම් වල දිනවකවානු නිර්ණය කිරීමට මෙම වගුව ඔබට උපකාරී වනු ඇත.

**ඉශ්‍රායෙල්හි රජවරු :**

| රජුගේ නම | රාජ්‍ය කාලය වසර ගණනින් | දිනවකවානු ක්‍රි.පූ. | බයිබල් කොටස |
|---|---|---|---|
| යෙරොබොවම් I | 22 | 976-954 | I රාජවලිය 11:26-14:20 |
| නාදාබ් | 2 | 954-953 | I රාජවලිය 15:25-28 |
| බාෂා | 24 | 953-930 | I රාජවලිය 15:27 - 16:7 |
| ඒලා | 2 | 930-929 | I රාජවලිය 16:6-14 |
| සිම්රි | (දින 7) | 929 | I රාජවලිය 16:9-20 |
| ඔම්රි | 12 | 929-918 | I රාජවලිය 16:15-28 |
| ආහබ් | 21 | 918-898 | I රාජවලිය 16:28-22:40 |
| අහසියා | 1 | 898-897 | I රාජවලිය 22:40-<br>2 රාජාවලිය 1:18 |
| යෙහෝරාම් | 11 | 897-885 | 2 රාජාවලිය 3:1-9:25 |
| යේහු | 28 | 885-857 | 2 රාජාවලිය 9:1-10:36 |
| යෙහෝවාහාස් | 16 | 857-841 | 2රාජාවලිය 13:1-9 |
| යෙහෝවාෂ් | 16 | 841-825 | 2 රාජාවලිය 13:10-14:16 |
| යෙරොබෝවම් II | 40 | 825-773 | 2 රාජාවලිය 14:23-29 |
| සෙකරියා | ½ | 773-772 | 2 රාජාවලිය 14:29-15:12 |
| ෂල්ලුම් | (මාස 1) | 772 | 2 රාජාවලිය 15:10-15 |
| මනෙහෙම් | 10 | 772-762 | 2 රාජාවලිය 15:14-22 |
| පෙකහියා | 2 | 762-760 | 2 රාජාවලිය 15:22-26 |
| පෙකා | 20 | 760-730 | 2 රාජාවලිය 15:27-31 |
| හෝෂෙයා | 9 | 730-721 | 2 රාජාවලිය 15:30-17:6 |

**යුදයේ රජවරු:**

| **රජුගේ නම** | **රාජ්‍ය කාලය වසර ගණනින්** | **දින වකවානු** | **බයිබල් කොටස** |
|---|---|---|---|
| රෙහොබෝවම් | 17 | 976-959 | I රාජවලිය 11:42-14:31 |
| අබියාම් | 3 | 959-956 | I රාජවලිය 14:31-15:8 |
| ආසා | 41 | 956-915 | I රාජවලිය 15:8-24 |
| යෙහෝෂාපාට් | 25 | 915-893 | I රාජවලිය 22:41-50 |
| යෙහෝරාම් | 8 | 893-886 | 2 රාජවලිය 8:16-24 |
| අහසියා | 1 | 886-885 | 2 රාජවලිය 8:24-9:29 |
| අතලියා | 6 | 885-879 | 2 රාජවලිය 11:1-20 |
| යෝවාෂ් | 40 | 879-840 | 2 රාජවලිය 11:1-12:21 |
| අමශියා | 29 | 840-811 | 2 රාජවලිය 14:1-20 |
| අශරියා(උස්සියා) | 52 | 811-759 | 2 රාජවලිය 15:1-7 |
| යෝතාම් | 18 | 759-743 | 2 රාජවලිය 15:32-38 |
| ආහස් | 19 | 743-727 | 2 රාජවලිය 16:1-20 |
| හෙසකියා | 29 | 727-698 | 2 රාජවලිය 18:1-20:21 |
| මනස්සේ | 55 | 698-643 | 2 රාජවලිය 21:1-18 |
| ආමොන් | 2 | 643-640 | 2 රාජවලිය 21:19-26 |
| යොෂියා | 31 | 640-609 | 2 රාජවලිය 22:1-23:30 |
| යෙහෝවාහාස් | (මාස 3) | 609 | 2 රාජවලිය 23:31-33 |
| යොහෝයාකිම් | 11 | 609-597 | 2 රාජවලිය 23:34-24:5 |
| යොහෝයාමීන් | (මාස 3) | 597 | 2 රාජවලිය 24:6-16 |
| ශෙදෙකියා | 11 | 597 | 2 රාජවලිය 24:17-25:30 |

## හතරවන වගුව: පරණ ගිවිසුමේ දිවැසිවරු

පරණ ගිවිසුමේ පොත් අතරින් බොහොමයක් පොත් දිවැසිවර ග්‍රන්ථ වන බැවින් මෙම දිවැසිවරු ජීවත් වූ කාලය හෝ ඔවුන් දිවැසිවැකි පැවසූ කාලය ගැන දැන සිටීම වැදගත් වේ. දිවැසිවරුන්ගේ කාලපරිච්ඡේදයේ සිදුවූ සිදුවීම් වල දින වකවානු දැනගැනීම පිණිස මෙම වගුව පාවිච්චි කරන්න.

| දිවැසිවරයාගේ නම | දිවැසිවැකි පැවසුවේ කාහටද | දිනවකවානු |
|---|---|---|
| යෝනා | අසරිය | වහල්බවට පත්වීමට පෙර (800-650) |
| නාහුම් | අසරිය | වහල්බවට පත්වීමට පෙර (800-650) |
| ඔබදියා | ඒදොම් | වහල්බවට පත්වීමට පෙර (800) |
| හොෂෙයා | ඉශ්‍රායෙල් | වහල්බවට පත්වීමට පෙර (750) |
| ආමොස් | ඉශ්‍රායෙල් | වහල්බවට පත්වීමට පෙර (750) |
| යෙසායා/යෙරෙමියා | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| යෙරෙමියා/විලාප ගී | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| යොවෙල් | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| මීකා | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| හබක්කුක් | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| ශෙපනියා | යුදය | වහල්බවට පත්වීමට පෙර (800-606) |
| එසකියෙල් | යුදය | වහල්බවේ කාලයේදී (606-536) |
| දානියෙල් | යුදය | වහල්බවේ කාලයේදී (606-536) |
| හග්ගයි | යුදය | වහල්බවින් පසුව (536-400) |
| සෙකරියා | යුදය | වහල්බවින් පසුව (536-400) |
| මලාකි | යුදය | වහල්බවින් පසුව (536-400) |

## බයිබලය ලියැවුණු කාලයේ ජන ජීවිතය

බයිබලය ලියැවුණු කාලයේ ජන ජීවිතය පිළිබඳව බයිබලයේ, ඉතිහාසඥයින් විසින් හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන්ගෙන් තොරතුරු හෙළි වී තිබේ. ඊජිප්තුවට යාමට පෙර ගෙවූ කාලයේදී ඉශ්‍රායෙල් ජනතාව කූඩාරම්වල ජීවත්වූහ. නැවුම් තණකොළ හා ජලය ඇති තැන් සොයමින් ඔවුහු තම සත්ව රැළවල් සමඟ එහා මෙහා ගියහ.

ඊජිප්තුවෙන් නික්මයාම හා වසර ගණනක් පාළුකරයේ ගෙවීමෙන් අනතුරුව, ඉශ්‍රායෙල් සෙනඟ තම පොරොන්දු දේශය වූ කානාන් දේශයෙහි පදිංචි වූහ. ඒ කාලයේ පටන් සාමාන්‍ය ජන ජීවිත රටාවකට හුරු වූ අතර වසර ගණනක් ගත වුවද එය වෙනස් වූයේ සුළු වශයෙනි.

කාන්තාවන් හා දරුවන් නිවසේ සිටි අතර ගැමි පුරුෂයෝ කුඹුරුවල හෝ වෙනත් ගැමි කර්මාන්තයක නියැලුණහ. ගොවිතැන හා එඬේර වෘත්තිය වැදගත් රැකියාවන් විය. මසුන් ඇල්ලීම හා වඩු කර්මාන්තය, කුඹල් කර්මාන්තය හා සම් කර්මාන්තය වැනි ගැමි කර්මාන්තය ද විය.

වසරේ බොහෝ කාලයක් දේශය උණුසුම් හා වියළි තත්වයක පැවති බැවින් ජල සැපයුම ඉතා සුළු ප්‍රමාණයක් විය. ගම්මානයේ ඇති ළිං වලින් එළු හමින් තනන ලද භාජනයක් භාවිතයෙන් ජලය ගනු ලැබීය. කාන්තාවන්ට සමාජගත වීමට මෙය වැදගත් ස්ථානයක් විය.

සිසිලස පවත්වා ගැනීම උදෙසා පුද්ගලයන් දිගු වස්ත්‍ර අඳින ලදි. එම සළුවේ රෙදි වර්ගය ධනය අනුව තීරණය විය. ධනවත් පුද්ගලයන්ට දීප්තිමත් වර්ණ යෙදූ රෙදි ලබාගත හැකි විය. බොහෝ විට ඇඳුම් වලින් පුද්ගලයාගේ වෘත්තිය නිරූපණය විය. උදාහරණයක් වශයෙන් පූජකයෙකු විශේෂ ඇඳුම් ඇන්ද අතර රබ්බිවරු (ඉශ්‍රායෙලයේ ආගමික නායකයන්) නිල් පැහැති දාවල්ලක් සහිත සළුවක් පැලඳුහ. පාවහන් හරක් හමෙන් සාදා තිබූ අතර විලුඹ ආවරණය වන ආකාරයෙන් වළලුකර දක්වා ගැටගැසිය හැකි ආකාරයේ සම් පටි සහිතව ඒවා සාදා තිබුණි.

විවාහයන් දෙමාපියන් විසින් සූදානම් කරන ලද අතර තරුණ පුද්ගලයෝ සුළු වශයෙන් සාමාජීයව සම්මිශ්‍රණය වූහ. භාර්යාව යනු වැඩ කරන්නාවූ වත්කමක් බැවින් ඇය උදෙසා මිලයක් ගෙවිය යුතු විය. ගෘහාශ්‍රිත ජීවිතය නිවස කේන්ද්‍රකරගෙන තිබුණි.

පරණ ගිවිසුම් යුගයේදී සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ දරුවන්ට ඉගෙන ගැනීමට පාසල් නොවීය. ඔවුන්ගේ දෙමව්පියන් විසින් ඔවුන්ට කුසලතාවයන් හා ධර්මය උගන්වනු ලැබීය. යේසුස්වහන්සේගේ කාලය වන විටත්, ගැහැණු දරුවකුගේ අධ්‍යාපනය පිළිබඳ වගකීම සම්පූර්ණයෙන්ම ඇයගේ මව මත පැවරී තිබුණි. පිරිමි දරුවන් වයස අවුරුදු හයේ පටන් සිනගෝගයේ තිබූ පාසලකට යවනු ලැබීය. ඉතිහාසය භූගෝලය සාහිත්‍යය හා ව්‍යවස්ථාව ඉගෙන ගන්නා පිණිස ඔවුන් විසින් යොදාගත් පොත වූයේ පරණ ගිවිසුමයි. ව්‍යාතිරේකී ශිෂ්‍යයන්ට පමණක් යෙරුසලමට ගොස් රබ්බිවරුන්ගෙන් ඉගෙන ගැනීමට අවස්ථාව හිමිවිය. සෑම පිරිමි දරුවෙකු විසින්ම යම් ව්‍යාපාරයක්ද ඉගෙන ගත යුතු විය. පිරිමි දරුවෙකුට වයස අවුරුදු 13ක් වූ විට ඔහු "බාර් මිට්ස්වා" යන තත්වයට පත්වේ. "ව්‍යවස්ථාවේ පුත්‍රයා" යන්න හඟවන යුදෙව් වචනය එයයි. මෙහි අර්ථය නම් ඔහු පුරුෂයෙකු වශයෙන් සලකනු ලබන බවයි.

ඉශ්‍රායෙල් සෙනඟ අතර සිදු වූ මරණයත්, විවිධාකාර වැළපීමේ අවස්ථාවන්ගෙන් සමන්විත විය. වෘත්තිමය වැළපෙන්නන් කුලියට ගැනීමේ, හැකියාව විය. නව ගිවිසුම් කාලය වන විට ශරීරයන් ආලේප කර විශේෂ සොහොන් රෙදි වලින් ඔතන ලදී. දිළිඳු පුද්ගලයන්ව පොදු සොහොන් ගෙවල් හෝ ලෙන්වල භූමදාන කරන ලදී. නමුත් ධනවත් පුද්ගලයන්ට ගල්වලින් සාදන ලද හා පැතලි ගලකින් මුද්‍රා තබන ලද සොහොන් ගෙවල් විය.

ඉශ්‍රායෙලයේ සිවිල් හා ආගමික නීතිය අතර කිසිදු වෙනසක් නොවීය. ප්‍රශ්න ඇති වූ විට ඒවා නිල වශයෙන් විනිශ්චය කරන ලද ස්ථානය වූයේ නගරයේ හෝ ගම්මානයේ දොරටුව අසල වේ. නව ගිවිසුම් යුගයේ තිබූ ඉහළම අධිකරණය වූයේ දේවමාලිගයේ රැස් වූ පුරුෂයන් 70 දෙනෙකුගෙන් සමන්විත සැන්හෙඩ්‍රින් සභාවයි. නව ගිවිසුම් යුගයේදී ඉශ්‍රායෙලය පාලනය කළා වූ රෝම අධිපතීන්, මරණ දඬුවම් හැර අනෙක් ඕනෑම දඬුවමක් තම නීතිය අනුව පැනවීමට ඉශ්‍රායෙල් සෙනඟට ඉඩ දී තිබුණි.

ඉශ්‍රායෙලයේ ආගමික ජීවිතය මුල්කාලීනව මණ්ඩපය මත කේන්ද්‍රගත කර තිබූ අතර පසුව එය යෙරුසලමේ දේවමාලිගය කේන්ද්‍රගතකර ගත්තේය. පරණ ගිවිසුමේ ආගමික රෙගුලාසි පූජකයන් විසින් හා ලෙවීවරු විසින් පරිපාලනය කරන ලදී. වසරේ වැදගත්ම ආගමික දිනය වනුයේ වන්දි ගෙවීමේ දිනයයි (day of Atonement). මේ දිනයේදී තමන්ගේම පව් උදෙසාත් සෙනඟගේ පව් උදෙසාත් වන්දි ගෙවනු පිණිස උත්තම පූජකයා දේවමාලිගයේ ඇති අතිශුද්ධස්ථානය වෙත ගමන් කරයි.

අනෙකුත් උත්සව අතර, ඉශ්‍රායෙල් සෙනඟ ඊජිප්තුවෙන් පිටව යාම පෙන්නුම් කරන්නාවූ පාස්කු මංගල්‍යය වැදගත් වේ. පෙන්තකොස්ත මංගල්‍යය අස්වැන්නේ ආරම්භය පෙන්නුම් කරන අතර, කූඩාරම් මංගල්‍යය අස්වැන්නේ මංගල්‍යයයි. පූරිම් මංගල්‍යය එස්තර් විසින් ඉශ්‍රායෙල් සෙනඟ ගළවා ගැනීම මතක් කර දෙන අතර, හොරණෑ මංගල්‍යය නව වසරේ ආරම්භය සංකේතවත් කරයි.

පැරණි ගිවිසුමේ අවසානය පටන් නව ගිවිසුමේ ආරම්භය දක්වා වූ කාලය අතරතුරදී නමස්කාරය ප්‍රධාන දේවමාලිගයේ සිට ප්‍රාදේශීය සිනගෝග වෙත මාරුවිය. මෙම පුරුද්ද ආරම්භ වූයේ ඉශ්‍රායෙල් සෙනඟ වහල් බවට හසු වී යෙරුසලමේ දේව මාලිගයක් නොමැති වූ කාලයේදීය. සිනගෝගයේ පැවති දේව මෙහෙයන්හිදී ක්‍රියාකාරී කොටසක් ඉසිලුවේ පුරුෂයන් පමණි. කාන්තාවන් හා දරුවන් වෙනමම කොටසක හිඳ ගත්හ. දේව මෙහෙයේ රටාව තුළ ඇදහිල්ල පිළිබඳ ප්‍රකාශයක්, යාච්ඤාවන් හා ව්‍යවස්ථාවන් හා දිවැසිවර ග්‍රන්ථවලින් කොටසක් කියවීම වැනි දේවල් අන්තර්ගත විය. මෙයින් අනතුරුව දේශනාවක් ද පුරුෂයන්ට සේවකයාගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාවක්ද ලබා දෙන ලදී.

පරණ ගිවිසුමේ ශුද්ධලියවිලි ශුද්ධවූ අකුලන පොත් වල ලියා තිබූ අතර ඒවා විවෘත කළ හැකි වූයේ ව්‍යවස්ථාව පිළිබඳ ආචාර්යවරුන්ට පමණි. හැකි අවස්ථාවලදී යළි ගොඩනඟා තිබූ යෙරුසෙලමේ දේවමාලිගය වෙත ගියහ. මෙම දේවමාලිගය පරණ ගිවිසුම් සමයේ තිබූ සාලමොන්ගේ දේවමාලිගයට සමාන වූ නමුත් ප්‍රමාණයෙන් විශාල විය.

බයිබලයේ කතාන්දරය ලියැවී ඇත්තේ ශතවර්ෂ ගණනාවක් පුරා නොවෙනස් වූ සම්ප්‍රදායික පවුල හා ග්‍රාමීය ජීවිතය පිළිබඳ මෙම පසුබිම තුළ වේ. එසේම ඉශ්‍රායෙලය වටා තිබූ රණකාමී අධිරාජ්‍යයන් හා රෝම අධිරාජ්‍යයේ බලපෑම ද එයට පසුබිම් වී ඇත. යේසුස්වහන්සේගේ කාලය වන විට රෝමය ඉශ්‍රායෙල් සෙනඟ පාලනය කිරීම දක්වා ව්‍යාප්ත වී තිබිණි.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. ගැළපිම : පළමු ලැයිස්තුවේ ඇති එක් එක් කාලපරිච්ඡේදයට හොඳින්ම ගැළපෙන නිර්වචනය දෙවන ලැයිස්තුවෙන් සොයා එහි අක්ෂරය ඉදිරියේ ඇති හිස්තැන මත ලියන්න.

| පළමු ලැයිස්තුව: කාලපරිච්ඡේද | දෙවන ලැයිස්තුව |
|---|---|
| _______මැවීමේ සිට ආබ්‍රහම් දක්වා | අ. ක්‍රියා පොත හා යැවුම් පත්‍ර මේ පිළිබඳ කතාන්දරය ඉදිරිපත් කරයි. |
| _______ආබ්‍රහම් සිට මෝසෙස් දක්වා | ආ. මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් පොත් මෙම කතාන්දරය විස්තර කරයි. |
| _______නික්මයාම | ඇ. ඉශ්‍රායෙල් සෙනඟ ඊජිප්තු වැසියන්ගෙන් නිදහස් වීම. |
| _______ජයගැනීම | ඈ. මෙම කාලපරිච්ඡේදය තුළදී ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශය අත්පත් කරගත්හ. |
| _______විනිශ්චයකාරයා | ඉ. මෙය මහත් ලෙස පාපය වැඩි වූ කාලයක් වූ අතර ඉශ්‍රායෙල් ගළවාගනු පිණිස දෙවියන්වහන්සේ විනිශ්චයකාරයෝ නැගිටෙවූ සේක. |
| _______රාජධානිය | ඊ. මේ කාලපරිච්ඡේදයේදී ඉශ්‍රායෙලය රාජධානි දෙකකට බෙදුණි. |
| _______රාජධානින් දෙක | උ. සාවුල්, දාවිත් හා සලමොන් රජවරු ලෙස රජකම් කළ කාලයයි. |
| _______යුදය තනිවීම | ඌ. මේ කාලපරිච්ඡේදය තුළදී ඉශ්‍රායෙලය හා යුදය බැඳීම්වලට යටත්ව සිටියහ. |
| _______වහල්භාවය | එ. යෙරුසලම හා දේවමාලිගය මේ කාලපරිච්ඡේදයේදී යළි ගොඩනඟන ලදී. |
| _______ප්‍රතිස්ථාපනය | ඒ. එකම රාජධානිය වූයේ යුදයයි. |
| _______ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය | ඔ. නෝවා, කායින්, ආබෙල් හා බාබෙල් කොත පිළිබඳ කතන්දරය සිදුවූයේ මෙම කාලයේදීය. |
| _______ශුභාරංචිය ව්‍යාප්තවීම | ඕ. ආබ්‍රහම්, ඊසාක්, යාකොබ් හා යෝසෙප් මේ කාලයේ සිටි ප්‍රධාන චරිත විය. |

3. ඉතිහාසය හෝ කාලානුක්‍රමික අධ්‍යයනය කියන්නේ ________________ සිදුවූයේද යන්නයි.

4. බයිබල් පුරාවිද්‍යාව යනු කුමක්ද?

______________________________________________

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඔබ බයිබලයේ කාලානුක්‍රමික අධ්‍යයනය පිළිබඳව උනන්දුවක් දක්වයි නම්, ලෝක බයිබල් ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කර ඇති New Chronological Bible නමැති බයිබලය ලබාගන්න. මෙය කාලානුක්‍රමිකව සකස් කරන ලද King James පරිවර්තනයේ බයිබලයකි. මෙහි අදහස නම් පොත් වශයෙන් බයිබලය සංවිධානය කරනු වෙනුවට (උත්පත්ති සිට එළිදරව් දක්වා) පරිච්ඡේද හා බයිබල් පද ඉදිරිපත් කර ඇත්තේ අතීතයේ හෝ අනාගතයේ සිදුවීම් සිදුවූ හෝ සිදුවීමට ඇති පිළිවෙළ අනුව වේ.

   මෙම බයිබලය තුළ උත්පත්ති සිට එළිදරව් දක්වා අන්තර්ගත දේවල් ප්‍රධාන කොටස් දොළහක් යටතේ ඉදිරිපත් කර ඇත.

   - අතීත ලෝකයේ වර්ධනය
   - ඉශ්‍රායෙලය ගෝත්‍රයක් ලෙස වර්ධනය වීම
   - ඉශ්‍රායෙලය ජාතියක් ලෙස වර්ධනය වීම
   - ඉශ්‍රායෙලය රාජධානියක් ලෙස වර්ධනය වීම
   - ඉශ්‍රායෙලය රාජධානීන් දෙකකට බෙදීම
   - ඉශ්‍රායෙලයේ දකුණු රාජධානිය නොනැසී පැවතීම
   - ඉශ්‍රායෙලය බබිලෝනියේ වහල්කමට හසුවීම
   - ඉශ්‍රායෙලය ජාතියක් ලෙස ප්‍රතිස්ථාපනය වීම
   - ගිවිසුම් දෙක අතරමැද කාලය තුළදී ඉශ්‍රායෙලයේ පැවැත්ම
   - (මෙය පැරණි ගිවිසුම හා නව ගිවිසුම අතරමැද කාලයයි)
   - පොළොව මත දේවරාජ්‍යය ආරම්භ වීම.
   - පොළොව මත දේව රාජ්‍යය දිගටම පැවතීම
   - පොළොව මත දේව රාජ්‍ය සම්පූර්ණත්වයට පත්වීම

Harvest House Publishers , Eugene, Oregon ප්‍රකාශයට පත් කරන ලද The Narrated Bible පිටපතද කාලානුක්‍රමික අධ්‍යයනය සඳහා හොඳ උපකරණයකි. මෙම පොත තුළ බයිබල් පද ඒ ආකාරයෙන්ම සඳහන් කර නැත. නමුත් එක් එක් බයිබල් පද පිළිබඳ කෙටි විස්තරයක් (විචාරයක්) සමග කාලානුක්‍රමික අධ්‍යයනය සඳහා බයිබල් පද පමණක් ඉදිරිපත් කර තිබේ.

2. ඔබ බයිබල් පුරාවිද්‍යාව පිළිබඳව උනන්දුවක් දක්වන්නේ නම්, පහත සඳහන් පොත් යෝජනා කළ හැකිය.

*Beginnings In Biblical Archaeology* by Howard Vos Published by Moody Press, Chicago, Illinois, U.S.A.

*Archaeology* in Bible Lands by Howard Vos Published by Moody Press, Chicago, Illinois, U.S.A.

# අට වන පරිච්ඡේදය

# සැකිල්ලක් සෑදීම, ලකුණු කිරීම, වගුගත කිරීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බයිබලය ලකුණු කිරීමේ ක්‍රමයක් පාවිච්චි කිරීමට,
- සැකිල්ලක් නිර්මාණය කිරීමට
- සාරාංශගත කළ වගුවක් නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

> **ඔබගේ ශික්ෂා සදාකාලේටම ධර්මිෂ්ඨය. මා ජීවත්වන පිණිස මට නුවණ දුන මැනව. (ගීතාවලිය 119:144)**

## හැඳින්වීම

මෙම මූලික කුසලතා තුන දියුණු කර ගැනීම ඕනෑම බයිබල් අධ්‍යයන ක්‍රමයක වර්ධනයට හේතු වනු ඇත. මෙම කුසලතාවයන් නම් සැකිල්ලක් නිර්මාණය කිරීම, ලකුණු කිරීම හා වගුගත කිරීමයි. මෙම පරිච්ඡේදයේ විෂයන් වී ඇත්තේ ඒවාය.

## ලකුණු කිරීම

ලකුණු කිරීම යනු ප්‍රධාන බයිබල් කොටස් ඉස්මතු කර පෙන්වීමේ ක්‍රමයකි. යම් නිශ්චිත විෂයකට සම්බන්ධ බයිබල් පද සොයා ගැනීමේදී ලකුණු කර තිබීම ඔබට උපකාරයක් වනු ඇත. ඔබගේ බයිබලය ලකුණු කිරීම උදෙසා තෝරාගත් පද යටින් ඉරි ඇදිය යුතු වේ. ඔබ සතුව විවිධ වර්ණයේ පාට පැන්සල් තිබේ නම් ඉරි ඇඳි පද වර්ණ ගැන්විය හැකිය. ඔබ සතුව පාට පැන්සල් නොමැති නම් ප්‍රධාන පද අසල තිරුවේ ඔබට යම් සලකුණක් යෙදිය හැක.

පහත සඳහන් පරිදි වර්ණ භාවිත කරන්න.

**රතු :** ගැළවීම හා සම්බන්ධවන පද සඳහා රතු පාටින් ලකුණු කරන්න. රතු පාටින් සංකේතවත් කරනුයේ යේසුස්වහන්සේගේ රුධිරයයි. ගැළවීම පිළිබඳ බයිබල් පද ඇඟවීම සඳහා ඔබට කුරුසියක සලකුණක් ද යෙදිය හැක.

**කොළ :** මෙය වර්ධනය වන්නා වූ දේවල් වල පැහැයයි. ආත්මික වර්ධනය පිළිබඳ පද යටින් ඉරි ඇඳීමට මෙම වර්ණය යොදාගන්න. වර්ධනය සංකේතවත් කිරීමට ඔබට මලක් ඇඳීමටද හැකිය.

**නිල් :** මෙය ආකාශයේ වර්ණයයි. යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම, නව යෙරුසලම, අලුත් අහස ආදියට සම්බන්ධ පද යටින්, ඉරි ඇඳීමට මෙම වර්ණය යොදාගන්න. ඔබ සලකුණු යොදා ගන්නේ නම් මෙම පද ලකුණු කිරීම පිණිස ඔබගේ බයිබලයේ පැත්තෙන් ඇති ඉඩෙහි ඔටුන්නක සළකුණක් යොදන්න. ඔටුන්නෙන් සංකේතවත් කරනුයේ ස්වර්ග රාජ්‍යයයි.

**දුඹුරු :** අස්වැන්න නෙළීමට සූදානම් වූ තිරිඟු කෙත දුඹුරු පැහැතිය. ශුභාරංචි සේවය ගැන කතා කරන විට යේසුස්වහන්සේ අස්වැන්න උදාහරණයට ගත් සේක. ශුභාරංචි සේවය හා සම්බන්ධ බයිබල් පද ලකුණු කිරීම සඳහා දුඹුරු පැහැය යොදා ගත්හ. අංකය යන වචනය වෙනුවට යොදන සළකුණක් වන (#) ලකුණද ඔබට පාවිච්චි කළ හැකිය. තවමත් ශුභාරංචියට සවන් දීමට සිටින මහත් ජන සංඛ්‍යාව ඔබට මතක් කරදීම සඳහා එය පාවිච්චි කරන්න.

වෙනත් වැදගත් විෂයන් පිළිබඳ බයිබල් පද ලකුණු කිරීම සඳහා **ඔබට අතිරේක වර්ණ** භාවිත කළ හැකිය: දම් පාට, රෝස පාට, කහ පාට, කලු පාට ආදිය.

විවිධ ලකුණු වලට ඔබ විසින් අර්ථයක් එකතු කර ඒවා ද භාවිත කළ හැකිය ♥☼✞✞✶●▲←➲

## සැකිල්ලක් නිර්මාණය කිරීම

සැකිල්ලක් නිර්මාණය කිරීම යනු අධ්‍යයන සටහන් සංවිධානය කිරීමේ ක්‍රමයකි. සේවයේදී හා අනාගත අධ්‍යයනයන්හිදී භාවිත කළ හැකි පරිදි එමගින් තොරතුරු සාරාංශ කර පෙන්වයි. සැකිල්ල තෝරාගත් තේමාවක් කේන්ද්‍රගත කර ගනී. මෙම තේමාව සාමාන්‍යයෙන් සැකිල්ලේ මාතෘකාව වන අතර එමගින් අධ්‍යයනය කරන්නාවූ විෂය පෙන්නුම් කරයි.

අධ්‍යයනයේ විෂය හඳුනාගැනීමෙන් අනතුරුව, ඊළඟ පියවර වනුයේ එම විෂය සම්බන්ධයෙන් පවසන්නාවූ ප්‍රධාන කරුණු හඳුනාගැනීමයි. ඊළඟට, අනු කරුණු තිබෙනු ඇත. “අනු” යන උපසර්ගයෙන් පැහැදිලි වනුයේ එය ප්‍රධාන කරුණ යටතේ වන කරුණක් හෝ ප්‍රධාන කරුණ පිළිබඳව යමක් පවසන්නාවූ කරුණක් වන බවයි.

සැකිල්ලක් සැකසීමට හැකි ආකාරයන් බොහෝමයකි. ප්‍රධාන කරුණු පෙන්වීම සඳහා රෝම ඉලක්කම් යන විශේෂ ඉලක්කම් වර්ගය යොදාගන්නාවූ ක්‍රමයක් අප විසින් තෝරාගෙන තිබේ. රෝම ඉලක්කම් ඔබට හුරු පුරුදු නොවන්නේ නම්, මෙම පරිච්ඡේදයේ තවදුරටත් අධ්‍යයනය සඳහා වන කොටසේ ලයිස්තුවක් ඉදිරිපත් කර තිබේ.

සැකිල්ලේ ඇති අනු කරුණු හෝඩියේ අක්ෂර ඇසුරෙන් පෙන්වා තිබේ. තවත් කරුණු තිබේ නම්, ඒවා සාමාන්‍ය ඉලක්කම් ආශ්‍රයෙන් පෙන්නුම් කළ හැකිය. සැකිල්ලක් නිර්මාණය කරන ආකාරය පෙන්වන්නාවූ පහත උදාහරණය අධ්‍යයනය කරන්න.

### මාතෘකාව මෙහි යොදන්න.

I. පළමු කරුණු උදෙසා යොදාගන්නාවූ අංක "1" වෙනුවට යොදන රෝම ඉලක්කම මෙයයි.

අ. ප්‍රධාන කරුණ හා සම්බන්ධවන්නාවූ අනුකරුණ උදෙසා යොදන අක්ෂරය මෙය වේ.

1. මේ හා සම්බන්ධ වන තවත් කරුණක් වුයේ නම්, අංක 1 යොදා එය ලකුණු කරනු ඇත.
2. ඇතැම්විට අ අක්ෂරයෙන් දක්වන කරුණ හා සම්බන්ධ තවත් කරුණු තිබිය හැකිය. එසේ නම්, අංක අනුපිළිවෙළින් ඒවා සඳහන් කරන්න.

ආ. ප්‍රධාන කරුණු අංක I ට අනු කරුණු කිපයක් තිබිය හැකිය. එසේනම් අකරාදි පිළිවෙළට අක්ෂර යොදමින් ඒවා සටහන් කරන්න. මෙම සෑම කරුණක්ම ප්‍රධාන කරුණට සම්බන්ධ විය යුතුයි.

II. තවත් ප්‍රධාන කරුණක් ඉදිරිපත් කිරීමට ඊළඟ රෝම ඉලක්කම යොදාගන්න.

අ. සෑම ප්‍රධාන කරුණකටම පසුව එකම රටාව අනුව අනුකරුණු ඉදිරිපත් කළ යුතුවේ.

උදාහරණයක් වශයෙන් රෝම 12:1-2 හි කෙටි සැකිල්ලක් අප විසින් නිර්මාණය කර තිබේ. පළමුව මෙම පද කියවන්න.

**එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙන්න. (රෝම 12:1-2)**

මෙම කොටසේ සැකිල්ල මේ ආකාර වේ.

### දේව කැමැත්ත සොයා ගැනීමේ පියවර

I. නුඹලාගේ ශරීරය ජීවමාන යාගයක් ලෙස ඔප්පු කරන්න.

අ. එය ශුද්ධ විය යුතුය.
ආ. දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි විය යුතුය.

II. මේ ලෝකයේ ආකාරයට සමාන නොවන්න.

අ. අන්‍යාකාර ඇත්තෝ වෙන්න.
1. අප අන්‍යාකාර ඇත්තන් වන්නේ සිත අලුත් කරගැනීමෙනි.

III. මෙම පියවරයන් දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා දැන ගැනීමට (සොයාගැනීමට) අපට උපකාරී වනු ඇත. එම කැමැත්ත.

අ. යහපත්ය
ආ. පිළිගතයුතුය
ඇ. සම්පූර්ණය

රෝම 12:1-2 හි සඳහන් දේව කැමැත්ත දැනගැනීමේ පියවරයන් මෙම සැකිල්ල තුළ පැහැදිලිව සාරාංශගත කර ඇති ආකාරය ඔබට දැකගත හැකිය.

## වගුගත කිරීම

අධ්‍යයනය සඳහා යොදාගන්නා කාරණා සංවිධානය කිරීමේ තවත් ක්‍රමයක් වනුයේ වගුගත කිරීමයි. මෙම කුසලතාවය වර්ධනය කරගැනීමට ඔබට උපකාර කරනු පිණිස මෙම පාඨමාලාව තුළදී ඔබ විසින් සම්පූර්ණ කිරීම පිණිස වගු කිහිපයක් ඉදිරිපත් කර තිබේ. ඔබ විසින් අධ්‍යයනය කර ඇති දේවල් දෘශ්‍ය රූප බවට පත් කර ගැනීමට වගුවක් ඔබට උපකාර වන බැවින් වගුගත කිරීම වැදගත් වේ. ඔබ විසින් ඉගෙනගත් දේවල් කෙටියෙන් සාරාංශගත කිරීමට වගුගත කිරීම උපකාරයක් වන අතර ඒ දේවල් මතක තබාගැනීමටද එය ඔබට උපකාරයක් වනු ඇත.

වගුවක් නිර්මාණය කළ හැකි මූලික ආකාර දෙකකි :

### තිරස් වගු :

කඩදාසියක දිගු අතට ඔබගේ වගුව අඳින්න. ඔබගේ අධ්‍යයනයට අවශ්‍ය තරම් කොටස් ගණනකට එය බෙදා ගැනීම සඳහා පිටුව හරහා ඉරි අඳින්න. පොත් අධ්‍යයනය කිරීමේදී තිරස් වගු යොදාගැනීම යෝග්‍ය වේ. එකළොස්වන පරිච්ඡේදයේ ඔබට මේ සඳහා උදාහරණයක් හමුවනු ඇත.

### සිරස් වගු :

මේ ආකාරයේ වගු කඩදාසියක සිරස් අතට අඳිනු ලැබේ. විශාල සෘජුකෝණාස්‍රයක් අඳිනු ලබන අතර එය අභ්‍යන්තරයේ බෙදා තිබෙනු දැකිය හැකිය. කෙටි කරුණු ප්‍රමාණයක් අධ්‍යයනය කරන විට හෝ පරිච්ඡේද අධ්‍යයනය කරන විට සිරස් වගු ඉතාම යෝග්‍ය වේ.

යාකොබ් 1:26-27 සිරස් වගුවක යොදා ඇති ආකාරය පිළිබඳ උදාහරණයක් පහත දැක්වේ.

පළමුව බයිබල් කොටස කියවන්න.

> **යමෙක් තමාගේ දිව යටත්කර නොගෙන, තමාගේ සිත රවටාගනිමින්, තමා භක්තිවන්තයෙකැයි සිතන්නේ නම්, ඔහුගේ භක්තිය නිෂ්ඵල ය. අපගේ පියවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි පිරිසිදුවූ නොකිලිටුවූ භක්තිය නම්, මව්පියන් නැති දරුවන්ද වැන්දඹු ස්ත්‍රීන්ද ඔවුන්ගේ විපත්තියේදී බලාගැනීමත්, ලෝකයෙන් කිලුටු නොවන ලෙස තමාම ආරක්ෂාකරගැනීමත්ය. (යාකොබ් 1:26-27)**

දැන් වගුව අධ්‍යයනය කරන්න.

**ආගම පිළිබඳ පරීක්ෂණ**

| **පෞද්ගලික විස්තරය** | **පරීක්ෂණය** | **ප්‍රතිඵලය** | **භක්තිය** |
|---|---|---|---|
| භක්තිවන්තයෙක් යැයි සිතයි. | දිව යටත් කර ගැනීම | සිත රවටා ගැනීම | නිෂ්ඵල |
| ලෝකයෙන් කිලිටි නොවී සිටීම | දිළිඳුන් බලාගනී. තමා ශුද්ධව තබාගනී | දෙවියන්වහන්සේ ඉදිරියෙහි නොකිලිටුව සිටීම. | පිරිසිදුය නොකිලිටුය |

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පහත සඳහන් සැකිල්ලේ ඇති වරද කුමක්ද?

**මාතෘකාව**

I. මෙය පළමු ප්‍රධාන කරුණයි.

අ. මෙය ප්‍රධාන කරුණ හා සම්බන්ධ වන අනුකරුණකි.

ආ. මෙය දෙවන ප්‍රධාන කරුණයි

3. වගුගත කළ හැකි ප්‍රධාන ආකාරයන් දෙක කවරේද?

4. බයිබල් අධ්‍යයනය හා සම්බන්ධ කර බලන විට “ලකුණු කිරීම” යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යාකොබ් 3:2-6 ඔබගේ බයිබලයෙන් අධ්‍යයනය කර පහත සැකිල්ල සම්පූර්ණ කරන්න.

## මනුෂ්‍යයාගේ දිව

I. අප වචනයෙන් නොපැකිලේ නම් අප : (2 පදය බලන්න)

අ.

ආ.

II. කුඩා දේවල් හි ඇති බලය පිළිබඳ උදාහරණ :

අ. අශ්වයෙකුට දමන කටකලියාවක් අරමුණු දෙකක් පිණිස යොදාගනී. (3 පදය බලන්න)

1.

2.

ආ. නැවේ සුක්කානම : (4 පදය)

1.

ආ. කුඩා ගින්නක් : (5 පදය)

1.

III. දිව ද කුඩා අවයවයකි. නමුත් එය : (5-6 පද)

අ. ලොකුවට පාරට්ටු කරයි.

ආ. අධර්මිෂ්ඨකමේ ලෝකයක්ය.

ඇ.

ඈ.

ඉ.

2. යාකොබ් 3:2-6 හි කොටසක් ආවරණය කරන්නාවූ මෙම වගුව දැන් සම්පූර්ණ කරන්න.

| දිව : සැසඳීම | |
|---|---|
| **උදාහරණය** | **ප්‍රතිඵලය** |
| අශ්වයෙකුට දමන කටකලියාව | උන්ගේ මුළු ශරීරයම හරවයි |
| නැවක සුක්කානම | |
| කුඩා ගින්න | |
| මනුෂ්‍ය දිව | |

3. මෙම පරිච්ඡේදයේ දක්වා ඇති ක්‍රමය අනුව පෙළගැස්වීම් සකස් කිරීමේදී පහත සඳහන් රෝම ඉලක්කම් වගුව යොදාගත හැකිය.

1. I
2. II
3. III
4. IV
5. V
6. VI
7. VII
8. VIII
9. IX
10. X
11. XI
12. XII
13. XIII
14. XIV
15. XV
16. XVI
17. XVII
18. XVIII
19. XIX
20. XX

30. XXX
40. XL
50. L
60. LX
70. LXX
80. LXXX
90. XC
100. C

එක් එක් කොටස සඳහා දී ඇති රටාව අනුගමනය කරන්න.
(I, II, III) උදාහරණ වශයෙන් 32 යන්න යනුවෙන් XXXII ලිවිය හැකිය.

තුන්වන කොටස : නිර්මාණාත්මක බයිබල් අධ්‍යයනය

# නව වන පරිච්ඡේදය

# බයිබලය තුළින් බයිබලය අධ්‍යයනය කිරීම

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- බයිබලයේ පාවිච්චි කර ඇති දේව වචනයේ සළකුණු හඳුනාගැනීමට
- බයිබලය යොදාගනිමින් දේව වචනය අධ්‍යයනය කිරීමට
- දේව වචනයේ මූලාශ්‍රය හඳුනාගැනීමට
- දේව වචනයේ ඇති කිරි හා මාංශ වල වෙනස හඳුනාගැනීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය :

**ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යවත් දේ දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව. (ගීතාවලිය 119:18)**

## හැඳින්වීම

බයිබලය අධ්‍යයනය කිරීමට පටන්ගත හැකි හොඳම ක්‍රමයක් නම්, බයිබලය ඒ පිළිබඳව පවසන්නාවූ දෙය ඉගෙන ගැනීමයි. මෙම පරිච්ඡේදයට විෂය වී ඇත්තේ එයයි. මෙම පරිච්ඡේදය තුළදී බයිබලය තුළින්ම එළිදරව් වන්නාවූ දේව වචනය පිළිබඳ සළකුණු හා විශේෂිත කරුණු පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත.

අප ආයතනයේ බොහෝ පාඨමාලා වලදී අප යම් ශුද්ධ ලියවිලි පාඨයන් ඉදිරිපත් කරන විට, පාඩමේ සන්දර්භය තුළ අප ඒවා ලියා දක්වන්නෙමුව. එසේ කරනුයේ ඔබගේ කාලය ඉතිරි කිරීම පිණිසය. එහෙත් මෙම පාඩම තුළ ඇති බයිබල් පද යම් විශේෂ හේතුවක් නිසා අප එසේ ඉදිරිපත් කර නැත. මෙම පාඩමේ එක් පරමාර්ථයක් වනුයේ ඔබගේ බයිබලය භාවිත කරන ආකාරය ඔබට හුරු පුරුදු කිරීම බැවින් අප බයිබල් පදය පමණක් ලයිස්තුගත කර තිබේ. ඔබ පාඩම අධ්‍යයනය කරන විට, එක් එක් පදය ඔබගේ බයිබලයෙන් කියවා බලන්න.

බයිබලයේ පොත් ඇති ස්ථාන ඔබට හුරුපුරුදු නැතිනම්, ඔබගේ බයිබලයේ ඉදිරියේ ඇති පිටු දෙස බලන්න. බොහෝ බයිබල් වල එක් එක් පොත ආරම්භවන පිටු අංකය සඳහන් කළාවූ "පටුනක්" දැකිය හැකිය. යම් පොතක් ඉදිරියේ දමා ඇති අංකය සහිත පිටුවට පෙරළූ විට, එම පොතෙහි පළමු පරිච්ඡේදය ඔබට හමුවනු ඇත. ඉන්පසුව පරිච්ඡේදය හා පදය සොයා ගන්න.

| ගීතාවලිය | 119 | 89 |
|---|---|---|
| ▼ | ▼ | ▼ |
| පොතෙහි නම | පරිච්ඡේදයේ අංකය | පදයෙහි අංකය |

## දේව වචනයේ මූලාශ්‍රය

බයිබලයේ මූලාශ්‍රය දෙවියන්වහන්සේය. ගීතාවලිය 68:11 කියවන්න. දේව වචනයේ මූලාශ්‍රය දෙවියන්වහන්සේ බව මෙයින් තහවුරු කරයි. බයිබලය දෙවියන්වහන්සේගේ වචනය බවත් එහි

මුලාරම්භය මනුෂ්‍යයා නොවන බවත් 1 තෙසලෝනික 2:13 පැහැදිලි කරයි. යේසුස්වහන්සේ පොළව මත සේවය කළ කාලයේදී උන්වහන්සේ කතා කල වචන වල මුලාශ්‍රය දෙවියන්වන්සේ බව උන්වහන්සේ පැහැදිලි කළ සේක. යොහන් 14:10 හා 24: 17:8 හා 14, හා 3:34 බලන්න.

## දේව වචනයේ ඉතිහාසය

"දේව වචනය කොතරම් කාලයක් පැවත තිබේද?" හා "දෙවියන්වහන්සේගේ වචන මුල් වරට ලියා තැබුවේ කවුරුන් විසින්ද?" යන ප්‍රශ්නවලට පිළිතුරු සපයමින්, බයිබලය එහි ඉතිහාසය පිළිබඳව බොහෝ දේ එළිදරව් කරයි. හෙබ්‍රෙව් 11:3 කියවන්න. අප ජීවත් වන ලෝකය දෙවියන්වහන්සේගේ වචනයෙන් නිර්මාණය කරන ලද බව මෙම පදයෙන් දක්වයි. ඔබගේ බයිබලයේ උත්පත්ති 1 වන පරිච්ජේදයේ සඳහන් කතන්දරය කියවීමෙන් මෙය සත්‍ය බව ඔබට වැටහෙනු ඇත. සැබවින්ම දෙවියන්වහන්සේගේ වචනවලින් ලෝකය නිර්මාණය කරනු ලැබීය. 2 පේතෘස් 3:5-7 හි ඔබට මේ පිළිබඳව වැඩි විස්තර කියවිය හැකිය. උන්වහන්සේ තමන්ගේ බලවත් වචනයෙන් ලෝකය හා එහි ඇති සියල්ල දරමින් සිටින බව හෙබ්‍රෙව් 1:3 හි පවසයි. දෙවියන්වහන්සේගේ වචනයෙන් ආකාශය මවන ලද බව ගීතාවලිය 33:6 හි පවසයි.

දෙවියන්වහන්සේ සදාකාලිකය. උන්වහන්සේට ආරම්භයක්ද අවසානයක්ද නැත. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් වෙන් කළ නොහැකි බැවින් (උන්වහන්සේ වාක්‍යාණෝය), වචනයටද ආරම්භයක් හා අවසානයක් නොමැත. දෙවියන්වහන්සේ මෙන්ම, උන්වහන්සේගේ වචනයද හැමවිටම පැවතී තිබේ. ඔබගේ බයිබලයේ නික්මයාම 20:1-17 කියවන්න. දේව වචනය ලිවීම පිණිස දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයාට (මෝසෙස්) ආනුභාවය ලබා දීම පිළිබඳව මුල්වරට වාර්තා වන්නේ මෙහිය.

ඔබගේ බයිබලයෙන් යොහන් 1 වන පරිච්ජේදය කියවන්න. 1-5 දක්වා හා 14 යන පද කියවා බලන්න. මෙම බයිබල් කොටස තුළ වාක්‍යාණෝ වශයෙන් සලකා ඇත්තේ යේසුස්වහන්සේය. පටන්ගැන්මේදී වාක්‍යාණෝ (යේසුස්වහන්සේ) දෙවියන්වහන්සේ හා සමග සිටි බවත් දෙවියන්වහන්සේව සිටි බවත් එයින් එළිදරව් කරයි. දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනය විසින් ලෝකය මවන ලද ආකාරය එයින් තහවුරු කරයි.

යේසුස්වහන්සේ හැමවිටම දෙවියන්වහන්සේ සමග සිටි සේක. එහෙත් වාක්‍යාණෝ (යේසුස්වහන්සේ) මාංසවත්වී මනුෂ්‍යයෙකු ලෙස පොළොවේ ජීවත් වීමට පැමිණ ඇති ආකාරය 14 වන පදය පවසයි. තමන්ගේම සෙනඟ උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ ආකාරයත් උන්වහන්සේ ලබාගන්නා අයට දෙවියන්වහන්සේගේ දරුවන් බවට පත්විය හැකි බවත් 11-12 පදවලින් පවසයි.

## පොත්, අකුලන පොත් හා ගල්පුවරු

වසර ගණනාවක් පුරා විවිධාකාරයෙන් දේව වචනය ලියවී තිබුණි. ඒවා මෝසෙස් විසින් ගල් පුවරුවල ලියනු ලැබූ අතර (නික්මයාම 20:1-17) ඉශ්‍රායෙල් සෙනඟ පොරොන්දු දේශයට ඇතුළුවන විට මහා ගල් පුවරුවල ලියන ලදී (ද්විතීය කථාව 27: 1-8) .

දෙවියන්වහන්සේගේ වචනය පොත්වල (ද්විතීය කථාව 31:24-26) හා අකුලන පොත්වල (යෙරෙමියා 36:2) ලියන ලදී. අකුලන පොත් යනු දෙකෙළවර ලී කුරු යොදන ලද දිගු කඩදාසියකි. ඔබ අකුළන පොතක ලියන විට හෝ එය කියවන විට, එක් කෙළවරකින් පටන් ගෙන ක්‍රමයෙන් දිග හරිනු ඇත.

දෙවියන්වහන්සේ තම වචනයේ ආනුභාවයෙන් ගීත පවා ලියැවූ සේක. ද්විතීය කථාව 31:19-22 කියවන්න. දාවිත් කාව්‍යමය ස්වරූපයෙන් දේව වචනය ලියා තිබූ අතර ඒවා බොහෝවිට ගායනා කරනු ලැබේ. ගීතාවලිය පොත බයිබලයේ ඇති නමස්කාර හා ගීතිකා පොත වේ.

## බයිබලයේ අනුභාවය

බයිබලය ඒ පිළිබඳව එළිදරව් කරන්නාවූ වැදගත් දෙයක් වනුයේ එය දේවානුභාවයෙන් ලියැවී ඇති බවයි. තම පණිවුඩය ලියා තබනු පිණිස දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවය තුළින් ශුද්ධ වූ මනුෂ්‍යයන්ට කතා කළ සේක.

ඔබගේ බයිබලයේ 2 තිමෝති 3:16-17 කියවන්න. දේව වචනය ආනුභාවයෙන් ලියැවී ඇති බව මෙම පද වලින් ස්ථිර කරයි. කිතුනු ජීවිතයේ ප්‍රධාන අංග හතරකින් එය උපකාරී වන බවද පවසයි. එනම්,

- ඉගැන්වීම
- තරවටුව
- හික්මවීම
- ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීම.

මෙම පද දේව වචනයේ ප්‍රධාන අරමුණු වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව (පරිණතව) සියලු යහපත් ක්‍රියාවන්ට සූදානම්ව (බලගැන්වී) සිටිනු ඇත.

## සදාකාලික වචනය

ස්වභාවික ලෝකය සතු බොහෝ පොත් වලංගු වන්නේ කෙටි කාලයක් සඳහා පමණි. උදාහරණයක් වශයෙන් වෛද්‍ය විද්‍යාත්මක ක්‍රියාපටිපාටීන් පිළිබඳව ලියැවුණු පොතක් වලංගු වන්නේ වසර කිහිපයකට පමණි. වඩා හොඳ ඖෂධ හෝ වඩා හොඳ ප්‍රතිකාර ක්‍රම වර්ධනය වූ විට එම පොත තවදුරටත් අදාළ නොවේ.

දේව වචනය සදාකාලික වන අතර සෑම කාලයේදීම අදාළ කරගත හැකි වේ. එය අතීතයේදී අදාළ විය, වර්තමානයේදී අදාළ වේ එසේම එය අනාගතයේ දී ද අදාළ වනු ඇත. (ගීතාවලිය 119:89 කියවන්න)

1 පේතෘස් 1:23 කියවන්න. දේව වචනය සදාකාලිකව පවතිනවා පමණක් නොව එය සදාකාලිකව ජීවමාන ද වන බව මෙම පද වලින් එළිදරව් කරයි. දෙවියන්වහන්සේද එසේම වන අතර අතීතයේදී එසේම සිටි සේක. අප සේවය කරනුයේ ජීවමාන දෙවි කෙනෙකුට වේ. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් වෙන් කළ නොහැකිය. උන්වහන්සේ ජීවමාන බැවින්, උන්වහන්සේගේ වචනය ද ජීවමාන වන අතර එය සෑම කාලයකටම අදාළ වේ.

යෙසායා 40:8 කියවන්න. දේව වචනය සදාකාලිකව පවතිනු ඇති බව මෙම පදයෙන් තහවුරු කරයි. ස්වභාවික ලෝකය තුළ ඔබ වටා ඇති දේවල් මෙන් එය විනාශ නොවනු ඇත.

## ප්‍රධාන බෙදීම් ද්විත්වය

දේව වචනයේ ප්‍රධාන බෙදීම් දෙකක් පිළිබඳව බයිබලය කතා කරයි. දේව වචනයේ කිරි මෙන්ම දේව වචනයේ මාංස ද තිබේ. දේව වචනයේ කිරි යනු පහසුවෙන් වටහාගත හැකි මූලික සත්‍යතාවයන් වේ. දේව වචනයේ මාංස යනු ආත්මික පරිණත බව ළඟා කරන්නාවූ වඩා ගැඹුරු සත්‍යතාවයන් වේ. හෙබ්‍රෙව් 5:13-14 හා 1 පේතෘස් 2:2 හි ඔබට මේ පිළිබඳව කියවිය හැකිය.

## දේව වචනයේ පරමාර්ථය

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ වචනය ලබා දුන්නේ නිශ්චිත පරමාර්ථයන් ළඟා කරගැනීම උදෙසා වේ. පරමාර්ථයක් යනු ඉලක්කයක් හෝ අරමුණකි. බයිබලයට අනුව, ඇතැම් පරමාර්ථයන් පහත පරිදි වේ.

- වචනය ශුභාරංචිය කෙරෙහි ඇදහිල්ල ඇති කරයි : ක්‍රියා 4:4
- එය පවිත්‍ර කරයි : යොහන් 15:3 එපිස 5:26
- ඔබ සවන් දී විශ්වාසකරයි නම්, එය සදාකාල ජීවනය ගෙන දෙයි. යොහන් 5:24

- සදාකාලික විනිශ්චයේ පදනම එයයි : යොහන් 12:48
- දේව වචනයෙන් අපවිත්‍ර ආත්ම එළවා දමනු ලබයි : මතෙව් 8:16,ලූක් 4:36
- වචනය දේශනා කරන විට ශුභාරංචියේ සත්‍යතාව ඒත්තු ගන්වමින් හාස්කම් සහිත ලකුණු දැකිය හැකිය : මාර්ක් 16:20
- එය ගැළවීම පිළිබඳ සහතිකයක් ලබා දෙයි 1 යොහන් 1:2-6
- ඔබ වචනයෙන් නැවත ඉපදීම ලබා ඇත. : 1 පේතෘස් 1:23; ගීතාවලිය 119:41
- දේව වචනය ශුභාරංචියේ සත්‍යතාව පිළිබඳව වාර්තා සපයයි. 1 යොහන් 5:7
- දේව වචනයෙන් ඔබ පවිත්‍ර කරනු ලැබ තිබේ : 1 තිමෝති 4:5
- උන්වහන්සේගේ වචනයේ බලාපොරොත්තුව තිබේ. ගීතාවලිය 130:5;119:49,81
- දේව වචනය තුළ සුවය ඇත. ගීතාවලිය 107:20
- විනාශකාරයාගේ මාර්ගයෙන් එය ඔබව ආරක්ෂා කරයි. ගීතාවලිය 17:4
- එය ආත්මය හා ජීවනයයි. යොහන් 6:63
- එය ප්‍රීතිය හා සත්තෝෂය ගෙන දෙයි : යෙරමියා 15:16
- දේව වචනය තුළින් ඇදහිල්ල වර්ධනය වේ. රෝම 10:17
- එය සැනසිල්ල ගෙන දෙයි: 1 තෙසලෝනික 4:18; ගීතාවලිය 119:50,52
- එය ආත්මික පෝෂණය ගෙන දෙයි : 1 තිමෝති 4:6
- එය යාච්ඤාවන්ට පිළිතුරු ලබා දෙයි : යොහන් 15:7
- සාර්ථකත්වයට ඇති යතුර එයයි. යොෂුවා 1:8
- ඔබ එයට සවන් දී එය ආරක්ෂා කළහොත් ඔබ ආශිර්වාද ලබනු ඇත. ලූක් 11:28
- එය ආත්මික වර්ධනයට උපකාරී වේ. 2 තිමෝති 3:16-17
- එය ආරක්ෂා කළ විට ආශිර්වාදයද ආරක්ෂා නොකළ විට ශාපයද ගෙනදෙයි. ද්විතීය කථාව 28
- පරීක්ෂා කාලයේදී එය අවියකි. මතෙව් 4
- එය ආත්මයේ වෙනසක් ඇති කරයි. ගීතාවලිය 19:7
- එය නුවණ නැත්තන් ඥාණවන්ත කරයි : ගීතාවලිය 19:7
- එය ආලෝකවත් කරයි : ගීතාවලිය 19:8
- එය අනතුරු අඟවයි : ගීතාවලිය 19:11
- වචනය ආරක්ෂා කිරීමෙන් මහත් විපාක ලැබේ. ගීතාවලිය 19:11
- එය ස්වර්ගයට ඇතුළු වීමට අවසර දෙයි : එළිදරව් 22:14
- ධර්මිෂ්ඨකම තුළ ගමන් කිරීමේ ආශිර්වාදය එමඟින් ලබා දෙයි: ගීතාවලිය 119:1-3
- ඔබගේ සතුරන්ට, ගුරුවරුන්ට හා මුතුන්මිත්තන්ට වඩා එය ඔබව ප්‍රඥාවන්ත කරයි : ගීතාවලිය 119:98-104
- එය ප්‍රාණවත් කරයි : ගීතාවලිය 119:25
- එය ශක්තිමත් කරයි : ගීතාවලිය 119:28
- ඔබ කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ කරුණාවේ පදනම එයයි :ගීතාවලිය 119:58
- එය සතුට ගෙන දේ: ගීතාවලිය 119:92

  එය සරල පුද්ගලයාට තේරුම් ගැනීම ලබා දෙයි : ගීතාවලිය 119:130,169;104

  එය මිදීම ගෙනදෙයි : ගීතාවලිය 119:170

## වචනය හිස් නොවේ

අප දැක්කාවු ආකාරයට, දේව වචනයේ පරමාර්ථයන් රැසක් තිබේ. දේව වචනය එහි පරමාර්ථයන් ඉටුකරගනු ඇති බව බයිබලය උගන්වයි. යෙසායා 55:11 කියවන්න. මෙහිදී දෙවියන්වහන්සේ පවසනුයේ උන්වහන්සේගේ වචනය හිස්ව හැරී නොඑන බවයි. එහි අර්ථය නම්, උන්වහන්සේ හිස් වූ පොරොන්දු ලබා නොදෙන බවයි. උන්වහන්සේ විසින් පවසන්නාවූ දෙය ඉටු වනු ඇත. බයිබලයේ සෑම වචනයක්ම පරමාර්ථයක් ඇතිව ලියා ඇති අතර එම පරමාර්ථය ඉටුවනු ඇත.

## දේව වචනයේ සලකුණු

දේව වචනය විස්තර කිරීම සඳහා බයිබලය විවිධාකාර සලකුණු රැසක් යොදා ගනී. සළකුණක් යනු යමක් සංකේතවත් කරන්නාවූ දෙයකි. උදාහරණ වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ කොඩියේ ඇත්තාවූ සෑම තරුවක්ම එහි ඇති ප්‍රාන්ත රාජ්‍යයන් පනහ අතරින් එකක් සංකේතවත්

කරයි. තරුව යනු රාජ්‍යය වෙනුවට යොදන සංකේතයකි. දේව වචනය විස්තර කිරීම සඳහා බයිබලයේ යොදා ඇති සලකුණු පහත දැක්වේ. එක් එක් පදය ඔබගේ බයිබලයෙන් කියවන්න.

**කැඩපත : යාකොබ් 1:23-27**

ස්වභාවික ලෝකය තුළදී ඔබ කැඩපතක් දෙස බැලූ විට එය ඔබගේ භෞතික රූපයේ ප්‍රතිබිම්බයක් පෙන්වයි. ඔබ දේව වචනය දෙස බැලූ විට, කැඩපතක් මෙන්ම බයිබලය ඔබගේ ආත්මික තත්වය ප්‍රතිනිරූපණය කරයි.

**සෝදන භාජනයක් :එපීස 5:26-27**

පවිත්‍ර කිරීම පිණිස ජලය දරන්නාවූ භාජනයක් හැඳින්වීම පිණිස බයිබලයේ යොදා ඇති වචනයක් වේ. දේව වචනය නැමති ජලය ඔබව ආත්මිකව පවිත්‍ර කරයි.

**පහන : ගීතාවලිය 119:105**
**ආලෝකය : ගීතාවලිය 119:105, 130, හිතෝපදේශ 6:23**

පහන හා ආලෝකය යන දෙකම මඟපෙන්වීම ලබා දෙයි. අඳුරේදී දැකීමේ හැකියාව එයින් ඔබට ලබා දෙයි. දේව වචනය ආත්මික මඟපෙන්වීම ලබාදෙන අතර පාපයේ අන්ධකාරයෙන් ගැළවීමේ මාර්ගය සොයා ගැනීමට එය උපකාර කරයි.

**වර්ෂාව : යෙසායා 55:10-11**
**ජලය : එපීය 5:27**

වර්ෂාව හා ජලය යන දෙකම ප්‍රාණවත් කරයි. දේව වචනය ඔබව ආත්මිකව ප්‍රාණවත් කරන බැවින් එය වර්ෂාවට හා ජලයට සමාන කර තිබේ.

**ආහාර : යෙරමියා 15:16 පේතෘස් 2:1-2, කොරින්ති 3:1-2, හෙබ්‍රෙව් 5:12-14**

**ඝන ආහාර : හෙබ්‍රෙව් 5:12**

දේව වචනය ආත්මික කුසගින්න නැති කරන බැවින් එය ස්වභාවික කුසගින්න නැති කරන්නාවූ ආහාර වලට සමාන කර තිබේ. ආහාර වලින් ස්වභාවික වර්ධනය ඇති කරන්නා සේම බයිබලය ආත්මික වර්ධනය ඇති කරයි. බයිබලයේ ඇතැම් කොටස් පහසුවෙන් තේරුම්ගත හැකි බැවින් ඒවා දේව වචනයේ කිරි වශයෙන් හඳුන්වනු ලබයි. අනෙකුත් කොටස් තේරුම් ගැනීම වඩා අපහසු වන බැවින් ඒවා මාංස වශයෙන් හඳුන්වයි. දෙවියන්වහන්සේට අවශ්‍ය වනුයේ ඔබ උන්වහන්සේගේ වචනයේ කිරි වල සිට මාංස දක්වා ගමන් කරනු දැකීමයි. බයිබලය අධ්‍යයනය කරන ආකාරය ඉගෙන ගැනීම මෙම පරමාර්ථය ඉටු කර ගැනීමට ඔබට උපකාරී වනු ඇත.

**ගින්න : යෙරමියා 23:29,20:9**

ස්වභාවික ලෝකය තුළදී අගනා ලෝහ පිරිසිදු කිරීම පිණිස ගින්දර යොදා ගනී. ගින්නෙන් සියලු අපවිත්‍රතා දැවී යයි. ඔබගේ ආත්මික ජිවිතය තුළ අපවිත්‍ර සිතුවිලි, වචන හා ක්‍රියා දවාලනු පිණිස දේව වචනය ගින්නක් ලෙස ක්‍රියා කරයි.

**කුළුගෙඩිය : යෙරමියා 23:29**

කුළු ගෙඩියකින් පර්වතයක් කැබලි කළ හැකිය. පාපය නිසා දැඩි වූ හදවත් ගෙන ඒවා කැබලි කර ඒවා දෙවියන්වහන්සේගේ හස්තයේ කීකරු හදවත් බවට පත් කිරීමට දේව වචනයට හැකියාව ඇත.

**දෙමුවහත් කඩුව : හෙබ්‍රෙව් 4:12**

දෙමුවහත් කඩුවක් යනු ඉතා තියුණු ආයුධයකි. එය වෛද්‍යවරු ශල්‍යකර්මයකදී යොදා ගන්නා පිහියකට සමාන වේ. දේව වචනය ආත්මික ශල්‍යකර්මයන් කරනු ලබයි. එය ආත්මික ලෙඩ රෝග නිවැරදි කරයි. ආත්මිකව ඇතිවන අනවශ්‍ය වර්ධනයන් හා අසාත්මිකතාවයන් එයින් ඉවත් කරයි.

**කඩුවක් : එපීස 6:17**

කඩුවක් යනු, ස්වභාවික ආයුධයකි. දේව වචනය ඔබගේ ආත්මික කඩුවය. එය ඔබගේ ආත්මික සතුරා වන සාතන්ට විරුද්ධව ඔබට භාවිත කළ හැකි ආයුධයකි.

**ඖෂධ : ගීතාවලිය 119:25**

ස්වභාවික ලෝකයේ ඖෂධ ඔබගේ භෞතික ලෙඩ රෝග සුව කරන්නාක්මෙන්ම, අපගේ ආත්මික ලෙඩ රෝග සුව කිරීමට දේව වචනය ඖෂධයක් ලෙස ක්‍රියා කරයි.

**බීජය : මතෙව් 13:1-23; මාර්ක් 4:1-20; ලූක් 8:4-15; I පේතෘස් 1:23, යාකොබ් 1:18**

දේව වචනය බීජයක් වැනිය. එය ඔබගේ හදවතෙහි රෝපණය කරනු ලැබූ විට, එය පලදැරිය හැකි භූමියක් නම් එය වර්ධනය වී ඔබගේ ජීවිතයේ ආත්මික පල ඇති කරනු ඇත.

**මී පැණි: ගීතාවලිය 19:10**

මී පැණි යනු ස්වභාවික ලෝකය තුළ ඇති ඉතාම මිහිරි දෙයකි. දේව වචනයද ආත්මිකව ඉතා මිහිරි වන බැවින් එය මී පැණි වලට සමාන කර තිබේ. දේව වචනය අධ්‍යයනය කිරීම ඔබගේ ජීවිතයට ආත්මික මිහිරිබව ඇති කරයි.

**රන් : ගීතාවලිය 19:9-10**

ස්වභාවික ලෝකය තුළ රන් යනු ඉතාම අගනා ලෝහයකි. බයිබලයේ ඇති ආත්මික වටිනාකම නිසා එය රන්වලට උපමා කර තිබේ.

## දේව වචනය පිළිබඳ විස්තරය

මෙම සලකුණු වලට අමතරව, බයිබලය දේව වචනය පිළිබඳ වෙනත් විස්තර කිරීම්ද ඉදිරිපත් කරයි ඒවා නම්

- ජීවනයේ ආත්මය : යොහන් 6:63
- සදාකාලික ජීවනයේ වචන : යොහන් 6:68
- අනර්ඝයි : 1 සාමුවෙල් 3:1
- පවිත්‍රය : හිතෝපදේශ 3:5; ගීතාවලිය 12:6; 19:7; 119:140
- සත්‍යය හා සිහිය ඇති කරයි : ක්‍රියා 26:25
- සත්‍යයි : යොහන් 17:17; කොලොස්සි 1:5; ගීතාවලිය 119:142
- ආරම්භයේ පටන් සත්‍යයි : ගීතාවලිය 119:160
- සෝදිසි කොට ඇත; ගීතාවලිය 18:3
- නිවැරදියි : ගීතාවලිය 33:4; 19:8; 119:75
- ජීවනයේ වචනයි : 1 යොහන් 1:1; පිලිප්පි 2:6
- ගැළවීමේ වචනයයි : ක්‍රියා 13:26
- ඇදහිල්ලේ වචනයයි : රෝම 10:8
- සර්ව සම්පූර්ණයි : ගීතාවලිය 19:7
- සැනසිලිදායකයාණන් : ගීතාවලිය 119:24
- විශ්වාසවන්ත : ගීතාවලිය 119:86
- පිහිටා තිබේ : ගීතාවලිය 119:89
- උරුමයයි : ගීතාවලිය 119:111
- ධර්මිෂ්ඨකමෙහි වචනයයි : ගීතාවලිය 119:123
- ධර්මිෂ්ඨ හා විශ්වාසවන්ත : ගීතාවලිය 119:138
- යුක්තිසහගතය : ගීතාවලිය 119:137
- ප්‍රීතියයි : ගීතාවලිය 119:143

## වචනයට ප්‍රතිචාර දැක්වීම

දේව වචනයට සවන් දීම, එය කියවීම හෝ අධ්‍යයනය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔබ දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රතිචාර දැක්විය යුතු බව බයිබලය උගන්වයි. ඔබ විසින් පහත සඳහන් දේවල් කළ යුතුය.

- ඔබගේ හදවතෙහි සරු පස මත එය වැටීමට ඉඩහැරීම : මාර්ක් 4 ලූක් 8, මතෙව් 13
- ප්‍රඥාවන්ත වීම සඳහා එයට සවන් දී එය ඉටු කිරීම යොහන් 12:47
- වචනය ආරක්ෂා කිරීම : යොහන් 13:23
- දේව වචනය ඔබ තුළ පැවතීම පිණිස යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම: යොහන් 5:38
- උන්වහන්සේගේ වචනය තුළ දිගටම පැවතීම : යොහන් 8:31
- භෞතික ආහාර මත පමණක් නොව, දේව වචනය මතද ජීවත් වීම: මතෙව් 4:4 ලූක් 4:4, ද්විතීය කතාව 8:3
- උන්වහන්සේගේ වචනය ගැන ප්‍රශංසා කිරීම. ගීතාවලිය 56:4,10
- ඒ ගැන ස්තුති දීම: ගීතාවලිය 119:62
- උන්වහන්සේගේ නාමයටත් ඉහළින් උන්වහන්සේගේ වචනය මහිමයට පත්කිරීම : ගීතාවලිය 138:2
- උන්වහන්සේගේ වචන ඔබගේ හදවතෙහි කොටා ගැනීම: යාකොබ් 1:21
- වචනය අසන්නෙකු පමණක් නොවී එය පිළිපදින්නෙකු වීම : යාකොබ් 1:22-23
- උන්වහන්සේගේ වචනයට ඔබ තුළ පැවතිය හැකි වන ලෙස පාපයට සමාව ඉල්ලා සිටීම: 1 යොහන් 1:10
- උන්වහන්සේගේ වචනයේ කිරිවලට ආශා කිරීම : 1 පේතෘස් 2:2
- දේව වචනය බොහෝ සෙයින් ඔබ තුළ පැවතීමට ඉඩහරින්න : කොලොස්සි 3:16
- දේව වචනය නිවැරදි ලෙස වෙන් කරන්න. 2 තිමෝති 2:5
- ශුද්ධ ලියවිලි පරීක්ෂා කර බලන්න : යොහන් 5:39 ක්‍රියා 17:11
- උන්වහන්සේගේ වචනය ප්‍රකාශ කරන්න. ගීතාවලිය 119:26-27
- උන්වහන්සේගේ වචනය තෝරා ගන්න. ගීතාවලිය 119:30
- උන්වහන්සේගේ වචනයට ඇලී සිටින්න : ගීතාවලිය 119:31
- උන්වහන්සේගේ වචනයේ මාර්ගය අනුව ගමන් කරන්න. ගීතාවලිය 119:32
- එය ආරක්ෂා කරන්න. ගීතාවලිය 119:33
- එය නිරීක්ෂණය කරන්න. ගීතාවලිය 119:34
- ඒ තුළ ප්‍රීති වන්න. ගීතාවලිය 119:35; 70; 77; 143; 174
- ඊට ඔබගේ හදවත යොමු කරන්න. ගීතාවලිය 119:36
- එය ඔබගේ ජීවිතය තුළ පිහිටා තිබෙනු දැකීමට ආශා කරන්න. ගීතාවලිය 119:38
- එය පසුපස හඹා යන්න : ගීතාවලිය 119:40
- අන් අයට පිළිතුරු දීමට එය පාවිච්චි කරන්න. ගීතාවලිය 119:42
- ඒ ගැන බලාපොරොත්තු තබාගන්න : ගීතාවලිය 119:43, 47
- එය සදාකාලිකව තබා ගන්න: ගීතාවලිය 119:44
- උන්වහන්සේගේ නියෝග සොයන්න: ගීතාවලිය 119:45
- නායකයන් ඉදිරියේ වචනය කතා කිරීමට කැමැත්තෙන් සිටින්න: ගීතාවලිය 119:46
- එය මෙනෙහි කරන්න: ගීතාවලිය 119:48; 78; 148
- එයින් අහක්ව නොයන්න : ගීතාවලිය 119:52
- එහි ඉගැන්වීම් අනුව ජීවත් වන්න: ගීතාවලිය 119:59
- උන්වහන්සේගේ වචනය පැවැත්වීමට ප්‍රමාද නොවන්න: ගීතාවලිය 119:60
- එය අමතක නොකරන්න : ගීතාවලිය 119:61,83,93,153,176
- එයින් අහක්ව නොයන්න : ගීතාවලිය 119:52
- එහි ඉගැන්වීම් අනුව ජීවත් වන්න: ගීතාවලිය 119:59
- උන්වහන්සේගේ වචනය පැවැත්වීමට ප්‍රමාද නොවන්න: ගීතාවලිය 119:60
- එය අමතක නොකරන්න : ගීතාවලිය 119:61,83,93,153,176
- දේව වචනයට බිය ඇති හා එය ආරක්ෂා කරන්නාවූ සගයන් තෝරා ගන්න : ගීතාවලිය 119:63
- එය විශ්වාස කරන්න : ගීතාවලිය 119:66; 128
- ඔබගේ මුළු හදවතින් එය ආරක්ෂා කරන්න : ගීතාවලිය 119:69
- රන් හා රිදී වලට වඩා එය අගය කරන්න : ගීතාවලිය 119:72

- එය ඉගෙන ගැනීමට ආශා කරන්න : ගීතාවලිය 119:73
- දේව වචනය තුළ බලාපොරොත්තු ඇති කර ගන්න : ගීතාවලිය 119:74,81
- ඒ තුළ සැනසිල්ල සොයා ගන්න : ගීතාවලිය 119:76:82
- එය ඔබගේ හදවත වෙනස් කරනු ඇති බවට ආශා කිරීම : ගීතාවලිය 119:80
- එයින් අභක්ව නොයෑම : ගීතාවලිය 119:87
- එය සොයා යාම: ගීතාවලිය 119:94
- එය සැලකිල්ලට ගැනීම : ගීතාවලිය 119:95
- දේව වචනය පසුපස යාම : ගීතාවලිය 119:131
- වචනය තුළ ඔබගේ පියවර හැඩගස්වා ගැනීම : ගීතාවලිය 119:133
- දේව වචනයට ගෞරවය නොලැබෙන විට ඒ ගැන දුක් වීම: ගීතාවලිය 119:136:158
- දේව වචනය ගැන ගරුසරුව සිටින්න : ගීතාවලිය 119:161
- එයට ප්‍රේම කරන්න: ගීතාවලිය 119:163, 165, 167
- උන්වහන්සේගේ වචනය කතා කරන්න : ගීතාවලිය 119:172

## වචනය පිළිබඳව ඇති වගකීම

දේව වචනයට නිසි ප්‍රතිචාර දැක්වීමට අමතරව, දේව වචනය පිළිබඳව ඔබට වගකීමක්ද තිබේ. මුල් කාලීන සභාව දේව වචනය දේශනා කරමින් සෑම තැනකම යාම තම වගකීම බවට උපකල්පනය කළහ (ක්‍රියා 8:4, 13:49, 12:24). දේව වචනය දේශනා කිරීමට නිර්භීතකම දෙනමෙන් ඔවුහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටි අතර (ක්‍රියා 4:29 හා 31) ඔවුන් විසින් ගත් උත්සාහයන් නිසා දේව වචනය ලෝකය පුරා වර්ධනය විය (ක්‍රියා 6:7; 19:20).

දේව වචනය පිළිබඳව ඔබට ඇති වගකීම සම්බන්ධයෙන් බයිබලය එළිදරව් කරන්නාවූ දේවල් පහත දැක්වේ.

- ඔබ උන්වහන්සේගේ වචනය ලෝකය පුරා දේශනා කළ යුතු වේ. මතෙව් 16:15; ලූක් 24:47; මාර්ක් 16:15
- ඔබට දේව වචනය උගන්වා තිබේ නම් එය අන් අයට ඉගැන්වීමේ වගකීම ඔබට තිබේ. ගලාති 6:6
- ඔබ වචනය දේශනා කළ යුතු වේ. 2 තිමෝති 4:2
- ඔබ බියකින් තොරව උන්වහන්සේගේ වචනය දේශනා කළ යුතු වේ. පිලිප්පි 1:4
- ඔබට අන් අයට දේව වචනය කතා කළ හැකි වන පිණිස දෙවියන්වහන්සේ එය ඔබ තුළ තබා තිබේ. ද්විතිය කතාව 18:18-19; යෙසායා 51:16; යෙරෙමියා 1:9:3:12:5:14:26:12; එසකියෙල් 2:6-7
- ඔබ ඔබගේම වචනය කථා නොකොට උන්වහන්සේගේ වචනය කථා කළ යුතු වේ.; යෙසායා 58:13
- ඔබ වචනය පිළිබඳව ලැජ්ජා නොවිය යුතුය. මාර්ක් 8:38
- ඔබ ඔබේ දරුවන්ට එය ඉගැන්විය යුතුය. ද්විතිය කතාව 6:6-9

## වචනය තුළ ඇති අනතුරු ඇඟවීම්

දෙවියන්වහන්සේ තම වචනය ගැන දී ඇති අනතුරු ඇඟවීම් කිහිපයක් පහත දැක්වේ.

- දේව වචනය දේශනා කිරීම නිසා පීඩාවන් ඇතිවේ. මාර්ක් 4:7
- දේව වචනය ගැන සාක්ෂි දැරීම නිසා ඇතැම් අය මරණයට ද පත් කරනු ලැබේ. එළිදරව් 6:9:20:4
- මනුෂ්‍යයාගේ සම්ප්‍රදායන් නිසා දේව වචනය ඔබගේ ජීවිතය තුළ බලපෑමක් ඇති නොවන තත්වයට පත් විය හැක. මාර්ක් 7:13
- ඔබට දේව වචනය වැරදි ලෙස ඉදිරිපත් කළ හැකිය. යෙරෙමියා 23:36
- ඔබට ස්වාමින්වහන්සේගේ වචනය දූෂණය කළ හැකිය. 2 කොරින්ති 2:17
- ඔබට රැවටිලිකාර ලෙස වචනය පාවිච්චි කළ හැකිය. 2 කොරින්ති 4:2

ඔබට ඇසෙන සෑම වචනයකටම සවන් නොදෙන ලෙස බයිබලය ඔබට පවසයි. හිතෝපදේශ 14:15 (මෙහි අදහස නම් දේව වචනය දේශනා කරන බව පවසන්නා වූ හැම කෙනෙක්ම

සැබැවින්ම එසේ නොකරන බවයි). දෙවියන්වහන්සේගේ සැබෑ වචනය උගන්වන්නේ නැති බොරු ගුරුවරු සිටිති (යුද් 1). ඔබ මෙම පුද්ගලයන්ගෙන් අහක්වී සිටිය යුතුය (1 තිමෝති 6:3-5). බොරු ගුරුවරු කතා කරනුයේ තමන්ගේම වචනයි. එසේම ඔවුහු පහත සඳහන් දේවල් ද කතා කරති.

| | |
|---|---|
| බොරු කීමේ වචන | යෙරෙමියා 29:23 |
| නිරර්ථක වචන | එපීස 5:6 |
| සිත් ඇදගන්නා වචන | කොලොස්සි 2:4 |
| ඉච්ඡා වචන | 1 තෙසලෝනික 2:5 |
| හිස් දෙඩවිලි | 1 තිමෝති 6:21 |
| වංචා වචන | 2 පේතෘස් 2:3 |
| ආඩම්බර වචන | 2 පේතෘස් 2:18; යුද් 16 |
| දුෂ්ට වචන | 3 යොහන් 10 |

අවසාන වශයෙන්, එළිදරව් 22:18-19 බයිබලය වචනය පිළිබඳ අවසාන, අනතුරු ඇඟවීමක් ඉදිරිපත් කරයි.

> **මේ පොතේ අනාගතවාක්‍ය වචන අසන සියල්ලන්ට මෙසේ සහතික ලෙස කියමි. එනම්, යමෙක් ඒ වචනවලට යමක් එකතුකරන්නේ නම්, දෙවියන්වහන්සේ මේ පොතෙහි ලියන ලද පීඩා ඔහුට එකතුකරන සේක. යමෙක් මේ අනාගතවාක්‍ය පොතේ වචනවලින් යමක් අහක්කරන්නේ නම්, මේ පොතෙහි ලියා තිබෙන ජීවන-වෘක්ෂයෙන්ද ශුද්ධ නුවරින්ද දෙවියන්වහන්සේ ඔහුගේ කොටස අහක්කරන සේක. යනුයි. (එළිදරව් 22:18-19)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. දේව වචනය නියෝජනය කිරීම සඳහා බයිබලයේ යොදාගෙන ඇති සංකේත පහක් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. දේව වචනයේ බොහෝ පරමාර්ථයන් මෙම පරිච්ඡේදයේ ලැයිස්තුගත කර තිබේ. ඒවායින් තුනක් හෝ ලැයිස්තුගත කිරීමට ඔබට හැකිද?

______________________________________________

______________________________________________

______________________________________________

4. ඔබට ඇසෙන්නා වූ හැම වචනයක්ම ඔබ විසින් විශ්වාස නොකළ යුත්තේ මන්ද?

______________________________________________

5. දේව වචනයට යම් යම් දේ එකතු කරන්නාවූ අයට දී ඇති අනතුරු ඇඟවීම කුමක්ද?

______________________________________________

6. දේව වචනයේ ලියා ඇති දේවල් වලින් යම් යම් දේ අඩු කරන්නාවූ අයට දී ඇති අනතුරු ඇඟවීම කුමක්ද?

______________________________________________

7. දේව වචනයේ මුලාශ්‍රය කවුරුන්ද? ______________________________

8. යේසුස්වහන්සේ කතා කළේ කාගේ වචනද? ______________________________

9. බයිබලයේ ඇත්තා වූ ප්‍රධාන බෙදීම් දෙක වනුයේ දේව වචනයේ ______________ හා ______________ ය.

10. බයිබලීය වාර්තාවන්ට අනුව, දෙවියන්වහන්සේගේ වචන ලියා තැබූ පළමු මනුෂ්‍යයා කවුරුන්ද?

---

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

බයිබලයේ සියලුම පරිච්ඡේද අතරින් ගීතාවලිය 119 බොහෝ වරක් දේව වචනය පිළිබඳව කතා කරයි. එය බයිබලයේ ඇති දීර්ඝම පරිච්ඡේදය ද වේ.

මෙම පරිච්ඡේදය තුළ දේව වචනය පිළිබඳව කතා කිරීමේ දී විවිධ වචන පාවිච්චි කර තිබේ. ඒවා පාවිච්චි කර ඇති හැම අවස්ථාවකදීම උන්වහන්සේගේ වචනය ගැන අපට ඇති දැනීමට එයින් යමක් එකතු කරයි. ගීතාවලිය 119 කියවා පහත සඳහන් වචන සඳහන් වන සෑම අවස්ථාවකදීම ඒ යටින් ඉරක් අඳින්න.

- වචනය
- වචන
- විනිශ්චයන්
- අණපනත්
- නියෝග
- ව්‍යවස්ථාව
- ආඥාව
- මාර්ගය
- ඔබගේ සාක්ෂි

ගීතාවලිය 119 හි සඳහන් මෙම සෑම වචනයක් යටින්ම ඔබ විසින් ඉරි ඇඳීමෙන් පසුව, පරිච්ඡේදය නැවත වරක් කියවා ඔබගේ අධ්‍යයනය සාරාංශගත කරන වගුවක් නිර්මාණය කරන්න. පහත සඳහන් රටාව අනුගමය කරන්න. මෙම වචන වලින් එකක් හෝ කිහිපයක් අතුළත් වන්නාවූ පද වල අංකය ලැයිස්තුගත කර ඉන්පසුව දේව වචනය පිළිබඳව මෙම පදවලින් උගන්වන්නාවූ දේවල් සාරාංශගත කරන්න.

මෙම රටාව අනුව කරගෙන යන්න

| පදයේ අංකය | සාරාංශය |
|---|---|
| 1 | අප උන්වහන්සේගේ ව්‍යවස්ථාව තුළ ජීවත් වන්නේ නම් ආශිර්වාද ලබනු ඇත. |

# දහ වන පරිච්ඡේදය

# භාවනා බයිබල් අධ්‍යයනය

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- භාවනා බයිබල් අධ්‍යයන ක්‍රමයේ පියවර ලැයිස්තුගත කිරීමට,
- භාවනා බයිබල් අධ්‍යයනයක් කිරීමට

හැකිවනු ඇත.

## ප්‍රධාන පදය:

> **ඔබගේ වචනය භාවනාකරන පිණිස රෑ යාම්වලට පළමුවෙන් මාගේ ඇස් ඇරුණේය.**
> (ගීතාවලිය 119:148)

## හැඳින්වීම

ඔබ විසින් ඉගෙන ගන්නා වූ පළමු බයිබල් අධ්‍යයන ක්‍රමය භාවනා බයිබල් අධ්‍යයනය ලෙස හැඳින්වේ. මෙම පරිච්ඡේදය තුළදී භාවනා බයිබල් අධ්‍යයනය නිර්වචනය කර, පැහැදිලි කර, ඒ සඳහා උදාහරණයක්ද ඉදිරිපත් කරයි. සැබවින්ම භාවනා බයිබල් අධ්‍යයනයක් කිරීම තුළින් ඔබ ඉගෙන ගත් දේවල් අදාළ කර ගැනීමේ අවස්ථාව තවදුරටත් හැදෑරීම සඳහා වූ කොටසින් ඔබට හිමි වේ.

## ක්‍රමය නිර්වචනය කිරීම

මෙම ක්‍රමයට නම ලැබී ඇත්තේ “භාවනාව” යන වචනය ආශ්‍රයෙනි. එහි අර්ථය “කැපවීම, පූජා කිරීම, නමස්කාර කිරීම හා යම් කරුණකට හෝ පුද්ගලයෙකුට අවංකව බැඳී සිටීම” යනුය. භාවනා බයිබල් අධ්‍යයන ක්‍රමය දෙවියන්වහන්සේට ඇති කැපවීම හා පූජාවීම වැඩි කරයි. නමස්කාරයටත් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ ගැඹුරු සම්බන්ධතාවයකටත් එයින් මඟ පෙන්වයි.

මෙම ක්‍රමයට දේව වචනය අධයනය කිරීම මෙන්ම එහි සත්‍යතාවයන් අදාළ කර ගැනීමද අන්තර්ගත වේ. සාතන් තමන්ගේ ප්‍රබලතම විරෝධතාවයන එල්ල කරන්නේ මෙම ක්‍රමයට විරුද්ධව වේ. දැනුම ලබා ගැනීම උදෙසා පමණක් කරන්නාවූ අධ්‍යයනයන්ට සාතන් විරුද්ධ වන්නේ නැත. ඔබගේ ආත්මික ජීවිතය තුළ ධනාත්මක වෙනස්කම් ඇති කරන ආකාරයේ අදාළ කරගැනීම් සඳහා අවස්ථාව සලසන බයිබල් අධ්‍යයනයන් පිළිබඳව ඔහු බොහෝ සෙයින් සැලකිලිමත් වේ. “වචනය අසන්නන් පමණක් වීම” ප්‍රමාණවත් නොවේ. වචනය අසන්නෙකු යනු දේව වචනය අධ්‍යයනය කරන, නමුත් එම වචනය කිසිදාක තම ජීවිතයට අදාළ කර නොගන්නා අය වේ.

> **නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙන්න. මක්නිසාද, යමෙක් වචනය අසන නමුත් එය පිළිපදින්නේ නැත්නම්, ඔහු කැඩපතකින් තමාගේ ස්වභාවික මුහුණ බලන මනුෂ්‍යයෙකුට සමානය. මක්නිසාද ඔහු තමාම බලාගනිමින් සිට අහක්ව ගිය කල, තමා කෙබඳු මනුෂ්‍යයෙක්ව සිටියේදැයි එවලේම මතක නැතිකරයි. නුමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගෙන, මතක නැතිකරන අසන්නෙක් නොවී, ක්‍රියාකරන කෙනෙක්ව, එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ ක්‍රියාකිරීමෙහිදී ආශිර්වාද ලබන්නේය.** (යාකොබ් 1:22-25)

මෙම පාඨමාලාව තුළදී ඔබ බොහෝ බයිබල් අධ්‍යයන ක්‍රම ඉගෙන ගනු ඇති නමුත් සෑම ක්‍රමයකම ප්‍රතිඵලය විය යුත්තේ අදාළ කර ගැනීමකි. ඔබ පොතක් පරිච්ඡේදයක්, පදයක්, වචනයක් හෝ වෙනත් ආකාරයක අධ්‍යයනයක් කළත්, ඔබ විසින් ඉගෙන ගත් දේවල් ඔබගේ ජිවිතයටත් සේවයටත් ඔබ විසින් අදාළ කරගත යුතුය.

## ක්‍රමය පැහැදිලි කිරීම

ඔබගේ භාවනා අධ්‍යයනය සඳහා "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටසේ සපයා ඇති ෆෝරමය යොදා ගන්න. අධ්‍යයනය සඳහා වූ පියවරයන් පහත දැක්වේ.

### පළමු පියවර : බයිබල් කොටසේ ඇති තොරතුරු වාර්තා කරගන්න.

ඔබ විසින් අධ්‍යයනය කරන කොටස ඇතුළත් පොතෙහි නම වාර්තා කරගන්න. ඉන්පසුව ඔබ විසින් තෝරාගත් පරිච්ඡේද හා පදවල අංක සටහන් කරගන්න.

### දෙවන පියවර : විෂය හඳුනාගන්න.

ඔබ විසින් අධ්‍යයනය කිරීමට තෝරාගෙන ඇති ශුද්ධ ලියවිලි කොටස කියවන්න. විෂය සාරාංශගත කරන්නාවූ මාතෘකාවක් තෝරාගෙන එය ඔබගේ වගුවේ සටහන් කරගන්න.

### තෙවන පියවර : ප්‍රධාන පදය හඳුනාගන්න.

ඔබ අධ්‍යයනය කරන්නාවූ ශුද්ධ ලියවිලි කොටස හොඳින්ම සාරාංශ කරන්නාවූ පදය කුමක්ද? එම පදය හා එහි බයිබල් කොටස ඔබගේ වගුවේ සටහන් කරන්න.

### හතරවන පියවර : සාරාංශය.

ශුද්ධ ලියවිලි කොටස තුළින් උගන්වන්නාවූ දේ ඔබගේම වචනවලින් සාරාංශගත කරන්න.

1. ප්‍රධාන කරුණු වල සැකිල්ලක් සාදා ගන්න.
2. බයිබල් කොටස සාරාංශ කිරීම සඳහා වගුවක් යොදාගන්න.
3. කෙටි සාරාංශගත ප්‍රකාශයක් සාදාගන්න.
4. බයිබල් කොටසේ අනුවර්තනයක් ලියන්න. අනුවර්තනයක් යනු ඔබ යම් බයිබල් පදයක් ගෙන එය ඔබගේ වචනයෙන් සාරාංශගත කර ලිවීමයි. බයිබල් කොටස අනුගමනය කරන්න. නමුත් එය අද දවසට ගැළපෙන භාෂාවෙන් ලියා දක්වන්න.

(මෙම පරිච්ඡේදයේ උදාහරණ කොටස බලන්න)

### පස්වන පියවර : මෙනෙහි කරන්න.

බයිබලය කියවා අධ්‍යයනය කිරීම වැදගත් වන නමුත් දේව වචනය මෙනෙහි කරන ආකාරයද ඔබ විසින් ඉගෙනගත යුතුවේ. "මෙනෙහි කිරීම" යන වචනයේ අර්ථය සිතීම, එය මත රැඳ පැවතීම හා සිතා බැලීමයි. ඔබ විසින් අධ්‍යයනය කිරීම සඳහා බයිබල් කොටසක් තෝරාගැනීමෙන් අනතුරුව, එහි විෂය හා ප්‍රධාන පදය හඳුනාගෙන, එහි ඇති ඉගැන්වීම් සාරාංශගත කර ඉන්පසුව බයිබල් කොටස ගැන මෙනෙහි කරන්න.

සාර්ථකවීමේ රහස දේව වචනය මෙනෙහි කිරීම බව දෙවියන්වහන්සේ යොෂුවාට පැවසූ සේක.

> **මේ ව්‍යවස්ථා පොත නුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරන්න. එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභසිද්ධ වන්නේය. (යොෂුවා 1:8)**

සෙමෙන් බයිබල් කොටස කියවන්න. එය හඬනගා කියවන්න. මෙම කොටසින් දෙවියන්වහන්සේ ඔබට පෞද්ගලිකව කතා කරන්නේ යැයි සිතන්න. මෙම පාඨමාලාවේ හයවන කොටසේ ඇතුළත් ප්‍රශ්න යොදා ගනිමින් ඉන් පවසන දේවල් ඔබගේ ජීවිතයට පෞද්ගලිකව අදාළ කරගන්න.

දේව වචනය මෙනෙහි කිරීමට ඇති වැදගත් ක්‍රමයක් නම් එය කටපාඩම් කිරීමයි. ඔබ යම් කොටසක් කටපාඩම් කළ විට ඕනෑම මොහොතක එය නැවත මතක් කර ඒ ගැන සිතා බැලීමට ඔබට හැකියාව තිබේ. ඔබ විසින් තෝරා ගන්නා ප්‍රධාන පදය කටපාඩම් කිරීමට සුදුසු කොටසකි. පහතින් දක්වා ඇති ආකාරයේ කාඩ්පත් සාදාගන්න. කාඩ්පතේ එක් පැත්තක බයිබල් පදය ලියන්න. කාඩ්පතේ දෙවන පැත්තේ පදයේ යොමුව ලියන්න.

| |
|---|
| පළමු පැත්ත :<br><br>ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතෙහි නිධාන කරගතිමි. |

| |
|---|
| දෙවන පැත්ත<br><br>ගීතාවලිය 119:11 |

බයිබල් පදය කිහිපවරක් හඬනගා කියවා ඉන්පසුව ඒ දෙස නොබලමින් නැවතවරක් පවසන්න. ඔබ විසින් එම පදය පැවසීමෙන් පසුව එය නිවැරදි දැයි දැන ගැනීමට කාඩ්පත දෙස බලන්න. කාඩ්පතෙහි බයිබල් කොටස ලියා ඇති පැත්ත දෙස බලමින් බයිබල් පදය පවසන්න. බයිබල් පදය ඇති පැත්ත දෙස බලමින් බයිබල් කොටස මතක තබාගැනීමට උත්සාහ කරන්න. ඔබගේ ශුද්ධ ලියවිලි මතක තබාගැනීමේ කාඩ්පත් ආරක්ෂිතව තබා ගනිමින් දිගින් දිගටම ඒවා මතක් කරමින් මෙනෙහි කරන්න.

## හයවන පියවර : අදාළ කරගන්න.

මෙනෙහිකිරීම් තුළදී ඔබ උගත් දේවල් අදාළ කරගැනීමට ඔබ දැන් සූදානම්ය. අදාළකරගැනීම යනු ඔබ විසින් ඉගෙනගත් සත්‍යයන් ඔබගේ ජීවිතයටත් සේවයටත් අදාළ කරගැනීමයි. ඇතැම්විට ඔබ ඉගෙනගත් සියල්ල එකවරම අදාළ කරගැනීමට ඔබට නොහැකිය. නමුත් ඔබට හැකි සියල්ල අදාළ කරගැනීමට පටන් ගන්න. අදාළ කරගැනීමේ ක්‍රියාවලිය තුළදී වරකදී ඔබට එක් කුඩා පියවරක් පමණක් ගැනීමට සිදුවුවද දේව වචනයේ සත්‍යතාවන් අදාළ කරගැනීමට දෙවියන්වහන්සේ ඔබට උපකාර කරනු ඇත.

දේව වචනය ඔබගේ ජීවිතයට අදාළ කරගැනීම සඳහා පහත සඳහන් ප්‍රශ්න ඔබට උපකාරී වනු ඇත.

**අනුගමනය කිරීම සඳහා උදාහරණ :**

මෙම ශුද්ධ ලියවිලි පාඨය තුළ අනුගමනය කිරීම සඳහා උදාහරණ තිබේද?

**මගහැරීමට වැරදීම්:**

ඔබ විසින් මගහැරිය යුතු වැරදි හෝ පාපයන් තිබේද?

**ඉටුකිරීමට ඇති කාර්යයක්:**

මෙම ශුද්ධ ලියවිලි කොටස යම් ක්‍රියාවක් යෝජනා කරන්නේද? යමක් කරන්න යයි ඔබට පවසා තිබේද? එසේ නම්, ඔබ විසින් කළ යුතු ක්‍රියාවන් කවරේද?

**ප්‍රකාශ කිරීමට ඇති පොරොන්දුවක් :**

ඔබට ප්‍රකාශ කළ හැකි ආකාරයේ පොරොන්දුවක් මෙම කොටස තුළ තිබේද?

**වර්ධනය කරගැනීමට සම්බන්ධතාවයක් :**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔබ දෙවියන්වහන්සේ සමග පවත්වන්නාවූ සම්බන්ධතාවය පිළිබඳව මෙම බයිබල් කොටසින් උගන්වන්නේ මොනවාද? පියවූ දෙවියන්වහන්ස, පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව ඉන් උගන්වන්නේ මොනවාද? ඔබගේ පවුලේ, සමාජයේ, සභාවේ හා ලෝකය තුළ සිටින අය සමග ඔබ පවත්වන්නාවූ සම්බන්ධතාවය පිළිබඳව ඉන් උගන්වන්නේ මොනවාද? ඔබ සමග ඇත්තාවූ ඔබගේ සම්බන්ධතාවය පිළිබඳව ඉන් පවසන්නේ මොනවාද?

**සිදු කළ යුතුවූ වෙනසක් :**

මෙම ශුද්ධ ලියවිලි කොටස තුළින් ඔබ ඉගෙනගත් දේවල් අනුව ඔබගේ ජිවිතයේ ඔබ විසින් ඇතිකරගත යුතුවූ වෙනස්කම් කවරේද? නිශ්චිත වන්න.

**යාච්ඤා කිරීමට යමක් :**

මෙම බයිබල් කොටස පිළිබඳව පෞද්ගලික යාච්ඤාවක් කරන්න. ඔබ විසින් ඉගෙනගෙන ඇති සත්‍යතාවයන් අදාළ කරගැනීමට ඔබට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. දේව වචනය තුළින් උගන්වන්නාවූ මූලධර්මයන් යාච්ඤාව තුළින් වඩා පෞද්ගලිකව අදාළ කරයි. මෙම පරිච්ඡේදයේ ඇති උදාහරණය මෙන් ඔබට අවශ්‍ය නම් ඔබගේ යාච්ඤාව ලියා තැබීමටත් ඔබට හැකිය.

## භාවනා අධ්‍යයනයට උදාහරණ

## පළමු පියවර : බයිබල් කොටසේ ඇති තොරතුරු වාර්තා කරගන්න.

පොත : ගලාති
පරිච්ඡේදය : 5
පද : 16-25

**දෙවන පියවර : විෂය හඳුනාගන්න**

විෂය : මාංසයේ ක්‍රියා හා ශුද්ධාත්ම ඵල

## තෙවන පියවර : ප්‍රධාන පදය හඳුනාගන්න.

ප්‍රධාන පදය : අපි ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ජිවත්වෙමු නම්, ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙමු. (ගලාති 5:25)

## හතරවන පියවර : සාරාංශගත කරන්න.

1. සාරාංශගත සටහනක් සඳහා උදාහරණයක් පහත දැක්වේ.

### මාංසයේ ක්‍රියා හා ශුද්ධාත්මයාණන්ගේ ඵල

I. මාංසය ආත්මයට විරුද්ධවත් ආත්මය මාංසයට විරුද්ධවත් සටන්වදී. මාංසයේ ජීවත් වන අය දේවරාජ්‍ය උරුමකර නොගනු ඇත. මාංසයේ ක්‍රියා තුළ පහත සඳහන් දේවල් අන්තර්ගත වේ.

i. වේශ්‍යාකම
ii. අපවිත්‍රකම
iii. සල්ලාලකම
iv. රූප වැඳීම
v. මායාව
vi. සතුරුකම
vii. විවාදය
viii. ඊර්ෂ්‍යාව
ix. ක්‍රෝධ
x පක්ෂවාදිකම්
xi. භේද
xii. ලබ්ධි භේද
xiii. වෛර
xiv. බීමත්කම
xv. මංගල්‍ය ඝෝෂා

II. දෙවියන්වහන්සේ අපට දීමට ආශා කරන්නාවූ ආත්මයාණන්ගේ ඵල මාංසයේ ක්‍රියා වලට ප්‍රතිරෝධි වේ.

i. ප්‍රේමය
ii. ප්‍රීතිය
iii. සමාදානය
iv. ඉවසිලිවන්තකම
v. කරුණාවන්තකම
vi. යහපත්කම
vii. විශ්වාසකම
viii. මෘදුකම
ix. පමණදැන ක්‍රියාකිරීම

III. අප විසින් කළ යුතු දේවල් නම්:

i. ආත්මයාණන් කරණකොටගෙන හැසිරීම (16, 25 පද)
ii. ආත්මයාණන් විසින් ගෙනයනු ලැබීම (18 පදය)
iii. ආත්මයාණන් තුළ ජීවත් වීම (25 පදය)

2. පහත දක්වා ඇත්තේ **සාරාංශගත වගුවකට** උදාහරණයකි.

**මාංසයේ ක්‍රියා හා ආත්මයාණන්ගේ ඵල :**
ගලාති 5:16-25

| මාංසයේ ක්‍රියා (තෘෂ්ණා සම්පූර්ණ කිරීම) | ආත්මයාණන්ගේ ඵල (ආත්මයාණන් තුළ ජීවත් වීම) |
|---|---|
| වේශ්‍යාකම | ප්‍රේමය |
| අපවිත්‍රකම | ප්‍රීතිය |
| සල්ලාලකම | සමාදානය |
| රූප වැඳීම | ඉවසිලිවන්තකම |
| මායාව | කරුණාවන්තකම |
| සතුරුකම | යහපත්කම |
| විවාදය | විශ්වාසකම |
| ඊර්ෂ්‍යා | මෘදුකම |
| භේද | පමණදැන ක්‍රියා කිරීම |
| ලබ්ධිභේද | |
| වෛර | |
| බීමත්කම | |
| මංගල්‍ය ඝෝෂා | |

3. **සාරාංශගත ප්‍රකාශයන්** සඳහා උදාහරණයක් පහත දැක්වේ.

මෙම බයිබල් කොටස තුළින් ප්‍රතිවිරුද්ධ තත්වයන් දෙකක් ඉදිරිපත් කරයි: මංසයේ තෘෂ්ණාවන් හා ආත්මයාණන්ගේ ඵලයි. අපි යේසුස්වහන්සේට අයිතිවනුයේ නම්, අපගේ මංසයේ තෘෂ්ණාවන් කුරුසපත් කර, ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ජීවත් වෙමින්, හැසිරෙමින් උන්වහන්සේ කරණකොටගෙන ගෙන යනු ලැබිය යුතුය. මාංසයේ ක්‍රියා නම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද, වෛර බීමත්කම හා මංගල්‍යය ඝෝෂාය, ආත්මයාණන්ගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම.

4. ගලාති 5:24-25 **අනුවර්තනයක්** ලෙස ලිවිය හැකි ආකාරය පිළිබඳ උදාහරණයක් පහත දැක්වේ.

ක්‍රිස්තුස්වහන්සේට අයිති වූ අය මාංසයේ ආශාවන්, කැමැත්ත හා තෘෂ්ණාවන් නැතිකර දමා තිබේ. ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ සිටින්නේ යැයි අප පවසමු නම්, අප එසේ හැසිරිය යුතුය.

## පස්වන පියවර : මෙනෙහිකිරීම

කටපාඩම් කළ යුතු වූ හා මෙනෙහි කළ යුතු වූ පද : 16-18 පද හා 25-26 පද. එසේම මාගේ ජීවිතය තුළ වර්ධනය වනු දැකීමට දෙවියන්වහන්සේ ආශා කරන්නාවූ ආත්මික ඵල ලැයිස්තුව කටපාඩම් කරන්න. ශුද්ධාත්මයාණන්ගේ එක් එක් ඵලය මෙනෙහි කරමින් ඒවා ගැන අධ්‍යයනය කරන්න. කරුණාවන්ත වීම, යහපත් වීම, මෘදුවීම, පමණ දැන ක්‍රියා කිරීම ආදියෙන් අදහස් වන්නේ කුමක්ද?

## හයවන පියවර : අදාළ කරගන්න.

**අනුගමනය කිරීම සඳහා වූ උදාහරණ :** මාගේ ජීවිතය තුළ ආත්මයාණන්ගේ ඵල වර්ධනය කිරීම.

**මඟහැරිය යුතු වරද :** මාංසයේ ක්‍රියා

**ඉටු කළ යුතු කාර්ය :**

ආත්මයාණන් තුළ හැසිරීම (16,25 පද)
ආත්මයාණන් විසින් ගෙනයනු ලැබීම (18 පදය)
ආත්මයාණන් තුළ ජීවත් වීම (25 පදය)

**ප්‍රකාශ කළ යුතු වූ පොරොන්දුව :** "ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරෙන්න, එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණ කරන්නේ නැතැයි කියමි." (16 පදය)

**වර්ධනය කර ගැනීමට සම්බන්ධතාවයන් :** අන් අය සමඟ ඇති මගේ සම්බන්ධතාවලදී ප්‍රේමය, ඉවසීම, කරුණාවන්තකම, මෘදුකම පෙන්නුම් කළ යුතුය. මා විසින් ප්‍රීතිය, සමාදානය, යහපත්කම, විශ්වාසකම හා පමණදැන ක්‍රියා කිරීම මා විසින් වර්ධනය කරගත යුතුය. දෙවියන්වහන්සේට අවශ්‍යවන්නේ උන්වහන්සේ සමඟ ඇති මාගේ සම්බන්ධතාවය ශුද්ධ හැසිරීමක් මත පදනම් වනු දැකීම බව මම ඉගෙන ගන්නෙමි. මම සැබැවින්ම දෙවියන්වහන්සේට අයිති වන්නේ නම්, අන් අය සමඟ හා දෙවියන්වහන්සේ සමඟ මා හට ඇති සම්බන්ධතාවයට එය බලපානු ඇත.

**සිදු කළ යුතු වූ වෙනස්කම් :** මා විසින් බොහෝ සෙයින් වෙනස් කරගත යුතු වූ අංශ තුන:

පමණ දැන ක්‍රියා කිරීම : ආහාර ගැනීම සඳහා මාගේ ආශාවන් පාලනය කර ගැනීම
ස්වයං පාලනය හා විනය වර්ධනය කර ගැනීම

ඇදහිල්ල : දෙවියන්වහන්සේගේ පොරොන්දු ගැන වඩ වඩා විශ්වාස කිරීම.
ප්‍රේමය : මා වටා සිටින ප්‍රේම කිරීමට අපහසු අයට ප්‍රේමය දැක්වීම.

**යාච්ඤා කිරීමට යමක් :**

දයාබර ස්වර්ගික පියාණෙනි : ඔබගේ ආත්මයාණන් තුළ හැසිරෙමින්, ඔබගේ ආත්මයාණන් විසින් ගෙනයනු ලබමින් සෑම මොහොතකම ඔබගේ ආත්මයාණන් තුළ ජීවත් වීමට මට උපකාර කළ මැනව. මාංසයේ ක්‍රියාවන්ගෙන් මාගේ ජීවිතය පවිත්‍ර කළ මැනව. ලෞකික ආශාවන් කුරුසපත් කිරීමට මට උපකාර කළ මැනව. ශුද්ධාත්මයාණන්ගේ අලංකාර ඵල මා තුළ වර්ධනය කළ මැනව.

යේසුස්වහන්සේගේ නාමයෙන්, ආමෙන්

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. භාවනා බයිබල් අධ්‍යයන ක්‍රමය යනු කුමක්ද?

3. භාවනා බයිබල් අධ්‍යයනයේ පියවරයන් හය ලැයිස්තුගත කරන්න.

4. වචනය "අසන්නෙකු" පමණක් නොව් "එය ක්‍රියාවට නංවන්නෙකු වීම" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? ඔබගේ පිළිතුරට සහයෝගය දක්වනු පිණිස ශුද්ධ ලියවිලි පාඨයන් ද ඉදිරිපත් කරන්න.

5. භාවනා බයිබල් අධ්‍යයනය යොදා ගන්නා විට සාතන් ඊට පහර දෙන්නේ ඇයි?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

භාවනා බයිබල් අධ්‍යයන ක්‍රමය යොදාගනිමින් පිලිප්පි 4:4-9 අධ්‍යයනය කරන්න. මෙම අධ්‍යයනය හා අනෙකුත් අධ්‍යයනයන් සඳහා මෙම පෝරමය භාවිත කරන්න.

### භාවනා බයිබල් අධ්‍යයනය

**පොත :** **පරිච්ඡේදය :** **පද :** **විෂය :**

**ප්‍රධාන පදය :**

**සාරාංශය :**

**මෙනෙහි කිරීම :**

**අදාළ කරගැනීම :**

**අනුගමනය කිරීමට උදාහරණ :**

**මඟහැරීමට ඇති වැරදි :**

**ඉටු කිරීමට ඇති කාර්යයන් :**

**ප්‍රකාශ කිරීමට ඇති පොරොන්දු :**

**වර්ධනය කර ගැනීමට ඇති සම්බන්ධතා :**

**සිදු කිරීමට ඇති වෙනස්කම් :**

**යාච්ඤා කිරීමට යමක් :**

# එකොළොස් වන පරිච්ඡේදය

# පොතක් අධ්‍යයනය කිරීම

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- බයිබලයෙහි පොතක් අධ්‍යයනය කරන ක්‍රමය පැහැදිලි කිරීමට
- බයිබලීය පොතක් අධ්‍යයනය කිරීමට
- පොතක් අධ්‍යයනය කිරීමේ වගුවක් නිපදවීමට
- බයිබලයෙහි පොතක කටු සටහනක් සෑදීමට හැකි වනු ඇත.

## ප්‍රධාන පදය:

> **තරුණයෙක් තමාගේ මාර්ගය පවිත්‍ර කරගන්නේ කුමකින්ද? ඔබගේ වචනය ප්‍රකාර පැවැත්මෙනි. (ගීතාවලිය 119:9)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහිදී ඔබහට බයිබලයෙහි සම්පූර්ණ පොතක් ගවේෂණය කරන ක්‍රමය ඉගෙන ගත හැකිය. ඔබ කළාවූ අධ්‍යයනය සාරාංශ ගත කරන පිණිස වගුවක් හා කටු සටහනක් සාදන ක්‍රමය ඉගෙන ගනු ඇත. පොතක් අධ්‍යයනය කිරීමේ ක්‍රමය සඳහා ඔබහට නිදර්ශනයක් සපයා ඇත. එසේම මෙම පරිච්ඡේදයෙහි "තවදුරටත් අධ්‍යයනය" කොටසෙහි ඔබට එවැනි අධ්‍යයනයක් කිරීමට අවස්ථාව සපයා තිබේ. ඉදිරි පරිච්ඡේදයන්හිදී ඔබ පොතක පරිච්ඡේද, ඡේද, වාක්‍යය හා වචන අධ්‍යයනය කරන ක්‍රමය ඉගෙන ගනු ඇත.

පොතක් සමීක්ෂණය කරමින් අධ්‍යයනයක යෙදීම "සංයෝගාත්මක (Synthetic)" බයිබල් අධ්‍යයන ක්‍රමයට උදාහරණයකි. එහි අර්ථය නම් අන්තර්ගතය පිළිබඳ පොදු දැනුමක් ලබා ගැනීම උදෙසා මුළු ඒකකයම එකවර අධ්‍යයනය කිරීමය. ඉන්පසුව අපි එම පොත පරිච්ඡේද, ඡේද, පද හා වචන ලෙස බෙදා අධ්‍යයනය කරන කල අපි "විශ්ලේෂණාත්මක Analytical" අධ්‍යයනයක යෙදෙමු. විශ්ලේෂණය යනු මුළු ඒකකයම එය සෑදී ඇති කුඩා ඒකක ලෙස වෙන් කොට විවිධ අංග විභාග කිරීමය. විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සංයෝගාත්මක (Synthetic) අධ්‍යයනයකට වඩා සවිස්තරාත්මකය.

## ක්‍රමය අර්ථ දක්වීම

පොතක් ලෙස කරන අධ්‍යයනය වැදගත් වනුයේ කිසියම් පොතක පරිච්ඡේද, ඡේද, පද හා වචන නිසියාකාර සන්දර්භයක් තුළ අර්ථ විවරණයට ලක් කළ යුතු බැවිනි. පොතක් ලෙස අධ්‍යයනය කිරීම මෙම සන්දර්භය පිළිබඳ දැනුම සපයා දෙයි.

## ක්‍රමය පැහැදිලි කර දීම

බයිබලයෙහි පොතක් අධ්‍යයනය කිරීම සඳහා පියවර තුනක් මෙන්න :

**පළමු පියවර : මූලික සමීක්ෂණය**

පොතෙහි තේමාව (විෂය) අවබෝධ කර ගැනීම පිණිස එකවරම මුළු පොතම කියවා ගෙන යන්න. එම තේමාව සාරාංශ කොට දැක්විය හැකි මාතෘකාවක් තෝරා ගන්න. ඔබගේ පොත අධ්‍යයනය කිරීමේ වගුවෙහිදී මෙම මාතෘකාව භාවිත කරනු ඇත. එය ඔබගේ කටු සටහනෙහිද මාතෘකාව වනු ඇත.

මෙම පොත ලිවීමෙහි පරමාර්ථය, ලියන ලද්දේ කවුරුන් වෙනුවෙන්ද, කතෘ කවුද යනාදිය තීරණය කරන්න. සමහර පොත්වල කතෘ සඳහන් කර තිබේ. නමුත් තව සමහර පොත්වල කතෘවරු සොයාගැනීම පිණිස ඔබට බාහිර බයිබල් අධ්‍යයන සම්පත් දායකයෙක් සොයා ගැනීමට සිදුවනු ඇත[2]. සෑම කතෘවරයෙකුටම ශුද්ධාත්ම ආනුභාවය යටතෙහි පොතක් ලිවීම උදෙසා විශේෂ හේතුවක් විය. මෙම පරමාර්ථය පොතෙහි අන්තර්ගතය මගින් පිළිබිඹු වෙයි.

පොතෙහි භූගෝලීය පිහිටීම තීරණය කරන්න. මෙම සිදුවීම් සිදුවූයේ මෙහිදීය. පොතක අධ්‍යයන වගුවෙහි මෙය වාර්තා කරන්න.

එක් වාක්‍යයකින් මූලික ජීවන හා සේවා ප්‍රතිපත්තිය සාරාංශ ගත කරන්න. මෙය ඔබගේ ජීවිතයට හෝ සේවයට අදාළ විය හැකි පොතෙහි මූලික සත්‍යය වේ. එක් පොතක බොහෝ ප්‍රතිපත්ති ඉගැන්විය හැකිය, එනමුත් මෙම සාරාංශ ගත කළ ප්‍රකාශනය සඳහා ඉතාමත්ම වැදගත් එක නිර්ණය කරගන්න.

බයිබලයෙහි පරිච්ඡේද වෙන් කිරීම දිව්‍යමය ආනුභාවයෙන් සිදු නොකළ බව මතක තබාගන්න. ඒවා මිනිසා විසින් බයිබලයෙහි විශේෂ කිසියම් ඡේදයක් සොයා ගැනීම සඳහා පහසුවට සාදන ලද්දකි. ඔබ මුළු පොතම පරිච්ඡේද වෙන් කිරීමෙන් තොරව කියවන කල, මූලිකවම එම පණිවුඩය දෙනු ලැබූ අයුරින්ම පුනරීක්ෂණය කරනු ඇත.

ඔබගේ පළමුවන කියවීමෙහිදී විස්තර පිළිබඳ එතරම් සැලකිලිමත් නොවන්න. පොදු විස්තර සඳහා පොත සමීක්ෂණය කරන්න. එනම්: තේමාව, කතෘ, කවුරුන් සඳහාද, භූගෝලීය පිහිටීම, මූලික ජීවන හා සේවා ප්‍රතිපත්තිය මෙයින් සමහරකි. මුළු පොතෙහිම පූර්ණ දැක්මක් ලබා ගැනීමට ඉක්මණින් කියවන්න. ඔබ මගින් නතර කොට කියවන දෙය විශ්ලේෂණය නොකරන්න. ඔබ එය පසුව සිදු කරනු ඇත.

**දෙවන පියවර : පොතක අධ්‍යයන වගුව**

පොත දෙවන වරට කියවන්න. පොතෙහි ප්‍රධාන බෙදීම් සලකුණු කර ගන්න. මෙම ප්‍රධාන බෙදීම් නිර්ණය කිරීමට විෂය කරුණු, සිදුවීම්, චරිතාපදාන සාධක, භූගෝලීය පිහිටීම් හෝ එවැනි වෙනයම් සාධක උපයෝගී කරගත හැකිය.

පොතෙහි සෑම පරිච්ඡේදයක් සඳහාම මාතෘකාවක් ලබා දෙන්න. පරිච්ඡේදය සඳහා ඔබ ලබා දෙන මාතෘකාව එම පරිච්ඡේදයෙහි පොදු අන්තර්ගතය පිළිබිඹු කළ යුතුය. එනමුත් එම මාතෘකාව බයිබලයෙහි ඕනෑම පරිච්ඡේදයකට යොදා ගත හැකි තරම් පොදු නොවිය යුතුය. පරිච්ඡේදයක අන්තර්ගතය අල්ලා ගත හැකි අඬුවක් ලෙස මාතෘකාව ගැන සිතන්න. මාතෘකාව කෙටියෙන් තබාගන්න. එවිට මතක තබා ගැනීම පහසුවෙයි. පොතෙහි අධ්‍යයන වගුවට මෙම පරිච්ඡේද මාතෘකා ඇතුලත් කරන්න.
පොතෙහි ප්‍රධාන පදය තෝරා ගන්න. ප්‍රධාන පදය එම පොතෙහි පරමාර්ථය හෝ අන්තර්ගතය ඉතාමත්ම හොඳින් කැටි කොට දක්වන පදයක් විය යුතුය. පොතෙහි අධ්‍යයන වගුවට එම පදයෙහි උපුටා දැක්වීම් ඇතුළු කරන්න.

---

[2] ඔබහට බයිබල් අධ්‍යයන මෙවලම් සපයා ගත නොහැකි නම්, හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයෙහි "මූලික බයිබල් සමීක්ෂණය" නම් පාඨමාලාවෙහි මෙය ඇතුලත් වන බව සලකන්න.

ඔබ කියවා ගෙන යන අතර වගුවෙහි සපයා දී ඇති හිස්තැනෙහි ප්‍රධාන චරිතවල නම් සටහන් කරන්න. ඔබහට පුද්ගල චරිත කථා අධ්‍යයනය ඉටු කිරීමට මෙම ලැයිස්තුව උපකාරී වනු ඇත. මෙම පාඨමාලාවෙහි ඉදිරියෙහිදී එය සිදු කරන ක්‍රමය ඔබට ඉගෙන ගැනීමට ලැබෙනු ඇත.

වගුවෙහි ප්‍රධාන වචන හා වාක්‍යාංශ වාර්තාගත කරන්න. ප්‍රධාන වචන හා වාක්‍යාංශ නම් පොත අවබෝධ කර ගැනීමට මූලික වන්නාවූ වචන හා වාක්‍යයන්ය. පොතෙහි එම වචන සාමාන්‍යයෙන් පොත තුළ නැවත නැවතත් උච්චාරණය වීම හෝ විස්තරාත්මකව පැහැදිලි කරනු ලබයි. ඔබහට මෙම වචන, පසුව මෙම පාඨමාලාවෙහිදී ඉගෙනීමට යන්නාවූ වචන ඇසුරින් සිදුකරන අධ්‍යයනයෙහිදී භාවිත කළ හැකිය.

**තුන්වන පියවර : පොතෙහි දළ සටහන**

පොතක් අධ්‍යයනයෙහි අවසාන පියවර නම් දළ සටහනක් සෑදීමය. පොත නැවත කියවන්න. ඔබ කියවන අතරතුර මුළු පොත සඳහා දළ කටු සටහනක් සාදන්න. ඔබගේ දළ සටහනෙහි, වගුවෙහි ඇති බෙදීම් හා පරිච්ඡේද මාතෘකා ප්‍රධාන සාධක බවට පත්වෙනු ඇත. ඔබගේ පොතෙහි දළ සටහනක් සෑදීමේ පරමාර්ථය නම් මුළු පොතෙහි ඇතුලත් කාරණා සාරාංශ කොට දැක්වීමය.

## මෙම ක්‍රමය සඳහා උදාහරණ

### පළමු පියවර : මූලික සමීක්ෂණය :

**පොත :** සමීක්ෂණය සඳහා යොදාගත් පොත පිලිප්පි පොතය.

**තේමාව :** තේමාව නම් ක්‍රිස්තියානි එකමුතු බවට කරන ආයාචනයයි.

**කතෘ :** පොතෙහි කතෘ ප්‍රේරිත වූ පාවුල්ය.

**ලියන ලද්දේ :** පොත ලියන ලද්දේ පිලිප්පියෙහි විසූ ක්‍රිස්තියානිකරුවන් සඳහාය.

**පරමාර්ථය :** පොතෙහි පොදු පරමාර්ථය දෙයාකාරය : පාවුල්ගේ සේවය උදෙසා පිලිප්පිවරු දැක්වූ සහයෝගයට ස්තුතිවන්ත වීමට සහ ක්‍රිස්තියානි අයගේ එකමුතු බව උදෙසාය.

**ප්‍රධාන වචන :** ප්‍රීතිය, සතුට.

**ප්‍රධාන පදය** : පිලිප්පි 2:2

**චරිත :** එවෝදියස්, සින්තිකී, තිමෝතියස්, එපප්‍රොදිතස්, ක්ලෙමන්ත්, සීසර්ගේ නිවැසියෝ.

**ජීවිත හා සේවා ප්‍රතිපත්ති :** මූලික ජීවන හා සේවා ප්‍රතිපත්තිය නම් එකමුතු බවත් එය ප්‍රීතිය ගෙන දෙන බවය.

**දෙවන පියවර : පොතෙහි අධ්‍යයන වගුව**

**කතෘ :** පාවුල්

**කවුරුන්ටද :** පිලිප්පියෙහි විසූ ඇදහිලිවතුන්ට

**පරමාර්ථය :** ඔවුන්ගේ උපකාරයට ස්තුති කිරීමට හා එකමුතු වන ලෙස ආයාචනයට

**ප්‍රධාන වචන :** සතුට, ප්‍රීතිය.

**ප්‍රධාන පදය :** පිලිප්පි 2:2

**චරිත :** එවෝදියස්, සින්තිකී, තිමෝතියස්, එපප්‍රොදිතස්, ක්ලෙමන්ත්, සීසර්ගේ නිවැසියෝ.

**ජීවිතයට හා සේවයට ප්‍රතිපත්ති :** ක්‍රිස්තියානි එකමුතු බව ප්‍රීතිය ගෙන දෙයි.

---

**පොතෙහි අධ්‍යයන වගුව**
**පොතෙහි නම : පිලිප්පි පොත**
**වගුව සඳහා මාතෘකාව : ක්‍රිස්තියානි එකමුතුකමට ආයාචනය**

| 1 | 2 | 3 | 4 | 5 | |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

## තුන්වන පියවර : පොතෙහි දළ සටහන

### පිලිප්පි පොත : ක්‍රිස්තියානි එකමුතුබවට ආයාචනයක්

1. හැඳින්වීම :
    - අ. සුභාශිංසනය : 1:1-2
        1. පාවුල් හා තිමෝතියස්ගෙන්
        2. පිලිප්පියෙහි සිටින ක්‍රිස්තුස්වහන්සේ තුළ ශුද්ධවතුන්ට බිෂොප්වරුන්ට හා උපස්ථායකයින්ට
    - ආ. පිලිප්පිවරු උදෙසා යාච්ඤාව 1:3-11
    - ඇ. පෞද්ගලික කාරණා 1:12-26
        1. ශුභාරංචිය පැතිරීමට මුල් වූ සිදුවීම් 1:12-18
        2. නැවත නිදහස් කරනු ලබාවි යයි ඇදහිල්ල 1:19-21
        3. මරණය හෝ ජීවත්වීම අතරින් වඩා යහපත් කොයි එකද කියා ඔහුගේ ප්‍රශ්නය - 1:22-26

2. එක්සත්වීමට දිරි ගැන්වීම 1:27-2:18
    - අ. දුක් විඳීමෙහිදී එක්සත්ව සිටීමට කරන ආයාචනය 1:27-30
    - ආ. ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්සත් බව 2:1-11
    - ඇ. ආත්මික වර්ධනය එක්සත් බව ගෙන දෙයි. 2:12-18

3. පාවුල්ගේ සැලසුම 2:19-30
    - අ. තිමෝති එවීමට බලාපොරොත්තු වීම 2:19-33
    - ආ. ඔහුම පැමිණීමට බලාපොරොත්තු වීම 2:24
    - ඇ. එපප්‍රොදිතස් එවීම 2:25-30

4. අනතුරු ඇඟවීම 3:1-4:1
    - අ. යුදෙව්වාදී ගුරුවරුන්ට එරෙහිව 3:1-16
    - ආ. බොරු ගුරුවරුන්ට එරෙහිව 3:17-21

5. දිරිගැන්වීම : 4:1-9
    - අ. එවෝදියා සහ සින්තකී අතර එක්සත්කම 4:1-3
    - ආ. සතුටෙහිදී එක්සත්බව 4:4
    - ඇ. විනීතකමට එක්සත්බව 4:5
    - ඇ. යාච්ඤාවෙහි එක්සත්බව 4:6
    - ඉ. මනසින් එක්සත්බව 4:7-8
    - ඊ. ක්‍රියාව සහ දැනගැන්ම අතර එක්සත්බව 4:9

6. ඔවුන්ගේ දීමනාවලට ස්තුතිය 4:10-20

7. සමුගැනීම 4:21-23

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. අධ්‍යයන ක්‍රමය වඩා හොඳින් විස්තර කරන අර්ථකථනයෙහි අංකය එයට ඉදිරියෙන් ලියන්න.

| **අධ්‍යයන ක්‍රමය** | **අර්ථදැක්වීම** |
| --- | --- |
| - විශ්ලේෂණ බයිබල් අධ්‍යයනය | 1. පොදු අන්තර්ගතය සඳහා සමීක්ෂණය (පොතක සමීක්ෂණය) |
| - සංයෝගාත්මක (සින්තටික්) බයිබල් අධ්‍යයනය | 2. එක් එක් අංශ විස්තරාත්මකව අධ්‍යයනය කිරීම. |

3. පොතක් අධ්‍යයනය කිරීමේ ක්‍රමයෙහි පියවර තුන නම් කරන්න.

4. පළමුවරට පොතක් සමීක්ෂණය කිරීමේදී වාර්තා කළ යුතු මූලික කරුණු 06 මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

අලුත් ගිවිසුමෙහි පොත්වලින් එකක් පිළිබඳව පොතක අධ්‍යයනය සිදු කරන්න. ඔබගේ පළමුවන අධ්‍යයනය සඳහා කෙටි පොතක් තෝරා ගන්නා ලෙස යෝජනා කරමු. මෙම පරිච්ඡේදයෙහිදී පොතක් අධ්‍යයනය කිරීමට ඔබ ඉගෙනගත් පියවර භාවිත කරන්න. ඔබගේ අධ්‍යයන පොතට වගුවක් හා දළ සටහනක් සාදා සාරාංශ ගත කරන්න. මෙම අධ්‍යයනයට හා ඉදිරියෙහිදී පොත් අධ්‍යයනය සඳහා මඟ පෙන්වීමක් ලෙස පහත සඳහන් පෝරමය භාවිත කරන්න. මෙම පෝරමයෙහි සපයා ඇති අංක සංඛ්‍යාවට වැඩි ප්‍රමාණයක් පරිච්ඡේද පොතෙහි ඇති නම් එවිට එක පෝරමයකට වඩා භාවිත කර ඔබගේ අධ්‍යයනය සම්පූර්ණ කරන්න.

---

**පොතක අධ්‍යයන වගුව**

**පොතෙහි නම :** **වගුව සඳහා මාතෘකාව**

**පරිච්ඡේද අංක**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

**පරිච්ඡේද මාතෘකා**

කතෘ :

පරමාර්ථය :

ප්‍රධාන වචන:

ප්‍රධාන පදය :

චරිත:

ජීවිතයට හා සේවයට ප්‍රතිපත්ති :

# දොළොස් වන පරිච්ඡේදය

# පරිච්ඡේද අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- පරිච්ඡේද අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර නම් කිරීමට
- බයිබලය. පරිච්ඡේද විලසින් අධ්‍යයනය කිරීමට
- ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කිරීම සඳහා පරිච්ඡේද වගුවක් සෑදීමට
- පරිච්ඡේදය සඳහා දළ සටහනක් සෑදීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

**ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිධාන කර ගතිමි. (ගීතාවලිය 119:11)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙහිදී ඔබ බයිබලයෙහි සම්පූර්ණ පොතක් සමීක්ෂණය කරන ක්‍රමය ඉගෙන ගත්තෙහිය. දැන් ඔබ බයිබලයෙහි ඇති පොතක ඇතුලත් එක් පරිච්ඡේදයක් අධ්‍යයනය කරන ක්‍රමය ඉගෙන ගනු ඇත. පරිච්ඡේද අධ්‍යයනය සඳහා උදාහරණයක් ඔබට සපයා ඇති අතර "තවදුරටත් අධ්‍යයනය" කොටසෙහිදී ඔබට එවැනි අධ්‍යයනයක් කිරීමට අවස්ථාව සපයනු ඇත.

## ක්‍රමය අර්ථ දැක්වීම.

පරිච්ඡේද අධ්‍යයනය යනු එම නමින්ම පැවසෙන කාරණාවය. එනම් දේව වචනය පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට ඉගෙනීමය.

## ක්‍රමය පැහැදිලි කිරීම

### පළමු පියවර: පරිච්ඡේදයට මාතෘකාවක් තෝරා ගන්න.

පරිච්ඡේද අධ්‍යයන වගුවෙහි ඔබ අධ්‍යයනය කරන පොතෙහි නම සහ පරිච්ඡේද අංකය සටහන් කරන්න. මුළු පරිච්ඡේදයම කියවා බලා එහි ඇතුලත් කාරණා පිළිබිඹු වන ආකාරයේ මාතෘකාවක් යොදන්න. (ඔබ පොතක සමීක්ෂණය කර ඇත්නම් දැනටම පරිච්ඡේද සඳහා මාතෘකා තෝරා ගෙන ඇත. පොතක් අධ්‍යයනය කරන ක්‍රමය යටතේ එකොළොස්වන පරිච්ඡේදයෙහිදී පරිච්ඡේද සඳහා මාතෘකා සොයා ගන්නා ආකාරය පැහැදිලි කරන ලදී.)

### දෙවන පියවර : බෙදීම් සලකුණු කරන්න.

පරිච්ඡේදය ඇතුළත ඡේද වෙන්කිරීම් (බෙදීම්) සලකුණු කරන්න. සමහර බයිබල් පදවල ඡේද සලකුණු කොට තිබේ. තව සමහර බයිබල්වල එම අංකය තද පාටින් මුද්‍රණය කර තිබේ. ඔබගේ බයිබලයෙහි ඡේද වෙන්කිරීමේ සලකුණ හෝ තද පාට මුද්‍රණ නැති නම් එවිට ඡේද වෙන් කිරීම ඔබම කළ යුතු වේ. (සිංහල බයිබලයෙහි ඡේද වෙන්කොට අනු මාතෘකා ඇතුළත්ය). මෙය සිදු කිරීම සඳහා ඔබ ඡේදයක අර්ථකථනය දැන සිටිය යුතුය.

"ඡේදයක් යනු එකම විෂයක් පිළිබඳව ලියැවුණු වාක්‍යය/පද කිහිපයක එකතුවකි. විෂය මාරු වන කළ අලුත් ඡේදයක් ඇරඹෙයි."

ඔබගේ බයිබලයෙහි ඡේද වෙන්කරන පද වටා රවුමක් අඳින්න.

## තුන්වන පියවර : පරිච්ඡේද අධ්‍යයන වගුවක් සාදන්න.

පරිච්ඡේද අධ්‍යයන වගුවෙහි පරිච්ඡේදයෙහි මාතෘකාව සටහන් කරන්න. ඡේද වෙන්කරන පද සටහන් කරන්න (උදාහරණ බලන්න). ඉන්පසු එක් එක් ඡේදයෙහි ඇතුළත් කාරණා පිළිබිඹු වන ලෙසට මාතෘකාව බැගින් සපයන්න. "සටහන්" ලෙසට සලකුණු කොට ඇති තීරුවෙහි පරිච්ඡේදයෙහි කොටස් අතර ඇති සම්බන්ධතාවය ඔබ සිතන ආකාරයට සඳහන් කිරීමට යොදාගන්න. (උදාහරණ බලන්න). මෙම සටහන් ඔබහට පරිච්ඡේදය සඳහා දළ සටහන සෑදීමෙහිදී උපකාරී වනු ඇත.

## හතරවන පියවර : පරිච්ඡේද දළ සටහනක් සාදන්න.

මීට පෙර පරිච්ඡේදයෙහි ඔබ සම්පූර්ණ පොතක් සඳහා දළ සටහනක් සාදන ආකාරය ඉගෙන ගත්තෙහිය. දැන් ඔබ එක් පරිච්ඡේදයක් සඳහා විස්තරාත්මක දළ සටහනක් සාදනු ඇත. ඔබ පරිච්ඡේද වගුව සෑදූ කල එම පරිච්ඡේදය සඳහා දැනටම මාතෘකාවක් තෝරා ගෙන ඇත. එම මාතෘකාවම ඔබගේ දළ සටහනටද භාවිත කරන්න.

ඡේද බෙදීම් හා ඡේදවලට යෙදූ මාතෘකා ඔබගේ ප්‍රධාන කරුණු ලෙසට භාවිත කරන්න. ඉන් පසුව උප කාරණා සොයාගෙන එක පරිච්ඡේදයක පද අනුව දළ සටහන සාදන්න. ප්‍රධාන කාරණා සහ උප කාරණා ඉදිරියෙන් බයිබල් පදයෙහි අංකය ලියන්න. එසේම මෙම විෂයට අදාළ සම්බන්ධතාවයක් දරන වෙනයම් බයිබල් කොටසක් තිබේ නම් එයද සඳහන් කර එය වඩා පැහැදිලි කරන්න. (උදාහරණ බලන්න). පරිච්ඡේද අධ්‍යයනය සඳහා ඇති පෝරමයේ ඉඩ මදි නම් තවත් කොළ භාවිත කරන්න. බයිබලයෙහි ඇති දිගු පරිච්ඡේද සඳහා ඔබහට කොළ කිහිපයක් භාවිත කිරීමට සිදුවෙනු ඇත.

## ක්‍රමය සඳහා උදාහරණයක්.

පරිච්ඡේද අධ්‍යයන ක්‍රමය සඳහා උදාහරණයක් ලෙස අපි යූද් පොත තෝරා ගනිමු. එහි ඇත්තේ එක් පරිච්ඡේදයක් පමණි.

## පළමු පියවර : පරිච්ඡේදයට මාතෘකාවක් තෝරා ගන්න.

එක් පරිච්ඡේදයකින් සමන්විත යූද් පොත සඳහා තෝරාගත් මාතෘකාව නම් : "බොරු ගුරුවරුන්ට එරෙහිව අනතුරු ඇඟවීම"ය.

## දෙවන පියවර : ඡේද වෙන් කිරීම සලකුණු කරන්න.

පරිච්ඡේදය පහත සඳහන් ලෙසට වෙන් කරන ලදී. එනම් : 1, 3, 4, 5, 8, 11, 12, 14, 16, 17, 19, 20, 22, 24 පද ලෙසිනි. මෙම පද බෙදා වෙන්වීම පෙන්වීමට රවුමකින් බයිබලයෙහි සලකුණු කරන ලදී.

## තුන්වන පියවර : පරිච්ඡේද අධ්‍යයන වගුවක් සාදන්න.

පරිච්ඡේද අධ්‍යයන වගුවක් සඳහා උදාහරණයක් මෙන්න :

| **පරිච්ඡේද අධ්‍යයන වගුව** | | |
|---|---|---|
| පොත : යූද් | පරිච්ඡේදය : එක | පරිච්ඡේද මාතෘකාව : බොරු ගුරුවරුන්ට එරෙහිව අනතුරු ඇඟවීම |
| **පදය** | **ජේද මාතෘකාව** | **සටහන්** |
| 1-2 | හැඳින්වීම | කතෘ යූද් |
| 3 | පරමාර්ථය | ඇදහිල්ලට පොර ඇල්ලීම |
| 4 | සමහර මනුෂ්‍යයන් | හඳුනා ගැනීමේ චරිත ලක්ෂණ පහක් |
| 5-7 | ඓතිහාසික වාර්තාව | ඉශ්‍රායෙල්, දේව දූතයෝ, සොදොම හා ගොමෝරාව |
| 8-10 | විස්තරය ඇරඹීම | තවත් චරිත ලක්ෂණ පහක් |
| 11 | උදාහරණ සහිතව විස්තර කිරීම | කායින්, බාලම්, කෝරා |
| 12-13 | සංසදනය මඟින් විස්තර | මංගල්‍යවල ලප, වළාකුළු, ගස්, මුහුදු රළ, තාරකා |
| 14-15 | අනාගත විනිශ්චය | ඒනොක් විසින් අනාගත වාක්‍යය පැවසූ ලෙසට ස්වාමින්වහන්සේ හා ශුද්ධවන්තයන් විසින් |
| 16 | විස්තරය තවදුරටත් | තවත් චරිත ලක්ෂණ පහක් |
| 17-18 | වචන මතක තබාගන්න | යේසුස්වහන්සේ විසින් අනතුරු ඇඟවීම |
| 19 | විස්තරය තවදුරටත් | තව චරිත ලක්ෂණ තුනක් |
| 20-21 | රැවටිලිකාරකම මඟ හැරීම | කරුණු හතරක් සහිත සැලැස්ම |
| 22-23 | ඒ හා සමඟ ගනුදෙනු කරන ක්‍රමය | අංග දෙකක් |
| 24-25 | උපසංහාරය | අපව මෙම නපුරු කාරණාවලින් ආරක්ෂා කළ හැකිය. |

## හතරවන පියවර : පරිච්ඡේද දළ සටහනක් සාදන්න.

අපි යූද් පොත ඇසුරින් සිදු කළ පරිච්ඡේද දළ සටහන මෙන්න :

**යූද්හි පරිච්ඡේද දළ සටහන : බොරු ගුරුවරුන්ට එරෙහි අනතුරු ඇඟවීම.**

1. හැඳින්වීම : සුභපැතුම් 1:1-2
   - අ. කවුරුන් විසින්ද : යූද්
     1. යාකොබ්ගේ සහෝදරයා
     2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දාසයා
   - ආ. කවුරුන් වෙතද
     1. දෙවියන්වහන්සේ විසින් ශුද්ධ කරන ලද
     2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ආරක්ෂා කරන ලද
     3. කැඳවනු ලැබූ

2. පරමාර්ථය : 1:3
   - අ. මූලික පරමාර්ථය : පොදු ගැළවීම
   - ආ. අලුත් කරනු ලැබූ පරමාර්ථය : ඔව්හු ඇදහිල්ල උදෙසා මහත් වීර්යය කිරීමට දිරිගැන්වීම

3. "මනුෂ්‍ය වර්ගයක" චරිත ගුණාංග (බොරු ගුරුවරුන්): 1:4
   - අ. රහසින් ඇතුළුවීම
   - ආ. දඬුවමට නියම වූ
   - ඇ. අභක්තික වූ
   - ඈ. දේව අනුග්‍රහය සල්ලාලකමට හරවාගත්

ඉ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එපා කරන්නාවූ

4. ඓතිහාසික වාර්තා තුනක් : 1:5-7
   අ. ඉශ්‍රායෙල් : වරක් මුදාගනු ලැබ පසුව විනාශවූ : 5
   (ගණන් කථාව 13-14 සහ 1 කොරින්ති 10:5-10)
   ආ. දේව දූතයෝ : ස්වකීය මූලික ස්ථානය අතහැරියාවූ යදම්වලින් බැඳ තබා සිටින:6
   (2 පේතෘස් 2:4)
   ඇ. සොදොම සහ ගොමෝරාව : පාපය හේතුවෙන් ගින්නෙන් දඬුවම් ලැබූ :7
   (උත්පත්ති 18-19)

5. බොරු ගුරුවරු පිළිබඳ විස්තරය : 1:8-10 (4 පදයෙහි සිට විස්තර කර ඇත)
   අ. නිස්සාර හීන දකින්නෝ : 8
   ආ. මාංශය කිළුටු කරගත් : 8
   ඇ. අධිපතිකම් සුළු කරති : 8
   ඈ. උත්තමයන්ට නින්දා කරති : 8-9
      1. මිකායෙල් අග්‍ර දේවදූතයා පවා යක්ෂයාට එරෙහිව හෝ නින්දා බස් නොපැවසීය.
      2. මෙම මනුෂ්‍යයෝ ඔවුන් නොදන්නා දේ පිළිබඳව දුෂ්ටව කතා කරති.
   ඉ. ස්වාභාවික දේ කිළුටු කරති. : 10

6. මෙම දුෂ්ට මිනිසුන් උදාහරණ සහිතව විස්තර කිරීම 1:11
   අ. කායින්ගේ මාර්ගය : පව් සමාව පිණිස ලෙය අවශ්‍ය බව ප්‍රතික්ෂේප කිරීම (උත්පත්ති 4)
   ආ. බාලාම්ගේ වැරැද්ද : මුදල් පිණිස සේවයෙහි යෙදීම (ගණන් කථාව 22-24)
   ඇ. වාසිය සඳහා කෝරා කථා කිරීම : දෙවියන්වහන්සේ තෝරා පත්කළ නායකත්වය ප්‍රතික්ෂේප කිරීම. (ගණන් කථාව 16)

7. මෙම දුෂ්ට මිනිසුන් උපමාවන් තුළින් විස්තර කිරීම. (ස්වාභාවික උදාහරණ හා සංසදනය) 1:12-13,
   අ. කැලැල් : ඔබගේ මංගල්‍යයෙහි "ගල් හා සමාන වේ., කැමෙහි ගල් තිබීම.
   ආ. වලාකුළු: බොහෝ දේ පොරොන්දු වුවත් දෙනු ලබන දේවල් කිසිවක් නොමැති, පහසුවෙන් එහාට මෙහාට ගෙනයනු ලබන.
   ඇ. ගස් : මුල් හෝ ඵල නොමැති, දෙවරක් මළා වූ ගස්, වරක් පාපයෙහි සහ දෙවනුව වංචාවෙහි.
   ඈ. මුහුදු රළ : රෞද්‍රය, ශබ්ද නඟයි, කිසිවක් ඉටු නොකරයි.
   ඉ. තාරකා : දීප්තිමත් ලෙස පෙනෙයි, නුමුත් අන්ධකාරය වෙත වෙන් කොට තිබේ.

8. ඒනොක් විසින් අනාගත විනිශ්වය ප්‍රකාශ කොට තිබේ. 1:14 - 15 (උත්පත්ති 5:18-24)
   අ. ශුද්ධවන්තයන් 10,000ක් සමග ස්වාමින්වහන්සේ විසින් විනිශ්වය කරනු ලැබීම.
   ආ. ඔවුන් කළාවූ සියලු අදේවභක්තික ක්‍රියා පිළිබඳව
   ඇ. උන්වහන්සේට එරෙහිව සිදුකළ සියලු දුෂ්ඨ කතාවලට.

9. දුෂ්ට මිනිසුන්ගේ විස්තරය තවදුරටත් 1:16-17
   අ. මැසිවිලි කියන්නෝ
   ආ. කොඳුරන්නෝ
   ඇ. තමුන්ගේ තෘෂ්ණාවල් අනුව හැසිරෙන්නෝ
   ඈ. කටින් මහත් උඩඟු වචන කියන්නෝ (පුරසාරම් දොඩවන්නෝ)
   ඉ. මනුෂ්‍යයන්ගේ තරාතිරම් බලන, මුදල් හා තත්ත්වය වැනි දේ බලා සමහරු වඩා හොඳ යයි සැලකීම.

10. මතක තබා ගන්න: යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ සේක : 18-19
   අ. අවසාන කාලයෙහි සරදම් කරන්නවුන් පැමිණේවි.
   ආ. ඔව්හු තමුන්ගේම අභක්තික තෘෂ්ණාවල හැසිරෙති.
   ඇ. භේද වන්නෝ වෙති. (කණ්ඩායම්, කොටස්)
   ඈ. මාංසිකයා.

ඉ. ඔවුන් තුළ ආත්මයාණන්වහන්සේ නොමැත.

11. මෙම දුෂ්ට මනුෂ්‍යයන්ගේ රැවටිලිවලින් බේරී සිටීමට කරුණු හතරකින් යුත් සැලැස්ම: 1:20-21
    අ. නුඹලාම ඇදහිල්ල පිට ගොඩනගාගන්න. 20
    ආ. ශුද්ධාත්මයාණන් තුළ යාච්ඤා කරන්න. 20
    ඇ. ඔබව දේව ප්‍රේමය තුළ තබා ගන්න. 21
    ඈ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දයාව බලා සිටින්න. 21

12. මෙම දුෂ්ට මිනිසුන් කෙරෙහි අපගේ ප්‍රතිචාරය :1:22-23
    අ. සමහරු කෙරෙහි අනුකම්පා කරන්න. 22
        1 දුර්වල අය සහ ඕනෑකමින්ම දුෂ්ට අය අතර වෙනසක් ඇතිකරන්න. (පහත පදය බලන්න)
    ආ. අනෙක් අයව භයින් යුක්තව බේරාගන්න. 23
        1. ඔවුන්ව පාපයේ ගින්නෙන් / අපායෙන් ඇද බේරාගන්න.
        2. මාංසික බව නිසා ලප ඇති වූ වස්ත්‍රවලට පවා ද්වේෂ කරන්න.

13. අවසන් සමුගැන්ම 1:24-25
    අ. උන්වහන්සේට අපව නොවැටී තබා ගත හැක: 24
        1. අපව කැළැල් රහිතව ඉදිරිපත් කිරීමට
        2. එතුමාගේ තේජස ඉදිරියෙහි
        3. මහත් ප්‍රීතියෙන් යුක්තව
    ආ. අපගේ ගැළවුම්කාරවූ එකම දෙවියන්වහන්සේට සදාකාලයටම :25
        1. ගෞරවයද
        2. උත්කෘෂ්ඨභාවය
        3. ආධිපත්‍යය
        4. බලයද දැනටත් සදාකාලයටත් වේවා !

## ප්‍රශ්න භාවිත කිරීම.

බයිබල් කොටස් විස්තරාත්මක ලෙස අධ්‍යයන කිරීමට ප්‍රශ්න ඇසීම ඔබට උපකාරී වනු ඇත. යූද් පොතෙහි ඇති එක පරිච්ජේදය පිළිබඳ විස්තර සොයා ගැනීමට යොදාගත් ප්‍රශ්න මාලාව උදාහරණයක් ලෙස පහතින් සපයා ඇත. ප්‍රශ්න ඇසීමට ඉගෙනීම ඔබව වඩා විස්තරාත්මක අධ්‍යයනයකට යොමු කළ හැක්කේ කෙසේදැයි පෙන්වීමට, මෙම ප්‍රශ්න මාලාව ඔබට උදාහරණයක් වනු ඇත.

**1-2 පද :**

මෙම යැවුම් පත්‍රයෙහි කතෘ කවුද?
යේසුස්වහන්සේට ඇති සම්බන්ධතාවය ගැන කුමක් පැවසේද?
යාකොබ්ට ඇති සම්බන්ධතාවය කුමක් යැයි පැවසේද?
යූද් තම පාඨකයින් ක්‍රිස්තියානින් බව හැඳින්වීමට යොදාගත් ක්‍රම 3 මොනවාද?
"ආරක්ෂා කරනු ලබන්නාවූ" යන්නෙහි අර්ථය කුමක්ද?
ඔහු "ආරක්ෂා කරනු ලැබූවන්ට" ලියන බැවින් එයින් තේරුම් යන්නේ කැඳවනු ලැබ, ප්‍රේම කරනු ලැබ, එහෙත් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ "ආරක්ෂා කරනු නොලබන" අය සිටින බවද?

**3 පදය :**

"පොදු ගැළවීම" යනු කුමක්ද?
යූද් 3හි යූද්ගේ මනස මෙම ලිපියෙහි විෂය වෙනස් කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ කළ බව පෙන්වනුයේ කුමකින්ද?
ඔහු මුලික වශයෙන් ලිවීමට අදහස් කළේ කුමක්ද?
ශුද්ධවන්තයන් යනු කවුද?

4 පදය

ඇදහිල්ල උදෙසා "පොර බදින" ලෙස යුද් පවසන්නේ ඇයි?
"පොර බැදීම" යනු කුමක්ද?
ලියවිලි පාඨයෙන් පෙන්නුම් වනුයේ මෙම බොරු ගුරුවරු දැනටම ඇවිත් සිටින බවද ? ඉදිරියෙහි ඒමට ඇති බවද?
මෙම අදේව භක්තික මනුෂ්‍යයෝ රිංගාගෙන ඇත්තේ කුමකටද?
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හැඳින්වීමට යොදා ගෙන ඇති වචන දෙක මොනවාද?
මෙම අදේව භක්තික මිනිසුන් විස්තර කිරීමට යොදා ගත් කාරණා තුන මොනවාද?

5-8 පද

5 වෙනි පදයෙහි ඉශ්‍රායෙල් පිළිබඳ සඳහන් කාරණා 2 මොනවාද?
එය යුද්ගේ විෂයට අදාළ වන්නේ කෙසේද?
6 වෙනි පදයෙහි විස්තර කර ඇති අය අතර සිටි ප්‍රධාන දේවදූතයා කවුද?
"මහත් දවස" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
"සදාකාල ගින්න" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

9-10 පද

මිකායෙල් යනු කවුද?
මිකායෙල් යක්ෂයාට දොස් නොතැබුවේ ඇයි?
මිකායෙල් හා යක්ෂයා අතර විවාදය කුමක්ද?
10 වෙනි පදයෙහි සඳහන් දුෂ්ට කතා කියන අය කවුද?

11 පදය

මෙම පදයෙහි සඳහන් දඬුවම් පිළිබඳ උදාහරණ තුන මොනවාද?
කායින්ගේ පාපය කුමක් වීද?
බාලාම්ගේ පාපය කුමක් වීද?
කෝරාගේ පාපය කුමක් වීද?
අදේව භක්තික මනුෂ්‍යයන්ගේ ක්‍රියා විස්තර කිරීමට යොදා ඇති ක්‍රියා පද තුන මොනවාද?

12-13 පද

යුද් මෙම අදේව භක්තික මිනිසුන් ස්වභාව ධර්මයෙහි කාරණා තුනක් සමඟ සංසන්දනය කරයි. ඒවා මොනවාද?
විස්තර කර දී ඇති පරිදි මුහුදු රළ, වළාකුළු හා තාරකා අතර පවතින සමානකම් මොනවාද?

14-16 පද:

ඒනොක් යනු කවුද?
16 පදයෙහි සඳහන් පරිදි මනුෂ්‍යයන් හට ගෞරව කිරීමේ පරීක්ෂාවට යොමු කරවන කාරණා මොනවා විය හැකිද?

17-19 පද

17 පදයෙහි සඳහන් කුමක් 1 පදයට සමානද?
17 පදයෙහි හා 5 පදයෙහි සමානකම කුමක්ද?
15 හා 18 පදවල "අභක්තික" යන පදය කී වතාවක් සඳහන් වේද?

20-23 පද

20 පදයට අනුව ඇදහිල්ල පැවතීම පිළිබඳව වගකීම කවුරුන් සතුද?

ක්‍රිස්තියානි ජීවිතයෙහි සම්පූර්ණ පරිණතභාවය හිමි කර ගැනීමට යන කාලය “ගොඩ නඟා ගැනීම” යන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කෙසේ බලපායිද? අපව දේව ප්‍රේමය තුළ තබා ගැනීමට වගකීම සතු කාටද?

**24-25 පද**

අපව නොපැකිළෙන ලෙස තබා ගැනීමට සමත් කවුද?
දෙවියන්වහන්සේ ඉදිරියෙහි කැළැල් නැතිව තැබීම යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
25 පදයෙහි සඳහන් දෙවියන්වහන්සේගේ ගුණාංග මොනවාද?

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. බයිබල් අධ්‍යයනයෙහි පරිච්ඡේද අධ්‍යයන ක්‍රමය යනු කුමක්ද?

3. බයිබල් අධ්‍යයනයෙහි පරිච්ඡේද අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර නම් කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඔබ මෙම පරිච්ඡේදයෙහිදී උගත් කරුණු උපයෝගී කරගෙන 2 පේතෘස් 2 පරිච්ඡේදය පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන්න. උදාහරණය ලෙස භාවිත කළ යූද් පරිච්ඡේදයෙහි මෙන්ම මෙම පරිච්ඡේදයෙහිද විෂය එකම කාරණාවක් සම්බන්ධව වේ.

   මීළඟ පිටුවෙහි සපයා ඇති පරිච්ඡේද අධ්‍යයනය සඳහා හිස් පෝරමය භාවිත කරන්න. ඉදිරියෙහිදී පරිච්ඡේද අධ්‍යයනයන් සඳහා මෙහි පිටපත් සාදාගන්න.

2. 2 පේතෘස් 2 ඇසුරින් ප්‍රශ්න මාලාවක් සාදාගන්න. මීළඟ පරිච්ඡේදවලදී ඔබ ඉගෙනීමට යන ඡේද, පද හා වචන අධ්‍යයනය සඳහා වැඩි විස්තර ලබා ගැනීමට එය ඔබට උපකාරී වනු ඇත.

3. මතෙව්, මාර්ක්, ලූක්, යොහන් ශුභාරංචි පොත් කියවන්න. යේසුස්වහන්සේ ඇසූ සියලු ප්‍රශ්න ලියාගන්න. උන්වහන්සේ අනෙක් අයට ඉගෙනීමට උපකාර කරන පිණිස ප්‍රශ්න භාවිත කළ අන්දම නිරීක්ෂණය කරන්න.

# පරිච්ඡේද අධ්‍යයනය

පොත : ______________________________

පරිච්ඡේදය : ______________________________

පරිච්ඡේදයෙහි මාතෘකාව : ______________________________

**පදය** **රිච්ඡේදයෙහි මාතෘකාව** **සටහන්**

# දහතුන් වන පරිච්ඡේදය

# ඡේද අධ්‍යයනය කිරීම

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ඡේද අධ්‍යයනයක් කරන ක්‍රමය පැහැදිලි කිරීමට
- ඡේද අධ්‍යයනය කිරීමට.
- ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කිරීම පිණිස ඡේද වගුවක් සෑදීමට.
- බයිබලයෙහි ඡේදයක කටු සටහන සෑදීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය:

**ඔබගේ වචනය එළිදරව්වීමෙන් ආලෝකය ලැබේ. එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ. (ගීතාවලිය 119:130)**

## හැඳින්වීම

ඔබ බයිබලයෙහි පොතක් සමීක්ෂණය කිරීමට හා පොතක පරිච්ඡේදයක් අධ්‍යයනය කිරීමට ඉගෙන ගෙන ඇත. ඔබ පරිච්ඡේදයක් අධ්‍යයනය කළ විට එය ඡේදවලට බෙදා වෙන්කළෙහිය. දැන් ඔබ එම ඡේද අධ්‍යයනය කරන ක්‍රමය ඉගෙන ගනු ඇත. ඡේද අධ්‍යයනයට උදාහරණයක් ඔබහට සපයා දී ඇත. වැඩිදුරටත් "තවදුරටත් අධ්‍යයනය" කොටසෙහිදී ඔබට එවන් අධ්‍යයනයක් සිදුකිරීමට අවස්ථාව සැපයෙනු ඇත.

## ඡේද අධ්‍යයනය

### පළමු පියවර : පරිච්ඡේද අධ්‍යයනයක් සිදු කරන්න.

ඔබ දැනටම ඉගෙන ගෙන ඇති පරිදි බයිබලයෙහි සෑම පරිච්ඡේදයක්ම ඡේද කිහිපයකින් සමන්විතය. ඡේද යනු එකම විෂයයකට අයත් වන පද සමූහයකි. විෂය වෙනස් වන කල අලුතින් ඡේදයක් ඇතිවේ. ඔබ පරිච්ඡේදයක් අධ්‍යයනය කරන විට, ඔබට වැදගත් ඡේදයන් හෝ එකිනෙකට සම්බන්ධිත ඡේද කිහිපයක් හමුවනු ඇත. මේවා ඡේද අධ්‍යයනය සඳහා භාවිත කළ හැකි කොටස් වේ.

### දෙවන පියවර : විස්තර නිරීක්ෂණය කරන්න.

පරිච්ඡේදයක ඇතුලත් ඡේද විවිධාකාරයෙන් එකිනෙකට සම්බන්ධ විය හැකිය. ඔබ ඡේදයක් අධ්‍යයනය කිරීමෙහිදී නිරීක්ෂණය කළ යුතු විශේෂ කාරණා පහතින් දැක්වේ.

**සම්බන්ධිකාරක පද:**

සම්බන්ධිකාරක පද ඉතා වැදගත්ය. එමඟින් ඡේදයක් ඇතුළත හා ඡේද අතර සම්බන්ධතාවයන් පැහැදිලි කොට හෙළි කර දෙයි. "නමුත්" යනු සම්බන්ධිකාරක පදයකි. එමඟින් ප්‍රතිවිරුද්ධතාවයක් හඳුන්වා දෙයි. උදාහරණයක් ලෙස:

**නමුත් මොවුහු තමුන් නොදන්නා කොයි දේටත් නින්දා කරති. නුවණ නැති තිරිසනුන් ලෙස ජම්මගතියෙන් ඔවුන්ට තේරෙන මේ දේවලින් තුමූම විනාශ කරනු ලබන්නෝය. (යූද් 1:10)**

මෙම ඡේදයෙහි ප්‍රතිවිරුද්ධතාවයක් පවතී. බොරු ගුරුවරු ඔවුන් නොදන්නා කාරණා පිළිබඳ නින්දා කරති. එසේම ඔවුන් දන්නා කාරණාද විනාශ කරති. මෙම පදය "නමුත්" යන පදයෙන් ඇරඹෙන බැවින් 9 වෙනි පදය සලකා බලා ප්‍රතිවිරුද්ධතාවය කුමක්දැයි සොයා ගැනීමට ඔබව යොමු කරවයි.

> **නුමුත් අග්‍ර දේවදූතයා වූ මිකායෙල් යක්ෂයා සමඟ පොර බදන අතර මෝසෙස්ගේ මිනිය ගැන විවාද කරද්දී නින්දිතවූ විනිශ්චයක් ඔහුට විරුද්ධව කරන්ට භය වී : ස්වාමීන්වහන්සේ නුඹට තරවටු කරන සේක්වයි කීවේය. (යූද් 1:9)**

10 වෙනි පදය උත්තමයන්හට නින්දා කරන බොරු ගුරුවරු අග්‍ර දේව දූතයා මිකායෙල් සමඟ සංසන්දනය කොට ප්‍රතිවිරුද්ධතාවය පෙන්වා දෙයි. මිකායෙල් ඉහළ තනතුරක් දැරුවද යක්ෂයාට එරෙහිව චෝදනා නොකර "ස්වාමීන්වහන්සේ ඔබට තරවටු කරන සේක්වා" යි පැවසීය. සම්බන්ධීකාරක පදය වන "හෝ" යෙදීමෙන් ප්‍රතිවිරුද්ධ අදහස් පිළිඹිබු වෙයි. උදා. ලෙස:

> **මක්නිසාද යහපත් වේවා, නපුරු වේවා, සියලු ක්‍රියාද සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවන සේක. (දේශනාකාරයා 12:14)**

ඔබ බැලිය යුතු අනෙකුත් සම්බන්ධීකාරක පද නම්, "එලෙස", "එසේ", "එවැනි" යන පදය. මෙම පද යෙදීමෙන් ප්‍රතිවිරුද්ධ අදහස් වෙනුවට සමානතාවයක් ප්‍රකාශ වේ. පහත සඳහන් පදයෙහි උදාහරණ ලෙස සාතන්ව සිංහයෙකුට සමාන කොට ඇත.

> **සිහි ඇතිව අවදිව ඉන්න. නුඹලාගේ විරුද්ධකාරයා වූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝහෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. (1 පේතෘස් 5:8)**

එසේම "සහ" යනු තවත් සම්බන්ධීකාරක පදයකි. එයින් දැන් ප්‍රකාශ කළාවූ කාරණයට යමක් එකතු කරවයි.

> **එහෙත් ඒ ආකාරයෙන්ම මොව්හුත් තමුන්ගේ නිස්සාර හීන දැක්වීම්වලදී මාංසය කිලුටු කර ගනිති. අධිපතිකම සුළු කරති. උත්තමයන්ට නින්දා කරති. (යූද් 1:8)**

"නම්" යන පදය කොන්දේසියක් හඳුන්වා දෙයි. පරණ ගිවිසුමෙහි බොහෝ පොරොන්දු හා අනාගතකීම්වල මෙම පදය ඇතුලත්ව පවතී. එමඟින් දෙවියන්වහන්සේගේ ජනතාව කිසියම් ප්‍රතිචාරයක් දැක්වුයේ නම් දෙවියන්වහන්සේ සිදු කරන දෙය ප්‍රකාශ කරයි.

> **මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත් මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි. (2 ලේකම් 7:14)**

"පිණිස" යන පදය පරමාර්ථයක් හඳුන්වා දෙයි. එමඟින් කිසියම් පරමාර්ථයක් ඉටු වන පිණිස කිසියම් දෙයක් මෙසේ සිදුවූ බව පෙන්වා දෙයි.

> **මෙසේ වූයේ: උන්වහන්සේ නාසරියයෙක්යැයි කියනු ලබන සේකැයි අනාගතවක්තෘවරුන් කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණ වන පිණිසය. (මතෙව් 2:23)**

ඔබ සෙවිල්ලෙන් සිටිය යුතු වෙනත් සම්බන්ධීකාරක පද නම් "එබැවින්" "එලෙස" "සඳහා". මෙම වචන හේතුව හා ප්‍රතිඵලය හඳුන්වා දෙයි.

> **උන්වහන්සේ සමූහයන් දැක ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පා කළ සේක. (මතෙව් 9:36)**

"තුළ" "තුළින්" හා "සමඟ" යනාදියද ඉතා වැදගත් සම්බන්ධීකාරක පද වේ. එම වචන මඟින් සංකල්ප අතර සම්බන්ධතාවය පෙන්නුම් කර දෙයි.

> **උන්වහන්සේ මුහුද වියළි බිමක් කළ සේක. ඔව්හු ගංගාව මැදින් පයින් ගියෝය. එහිදී අපි උන්වහන්සේ කෙරෙහි ප්‍රීතිවීමුව. (ගීතාවලිය 66:6)**

**පොදු ආකෘතිය :**

ඔබ ජේද අධ්‍යයනය කරන විට අදහස් සකසා ඇති ආකාරය හා පද එකිනෙකට සම්බන්ධව පවතින ආකාරය නිරීක්ෂණය කරන්න. සමහරවිට කතෘ පොදු ප්‍රකාශනයක් සිදු කොට පසුව එය උදාහරණ සහිතව විස්තර කරයි. අනෙකුත් අවස්ථාවකදී ඔහු අදහස් මාලාවක් සඳහන් කොට පොදු ප්‍රකාශනයකින් සාරාංශ ගත කරයි.

මෙම පරිච්ජේදයෙහි පසුව සපයා දී ඇති උදාහරණ සලකා බැලීමේදී යූද් බොරු ගුරුවරුන්ගේ ගුණාංග පිළිබඳව ජේද කිහිපයක් ලියූ බව පෙනී යයි. ඉන්පසුව ඔහු ප්‍රකාශ කළ කාරණා පැරණි ගිවිසුමෙහි උදාහරණ මඟින් වැඩි දුරටත් පෙන්නුම් කර දී ඇත.

**නැවත නැවත කීම :**

බයිබලයෙහි ඇති සෑම වචනයක්ම ශුද්ධාත්ම ආනුභාවයෙන් යුක්තය. එබැවින් කිසියම් වචනයක් හෝ වාක්‍යාංශයක් නැවත- නැවතත් කීමෙන් එය ඉතා වැදගත් බව පෙන්නුම් කරයි. ශුද්ධාත්මයාණෝ දේව වචනය ලියූ අයට කිසියම් පද වචන හෝ වාක්‍යාංශ නැවත- නැවතත් කීමට සැලැස්වූයේ ඒවා ඔබගේ මනසෙහි රැඳී තිබිය යුතු බැවිනි.

"සැබවක් සැබවක්" යන පදය උදාහරණයක් ලෙස බලන්න. යේසුස්වහන්සේ එම වචන පවසමින් කතා කිරීමට පටන් ගත් කල එය හරියට නිවේදකයෙක් "කරුණාකර මට සවන් දෙන්න ඉතා වැදගත් පණිවිඩයක් ඔබට පැවසීමට මට තිබේ" යයි කියනු සමානය. නැවත නැවතත් සඳහන් කර ඇති කිසියම් වචන, වාක්‍යංශ හෝ පද සවිස්තරාත්මකව අධ්‍යයනය කරන්න.

**ප්‍රශ්න සහ පිළිතුරු:**

බයිබලයෙහි ඇති ප්‍රශ්න සහ පිළිතුරු සලකා බැලීම වැදගත්ය. බොහෝවිට කතෘවරයෙකු විෂයයක් හඳුන්වා දීම සඳහා ප්‍රශ්නයක් අසයි. ඉන්පසු ඔහු එම ප්‍රශ්නය පැහැදිලි කොට එයට සැපයිය හැකි පිළිතුරු ඉදිරිපත් කරයි. මේ සඳහා කදිම නිදසුනක් නම් රෝම 6 වෙනි පරිච්ජේදයයි. මුළු පරිච්ජේදයම කියවන්න. 1-3 දක්වා පදවල සඳහන් ප්‍රශ්නයද ඉන් පසුව මුළු පරිච්ජේදය පුරා සඳහන් කර ඇති එයට පිළිතුරුද සලකා බලන්න.

**හැඳින්වීම්:**

විෂය හඳුන්වා දෙන්නාවූ ජේද දෙස විමසිලිමත් වන්න. උදා: ලෙස: පසුගිය පරිච්ජේදයෙහිදී ඔබ අධ්‍යයනය කළාවූ යූද් පොතෙහි තුන්වන පදය ඊළඟට ඇති පදවලට හැඳින්වීමක් සපයයි.

> **ප්‍රේමවන්තයෙනි අපේ පොදු ගැළවීම ගැන නුඹලාට ලියා එවන්ට මුළු උත්සාහය දරන විට එක වරක්ම ශුද්ධවන්තයන්ට භාරදුන් ඇදහිල්ල උදෙසා උනන්දු ආකාරයෙන් පොර අල්ලන ලෙස අවවාද කරමින් නුඹලාට ලියා එවන්ට මට ඕනෑ විය. (යූද් 1:3)**

මෙම හඳුන්වා දීමේ ජේදය ඔහු පොත ලියූ පරමාර්ථය පහදා දෙයි. ඔහු සැබෑ ඇදහිල්ල උදෙසා ඔවුන්ව උදක්ම පොර බදින ලෙස දිරිගන්වයි. එම ජේදයෙහි ඉතිරි කොටසින් ඔහුගේ දිරිගැන්වීමට හේතු කාරණා ඉදිරිපත් කරයි. ඔවුන්ව සැබෑ ඇදහිල්ලෙන් වෙනස් කිරීමට උත්සාහ දරන බොරු ගුරුවරු සභාවට ඇතුළු වෙමින් සිටිති.

**සාරාංශ ගත කිරීම හා අවසන් කිරීම:**

මුළු ජේදයක්, පරිච්ජේදයක් හෝ සමහරවිට පොතක්ම සාරාංශ කොට දක්වන කොටස් (ජේදයන්) පිළිබඳව විමසිලිමත්ව උද්යෝගයෙන් බලන්න. උදාහරණ ලෙස: දේශනාකාරයාගේ පොතෙහි මුළු පොතම සාරාංශ කොට දක්වන එක් පදයක් තිබේ. දේශනාකාරයාගේ පොතෙහි කතෘ දෙවියන්වහන්සේගෙන් තොරව ඔහු ජීවිතය සෙවූ අයුරු විස්තර කරයි. ඔහුගේ අවසන් නිගමනය වූයේ :

**සියල්ල අසන ලදී. මුළු කාරණයේ තීන්දුව නම් මේය: දෙවියන්වහන්සේට භයව උන්වහන්සේගේ ආඥා පවත්වන්න. මේ වනාහි සියලු මනුෂ්‍යයන්ගේ යුතුකමය. මක්නිසාද යහපත් වේවා නපුරු වේවා සියලු ක්‍රියාද සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවන සේක. (දේශනාකාරයා 12:13-14)**

**සිතුවිල්ල ක්‍රමයෙන් වැඩි දියුණු කිරීම :**

ජේද අධ්‍යයනය කිරීමෙහිදී සිතුවිල්ල ක්‍රමයෙන් ඉදිරියට ගෙන යන ජේද දෙස විමසිලිමත් වන්න. පහත සඳහන් ජේදය සලකා බලන්න.

**එසේය මේ කාරණය නිසාම මුළු උත්සාහයෙන් නුඹලාගේ ඇදහිල්ල සමඟ ගුණයද ගුණය සමඟ දැනගැන්මද දැනගැන්ම සමඟ පමණ දැන ක්‍රියා කිරීමද පමණ දැන ක්‍රියා කිරීම සමඟ ඉවසිල්ලද ඉවසිල්ල සමඟ දේව භක්තියද දේව භක්තිය සමඟ සහෝදර ස්නේහයද සහෝදර ස්නේහය සමඟ ප්‍රේමයද සපයා ගන්න. මක්නිසාද මේවා නුඹලාට තිබේ නම්, වැඩි වේ නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමෙහි කම්මැළි බවටවත් අඵල බවටවත් පැමිණෙන්ට ඒවා නුඹලාට ඉඩ නොදෙයි. නුමුත් මේවා නැති තැනැත්තේ තමාගේ පරණ පව්වලින් පවිත්‍ර කරනු ලැබූ බව මතක නැති කොට ළඟ තිබෙන දේ පමණක් බලමින් අන්ධව සිටියි. (2 පේතෘස් 1:5-9)**

මෙම ජේදය නියත වශයෙන්ම ක්‍රමයෙන් වැඩි දියුණු වෙමින් ඉදිරියට යයි. අප සවිලවත් වන තුරු එක් ගුණාංගයකට තවත් එකක් එකතු කළ යුතුය.

**සාහිත්‍යමය ස්වරූපය:**

සාහිත්‍යමය ස්වරූපය යනු කොටසක් ලියා ඇති ආකාරය වේ. සමහර ජේද නාට්‍යානුරූපව හෝ කතාවක් විලසින් ඇත. එනම් එය කතාවක් කියවන ලෙසින් වේ. තව සමහර ජේද කවියක ස්වරූපයෙන් ගීතාවලියෙහි මෙන් ලියා ඇත. තව කොටස් උපමා කතා වේ. එනම් ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීම සඳහා භාවිත කරන කුඩා කතාවකි. සමහර ජේද නාට්‍යයක් වැනිය. උදාහරණ ලෙස: සාලමොන්ගේ ගීතය නාට්‍යයක් ලෙස හා කාව්‍ය ආකාර වේ. සවිස්තර අනුශාසනා වල ස්වරූපය දේශනාවක් වැනිය. එය කිසියම් විෂයක් පිළිබඳව උපදෙස් මාලාවක් සහිත ජේද කිහිපයකි.

**ප්‍රධාන වචන :**

කිසියම් ජේදයක ඇතුළත් ප්‍රධාන වචන හඳුනා ගැනීම එම කොටසෙහි අර්ථය තේරුම් ගැනීමට උපකාරී වේ. ප්‍රධාන වචන නම් එම ජේදයට වැදගත් වූ වචනය. බොහෝ අවස්ථාවන්හිදී එම වචන නැවත නැවතත් සඳහන් කරන ලද වචන වේ. විශේෂයෙන්ම ඔබට වටහා ගැනීමට අපහසු වචන සලකුණු කරන්න. එම වචන සඳහා වචන අධ්‍යයනයක් කළ හැකි වන්නේය. (මෙම පාඩමාලාවෙහි පසු පාඩමකදී වචන අධ්‍යයනය කරන ක්‍රමය ඔබ ඉගෙන ගනු ඇත.) උදාහරණ ලෙස: පහත සඳහන් කොටස කියවන්න.

**මක්නිසාද පුරාණ කාලයේදී මේ දඬුවමට නියම කොට තැබුවාවූද අභක්තිකවූද අපගේ දෙවියන්වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවාගන්නාවූද අපගේ එකම අධිපතිවූ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එපා කරන්නාවූද මනුෂ්‍යයන් වගයක් රහසින් ඇතුල් වී සිටිති. (යූද් 1:4)**

ඔබ “සල්ලාලකම” යන වචනයෙහි තේරුම දන්නවාද? මෙම වචනය බොරු ගුරුවරු විස්තර කිරීමට යොදාගෙන ඇති බැවින් එය වැදගත්ය. බොරු ගුරුවරුන්ගේ එක් චරිත ලක්ෂණයක් නම් ඔවුහු දෙවියන්වහන්සේගේ අනුග්‍රහය සල්ලාලකමට හරවා ගැනීමය. අධ්‍යයනය සඳහා මෙය ප්‍රධාන වචනයකි.

**ව්‍යාකරණ ගොඩනැගී ඇති ආකාරය :**

ව්‍යාකරණය යනු කතාවෙහි වාක්‍යය හා ජේද ගොඩනැංවීම සඳහා යොදාගන්නාවූ වචන හෝ කතාවෙහි කොටස් වේ. ක්‍රියා පද ලෙසින් හඳුන්වන පද පිළිබඳව සැලකිලිමත්වන්න. ක්‍රියා පද යනු කිසිවෙක් කළාවූ, කරමින් පවතින්නාවූ හෝ කිරීමට යන්නාවූ ක්‍රියාවන්ය. ක්‍රියා පද අණදීමටද භාවිත කෙරේ.

> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න.** (මාර්ක් 16:15)

"ගොස්" "ප්‍රකාශ කරන්න" යනු ක්‍රියා පදයන් වේ. එමඟින් අපට යන ලෙස අණකරයි. මෙය කීකරු වීම සඳහා ආඥාවකි.
නාම පද යනු යම් පුද්ගලයෙක්, ස්ථානයක් හෝ භාණ්ඩයක් හැඳින්වීමට යොදාගන්නා පදයකි. පහත සඳහන් පදයෙහි ඇල අකුරින් සඳහන්වන්නේ නාම පද වේ.

> **යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දාසයෙක්ද යාකොබ්ගේ සහෝදරයාදවූ යූදස් යන මා විසින් ...** (යූද් 1:1).

නාම පද මඟින් අපට එයට සම්බන්ධ වු පුද්ගලයන් කවුද සිදුවූ කාරණාව කුමක්ද සිදුවූයේ කුමන ස්ථානයෙහිද යන විස්තරය සපයා දෙයි. "සර්ව නාමයක්" යනු නාම පදයක් වෙනුවට යොදාගන්නා පදයකි. උදාහරණ ලෙස: "ඔහු" හෝ "ඇය" සර්ව නාමයන් වේ. "ශුද්ධාත්මයාණෝ යූද්ට පොත ලිවීමට පෙලඹවූ සේක" වෙනුවට "ශුද්ධාත්මයාණෝ ඔහුව පොත ලිවීමට පෙලඹවූ සේක" යි පැවසිය හැකිය. මෙලෙස "ඔහු" යන සර්ව නාමය "යූද්" යන නාම පදය වෙනුවට භාවිත කළ හැකිය.

විශේෂණ පද හා ක්‍රියා විශේෂණ කතාවෙහිදී ඉතා වැදගත්ය. ක්‍රියා විශේෂණ අපට ක්‍රියාවක් පිළිබඳව පවසයි. එමඟින් ක්‍රියාව සිදුවූ ආකාරය විස්තර කරයි. උදාහරණ ලෙස: ඔහු වේගයෙන් දිව්වේය" යන වාක්‍යයෙහි "වේගයෙන්" යනු ක්‍රියා විශේෂණයකි. ඔහු දිව ගිය ආකාරය එයින් කියැවේ. නාම විශේෂණයකින් නාමයක් හෝ සර්ව නාමයක් විස්තර කරයි. "යූද් උසයි." මෙහිදී "උසයි" යනු යූද් විස්තර කිරීමට යොදාගත් පදයෙහි විශේෂණයකි.

ඔබ මීට පෙර ව්‍යාකරණ සම්බන්ධව ඉගෙන ගෙන නොමැති නම් මෙම කොටස ඔබට මඳ වශයෙන් වියවුල් සහගත විය හැකිය. එනමුත් ඔබ එය පුහුණු වීමත් සමඟ පහසුවෙන් හඳුනාගැනීමට හැකි වනු ඇත. කතාවෙහි කොටස් හඳුනාගැනීම වැදගත් වනුයේ එමඟින් ඔබහට පුද්ගලයන් ස්ථාන හා භාණ්ඩ හඳුනාගැනීමට සහාය වන බැවිනි. එමඟින් යම්කිසි තැනැත්තෙක් කුමන කාර්යයක් කවදා කෙසේ කළේදැයි පවසයි. එමඟින් කිසියම් කාර්යයක් කළේ කෙසේද, එය කුමක්ද, කවදා සිදුවීද, කරමින් පවතීද ඉදිරියට කිරීමට යයිද කියා විස්තර කරයි. එසේම විෂය කරුණු පිළිබඳව අවබෝධය වැඩි කිරීමට තුඩු දෙන්නාවූ විස්තර සපයා දෙයි.

## තුන්වන පියවර : ජේද අධ්‍යයන වගුවක් සාදන්න :

දෙවන පියවරෙහි විස්තර කළ අයුරින් ජේද අධ්‍යයනයක යෙදීමේදී සමහර ජේද එකිනෙකට සම්බන්ධතාවයක් දරන බව ඔබට වැටහී යන්නට ඇත. එම සම්බන්ධතාවය එකිනෙකට පරස්පර වීම, සංසන්දනාත්මක වීම, ක්‍රමයෙන් දියුණු වීම හෝ වෙනකිසියම් ආකාරයක් විය හැක. ජේද අධ්‍යයනය සඳහා මේවා තෝරාගන්න.

ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කිරීමට ඔබ වගුවක් සාදනු ඇත. ඔබගේ වගුව සඳහා පොදු මාතෘකාවක් තෝරා ගන්න. එය ජේදවල සම්බන්ධතාවය හා විෂයෙහි සම්බන්ධතාවය පිළිඹිබු කළ යුතුය. වගුවට ඔබගේ අධ්‍යයනයෙහිදී සොයාගත් ජේද මාතෘකා හා බෙදීම් ඇතුලත් කරන්න. ඔබ අධ්‍යයනය කළ පොත පරිච්ජේදය හා ජේදය වගුවෙහි වාර්තා කරන්න. වගුවෙහි දෙපස තීරු ඔබගේ නිරීක්ෂණ හා අදාළ කිරීම් සටහන් කිරීමට යොදාගන්න.

**හතරවන පියවර : ජේද දළ සටහනක් සාදන්න** :

ඔබගේ වගුව උපයෝගි කරගෙන ජේදයෙහි දළසටහනක් සාදන්න. ඔබ සාදන්නාවූ දළ සටහනක් අන්‍යයන් සමඟ දේව වචනයෙහි සත්‍යයතාවයන් බෙදා ගැනීමෙහිදී ඔබ ඉගෙන ගත් කාරණා ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීමට ඔබට උපකාරී වනු ඇත.

## ක්‍රමය සඳහා උදාහරණයක්

**පළමු පියවර : පරිච්ජේද අධ්‍යයනයක් කරන්න** :

මීට පෙර පාඩමෙහිදී යූද් 1 ඇසුරින් පරිච්ජේද අධ්‍යයනයක් සිදුකරන ලදී. මේ ඇසුරින් අප ජේද අධ්‍යයනයක් කරන්නෙමු. එබැවින් අප පළමු පියවර දැනටම අවසන් කර ඇත්තෙමු.

**දෙවන පියවර : විස්තර නිරීක්ෂණය කරන්න**:

යූද් 1 පරිච්ජේදයෙහි ජේද විස්තරාත්මකව අධ්‍යයන කර ඇති බැවින් එහිදී ඔබ ජේද අතර සම්බන්ධතාවයන් පැන නැගි ආකාරය පද 4, 8-10, 16, 17-18 සහ 19 දී දුටුවෙහිය. මෙම ජේද සියල්ල බොරු ගුරුවරුන්ගේ චරිත ලක්ෂණ විස්තර කර දෙයි.

**තුන්වන පියවර : ජේද අධ්‍යයන වගුවක් සාදන්න**:

මීට පෙර අධ්‍යයනයන්හිදී ඔබගේ අධ්‍යයනය සඳහා හිස් වගු ඔබට සැපයුවෙමු. ජේද අධ්‍යයනය සඳහා ඔබ ඔබගේම වගුව ඇඳගත යුතු වේ. එයට හේතුව අවශ්‍ය කරන ඉඩ ප්‍රමාණය කොපමණ වේදැයි අපට නියත ලෙස නිර්ණය කළ නොහැකි වීමය. එබැවින් නියමිත ප්‍රමිතියකින් යුත් වගුවක් අපට සැපයිය නොහැකිය. සමහර ජේද බොහෝ විස්තර සහිත දිගු ජේද විය හැකිය. එවන් ජේද සඳහා වැඩි ඉඩ ප්‍රමාණයක්ද අවශ්‍ය වනු ඇත.

ජේද වගුව සඳහා උදාහරණයක් පහතින් දැක්වේ. ඔබගේ වගුව සැදීමට මෙම වගුව උපයෝගී කරගන්න. එක් එක් කොටසකට නියමිත පදයෙහි අංකය සඳහන් කිරීමට මතක තබාගන්න. (සෑම ජේද කොටසකටම පද අංකය උඩ වම් කෙළවරෙහි සඳහන් කරන්න.)

**ඡේද අධ්‍යයන වගුව**

පොත: යූද්　　පරිච්ඡේදය : 1　　ඡේද: 4, 8-10, 16, 17-18, 19

මාතෘකාව : බොරු ගුරුවරුන්ගේ චරිත ගුණාංග

| | |
|---|---|
| 4 | |
| රහසින් ඇතුළු වීම | ගමන |
| පුරාණයේ පටන් දඬුවමට නියමව සිටීම | පසුබිම |
| අභක්තික මනුෂ්‍යයෝ | හැසිරීම |
| දෙවියන්වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවන | දේව ධර්මය |
| අපගේ එකම අධිපති වූ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එපා කරන්නාවූ | දේව ධර්මය |
| 8-10 | |
| නිස්සාර හීන දකින්නෝ | හැසිරීම |
| මාංශය කිලුටු කරගැනීම | හැසිරීම |
| අධිපතිකම සුළු කිරීම | හැසිරීම |
| උත්තමයන්ට නින්දා කිරීම | කතාව |
| තමුන් නොදන්නා කරුණු පිළිබඳව නින්දා කිරීම | කතාව |
| ස්වභාවිකව දන්නා දේ වලින් විනාශ කර ගැනීම | හැසිරීම |
| 16 | |
| මැසිවිලි කියති | කතාව |
| කොඳුරති! | කතාව |
| තම තෘෂ්ණාව අනුව හැසිරෙති | ගමන |
| කටින් මහත් උඩඟු වචන පවසති | කතාව |
| ප්‍රයෝජනය පිණිස මනුෂ්‍යයන්ගේ තරාතිරම් බලති | හැසිරීම |
| 18-19 | |
| සරදම් කරන්නෝ | කථාව |
| තමන්ගේම අභක්තික තෘෂ්ණාවල හැසිරෙති | ගමන |
| භේද කරති | හැසිරීම |
| මාංසිකය | හැසිරීම |
| ශුද්ධ ආත්මය නොමැත | දේව ධර්මය |

අධ්‍යයනය සඳහා ප්‍රධාන වචන:

සල්ලාලකම (4 ඡේදය) මෙම වචනයෙහි අර්ථය කුමක්ද?

**හතරවන පියවර : ජේදයෙහි දළ සටහනක් සාදන්න :**

"බොරු ගුරුවරුන්ගේ චරිත ගුණාංග" නම් ජේදය සඳහා දළ සටහනක් මෙන්න:

1. ඔවුන්ගේ පසුබිම :
   - අ. පුරාතනයේ සිට මෙම දඬුවමට නියමව සිටි.

2. ඔවුන්ගේ ගමන
   - අ. රහසින් ඇතුළු වීම
   - ආ. තමුන්ගේම තෘෂ්ණාව අනුව හැසිරෙන
   - ඇ. තමුන්ගේම අභක්තිකකම අනුව හැසිරෙන

3. ඔවුන්ගේ කතාව :
   - අ. උත්තමයන්ට නින්දා කරන
   - ආ. නොදන්නා කාරණාවලට නින්දා කරන
   - ඇ. කොඳුරන
   - ඈ. මැසිවිලි කියන
   - ඉ. කටින් මහත් උඩඟු වචන කියන
   - ඊ. සරදම් කරන

4. ඔවුන්ගේ දේව ධර්මය :
   - අ. දෙවියන්වහන්සේගේ දයාව සල්ලාලකමට හරවන
   - ආ. අපගේ එකම අධිපතිවූ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එපාකරන
   - ඇ. ශුද්ධාත්මයාණෝ රහිත

5. ඔවුන්ගේ හැසිරීම :
   - අ. අභක්තික
   - ආ. නිස්සාර හින දකින්නෝ
   - ඇ. මාංශය කිළුටු කරන
   - ඈ. මාංශික
   - ඉ. භේද කරන
   - ඊ. ස්වාභාවික දැනුම විනාශ කරන
   - උ. අධිපතිකම් ප්‍රතික්ෂේප කරති.
   - ඌ. මනුෂ්‍යයන්ගේ තරාතිරම් අනුව සලකති.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

2. ජේද අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. පළමු ලැයිස්තුවේ සාහිත්‍යමය ස්වරූපයේ නම බලන්න. දෙවන ලැයිස්තුවෙහි ඇතුළත් අර්ථ දැක්වීම් කියවා බලන්න. සාහිත්‍යමය ස්වරූපය ඉදිරියෙන් එයට ගැළපෙන අර්ථ දැක්වීමෙහි අංකය සඳහන් කරන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ____________ සවිස්තර ස්වරූපය | 1. කතාවක් වැනිය. |
| ____________ කව්‍යමය | 2. ගීත කවි ගීතාවලිය උදාහරණයකි. |
| ____________ උපමා | 3. දේශනාවක් වැනිය. |
| ____________ නාට්‍යමය | 4. ආත්මික සත්‍යතාවයන් පැහැදිලි කිරීමට භාවිත කරන කෙටිකතා |

4. කතාවක ව්‍යාකරණ ලැයිස්තුවක් අංක 1 යටතේ සපයා ඇත. දෙවන ලැයිස්තුවෙහි අර්ථකථන දී ඇත. ව්‍යාකරණය ඉදිරියෙන් එයට ගැළපෙන අර්ථ කථනයෙහි අංකය සඳහන් කරන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ____________ නාම පදය | 1. ක්‍රියාවේ වචනයකි. |
| ____________ සර්ව නාමය | 2. යම් දෙයක් සිදුකළ ක්‍රමය විස්තර කරයි. |
| ____________ ක්‍රියා පදය | 3. විස්තර කිරීමේ වචනයකි. |
| ____________ ක්‍රියා විශේෂණය | 4. පුද්ගලයෙකුගේ ස්ථානයක හෝ භාණ්ඩයක නමකි. |
| ____________ විශේෂණ පද | 5. පුද්ගලයෙකුගේ නම වෙනුවට මෙය භාවිත කළ හැකිය. |

5. පළමු ලැයිස්තුවෙහි ඇතුලත් සම්බන්ධිකාරක වචන බලන්න. දෙවන ලැයිස්තුවෙහි ඇති අර්ථදැක්වීම් කියවන්න. අදාළ සම්බන්ධිකාරක වචනයට ගැළපෙන අර්ථදැක්වීමෙහි අංකය එය ඉදිරියෙන් සඳහන් කරන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ___________එවැනි, වාගේ | 1. මෙම වචන වලින් පරස්පර බවක් පෙන්වීමට යන බව දක්වයි. |
| ___________සහ | 2. මෙම වචනයෙන් දැනටම පවසා ඇති විෂයට තව යමක් එකතු කරන බව පෙන්වයි. |
| ___________නම් | 3. මෙම වචන වලින් සංසන්දනයක් කිරීම යන බව පෙන්වා දෙයි. |
| ___________නමුත්, හෝ | 4. මෙම වචනයෙන් දෙවියන් වහන්සේගේ ජනතාවගේ ප්‍රතිචාරය කොන්දේසියක් මත ගොඩ නැගී ඇති බව පෙන්වයි. |

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යුද් පොතෙහි පළමුවන පරිච්ඡේදයෙහි ඡේද අධ්‍යයනයක් කරන්න. ඡේද 5-7, 11, 12-13

   මෙම පද සියල්ල "බොරු ගුරුවරුන්ට උදාහරණ" වේ. මෙය ඔබගේ වගුවෙහි මාතෘකාව විය යුතුය.

   5-7 - බොරු ගුරුවරුන්ට පැමිණෙන විනිශ්චය පිළිබඳ උදාහරණයක් සපයයි.

   11 පදය - ඔවුන්ගේ වරදවලට උදාහරණ සපයයි.

   12-13 පද බොරු ගුරුවරුන් සඳහා (සංසන්දනාත්මක) ස්වාභාවික උදාහරණ සපයයි.

2. මීට පෙර පරිච්ඡේදයෙහිදී ඔබ 2 පේතෘස් 2 පරිච්ඡේදය ඇසුරින් පරිච්ඡේද අධ්‍යයනයක් සිදු කළෙහිය. මෙහි විෂය යුද් 1හි විෂය හා බොහෝ සමානය. එනම් බොරු ගුරුවරු සම්බන්ධවය. දැන් ඔබ 2 පේතෘස් 2 ඇසුරින් ඡේද අධ්‍යයනයක් සිදු කරන්න. ඔබ දැනටමත් අරඹා ඇති "බොරු ගුරුවරුන්ගේ චරිත ලක්ෂණ" සහ "බොරු ගුරුවරුන් සඳහා උදාහරණ" නම් වගුවලට අලුතින් යමක් එකතු කිරීම සිදු කළ හැකිය.

# දහහතර වන පරිච්ඡේදය

# බයිබල් පද අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවිය හැකිමට
- පද අධ්‍යයනයක් කරන ක්‍රමය පැහැදිලි කිරීමට
- පද අධ්‍යයනයක් සිදු කිරීමට
- ඔබගේ පද අධ්‍යයනය සාරාංශ කොට දැක්වීම සඳහා වගුවක් සෑදීමට
- පද අධ්‍යයන දළ සටහනක් සෑදීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

> **ඔබගේ සියලු ආඥා ධර්මිෂ්ඨකම වන බැවින් මාගේ දිව ඔබගේ වචනය ගැන ගී කියාවා. (ගීතාවලිය 119:172)**

## හැඳින්වීම

ඔබ බයිබලයෙහි සම්පූර්ණ පොතක් සමීක්ෂණය කරන ආකාරය ඉගෙන ගත්තෙහිය. ඉන්පසුව පොතක පරිච්ඡේදයක් ඇතුළත ඇති ඡේද අධ්‍යයනයද ඉගෙන ගත්තෙහිය. මෙම පාඩමෙහිදී එක් පදයක් සවිස්තරාත්මකව අධ්‍යයනය කරන ක්‍රමය ඉගෙන ගනු ඇත. මේ සඳහා ඔබහට උදාහරණයක් සපයා දී තිබේ. ඔබටද "තවදුරටත් අධ්‍යයනය සඳහා" නම් කොටසෙහිදී මෙලෙස පදයක් අධ්‍යයනය සිදු කිරීමට අවස්ථාව සැපයෙනු ඇත. ඔබ පදයෙහි අධ්‍යයනය සිදු කරන විට මීට පෙර කරන ලද පාඩම්වලදී ඉගෙනගත් කාරණා එනම් ප්‍රශ්න ඇසීම හා ආකෘතියෙහි විස්තර සොයා බැලීම ප්‍රයෝජනයට ගන්න.

## ක්‍රමය අර්ථ දැක්වීම

**පළමු පියවර : පදය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න** :

සෑම පදයක්ම එහි සන්දර්භය තුළ අර්ථකථනය කළ යුතුය. සන්දර්භය නම් එම පදය වටා ඇති පදවල පිහිටීමය. සන්දර්භයෙහි දෙවියන්වහන්සේ දෙන්නාවූ සම්පූර්ණ පණිවුඩයම ඇතුළත් වන අතර ඉන් එක් පදයක් එහි එක් කොටසක් පමණක් වේ. එබැවින් එක් පදයක් තනිව ගෙන සන්දර්භයෙන් පිටත එය වැරදි ලෙස අර්ථකථන දැක්වීම නොකළ යුතුය. මෙය බොහෝ විට බොරු ගුරුවරු සිදු කරන ක්‍රියාවකි.

**දෙවන පියවර : ඒ හා සම්බන්ධිත පද අධ්‍යයනය කරන්න :**

ඔබ අධ්‍යයනය කිරීමට තෝරා ගත් පද හා සම්බන්ධිත තවත් පද එම සන්දර්භය තුළින්ම ඔබට සොයා ගත හැකි වනු ඇත. එමඟින් ඔබ අධ්‍යයනය කරන පදයට වැඩි විස්තර එකතු කර දෙනු ඇත. එමගින් ඔබට සංසන්දනයක් හෝ පරස්පර බවක් ලබා දේ. සමහරවිට ඔබ අධ්‍යයනය කරන පදය බයිබලයෙහි වෙනයම් පොතක පදයක් හා සම්බන්ධතාවයක් දැරිය හැකිය. (මෙම පරිච්ඡේදයෙහි දී ඇති උදාහරණ බලන්න). මෙම බයිබල් පද බයිබලයෙන් සොයා බලා අධ්‍යයනය කරන්න.

**තුන්වන පියවර : පද අධ්‍යයන වගුවක් සාදන්න :**

වගුව සඳහා මාතෘකාවක් තෝරා ගන්න. පද අධ්‍යයන වගුවෙහි ඔබ අධ්‍යයනය කරන පොතෙහි නම, පරිච්ඡේද අංකය හා පදයෙහි අංකය සඳහන් කරන්න. ඔබගේ වගුව සංවිධානය කිරීම රැඳී පවතිනුයේ ඔබගේ අධ්‍යයනයෙහිදී ඔබ තොරතුරු රැස් කරගෙන ඇති ක්‍රමය අනුවය. මීට පෙර පරිච්ඡේදයන්හි "තවදුරටත් අධ්‍යයනය සඳහා" පැවරුම් ඔබ කර ඇත්නම් මේ වනවිට ඔබට අධ්‍යයන වගු පිළිබඳව මනා දැනුමක් පවතින අතර ඔබට ඔබගේම වගුවක් නිපදවිය හැකිය. ඔබ වාර්තා කරන්නාවූ විස්තර අනුව ඔබට තිරස් හෝ සිරස් වගුවක් සෑදිය හැකිය.

**හතරවන පියවර : පද අධ්‍යයන දළ සටහනක් සාදන්න :**

මීට පෙර පැවරුම්වලදී සිදු කළ අධ්‍යයන ඇසුරින් ලද දක්ෂතාවය ප්‍රයෝජනයට ගනිමින් පදය සඳහා දළ සටහනක් සාදන්න. ගැළපෙන මාතෘකාවක්, අනු මාතෘකා හා උප මාතෘකා යොදන්න. ඔබගේ වගුව, පදය සඳහා දළ සටහන සෑදීමට ප්‍රයෝජනයට ගන්න.

## ක්‍රමය සඳහා උදාහරණයක්

**පළමු පියවර : පදය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න :**

පද අධ්‍යයන ක්‍රම පැහැදිලි කිරීමට අපි යූද් 1:11 තෝරා ගතිමු. මීට පෙර පාඩම්වලදී අපි එම පදය එහි පරිච්ඡේදය හා ඡේදය තුළ අධ්‍යයනය කළෙමු. එබැවින් පදය සන්දර්භය තුළ අධ්‍යයනය දැනටම අවසන් කොට ඇත්තෙමු. ඔබ අධ්‍යයනය සඳහා පදයක් තෝරා ගන්නා කල පළමුව එය එහි සන්දර්භය තුළ විමසා බලන්න. මීට පෙර පාඩම් දෙකෙහි ඉගෙනගත් පරිච්ඡේද හා ඡේද අධ්‍යයන නිපුණතාවය ඇසුරින් ඔබට එය සිදු කළ හැකිය. එසේම සම්පූර්ණ පොත ආශ්‍රයෙන් මෙම පදය සලකා බැලීමට මතක තබා ගන්න. යූද් 1:11 සන්දර්භය තුළ අධ්‍යයනය කිරීම පද අධ්‍යයන වගුවෙහි වාර්තා කොට තිබේ.

**දෙවන පියවර : අධ්‍යයනය හා සම්බන්ධ පද :**

යූද් 1:11 එම පරිච්ඡේදයෙහි ඇති වෙනත් පද හා සම්බන්ධව බොරු ගුරුවරු පිළිබඳව පවසයි. බොරු ගුරුවරු සඳහා, 5-7 පදවලින් අපට ඓතිහාසික උදාහරණ සපයන අතර 12-13 පදවල ස්වභාවික උදාහරණ සපයයි. යූද් 1:11 පැරණි ගිවිසුමෙහි ඡේද තුනක් සමග සම්බන්ධතාවයක් දරයි.

| | |
|---|---|
| කායින්ගේ කථාව | උත්පත්ති 4:1-15: 1 යොහන් 3:12 |
| බාලාම්ගේ කථාව | ගණන් කථාව 22-24 |
| කෝරාගේ කථාව | ගණන් කථාව 16 |

මෙම සම්බන්ධිත පද සාරාංශ ගත කළ වගුවෙහි හා දළ සටහනෙහි වාර්තා කොට තිබේ.

**තුන්වන පියවර : පද අධ්‍යයන වගුවක් සාදන්න :**

පහත සඳහන් පද අධ්‍යයන වගුවෙහි උදාහරණය අධ්‍යයනය කරන්න.

**පද අධ්‍යයන වගුව**

පොත : යූද් පරිච්ඡේදය : 1 පදය : 11

**බොරු ගුරුවරු සඳහා පරණ ගිවිසුමෙහි උදාහරණ:**
**යූද් 1:11 "ඔවුන්ට දුක්වේ" යැයි දෙවියන්වහන්සේ පවසන සේක.**

**හේතු ...**

1. ඔව්හු **කායින්ගේ** මාර්ගයෙහි ගොස් ඇත.
   උත්පත්ති 4:1-15 : පාපයට සමාව ඇත්තේ ලේ වැගිරීම තුළින් පමණක් බව කියන දෙවියන්වහන්සේගේ සැලැස්ම ඔහු එපා කළේය. හෙබ්‍රෙව් 9:22 බලන්න.
   1 යොහන් 3:12 : ඔහු තමාගේ ක්‍රියා දුෂ්ට බැවින් තම සොහොයුරා මැරුවේය.

2. ඔව්හු **බාලාම්ගේ** වැරැද්ද පසුපස කැදරව දිව ගොස් ඇත.
   ගණන් කථාව 22-24 - ඔව්හු මූල්‍යමය ප්‍රයෝජන සඳහා ඕනෑම දෙයක් කරනු ඇත.

3. ඔව්හු **කෝරාගේ** විරුද්ධ කථාවේදී විනාශ වූවෝය.
   ගණන් කථාව 16: දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය බලය ප්‍රතික්ෂේප කරමින් තෝරාගත් නායකත්වය පිළිනොගත්තෝය.

මෙහි ප්‍රගතිය සලකා බලන්න : ඔව්හු වැරදි මාර්ගයෙහි **ගොස් ඇත.**
ඉන්පසු ඔව්හු වැරැද්ද පසුපස **කැදරව දිව ගොස් ඇත . . .**
ඔව්හු **විනාශ වූහ.**

යූද් 1හි බොරු ගුරුවරු පිළිබඳ වෙනත් උදාහරණ :
ඓතිහාසික උදාහරණ : 5-7 පද
ස්වාභාවික උදාහරණ: 12-13 පද

**හතරවන පියවර : පද අධ්‍යයන දළ සටහනක් සාදන්න :**

පදයක අධ්‍යයනයෙහි දළ සටහනක් සඳහා උදාහරණයක් පහතින් සපයා ඇත.

## පරණ ගිවිසුමෙහි බොරු ගුරුවරු පිළිබඳ උදාහරණ

පොත : යුද්    පරිච්ඡේදය : 1    පදය : 11

I. ඔවුන්ට (බොරු ගුරුවරුන්ට) දුක්වේ ! කියා දෙවියන්වහන්සේ පවසන සේක.

II. හේතු :
  අ. ඔව්හු **කායින්ගේ** මාර්ගයෙහි ගොස් ඇත.
    1. උත්පත්ති 4:1-15 : පව් සමාව ලැබිය හැක්කේ ලේ වැගිරීමකින් පමණක් ලෙසට දෙවියන්වහන්සේ දී තිබූ සැලැස්ම ඔහු ප්‍රතික්ෂේප කළේය.
      අ. මෙම සත්‍යය හෙබ්‍රෙව් 9:22හි ප්‍රකාශ කොට ඇත.
    2. 1 යොහන් 3:12 : ඔහුගේ ක්‍රියා දුෂ්ට බැවින් ඔහු තම සොහොයුරා මැරුවේය.

  ආ. ඔව්හු **බාලාම්ගේ** වැරැද්ද පසුපස කෑදරව දිව ගොස් ඇත.
    1. ගණන් කථාව 22-24 : මුල්‍යමය ප්‍රයෝජන තකා බාලාම් ඕනෑම දෙයක් කළේය.
  ඇ. ඔව්හු **කෝරාගේ** විරුද්ධ කතාවෙන් විනාශ විය.
    1. ගණන් කථාව 16 : කෝරා දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය ප්‍රතික්ෂේප කරමින් තෝරාගත් නායකත්වය පිළි නොගත්තේය.

III. දුෂ්ටකමෙහි ඉදිරියට යෑමේ ක්‍රියා පටිපාටියක් ඇත.
  අ. පළමුව අප වැරදි මාර්ගයෙහි යන්නෙමු.
  ආ. ඉතා ඉක්මණින්ම කෑදර කමින් වැරදි මාර්ගයෙන් දුවන්නෙමු.
  ඇ. අවසාන ප්‍රතිඵලය විනාශයයි.

IV. යුද් 1 හි සඳහන් බොරු ගුරුවරු පිළිබඳ අනෙකුත් උදාහරණ :
  අ. ඓතිහාසික උදාහරණ 5-7 පද
    1. ඉශ්‍රායෙල්
    2. දේවදූතයෝ
    3. සොදොම හා ගොමෝරාව

  ආ. ස්වභාවික උදාහරණ 12-13 පද
    1. මංගල්‍යයෙහි ලප
    2. ජලය රහිත වළාකුළු
    3. ඵල නොමැති ගස්
    4. රෞද්‍ර මුහුදු රළ
    5. මුළාව යන තාරකාවෝ

සටහන : සියලුම බයිබල් අධ්‍යයන ක්‍රමවලදී මෙන්ම ඔබ පද අධ්‍යයන ක්‍රමයෙහිදී ඉගෙනගත් කාරණා ජීවිතයට අදාළ කරගැනීමට මතක තබා ගන්න. ඔබගේ පද අධ්‍යයනය ඔබගේ ජීවිතයට හා සේවයට කෙලෙස අදාළ විද? අදාළ කර ගැනීමේ උපදෙස් සඳහා "භාවනා ක්‍රමය" පුනරීක්ෂණය කරන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. අප සැමවිටම පදයක් එහි _______________ තුළ අධ්‍යයනය කිරීම වැදගත්ය.

3. පද අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර නම් කරන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

මීට පෙර පාඩම්වලදී ඔබ පොතක් සමීක්ෂණය කිරීම, පරිච්ඡේද අධ්‍යයනය හා ඡේද අධ්‍යයනය ඉගෙන ගත්තෙහිය.

ඔබ මින් පෙර අධ්‍යයනය කර ඇති ඡේදයකින් එක් පදයක් තෝරාගන්න. මෙම පාඩමෙහි ඉගෙනගත් නිපුණතා උපයෝගි කරගනිමින් පද අධ්‍යයනයක් සිදු කරන්න. පහත සපයා ඇති හිස්තැනක ඔබගේ අධ්‍යයන සාරාංශ ගත කොට පද අධ්‍යයන වගුවක් හා දළ සටහනක් සාදන්න.

**පද අධ්‍යයන වගුව :**

**පද දළ සටහන :**

# පහළොස් වන පරිච්ඡේදය

# වචන පද අධ්‍යයනය

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- අධ්‍යයනය සඳහා ප්‍රධාන බයිබල් පද හඳුනා ගැනීමට
- බයිබලයෙන් වචන අධ්‍යයනයක් කරන ක්‍රමය පැහැදිලි කිරීමට
- බයිබල් වචන අධ්‍යයනයක්

සිදු කිරීමට හැකි වනු ඇත.

## ප්‍රධාන පදය:

**සැබවක් නුඹලාට කියමි : අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. (මතෙව් 5:18)**

## හැඳින්වීම

ඔබ බයිබලය පොත් වශයෙන්, පරිච්ඡේද, ඡේද හා පද වශයෙන් අධ්‍යයනය කරන ක්‍රමය ඉගෙන ගෙන ඇත. මෙම පාඩමෙහිදී ඔබ බයිබලයෙහි කුඩාම ඒකකය වන වචනය අධ්‍යයනය කිරීමට ඉගෙන ගනු ඇත. වචන අධ්‍යයන ක්‍රමය සඳහා උදාහරණයක් ඔබ හට සපයා දී ඇත. "තවදුරටත් අධ්‍යයනය" සඳහා කොටසෙහි ඔබට එම වචන අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව සපයා දී තිබේ.


## ක්‍රමය අර්ථ දැක්වීම

වචන අධ්‍යයනය නම් බයිබලයෙහි සඳහන් එක් වචනයක් පිළිබඳ අධ්‍යයනයකි. වචන අධ්‍යයනයෙහි ඉලක්කය නම්, එම වචනය ඊට අදාළ සන්දර්භය තුළ අවබෝධ කර ගැනීමය. දේවානුභාවයෙන් දුන් දේව වචනයෙහි සෑම වචනයක්ම කෙතරම් වැදගත්ද යත් යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. එනම්:

**සැබවක් නුඹලාට කියමි : අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. (මතෙව් 5:18)**

"එක අකුරක්වත් බිංදුවක්වත්" යනුවෙන්, හඳුන්වා ඇත්තේ හෙබ්‍රෙව් අක්ෂරයන්ය. යේසුස්වහන්සේ මේවායෙහි වටිනාකම අවධාරණය කර ඇත්නම්, සැබවින්ම දේව වචනයෙහි සෑම වචනයක්ම වැදගත් වන බව අපි දනිමු. එක් එක් වචනයෙහි අර්ථය මුළු පදයෙහිම අර්ථය කෙරෙහි බලපායි. පද මඟින් ඡේද පැහැදිලි කරයි. ඡේද ඔබහට පරිච්ඡේද අවබෝධ කරගැනීමට සහාය සපයයි. පරිච්ඡේද සම්පූර්ණ පොතක් පිළිබඳ දැනුම සපයයි.

පහත සඳහන් රූප සටහන මඟින් බයිබලයෙහි පොදු (පොත්) සිට විශේෂිත (පද) දක්වා බයිබලීය ආකෘතිය පැහැදිලි කරදෙයි.




## ක්‍රමය පැහැදිලි කරදීම

**පළමු පියවර : වචනය තෝරාගන්න :**

පරිච්ඡේද, ඡේද හා පද අධ්‍යයනයෙහිදී අපි ප්‍රධාන වචන නම් සංකල්පය ඉදිරිපත් කළෙමු. ප්‍රධාන වචනයක් නම්, පදයක අර්ථය කෙරෙහි වූ මූලික වචනයයි. එය වැදගත් වචනයකි. සමහරවිට එම වචනය විශේෂ අවධාරණය සඳහා නැවත නැවතත් සඳහන් වේ. තව සමහර අවස්ථාවලදී එය තේරුම් ගැනීමට අපහසු වචනයක් විය හැකිය.

අධ්‍යයනය සඳහා වචනයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතුය. උදාහරණ ලෙස, "සඳහා, සහ, නම්" යනු ප්‍රධාන වචන නොවේ. ඒවා සම්බන්ධීකාරක වචන වන අතර වාක්‍යයට අරුතක් ගෙන දෙයි. එනමුත් එම වචන, වචන අධ්‍යයනය සඳහා සුදුසු වචන නොවේ. ඔබ අධ්‍යයනය සඳහා තෝරාගන්නාවූ වචනය, ප්‍රධාන වචනයක් බවට නිසැක ලෙස දැනගන්න.

**දෙවන පියවර : වචනය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න :**

වචනය එහි අන්තර්ගත පරිච්ඡේදය තුළ, එම සන්දර්භයෙහි සිට අධ්‍යයනය කරන්න. එම වචනය එම පරිච්ඡේදයෙහි වෙනයම් ස්ථානයක සඳහන් වී තිබේද? එසේ නම් එම වචනයෙහි අර්ථය පිළිබඳ ඉන් එළිදරව් වන කරුණු මොනවාද? එම වචනයෙහි අර්ථය පැහැදිලි කරන වෙනත් පදයක් එම පරිච්ඡේදය තුළ තිබේද? ඉන්පසුව එම වචනය ඡේදයෙහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න. ඡේදයෙහි ඇතුළත් විෂය කුමක්ද? මෙම ප්‍රධාන වචනය එම විෂයට සම්බන්ධ වන්නේ කෙලෙසද?

ඉන්පසු එම වචනය එම පදයෙහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න. එය පදයට සම්බන්ධවන්නේ කෙලෙසින්ද? මෙම පදය ව්‍යාකරණවල කුමන අංශයට අයත්ද? එය නාම පදයක්, සර්ව නාමයක්, ක්‍රියා පදයක්, ක්‍රියා විශේෂණයක් හෝ නාම විශේෂණයක්ද?

ඔබ වචන අධ්‍යයනය සඳහා වචනයක් තෝරා ගත් නමුත් එය පිහිටා ඇති සන්දර්භය ඔබ විශ්ලේෂණය කර නොමැති නම්, එය සිදු කිරීමට සැමවිටම කාලයක් යොදවන්න. දේව වචනයෙහි සම්පූර්ණ අර්ථය සපයා දීම සඳහා පරිච්ඡේද, ඡේද, පද හා වචන යන සියල්ල එකිනෙකට ඇඳී ගැළපී පවතියි. එබැවින් පදයක් හෝ වචනයක් එහි සන්දර්භයෙන් බැහැරව තනිව නොගැනීම වැදගත් වනුයේ ඔබ එය වැරදි ලෙස අර්ථකථනය කිරීමෙන් වැළකීම සඳහාය.

**තුන්වන පියවර : වචනයෙහි අර්ථය තීරණය කරගන්න :**

ප්‍රධාන වචනයක් තෝරාගෙන එය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කළ පසු ඊළඟ පියවර වනුයේ එහි අර්ථය තීරණය කිරීමය.

වෙනස් වුවත් එකම අර්ථය ඇති වචන කෙරෙහි විමසිලිමත් වන්න. උදාහරණ ලෙස, "දේව රාජ්‍යය" සහ "ස්වර්ග රාජ්‍යය" එකම වචනය වුවත් විවිධ අර්ථ ඇති වචන කෙරෙහිද සැලකිලිමත් වන්න. උදාහරණ ලෙස, යොහන් 21:15-17 හි යේසුස්වහන්සේ පේතෘස්ගෙන් තෙවරක් "ඔබ මීට වඩා මට ප්‍රේම කරනවාද?" යි ප්‍රශ්න කළ සේක. එම එක් එක් වතාවේ "ප්‍රේමය" යන වචනයෙහි අර්ථය වෙනස් විය.

ඔබ ග්‍රීක් හෝ හෙබ්‍රෙව් භාෂාව දන්නේ නම් හා එම භාෂාවෙන් ඔබ සතුව බයිබලයක් තිබේ නම් හැර, ඔබට මුල් භාෂාවෙන් එම වචනයෙහි අර්ථය තීරණය කිරීම සඳහා අමතර අධ්‍යයන මෙවලම් තිබිය යුතුය. ඔබට අවශ්‍ය වන මූලික අධ්‍යයන උපකාරක මෙවලම් දෙක නම් සම පද අකාරාදිය( Concordance) සහ වචන අධ්‍යයන ( Word Study book) පොතකි. මෙම බයිබල් අධ්‍යයන මෙවලම් දෙක භාවිත කරන ක්‍රමය මෙම පොතෙහි පස්වන පරිච්ඡේදයෙහි පැහැදිලි කරදෙයි.

ඔබහට සම පද අකාරාදියක් නොමැති වුවත්, බයිබල් වචන අධ්‍යයන පොතක් නොමැති වුවත් ඔබට තවමත් වචන අධ්‍යයනය කළ හැකිය. එනමුත් එම වචනයෙහි මූලික අර්ථය වටහා ගත නොහැකි වනු ඇත. ඔබහට සම පද අකාරාදියක් හෝ බයිබල් වචන අධ්‍යයන පොතක් හෝ **නොමැති නම්,** පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

1. ඔබගේ බයිබලයෙහි මැද තීරුවෙහි අධ්‍යයනය සඳහා අමතර නිර්දේශ පද සඳහන් කර තිබේ නම්, එම පද සියල්ල කියවා බලන්න. එමඟින් එම වචනය පිළිබඳ ඔබේ දැනුම පුළුල් විය හැකිය. සමහර අවස්ථාවලදී මැද තීරුවෙහි වචනය අර්ථයද සපයා තිබිය හැකිය.

2. ඔබගේ බයිබලයෙහි අග කොටස සෝදිසි කර බලන්න. සමහර බයිබල්වල අවසානයෙහි ඉතා වැදගත් වචන සඳහා සම පද ආකාරාදියක් සපයයි. තව සමහර බයිබල්වල අර්ථ දැක්වීම් සපයන ශබ්ද කෝෂයක් ඇතුළත් වේ.

3. නූතන ශබ්ද කෝෂයකින් එම පදය සොයා බලන්න. එම වචනය බයිබලීය සමයෙහි වෙනයම් අර්ථයක් සඳහා යෙදුවද ඔබට එහි නූතන අර්ථය සොයා දැනගත හැකි වනු ඇත.

4. එම පරිච්ඡේදයෙහි හෝ පොතෙහි එම වචනය භාවිත කර ඇති වෙනයම් ආකාරයන් අධ්‍යයනය කරන්න. මෙයද ඔබට වචනයෙහි අර්ථය වටහා ගැනීමට උපකාරී වනු ඇත.

ඔබට සම පද අකාරාදියක් හෝ බයිබල් වචන අධ්‍යයන පොතක් **තිබේ නම්** පහත සඳහන් පියවර අධ්‍යයනය කරන්න.

1. ඔබගේ බයිබලයෙහි මැද තීරුවක් ඇත්නම් එහි අමතර නිර්දේශ පද හා වචනවල තේරුම සපයා දී ඇත්නම්, ඔබ ඉගෙන ගන්නා වචනය එහි තිබේදැයි සොයා බලන්න. (මීට පෙර කොටසෙහි අංක 1 යටතෙහි මැද තීරුව භාවිත කරන ක්‍රමය පැහැදිලි කරදුනි.)

2. බයිබල් අකාරාදියෙහි ඔබගේ වචනය බලන්න. අකාරාදියෙහි වචන සකසා ඇත්තේ හෝඩියෙහි අක්ෂර අනුපිළිවෙළටය. එම වචනය බයිබලයෙහි ස්ථාන කිහිපයකදී භාවිත කොට ඇත්නම්, එම වචනය සඳහන් බයිබල් පද ලැයිස්තුවක් ඔබට සපයනු ඇත. වචනයෙහි අර්ථය අවබෝධ කර ගැනීම සඳහා එම පද අධ්‍යයනය කරන්න.

   ඔබ අධ්‍යයනය කරන පදයේ එම වචනය යොදා ඇති ආකාරය සොයා බලන්න.
   ඉංග්‍රීසි සම පද අකාරාදියෙහි (Concordance) වචන ලැයිස්තුවෙහි කෙළවර ඇති අංකය සටහන් කරගෙන අකාරාදියෙහි අවසානයෙහි මෙම අංකයට ගැළපෙන කොටස බලන්න.

ඔබ පැරණි ගිවිසුමෙන් පදයක සඳහන් වචනයක් සොයයි නම් හෙබ්‍රෙව් ශබ්ද කෝෂයෙන් එම අංකය සොයන්න. ඔබ අලුත් ගිවිසුමෙහි පදයක වචනයක් අධ්‍යයනය කරයි නම් ග්‍රීක ශබ්ද කෝෂයෙන් එම වචනය සොයන්න. (මෙය සිදුකරන ක්‍රමය පස්වෙනි පරිච්ඡේදයෙහිදී පැහැදිලි කරන ලදී.) සිංහල භාෂාවෙන් තිස්ස වීරසිංහ දේවගැතිතුමා විසින් ලියන ලද ශුද්ධ බයිබලයේ සමපද අකාරාදිය භාවිත කළ යුතු වේ.

3. ඔබගේ වචනය බයිබලීය වචන අධ්‍යයන පොතකින් සොයා බලන්න. වචන අධ්‍යයන පොත්වල වචන සිංහල හෝඩියේ අක්ෂර අනුව සකසා ඇත. ඔබගේ වචනය බයිබලයෙහි වෙනත් ස්ථානවල ඇත්නම් එය පිළිබඳ ඔබහට ලැයිස්තු කිහිපයක් සම්බවෙනු ඇත. ඔබ ඒවාත් අධ්‍යයනය කරන අතරම ඔබගේ වචනය තෝරා ගත් පදය කෙරෙහි අවධානය යොමු කරන්න. ඔබගේ පරමාර්ථය වනුයේ මෙම පදයෙහි සන්දර්භය තුළ මෙම වචනයට හිමි අර්ථය තිරණය කිරීමය.

4. එම වචනය නවීන ශබ්ද කෝෂයකින් සොයා බලන්න. මෙයින් ඔබට නූතනයෙහි මෙම වචනය භාවිත වන ක්‍රමය පැවසේ. එය බයිබල් යුගයෙහි යෙදූ අර්ථයම විය හැකිය. නැතහොත් වෙනස් විය හැකිය. බයිබලීය යුගයෙහි හා නූතන යුගයෙහි එම වචනයෙහි භාවිතය වෙනස් වීමට හේතු විය හැකි කාරණා දෙකක් පවතී. ඒවා නම්:

පළමුව වචන වල තේරුම කාලය අනුව වෙනස් වීමට ඉඩ ඇත. පරණ වචනවලට අලුත් අර්ථයන් දිය හැකිය. සමහරවිට මූලික අර්ථය අමතක කර ඇත.

දෙවනුව බයිබලය ලියනු ලැබුවේ ග්‍රීක හා හෙබ්‍රෙව් යන භාෂාවලිනි. එකම වචනයට විවිධ භාෂාවලින් විවිධ තේරුම් තිබිය හැකිය. වචනය ග්‍රීක් හෝ හෙබ්‍රෙව් බසින් එක් අරුතක්ද වෙන භාෂාවකින් තව වෙනයම් අර්ථයක්ද දැරිය හැකිය.

**හතරවන පියවර : ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කරන්න** :

වචන අධ්‍යයනයෙහිදී පළමු පියවර තුනෙහිදී ඔබ වචනය පිළිබඳ ඉගෙනගත් කාරණා සටහන් කරගන්න. එම වචනයෙහි අර්ථය බයිබල් තිරුවෙන්, සමපද අකාරාදියෙන්, වචන අධ්‍යයන පොතින් හා ශබ්ද කෝෂය ඇසුරින් ලියන්න. එම වචනය බයිබලයෙහි වෙනයම් කොටසක භාවිත වී ඇත්නම් එහි සඳහන් විස්තර සටහන් කරන්න.

ඔබගේ අධ්‍යයනය සම්පූර්ණ කළ පසු ඔබ වගු හා දළ සටහන් පිළිබද ඉගෙන ගෙන ඇති කරුණු භාවිත කරමින් ඔබගේ වචන අධ්‍යයනය සාරාංශ ගත කරන්න. ඔබගේ වගුවෙහි හා දළ සටහනෙහි කිසියම් ස්ථානයක පොත, පරිච්ඡේදය, පදයෙහි අංකය හා ඔබ අධ්‍යයනය කරන වචනය ලිවීමට මතක තබාගන්න.

## ක්‍රමයෙහි උදාහරණ

**පළමු පියවර : ඔබගේ වචනය තෝරා ගන්න** :

මීට පෙර පාඩම් වලදී, පරිච්ඡේද ක්‍රමය, ජේද ක්‍රමය හා පද අධ්‍යයන ක්‍රමය විදහා දැක්වීමට අපි යුද්, 1 වෙනි පරිච්ඡේදය භාවිත කළෙමු. අපගේ අධ්‍යයනයෙන් යුද් 1 වෙනි පරිච්ඡේදයෙහි 4 වෙනි පදයෙන් අප "සල්ලාලකම" යන වචනය තෝරා ගත්තෙමු. මෙම වචනය ප්‍රධාන වචනයක් වනුයේ එය මෙම ජේදයෙහි විෂය වන බොරු ගුරුවරු විස්තර කිරීමට භාවිත කර ඇති බැවිනි. එසේම එය තේරුම් ගැනීමට අපහසු වචනයක්ද බැවින් ප්‍රධාන වචනයකි.

**දෙවන පියවර : වචනය එහි සන්දර්භය තුළ අධ්‍යනය කරන්න :**

මීට පෙර පාඩම්වලදී, ඔබ යුද් පොතෙහි පරිච්ඡේද හා ජේද අධ්‍යයනයක් සම්පූර්ණ කර ඇත. එයින් අදහස් වන්නේ ඔබ දැනටමත් "සල්ලාලකම" යන වචනය එහි සන්දර්භය තුළ ඉගෙන ගෙන ඇති බවය. යුද් 1 වෙනි පරිච්ඡේදයෙහි විෂය නම් බොරු ගුරුවරුන්ට එරෙහි අනතුරු ඇඟවීම බවද ඔබ ඉගෙන ගෙන තිබේ. සල්ලාලකම යන වචනය ඇතුලත් 4 වෙනි පදය යුද්හි

එක් ජේදයකි. මෙම වචනය එහි සන්දර්භය තුළ අධ්‍යයනය සඳහා පරිච්ජේද අධ්‍යයන හා ජේද අධ්‍යයනය යන පාඩම් වෙත නැවත යොමුවන්න.

මීට පෙර පරිච්ජේදයෙහිදී අපි වචන අධ්‍යයනය කරන ක්‍රමය පැහැදිලි කළෙමු. සල්ලාලකම යන වචනය සඳහන් යූද් 1:4 පදය ඔබ තවම අධ්‍යයනයක් සිදු කොට නොමැත. වචන අධ්‍යයනයක් කිරීමට පෙර මෙතැනින් නවතා දැන් යූද් 1:4හි පද අධ්‍යයනයක් සිදු කරන්න.

ඔබගේ පද අධ්‍යයනයෙහිදී "සල්ලාලකම" නාම විශේෂණයක් බව වැටහී යන්නට ඇත. එය බොරු ගුරුවරු විස්තර කිරීමට යොදා ගෙන ඇති වචනයකි. බොරු ගුරුවරු දේව කරුණාව සල්ලාලකමට හරවති.

**තුන්වන පියවර : වචනයෙහි අර්ථය තීරණය කරන්න :**

1. යූද් 1:4 අධ්‍යයනය සඳහා අප භාවිත කළ බයිබලයෙහි මැද තීරුවෙහි විස්තරය අනුව අපව තිතස් 2:11ට හා හෙබ්‍රෙව් 12:15ට යොමු කරයි.

2. සල්ලාලකම යන වචනය සඳහා සම පද අකාරාදී පටුන පහතින් දැක්වේ.

| **සල්ලාලකම (පිළිකුල් ක්‍රියා, වේශ්‍යකම්)** | |
|---|---|
| දුෂ්ඨකම, වංචාව, ස...කම . . . . . . . . . . . . . . . . . . | මාර්ක් 7:22 |
| ස...කමද ගැන පසුතැවිලි නුවූ . . . . . . . . . . . . . . . | 2 කොරින්ති 12:21 |
| වේශ්‍යකම, අපවිත්‍රකම, ස...කම . . . . . . . . . . . . . . . | ගලාති 5:19 |
| ස...කමට භාර වූණෝය . . . . . . . . . . . . . . . . . . . | එපීස 4:19 |
| ස...කම්වලද, තෘෂ්ණාවලද . . . . . . . . . . . . . . . . . | 1 පේතෘස් 4:3 |
| අපගේ දෙවියන්වහන්සේගේ කරුණාව ස...කමට . . . . . . | යූද් 4 |

එම වචනය සඳහන් සියලු පද සොයා බලා අධ්‍යයනය කරන ලදී.

සල්ලාලකම යන වචනය අලුත් ගිවිසුමෙහි සඳහන් වචනයක් බැවින් අපිට ඉංග්‍රීසි අකාරාදියෙහි අග ඇති ග්‍රීක ශබ්ද කෝෂය භාවිත කොට බැලිය හැකිය. ග්‍රීක ශබ්ද කෝෂයෙහි දී ඇති වචන පහතින් සඳහන් වේ.

> ඇසෙල්ජියා (Aselgeia) - දැඩි දුෂ්‍ය අසංවර බව, ස...කම සංසන්දය කිරීමේදී (අසුබවාදී කාරණයක් ලෙස) මෙසේ වේයැයි අනුමාන කරන ලද selges (නිමවූ යමක්), අශීලාචාර (සමහරවිට අනෙකුත් දුෂ්ට ක්‍රියාද සමඟ) අවිනීත, අසංවර, නොහික්මුණ.

3. ඉන්පසුව බයිබල් වචන අධ්‍යයන පොතක් භාවිත කරන ලදී. එහි සල්ලාලකම සඳහා සපයා ඇති විස්තරය පහතින් දැක්වේ.

**සල්ලාලකම**

මෙයින් අදහස් වනුයේ සීමාව ඉක්මවා ගිය, ලිංගික වූ දැඩි දූෂ්‍ය බවකි. එය සීමාවන් නොදනී, අවිනීතය, අධම: මාර්ක් 7:22 හදවතින් පිටවන එක් දුෂ්ටකමකි: 2 කොරින්ති 12:21හි, කොරින්ති සභාවෙහි සිටි අයගෙන් සමහරු මෙම දුෂ්ටකම පිළිබඳව වරදකරුවෝ වූහ. ගලාති 5:19 හි මෙය මාංශයෙහි ක්‍රියා අතරට එක් වේ. එපීස 4:19හි තම හැඟීම්වලට යටත්වූ නැවුම් නොවූ අය තුළ පවතින පව්වලින් එකකි.

1 පේතෘස් 4:3 හා යූද් 4හි දෙවියන්වහන්සේගේ කරුණාව අභක්තික මනුෂ්‍යයෝ මෙයට හරවා ඇත. රෝම 13:13 හි එය "අනාචාරය" ලෙස දක්වා තිබේ. ඇදහිලිවතුන් එයින් ප්‍රවේසම් විය යුතුය.

අපි මෙම සම්පූර්ණ ලැයිස්තුවම අධ්‍යයනය කළෙමු. යූද් 1:4ට විශේෂ අවධානය යොමු කළෙමු.

4. සාමාන්‍ය ශබ්ද කෝෂය මේ සඳහා සපයා ඇති අර්ථය නම් :
"නාමයෙන්, උත්තේජනය, වශීවීම, හැඟීම් උද්දීපනය කරන්නාවූ සිතුවිලි"

## හතරවන පියවර : ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කරන්න :

අපගේ මීට පෙර පියවරයන්හිදී අපි සල්ලාලකම යන වචනය පිළිබඳ සටහන් තැබුවෙමු.

පළමු පියවරෙහිදී අපි අධ්‍යයනය සඳහා තෝරාගත් වචනය ලියුවෙමු.

දෙවන පියවරෙහිදී අපි දැනටම සිදුකර තිබූ පරිච්ඡේද හා ඡේද අධ්‍යයනය අපගේ වචන අධ්‍යයනයෙහි කොටසක් බවට පත් කර ගතිමු. ඔබහට පද අධ්‍යයනයෙහිදී යූද් 1:4 අධ්‍යයන කිරීමට නියමිත විය. මේ සියලු අධ්‍යයනවල විස්තර වචන අධ්‍යයනයෙහි කොටසක් බවට පත් විය.

තුන්වන පියවරෙහිදී අපි බයිබල් තීරු සටහන්, සම පද අකාරාදිය, වචන අධ්‍යයන පොත, නූතන ශබ්ද කෝෂය හා වචනය ඇතුලත් වෙනත් පද ආදිය භාවිත කොට සල්ලාලකම යන වචනය පිළිබඳ ඉගෙන ගත හැකි බොහෝ විස්තර සටහන් කර ගතිමු.

අපි මෙම වචනය පිළිබඳ සෑහෙන තොරතුරු ප්‍රමාණයක් රැස් කළෙමු. අපගේ අවසාන පියවර වනුයේ අප සොයාගත් කරුණු වගුවක් හා/හෝ දළ සටහනක් ඇසුරින් සාරාංශ ගත කිරීමය. මීට පෙර පාඩම්වලදී අප ඉගෙන ගත් ආකාරයට අධ්‍යයනයක් එහි සංවිධානාත්මක ස්වරූපයෙන් කල් තබා ගැනීමට හොඳම ක්‍රමය මෙය වේ. එය ඔබහට ඉගෙන ගත් කරුණු අන් අය සමඟ බෙදා ගැනීමට උපකාරී වේ.

මීළඟ පිටුවල අප සල්ලාලකම පිළිබඳ සිදු කළ අධ්‍යයනයෙහි සාරාංශය ඇතුලත් කොට තිබේ. මෙම උදාහරණ ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කිරීමට වගු, දළ සටහන්, පින්තූර හා ඡායාරූප භාවිත කරමින් ඉටු කිරීමට ආදර්ශයක් කර ගන්න.

මීට පෙර සාකච්ඡා කළ එක් එක් ක්‍රමය සම්බන්ධයෙන් අපි ඔබහට මතක් කර දීමට කැමති කාරණයක් නම් ඔබගේ වචන අධ්‍යයනයෙහිදී ද ඔබ උගත් කරුණු අදාළ කර ගැනීමෙහි පවතින වැදගත්කමය. බයිබල් අධ්‍යයනය, දැනුම හඹා යන පිපාසයක් පමණක්ම නොවේ. ඔබ වචනය අසන්නෙක් පමණක් නොව එය පිළිපදින්නෙක්ද විය යුතුය. මෙය ඔබට කළ හැකි වනුයේ දේව වචනයෙහි සත්‍යතාවයන් අදාළ කර ගැනීමෙනි.

## වචන අධ්‍යයනය

**පොත :** යූද්

**පරිච්ඡේදය :** 1

**පදය :** 4

**වචනය :** සල්ලාලකම

**එම අර්ථයම ඇති වෙනත් වචන:** හිතුවක්කාරකම

**ව්‍යාකරණය :** සල්ලාලකම - නාම විශේෂණයකි. යූද් 1:4හි එය බොරු ගුරුවරුන්ගේ චරිත ගුණාංගයන් විස්තර කිරීමට භාවිත කොට තිබේ.

**පළමුවන වගුව**

සල්ලාලකම : අර්ථ දැක්වීම

| **අදාළ ගොනුව** | **අක්ෂර වින්‍යාසය** | **අර්ථය** |
|---|---|---|
| ග්‍රීක් | ඇසෙල්ජියා (Aselgeia) | අනාචාර, අපවිත්‍ර |
| නූතන | සල්ලාලකම | අසභ්‍ය, හැඟීම් උද්කරන්නාවූ කාමුක හැඟීම් |
| වයින්ගේ වචන අධ්‍යයනය | ඇසෙල්ජියා (Aselgeia) | සීමාව ඉක්මවා ගිය ලිංගික ආශාව සීමාවක් නොමැතිකම, අවිනීත බව, හිතුවක්කාරකම. |

**දෙවන වගුව**

**සල්ලාලකම : බයිබලයෙහි අමතර භාවිතය**

| **උපුටා ගැනීම** | **සාරාංශය** |
|---|---|
| මාර්ක් 7:22 - | හදවතින් නික්මෙන එක් දුෂ්ටකමකි. |
| 2 කොරින්ති 12:21 | කොරින්ති සභාවෙහි සිටි අයගෙන් සමහරු මෙම දුෂ්ටකම පිළිබඳව වරදකරුවෝ වූහ. |
| ගලාති 5:19 | මාංශයෙහි ක්‍රියා අතර සඳහන් වේ. |
| එපීස 4:19 | තම පැරණි හැඟීම්වලට යටත් වූ නැවත උත්පාදනය නොලත් අය තුළ පවතින පව්වලින් එකකි. |
| 1 පේතෘස් 4:3 | තම පැරණි හැඟීම්වලට යටත් වූ නැවත උත්පාදනය නොලත් අය තුළ පවතින පව්වලින් එකකි. |
| රෝම 13:13 | ඇදහිලිවතුන්ට ප්‍රවේශම් වන ලෙස අනතුරු ඇඟවූ පව්වලින් එකකි. |
| 2 පේතෘස් 2:2 | මෙය බොරු ගුරුවරුන්ගේ චරිත ලක්ෂණයක් ලෙස සඳහන් වේ. |
| යූද් 1:4 | මෙය බොරු ගුරුවරුන්ගේ චරිත ලක්ෂණයක් ලෙස සඳහන් වේ. |

## සල්ලාලකම පිළිබඳ විස්තීර්ණ අධ්‍යයනය

වචන අධ්‍යයනය ඔබව දේව වචනය පුළුල් ලෙස, විස්තීරණව අධ්‍යයනය කිරීම සඳහා යොමු කළ හැකිය. සල්ලාලකම යන වචනය අධ්‍යයනය කිරීම තුළින් පහත සඳහන් අමතර අධ්‍යයනයට යොමු විය හැකිය :

1. මාර්ක් 7:22හි මෙය ඇතුලාන්තයෙන් නික්මෙන පාපයක් ලෙස නම් කොට තිබේ. එය අධ්‍යයනය කරන්න. ඇතුලාන්තයෙන් නික්මෙන අනිකුත් පාප මොනවාද?

2. 2 කොරින්ති 12:21 අධ්‍යයනය කරන්න. පාවුල්තුමා, සල්ලාලකමට අමතරව කොරින්ති සභාවෙහි පවතින බවට හඳුනාගත් වෙනත් පාප මොනවාද?

3. හිතුවක්කාරකම සඳහා භාවිත කර ඇති වචන සම පද අකාරාදියෙහි බලන්න. එම තේරුම සල්ලාලකම යන්නෙහි තේරුමද? බයිබලයේ වෙනයම් ස්ථානවල හිතුවක්කාරකම යන පදය භාවිත කර තිබේද?

4. ගලාති 5:19 - සල්ලාලකම හැරුණ විට මාංශයෙහි ක්‍රියා වෙන මොනවාද?

5. එපීස 4:17-19 අධ්‍යයනය කරන්න. ඇදහිලිවතුන් හා නොඇදහිලිවතුන් සංසන්දනය කරමින් වගුවක් සාදන්න. නොඇදහිලිවතුන්ගේ චරිත ගුණාංග ලෙස 17-19 සපයා ඇති ගුණාංග නම් කරන්න. එයට සල්ලාලකමද ඇතුලත්ය. ඇදහිලිවතුන්ගේ චරිත ගුණාංග 20-24 දක්වා සඳහන් වේ. එයද ඇතුලත් කරන්න.

6. 1 පේතෘස් 4:3- අධ්‍යයනය කරන්න. අතීතයෙහිදී අප හැසිරුණාවූ. සල්ලාලකමට අමතරව අනෙකුත් පාප මොනවාද?

7. රෝම 13:13 අධ්‍යයනය කරන්න. සල්ලාලකමට අමතරව ඇදහිලිවතුන් සිදු නොකළ යුතු වෙනත් පාප මොනවාද?

8. බොරු ගුරුවරු සල්ලාලකමට හරවා ගෙන ඇති දේව කරුණාව පිළිබඳ අධ්‍යයනය කරන්න. උදාහරණ ලෙස: තීතස් 2:11හි දෙවියන්වහන්සේගේ කරුණාව සියලු මනුෂ්‍යයන්ට ප්‍රකාශ වී තිබේ යැයි සඳහන් වේ. හෙබ්‍රෙව් 12:15 හි අපට “දෙවියන්වහන්සේගේ කරුණාවෙහි පසුබට විය” හැකි බවද පෙන්වා දෙයි.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. වචන අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර නම් කරන්න.

3. ප්‍රධාන වචනයක් යනු කුමක්ද?

4. පහත සඳහන් වචන අතුරින් ප්‍රධාන වචනයක් වනුයේ, හා අධ්‍යයනය සඳහා සුදුසු වනුයේ කුමන වචනයද? ____________________

ඔහු, පමණ දැන හැසිරීම, ඇය, නම්, සහ.

5. වචන අධ්‍යයනයෙහිදී භාවිත කළ යුතු වඩාත්ම වැදගත් බයිබල් අධ්‍යයන පොත් දෙක මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

ඔබ මීට පෙර පාඩම්වලදී ඉගෙන ගත් පදයකින් හෝ ඡේදයකින් වචනයක් අධ්‍යයනය සඳහා තෝරා ගන්න. එය ප්‍රධාන වචනයක් හෝ ඔබට තේරුම් ගත නොහැකි වචනයක් බවට නිසැක වන්න. ඔබ මෙම පාඩමෙහිදී ඉගෙනගත් නිපුණතා උපයෝගී කරගෙන ඔබ තෝරාගත් වචනය පිළිබඳ වචන අධ්‍යයනයක් සිදු කරන්න.

### පළමු පියවර : වචනයක් තෝරා ගන්න :

මම අධ්‍යයනය සඳහා තෝරාගත් වචනය නම්: ____________________________________

### දෙවන පියවර : වචනය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න :

මෙම වචනය සඳහා එහි සන්දර්භය තුළ ඇති ශුද්ධ ලියවිලි යොමුවන් නම් :

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

### තුන්වන පියවර: වචනයෙහි අර්ථය තිරණය කරන්න :

මෙම සන්දර්භයෙහි යොදා ගෙන ඇති පරිදි වචනයෙහි අර්ථය නම් :

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

### හතරවන පියවර : ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කරන්න :

ඔබ මෙම වචනය පිළිබඳව ඉගෙනගත් කරුණු සාරාංශ ගත කිරීම සඳහා වගුවක්, දළ සටහනක්, රූප සටහනක් හෝ ජායාරූපයක් සාදන්න.

# දහසය වන පරිච්ඡේදය

# මාතෘකානුකුල බයිබල් අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- මාතෘකානුකුලව බයිබල් අධ්‍යයන ක්‍රමය පැහැදිලි කිරීමට
- මාතෘකානුකුල බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමට

හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

> **එබැවින් රනට වඩා, එසේය, පවිත්‍ර රනට වඩා, ඔබගේ ආඥාවලට ප්‍රේම කරමි. එබැවින් සියලු දේ ගැන ඔබගේ නියෝග සියල්ල හරියයි සලකමි. සියලු වංක මාර්ග නුරුස්සා හරිමි.** (ගීතාවලිය 119:127-128)

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය මාතෘකානුකුල බයිබල් අධ්‍යයන ක්‍රමය හඳුන්වා දෙයි. එම ක්‍රමය අර්ථ දක්වා පැහැදිලි කොට ඒ සඳහා උදාහරණයක්ද සපයා දී ඇත. ඔබ ඉගෙන ගත් කරුණු අදාළ කරගනිමින් ඔබටම මාතෘකානුකුල අධ්‍යයනයක් සිදු කිරීමට "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටසින් අවස්ථාව ලැබෙනු ඇත.

## ක්‍රමය අර්ථ දැක්වීම.

මාතෘකා අධ්‍යයන ක්‍රමය බයිබලයෙහි තෝරාගත් විෂයක් කෙරෙහි අවධානය යොමු කරවයි. මෙම ක්‍රමයෙහි ඉලක්කය වනුයේ එම විෂය සම්බන්ධයෙන් බයිබලයෙහි උගන්වන සියලු කාරණා සොයා දැනගැනීමය.

## ක්‍රමය පැහැදිලි කිරීම.

මාතෘකානුකුල බයිබල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර පහතින් දැක්වේ. එනම්:

**පළමු පියවර : මාතෘකාවක් තෝරාගන්න :**

ඔබට පොදු මාතෘකාවක් තෝරා ගත හැකිය. උදාහරණ ලෙස බයිබලයෙහි සඳහන් සියලු භාස්කම්, එසේ නොමැති නම් යේසුස්වහන්සේ සිදුකළ භාස්කම් හෝ කිසියම් බයිබල් පොතක සඳහන් භාස්කම් ලෙසට තෝරා ගත හැකිය.

ඔබගේ පළමු අධ්‍යයනය සඳහා තෝරා ගන්නා විෂය සම්පූර්ණ බයිබලයෙන්ම අධ්‍යයනය කිරීමට වඩා එක් පොතක් ඇතුළත පමණක් සිදු කිරීම සුදුසු වේ. ඔබගේම ජීවිතයෙහි අවශ්‍යතාවයක් පවතින විෂයක් පිළිබඳව ඔබට අධ්‍යයනය කළ හැකිය. එසේ නොමැති නම් ඔබගෙන් කිසියම් කෙනෙකු විමසා ඔබට පිළිතුරු දීමට නොහැකි වූ මාතෘකාවක් තෝරාගත හැකිය. නැත්නම් ඔබට සම්පූර්ණයෙන්ම වැටහී නොමැති මාතෘකාවක් විය හැකිය.

අනෙක් අයගේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ඔබ උපදේශනය කරන විට ප්‍රයෝජනයට ගත හැකි මාතෘකා තෝරා ගත හැකිය. උදාහරණයක් ලෙස ඔබහට කෙනෙක්ව සැනසීමට ඉගෙන ගන්නා පිණිස මරණය පිළිබඳ ඉගෙන ගැනීමට අවශ්‍ය විය හැකිය. එසේත් නොමැති නම් භයින් සිටින අයෙකුට උපකාර කරන පිණිස භය පිළිබඳ ඉගෙනීමට අවශ්‍ය විය හැකිය.

**දෙවන පියවර : ශුද්ධ ලියවිලි කොටස තෝරා ගන්න :**

මාතෘකාව තෝරා ගත් පසුව ඔබ එම මාතෘකාව සඳහා අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන ශුද්ධ ලියවිලි කොටස තෝරා ගත යුතුය.

ඔබට එක විෂයක් බයිබලයෙහි ඇති එක පොතකින් හෝ පොත් කිහිපයකින් හෝ සම්පූර්ණ බයිබලයෙන්ම සිදු කළ හැකිය.

**තුන්වන පියවර : තොරතුරු රැස්කරගන්න :**

ඔබ අධ්‍යයනය කිරීමට තෝරාගත් කොටස ඇසුරින් මාතෘකාවට සම්බන්ධ සියලු පද එක්රැස් කරගන්න. අකරාදියක් ඔබට ප්‍රයෝජනවත් විය හැකිය. නමුත් එය අත්‍යවශ්‍යම නොවේ. උදාහරණ ලෙස: ඔබ යේසුස්වහන්සේ කළ හාස්කම් අධ්‍යයනය කරනවා නම් මතෙව් මාර්ක්, ලූක් සහ යොහන් පොත් කියවන්න. යේසුස්වහන්සේ සිදු කළ හාස්කම්, එය ලියැවී ඇති ස්ථාන සඳහන් කරන වාර්තාවකට ඇතුළු කරන්න.

**හතරවන පියවර : තොරතුරු සාරාංශ ගත කරන්න :**

ඔබ මාතෘකාවක් පිළිබඳ තොරතුරු රැස් කළ විට ඔබ සතුව ශුද්ධ ලියවිලි පාඨ රාශියක් තිබිය හැකිය. දැන් මාතෘකාව පහසුවෙන් අවබෝධ කර ගැනීම සඳහා මෙම පද සංවිධානය කළ යුතුය.

ඔබ එක් රැස්කළ පද අධ්‍යයනය කරන්න. එම පදවලින් ඉදිරිපත් වන ප්‍රධාන කාරණා හඳුනාගන්න. මෙම කරුණුම ඉදිරිපත් කරන වෙනත් පද මොනවාද? මෙම පද එක තැනකට සකසා ගන්න. ඉන්පසුව ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කිරීමට වගුවක් හෝ දළ සටහනක් සාදන්න.

මතක තබාගන්න : කිසියම් විෂයයක් සම්බන්ධයෙන් බයිබලයෙහි උගන්වන කරුණු සියල්ල අධ්‍යයනය කිරීමට පමණක් නොව, එය ඔබගේ ජීවිතයට හා සේවයට අදාළ කරගැනීමට අවශ්‍ය බව මතක තබාගන්න.

## ක්‍රමය පිළිබඳ උදාහරණ

**පළමු පියවර : මාතෘකාවක් තෝරා ගන්න :**

හාස්කම්

**දෙවන පියවර : ශුද්ධ ලියවිලි කොටස තෝරාගන්න :**

ලූක් පොතෙහි සඳහන් හාස්කම් අධ්‍යයනය කරනු ඇත.

**තුන්වන පියවර : තොරතුරු රැස්කරගන්න :**

ලූක් පොතෙහි හාස්කම් : 1:11, 3:21, 4:30, 5:1, 7:11, 9:28, 10:17, 4:33, 13:11, 14:1, 17:11, 22:50

**හතරවන පියවර : තොරතුරු සාරාංශ ගත කරන්න.**

**දළ සටහන සාරාංශ ගත කිරීමෙහි උදාහරණයක් :**

## ලූක් පොතෙහි සඳහන් හාස්කම්.

1. ලූක් පොතෙහි හාස්කම් තිස් එකක් වාර්තා ගත කොට තිබේ.

2. හාස්කම් සිදුකළ පුද්ගලයන් :

   අ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ 4:28-30, 4:31-37, 4:38-39, 4:40-41, 5:1-11, 5:12-15, 5:17-26, 6:6-11, 6:17-20, 7:1-10, 7:11-15, 7:21, 8:2-3, 8:22-25, 8:26-39, 8:41-42, 49, 56, 8:43-48, 9:11-17, 9:37-43, 11:14-23, 13:10-17, 14:1-6, 17:11-19, 18:35-43, 22:50-51, 24:1-7, 24:50-51.

   ආ. අනෙක් අය
      1. ගාබ්‍රියෙල් දේවදූතයා : 1:11-23, 57,59.
      2. ශුද්ධාත්මයාණෝ : 3:21-22
      3. දෙවියන්වහන්සේ : 9:28-37
      4. ගෝලයෝ : 10:17

3. හාස්කම් (වර්ගීකරණය) කාණ්ඩවලට වෙන් කිරීම.

   අ. මළවුන්ගෙන් නැගිටුවීම : 7:11-15, 8:41-42, 49, 56, 24:1-7

   ආ. යක්ෂයන් දුරු කිරීම : 4:33-37, 8:2-3, 8:26-39, 9:14-23, 9:37-43

   ඇ. සුව කිරීම : 4:38-39, 4:40-41, 5:12-16, 5:17-26, 6:6-10, 6:17-20, 7:1-10, 8:43-48, 13:11-17, 14:1-6, 17:11-19, 18:35-43, 22:50-51,

   ඈ. ස්වභාවධර්මයෙහි බලවේග කෙරෙහි : 5:1-11, 8:22-25, 9:11-17

**වගුවක සාරාංශ ගත කිරීමේ උදාහරණය**

ලූක් පොතෙහි සඳහන් එක් එක් හාස්කම පිළිබඳව වගුවක ආධාරයෙන් සාරාංශ ගත කිරීම සිදු කළ හැකිය. එම වගුවට පහත සඳහන් මාතෘකා ඇතුලත් විය යුතුය.

හාස්කම : හාස්කම කුමක් වීද? එහි බයිබල් පද යොමුව.
තලය/ක්ෂේත්‍රය : හාස්කම කුමන ක්ෂේත්‍රයක් සම්බන්ධව සිදුවීද? ස්වභාවධර්මය, සුවකිරීම, මළවුන්ගෙන් නැගිටුවීම, යක්ෂයන් දුරු කිරීම, වෙනයම් යනාදී . . .
අවස්ථාව : හාස්කම සිදුකළ අවස්ථාව කුමක්ද?
ජනතාව : එයට සම්බන්ධ වූ ජනතාව කවුද?
ක්‍රමය : යොදාගනු ලැබුවේ කුමන ක්‍රමයද? එය වාචිකව සිදුවූවක්ද? ස්පර්ශ කිරීමෙන්, යාච්ඤාවකින් යනාදී ලෙස.
ප්‍රතිඵල : හාස්කමෙහි ප්‍රතිඵල කුමක්වීද?
ප්‍රතිචාරය : හාස්කමට සහභාගි වූ හෝ එයට සාක්ෂිකරුවන් වූ එය දුටු අයගේ ප්‍රතිචාරය කුමක්වීද?

ලූක් පොතෙහි සඳහන් එක් හාස්කමක් විශ්ලේෂණය කොට පහත උදාහරණයක් ලෙස ඉදිරිපත් කොට තිබේ. එවන් අධ්‍යයනයක් සෑම හාස්කමක් පිළිබඳවම සිදු කළ හැකිය.

| ලූක් පොතෙහි සඳහන් හාස්කම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| හාස්කම | ක්ෂේත්‍රය | අවස්ථාව | ජනතාව | ක්‍රමය | ප්‍රතිඵල | ප්‍රතිචාරය |
| සුව කිරීම | ශාරීරික | පේතෘස්ගේ නැන්දම්මාගේ නිවස | පේතෘස් හා නැන්දම්මා | දුරුකිරීම | උණ හැරයාම | ඇය නැගිට අන් අයට උපස්ථාන කළාය. |

මීට පෙර වගුව විශේයෙන්ම හාස්කම් සඳහා සැලසුම් කළ එකකි. එය අනෙකුත් මාතෘකා සඳහා යොදා ගත නොහැකිය. එහෙත් එය ඔබගේ මාතෘකානුකූල අධ්‍යයනයක් සාරාංශ ගත කිරීමට වගුවක් සැදිය හැකි ආකාරය පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය තුළින් ජීවිතයට හා සේවයට අදාළ කරගත හැකි ආකාර පිළිබඳ උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ. ඔබට වෙනයම් උදාහරණ පිළිබඳ සිතිය හැකිද?

- හාස්කම් ඇදහිලිවතුන්ගේ ජීවිතයෙහි කොටසක් විය යුතුද?
  (මතෙව් 16:17-18, යොහන් 14:12 බලන්න.)
- යේසුස්වහන්සේ රෝගය, මරණය හා යක්ෂාවේශය සම්බන්ධව ක්‍රියා කළ ආකාරයෙන් ඔබගේ සේවය සඳහා අදාළ කරගැනීමට ඔබට ඉගෙන ගත හැක්කේ කුමක්ද?
- ඔබගේම සේවයෙහිදී අදාළ කරගැනීම සඳහා ඇදහිල්ල හා හාස්කම් අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව ඔබට ඉගෙන ගත හැකි දේ මොනවාද?
- දෙවියන්වහන්සේගේ සැබෑ හාස්කම්වලට පසුව ඇතිවිය යුතු ප්‍රතිඵල මොනවාද? සැබෑ හාස්කම් සහ බොරු සේවකයන්ගේ රැවටීමේ සලකුණු අතර වෙනස වටහා ගැනීමට මෙම ප්‍රතිඵල ඔබට කෙසේ උපකාර විය හැකිද?

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. මාතෘකානුකූල බයිබල් අධ්‍යයන ක්‍රමය අර්ථ දක්වන්න.

3. මාතෘකානුකූල බයිබල් අධ්‍යයනයක පියවර හතර මොනවාද?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

භාස්කම් පිළිබඳ අධ්‍යයනය දිගටම පවත්වා ගෙන යන්න. මතෙව් පොතෙහි සඳහන් සියලුම භාස්කම් අධ්‍යයනය කරන්න.

මෙම පරිච්ඡේදයෙහි ඔබට සපයා දී ඇති උදාහරණ දළ සටහනට සමාන ඔබගේම දළ සටහනක් අධ්‍යයනය සඳහා සාදා ගන්න. මතෙව් පොතෙහි ඇතුලත් එක් එක් භාස්කම් විශ්ලේෂණය සඳහා සපයා ඇති ආදර්ශ වගුව භාවිත කරන්න. එසේම මෙම පරිච්ඡේදයෙහිදී ඇරඹූ ලූක් පොතෙහි සඳහන් භාස්කම් පිළිබඳ අධ්‍යයනය අවසන් කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය. එක් එක් භාස්කම විශ්ලේෂණය කිරීම සඳහා වගුව භාවිත කරන්න. අලුත් ගිවිසුමෙහි මාර්ක්, යොහන් හා ක්‍රියා යන පොත්වල අනෙකුත් භාස්කම් වාර්තා කොට තිබේ. ඔබගේ භාස්කම් මාතෘකාව හා තවදුරටත් මෙම පොත් ඇසුරින් දිගටම පවත්වා ගෙන යාමට ඔබට අවශ්‍ය විය හැකිය.

පැරණි ගිවිසුමේ භාස්කම් අධ්‍යයනය සඳහා ඔබට අවශ්‍ය විය හැකිය. එසේම පහත ලයිස්තුව ඔබහට පැරණි ගිවිසුමේ භාස්කම් සොයා දැනගැනීමට උපකාරී වනු ඇත.

| | |
|---|---|
| උත්පත්ති : | 1; 19:26 |
| නික්මයාම : | 17 |
| ගණන් කථාව: | 6 |
| යෝෂුවා : | 3 |
| විනිශ්චයකාරයන්ගේ පොත : | 3 |
| 1 සහ 2 සාමුවෙල් : | 3 |
| 1 සහ 2 රාජාවලිය : | 26 |
| දානියෙල් : | 2 |
| යෝවෙල් : | 1 (යෝවෙල් 1:17) |
| යෝනා: | 1 |

**භාස්කම් අධ්‍යයනයෙහිදී භාවිත කිරීම සඳහා ආදර්ශ වගුව :**

| **....................................................................... පොතෙහි සඳහන් භාස්කම්** | | | | | | |
|---|---|---|---|---|---|---|
| **භාස්කම** | **ක්ෂේත්‍රය** | **අවස්ථාව** | **ජනතාව** | **ක්‍රමය** | **ප්‍රතිඵල** | **ප්‍රතිචාර** |

# දහහත් වන පරිච්ඡේදය

# චරිතාපදාන අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- චරිතාපදාන බයිබල් අධ්‍යයන ක්‍රමය අර්ථ දැක්වීමට
- චරිතාපදාන බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමට

හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුණේය, ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහි චරිතාපදාන බයිබල් අධ්‍යයනය ක්‍රමය අර්ථ දක්වා පැහැදැලි කරදෙනු ඇත. මේ සඳහා උදාහරණයක්ද ඉදිරිපත් කොට ඇත. "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටසෙහිදී ඔබහට චරිතාපදාන බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමට අවස්ථාව සපයා දෙනු ලැබේ.

## ක්‍රමය අර්ථ දැක්වීම

චරිතාපදානය යනු කිසියම් පුද්ගලයෙකුගේ ජීවිත කතාවය. චරිතාපදාන බයිබල් අධ්‍යයන ක්‍රමය නම් බයිබලයේ සඳහන් පුද්ගලයෙකු පිළිබඳ අවධානය යොමු කරවන අධ්‍යයන ක්‍රමයකි. බයිබලයෙහි සඳහන් පුද්ගලයන්ගේ චරිත අධ්‍යයනය තුළින් ඔවුන් ලද අත්දැකීම් ඇසුරින් ඔබගේ ජීවිතයට යමක් ඉගෙන ගත හැකිය. බයිබලය මෙසේ සඳහන් කරයි.

> **ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුණේය, ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නාවූ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11)**

බයිබලයෙහි සඳහන් පුද්ගලයන්ගේ ජීවිතවල සිදුවූ සිදුවීම් ශුද්ධාත්ම ආනුභාවයෙන් එහි වාර්තා කර තිබෙන්නේ ඔබගේ ප්‍රයෝජනය උදෙසාය. ඔවුන්ගේ අත්දැකීම් තුළින් ඔබහට මහඟු ආත්මික පාඩම් ඉගෙනගත හැකිය. ඔවුන්ගේ අසමත්වීම් නිරීක්ෂණය කිරීම තුළින් මඟ හැරිය යුතු ආත්මික වැරදි මොනවාදැයි ඉගෙන ගත හැකිය. ඔවුන්ගේ සාර්ථකත්වය නිරීක්ෂණය තුළින් ඔබගේ ජීවිතයෙහි සුභවාදී ආත්මික ගුණාංග සංවර්ධනය කර ගත හැකිය.

# ක්‍රමය පැහැදිලි කිරීම

## පළමු පියවර : අධ්‍යයනය කිරීම සඳහා පුද්ගලයෙකු තෝරා ගන්න.

මෙහිදී ඔබ විශේෂ උනන්දුවක් දක්වන පුද්ගලයෙකු තෝරා ගත හැකිය. ඔබ හෙබ්‍රෙව් 11, ගලාති 3:7 හෝ ලූක් 4:27 සඳහන් පුද්ගලයන් අතුරින් කෙනෙකු තෝරා ගැනීමට සතුටු වනු ඇත. ඔබ දැනට කියවන හෝ අධ්‍යයනය කරන බයිබලයේ පොතෙන් වැදගත් කෙනෙකු අධ්‍යයනය සඳහා තෝරා ගැනීමට හැකිය. සියලු චරිතාපදාන අධ්‍යයනයන්ගේත් උසස්ම අධ්‍යයනය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිත කථාව බව මතක තබා ගන්න.

නම් පටලවා නොගැනීමට ප්‍රවේශම් වන්න. උදාහරණ ලෙස බයිබලයෙහි සෙකරියා නමින් 30 දෙනෙක්, නාතාන් නමින් 20 දෙනෙක්, ජොනතන් නමින් 15 දෙනෙක්, යූදස්ලා 8 දෙනෙක්, මරියා නමින් 7 දෙනෙක්, යාකොබ් නමින් 5 දෙනෙක් සහ යොහන් නමින් 5 දෙනෙක් සිටිති. එබැවින් ඔබ අධ්‍යයනය කරන පද ඔබ තෝරා ගත් පුද්ගලයා සම්බන්ධව කියැවෙන පද මිස එනමින් සිටින අනිකුත් පුද්ගලයන් පිළිබඳව නොවන බවට නිසැක කරගන්න.

එසේම එක නමකට වැඩියෙන් ඇති පුද්ගලයන් පිළිබඳව විමසිලිමත් වන්න. උදාහරණ ලෙස: යාකොබ්ගේ නම ඉශ්‍රායෙල් බවටත්, ආබ්‍රම්ගේ නම ආබ්‍රහම් බවටත්, සාවුල්ගේ නම ප්‍රේරිත වූ පාවුල් බවටත් වෙනස් විය.

## දෙවන පියවර : තොරතුරු රැස්කර ගන්න.

ඔබ තෝරා ගත් පුද්ගලයා සම්බන්ධව බයිබලයෙහි සඳහන් සියලු තොරතුරු රැස්කර ගන්න. ඔබ සතුව බයිබල් අකාරාදියක් තිබේනම් එම පුද්ගලයා පිළිබඳ සඳහන් සියලු බයිබල් පද ඉන් සොයා ගත හැකිය. ඔබ සතුව අකාරාදියක් නොමැති නම් කෙළින්ම බයිබලයෙන් තොරතුරු රැස්කර ගන්න. බොහෝ විට තෝරාගත් එක් පුද්ගලයෙක් පිළිබඳ සියලු තොරතුරු බයිබලයෙහි එක පොතක හෝ එක ළඟ පිහිටි පොත් මාලාවක ඇතුළත් වේ. ඔබ අධ්‍යයනය කරන පුද්ගලයා පිළිබඳ සියලු බයිබල් පද උපුටා ගැනීම් ලැයිස්තුවක් සාදා ගෙන එය බයිබලයෙන් කියවා බලන්න.

## තුන්වන පියවර : තොරතුරු විශ්ලේෂණය කරන්න.

චරිතාපදාන බයිබල් අධ්‍යයනයකදී ඔබ විසින් රැස් කරගත යුතු හා විශ්ලේෂණය කළ යුතු තොරතුරු කිහිපයක් පහත ලැයිස්තුවේ සඳහන් වෙයි. බයිබලයෙහි සෑම චරිතයක් පිළිබඳවම මෙම සියලු තොරතුරු සපයා නොතිබිය හැකිය. එහෙත් ඔබට සොයා ගත හැකි සියලු කාරණා ඔබ අධ්‍යයනය කරන තැනැත්තා පිළිබඳව උපරිම ලෙස කරුණු සොයා ගැනීමට උත්සාහ කරන්න. මෙම පාඩමෙහි "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසෙහි අවසානයෙහි ඇති වගුව ඔබ රැස්කරගත් තොරතුරු වාර්තා කොට විශ්ලේෂණය සඳහා භාවිත කරන්න.

චරිතාපදාන අධ්‍යයනයකදී රැස්කර ගත යුතු තොරතුරු නම් :

නම සහ නමෙහි අරුත
නෑදෑයින් : දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, පරම්පරාවේ අය, දරුවෝ.
උපත : ස්ථානය, උපතෙහි විශේෂත්වය, උපත හා සම්බන්ධ අසාමාන්‍ය සිදුවීම්.
ළමා කාලය හා මුල් ළමා පුහුණුව
භූගෝලීය පසුබිම : මෙම පුද්ගලයාගේ කතාව සිදුවූයේ කෙසේද?
යහළු මිත්‍රාදීන්, පෞද්ගලික සම්බන්ධතා.
රැකියාව හෝ වෘත්තිය : ඔවුන් දැරූ තනතුර හෝ නියැලි වෘත්තිය කුමක්ද? ඔවුන් ජීවත් වීමට ඉපයීම කෙසේ සිදු කළෝද?
ශාරීරික හැඩරුව
සුබවාදී චරිත ලක්ෂණ
අසුබවාදී චරිත ලක්ෂණ
සුවිශේෂී ආත්මික සිදුවීම්
    දෙවියන්වහන්සේ සමඟ පළමු සම්මුඛ වීම.
    හැරීම

සේවයට කැඳවීම.
එම පුද්ගලයාගේ ජීවිතයෙහි දරුණුම අර්බුදය හෝ ජීවිතයේ හැරුණාවු අවස්ථාව (උදාහරණ ලෙස: සාවුල් දමස්කයට යන මගදී)

මරණය : කොහේද, කවදාද, අසාමාන්‍ය වාතාවරණයක් යටතේ.

### හතරවන පියවර : ඔබ ඉගෙන ගත් කාරණා අදාළ කරගන්න.

ඔබ අධ්‍යයනය පුද්ගලයාගේ ජීවිතයෙන් ඔබගේ පෞද්ගලික ජීවිතයට අදාළ කරගන්න. උදාහරණ ලෙසට :

**ඔහු සතුවූ සුබවාදී චරිත ලක්ෂණ මොනවාද?** ඔබගේ ජීවිතයෙහි එම ගුණාංග වර්ධනය කර ගැනීමට දෙවියන්වහන්සේගෙන් උපකාර ඉල්ලා සිටින්න.

**ඔහු සතුවූ අසුබවාදී චරිත ලක්ෂණ මොනවාද?** ඔබගේ ජීවිතයෙහි එම ලක්ෂණ දකියිද? එයින් ජය ගැනීමට ඔබට සහාය දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

එම පුද්ගලයාගේ ජීවිතයෙන් ඔබ **ඉගෙනගත් අනර්ඝතම සත්‍යය** සාරාංශ කොට දැක්වීමට **එක් වාක්‍යයක් ගොඩ නඟන්න.** උදාහරණ ලෙස: සැම්සොන්ගේ ජීවිතය පිළිබඳ එම වාක්‍යය මෙසේ විය හැකිය. "ආත්මික කාරණා පාවාදීමෙහි (දියාරු කිරීමෙහි) ප්‍රතිඵලය අසමත් වීමය."

## ක්‍රමය පිළිබඳ උදාහරණය

### පළමු පියවර : අධ්‍යයනය කිරීමට පුද්ගලයෙකු තෝරා ගන්න.

සාවුල් රජතුමා

### දෙවන පියවර : තොරතුරු රැස්කරගන්න.

සාවුල්ගේ කතන්දරය ඇත්තේ 1 සාමුවෙල් 9-31 දක්වාය. මෙම පරිච්ජේද ඇසුරින් තොරතුරු රැස්කරන ලදී.

### තුන්වන පියවර : තොරතුරු විශ්ලේෂණය කරන්න.

**නම සහ නමෙහි අරුත :**

සාවුල් යන්නෙහි අර්ථය "දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටි" 1 සාමුවෙල් 9:2.

**නෑදෑයින්** : දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, පරම්පරාව, දරුවෝ: ඔහු කීෂ්ගේ පුත්‍රයාය. කීෂ්, අපියාගේ පුත්‍රයා වන බෙඛෝරත්ගේ පුත්‍රවූ ශෙරෝර්ගේ පුත්‍රයා වන අබියෙල්ගේ පුත්‍රයා විය. කීෂ් බෙන්යමීය මනුෂ්‍යයෙකු වූ අතර මහත් ධනවත් බලවත් මිනිසෙක් විය.

සාවුල්හට පුත්‍රයන් තිදෙනෙක් වූහ. ඔවුන්ගේ නාම නම්, යොනතන්, ඉෂ්වි සහ මල්කිෂුවාය. ඔහුට දූවරු දෙදෙනෙක් විය. ඔවුන්ගේ නාම නම්, මේරබ් සහ මීඛල්ය. ඔහුගේ භාර්යාවගේ නම අහිනොවම්ය. 1 සාමුවෙල් 14:49-50

**උපත** : ස්ථානය, උපතෙහි වැදගත්කම උපත හා සම්බන්ධ අසාමාන්‍ය සිදුවීම්.

බයිබලය මෙම කාරණා කිසිවක් සඳහන් කර නොමැත.

**ළමා කාලය හා ළමා පුහුණුව :**

ඔහු තම පියාගේ කොටළුවන් බලා ගත්තේය. 1 සාමුවෙල් 9:3

**භූගෝලීය පිහිටීම :**

යුදය

**යහළු මිත්‍රයන්, සගයින්, පෞද්ගලික සම්බන්ධතා :**

බෙලියල් දරුවෝ ඔහුව සුළු කොට තැකුවෝය. 1 සාමුවෙල් 10:27. ඔහු තමාගේ සේනාංකයෙහි ප්‍රධානියා වූ තම බාප්පාගේ පුත්‍රයා වන අබ්නේර් හා ඉතා සමීප විය : 1 සාමුවෙල් 14:50. දාවිත් සාවුල්ගේ සගයෙකු විය. පළමුව ඔහු දාවිත්ට ප්‍රිය කළ නමුත් පසුව සාවුල් දාවිත්ට ඊර්ෂ්‍යා කළ බැවින් යහළුකම පළුදු විය. 1 සාමුවෙල් 18:6-9. මුල් වරට සාවුල් රජ බවට පත් වූ කල, දෙවියන්වහන්සේ විසින් හදවත ස්පර්ශ කළාවූ ජන කණ්ඩායමක් ඔහු හා සමඟ විය. ඔහු දෙවියන්වහන්සේගෙන් විමසීමෙන් තොරව "ශක්තිමත් ජව සම්පන්න" මිනිසුන් කණ්ඩායමට එකතු කර ගන්නට පටන් ගත් පසු ගැටලු ආරම්භ විය. 1 සාමුවෙල් 10:26, 13:2, 14:52.

**රැකියාව හෝ තනතුර :**

ඉශ්‍රායෙල්හි පළමු රජු

**ශාරීරික හැඩරුව :**

ඔහු සියලු මිනිසුන්ට වඩා උරහිසින් උස්ව සිටියේය. 1 සාමුවෙල් 9:2, 10:23, ඔහු ඉතා ශෝභමාන කෙනෙක් ලෙස විස්තර කරයි. 1 සාමුවෙල් 9:2.

**සුබවාදී චරිත ලක්ෂණ :**

| | |
|---|---|
| පවුල පිළිබඳ සැලකිල්ල දැක්වීය. | 1 සාමුවෙල් 9:5 |
| තෝරාගත් පුද්ගලයා | 1 සාමුවෙල් 9:2, 10:24 |
| ඔහුගේ හදවත වෙනස් කිරීමට ආත්මයට ඉඩ හැරීය. | 1 සාමුවෙල් 11:6, 10:6 |
| විනීත : බඩු මළු අතර සැඟවිණි. | 1 සාමුවෙල් 10:22 |
| මැරීම ප්‍රතික්ෂේප කළේය. | 1 සාමුවෙල් 11 |
| නායකත්වය : ජනතාව පෙළ ගැස්වීම | 1 සාමුවෙල් 11 |
| ආත්මයේ මනුෂ්‍යයෙකි. | 1 සාමුවෙල් 11 |
| මුලින් කීකරුවන්ත කෙනෙකි. | 1 සාමුවෙල් 9:27 |
| දේව භක්තිකයන් සමඟ එක්ව සිටියහ. | 1 සාමුවෙල් 11:7, 10:26 |
| දෙවියන්වහන්සේ උදෙසා නිර්භීත විය. | 1 සාමුවෙල් 10:6 |
| මුලින් යටහත් පුද්ගලයෙකු විය. | 1 සාමුවෙල් 9:21 |

**අසුබවාදී චරිත ලක්ෂණ**

| | |
|---|---|
| දෙවියන්වහන්සේට කීකරු වීමට වඩා එවේලෙහි අවශ්‍යතාවයනට අනුව ක්‍රියා කළේය. | 1 සාමුවෙල් 13:8-12 |
| අකීකරු වී, බොරු කියා, වරද පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය. | 1 සාමුවෙල් 15 |
| දෙවියන්වහන්සේගේ ජනතාව දුකට පත් කළේය. | 1 සාමුවෙල් 15:35 |
| දෙවියන්වහන්සේ සිතන දෙයට වඩා මිනිසුන් සිතන දෙය ගැන වඩා සැලකිලිමත් විය. | 1 සාමුවෙල් 15:30 |
| දෙවියන්වහන්සේ ස්පර්ශ කළාවූ මිනිසුන් කණ්ඩායමට වඩා තමාට සමීපව සිටින පිණිස ශක්තිමත් ජව සම්පන්න මිනිසුන් කොටසක් තෝරා ගත්තේය. | 1 සාමුවෙල් 10:26, 14:52 |
| බයෙන් පසු විය. | 1 සාමුවෙල් 17:11 |

බාහිර පෙනීම අනුව විනිශ්චය කළේය. 1 සාමුවෙල් 17:33

මනුෂ්‍යයාගේ යුද්ධායුධ විශ්වාස කළේය. 1 සාමුවෙල් 17:38

ඊර්ෂ්‍යා විය. 1 සාමුවෙල් 18:6-9

අශුද්ධ ආත්මයක් පැමිණියේය 1 සාමුවෙල් 18:10

පළිගැනීමේ ආත්මය 1 සාමුවෙල් 18:11

දෙවියන්වහන්සේගේ ආලේපලත් තැනැත්තාට එරෙහිව
කුමන්ත්‍රණය කළේය. 1 සාමුවෙල් 18:20-30

**සුවිශේෂී ආත්මික සිදුවීම්**

දෙවියන්වහන්සේ සමඟ මුල් සම්මුඛ වීම 1 සාමුවෙල් 9:15-27
දෙවියන්වහන්සේ වෙතට හැරීම 1 සාමුවෙල් 10:9
සේවයට කැඳවීම 1 සාමුවෙල් 10:1
බැරෑරුම් අර්බුදය හෝ හැරනාවු අවස්ථාව 1 සාමුවෙල් 13

**මරණය** : කවදාද, කොතැනදීද, අසාමාන්‍ය අවස්ථාවක් යටතේදීද.

1 සාමුවෙල් 31 : ඔහු තමාගේම අතින් මැරුම් කෑවේය. එදින ගිල්බෝවාහිදී පිලිස්තිවරුන්ට එරෙහි සටනෙහිදී ඔහුද ඔහුගේ පුතුන් තිදෙනාද යුද්ධායුධ දරන්නාද ඔහුගේ සියලු මනුෂ්‍යයන්ද මිය ගියෝය.

## හතරවන පියවර : ඔබ ඉගෙන ගත් කාරණා අදාළ කරගන්න :

මගේම ජීවිතයෙහි වර්ධනය කර ගැනීමට මා විසින් උත්සාහ කළ යුතු සාවුල්ගේ ජීවිතයෙහි තිබූ **සුබවාදී චරිත ලක්ෂණ** නම් :

ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහි පැමිණි කල මට “වෙනස් වූ මිනිසෙකු” බවට පත් විය හැකිය. 1 සාමුවෙල් 10:6. මම එවැනි ආලේපයක් දෙවියන්වහන්සේගෙන් ලැබීමට සෙවිය යුතුය.

මගේ ජීවිතයෙහි මඟ හැරීමට සෙවිය යුතු සාවුල්ගේ ජීවිතයෙහි වූ **අසුබවාදී චරිත ලක්ෂණ නම්**

දෙවියන්වහන්සේ තමාගේම හදවතට එකඟ වූ නායකයන් ආශා කරන සේක. 1 සාමුවෙල් 13:14. සාවුල් මෙහිදී අසමත් වුවද මම එවැනි නායකයෙකු වීමට අපේක්ෂා කරමි.

අකීකරුකම : දෙවියන්වහන්සේ විසින් අණ කළ දෙයට වඩා එම මොහොතේ අවශ්‍යතාවය අනුව ක්‍රියා කිරීම. මගේම පාපයට අන් අය වෙත වරද පැටවීම. දෙවියන්වහන්සේ මා ගැන සිතන දෙයට වඩා මනුෂ්‍යයන් මා ගැන සිතන දෙය පිළිබඳව වැඩි සැලකිලිමත් වීම.

සාවුල්ගේ අසුබවාදී චරිත ලක්ෂණ ලැයිස්තුව වරින්වර කියවා බලා මගේම හදවත නිතර නිතර සෝදිසි කර බැලීම වටී.

දෙවියන්වහන්සේ සාවුල් කැඳවූයේ තම ජනතාව කෙරෙහි අධිපතියා වීමටය. 1 සාමුවෙල් 10:1. ඒ වෙනුවට ඔහුව රජ බවට පත් කළේ මනුෂ්‍යයෝය. (1 සාමුවෙල් 12:12-15, 10:24). දෙවියන්වහන්සේ සැලැස්ම වූයේ ඉශ්‍රායෙල්හි රජ වීමටය. සමහර විට මනුෂ්‍යයන්ගේ ප්‍රශංසාව, දේව සැලැස්මෙන් මා වෙනතකට යොමු කළ හැකි බැවින් මම ප්‍රවේශම් විය යුතු වේ.

දෙවියන්වහන්සේ ආරම්භයේදී සාවුල් සමඟ සිටි නමුත් (1 සාමුවෙල් 10:7,9, 13:14), පසුව ඔහුට රාජ්‍යය අහිමි විය. ඔහුගේ පාපයට පසුවත් රාජ්‍යය අහිමිවීම පිළිබඳව අනාගත කීමට පසුවත්, දෙවියන්වහන්සේගේ ආලේපය තවමත් සාවුල් මත විය. (1 සාමුවෙල් 14:47). දෙවියන්වහන්සේගේ

දීමනා හා කැඳවීම් පසුතැවිලි වීමෙන් තොරය. සාවුල්ට තවමත් දෙවියන්වහන්සේගේ හඬ ඇසුණි. (1 සාමුවෙල් 15:1) එතුමා නමස්කාර කළේය (15:31). එනමුත් පාපොච්චාරණය නොකළ පාපය ඔහු තුළ වූ බැවින් රාජ්‍යය අහිමි විය.

දෙවියන්වහන්සේ නායකයෙකු ලෙස ආලේප කළාවූ මනුෂ්‍යයාට අත තැබීමේ භයානකකම දාවිත් හඳුනාගත්තේය. මමද මෙම අනතුරු ඇඟවීමට සවන් දිය යුතු වෙමි.

සාවුල්ගේ ජිවිතයෙන් ඉගෙන ගත් **ශ්‍රේෂ්ඨතම සත්‍යය** නම් දෙවියන්වහන්සේට අකීකරු වීමෙහි ප්‍රතිඵලයයි. එය සාමුවෙල්ගේ ප්‍රකාශනයෙහි කැටි කොට දක්වා ඇත. "පූජාවට වඩා කීකරු වීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන් දීමත් හොඳය." 1 සාමුවෙල් 15:22.

එවන් අකීකරුකමෙහි ප්‍රතිඵලය සාවුල් පිළිබඳ දාවිත්ගේ ප්‍රකාශනයෙහි සාරාංශ ගතව ඇත. "අහෝ, බලවතුන් වැටුණ හැටි !" 2 සාමුවෙල් 1:19.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. චරිතාපදාන බයිබල් අධ්‍යයන ක්‍රමය අර්ථ දක්වන්න.

3. චරිතාපදාන බයිබල් අධ්‍යයන ක්‍රමයෙහි පියවර හතර ලියන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදය අවසානයේ දක්වා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

බයිබල් චරිතයක් තෝරා ගෙන චරිතාපදාන අධ්‍යයනයක් සිදු කරන්න. පහත සඳහන් වගුව ඔබගේ චරිතාපදාන අධ්‍යයනය සහ ඉදිරියෙහිදී සිදු කරන අධ්‍යයන සඳහා භාවිත කරන්න.

## චරිතාපදාන බයිබල් අධ්‍යයනය

### පළමු පියවර : අධ්‍යයනය කිරීමට තැනැත්තෙකු තෝරා ගන්න :

### දෙවෙනි පියවර : තොරතුරු රැස්කර ගන්න :

මෙම පුද්ගලයාගේ ජීවිතය පිළිබඳ වාර්තා කරන බයිබල් පද ලේඛණයක් සාදන්න.

### තුන්වන පියවර : තොරතුරු විශ්ලේෂණය කරන්න :

**නම සහ නමෙහි අර්ථය:**

**නෑදෑයින් :** දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, පරම්පරාවේ අය, දරුවෝ.

**උපත :** ස්ථානය, උපතෙහි විශේෂත්වය, උපත හා සම්බන්ධ අසාමාන්‍ය සිදුවීම්.

**ළමා කාලය හා ළමා පුහුණුව:**

**භූගෝලීය පසුබිම :**

**යහළු මිත්‍රාදීන්, පෞද්ගලික සම්බන්ධතා.**

**රැකියාව හෝ වෘත්තිය :**

**ශාරීරික හැඩරුව**

**සුබවාදී චරිත ලක්ෂණ**

**අසුබවාදී චරිත ලක්ෂණ**

**සුවිශේෂී ආත්මික සිදුවීම්**

**දෙවියන්වහන්සේ සමඟ පළමු සම්මුඛ වීම.**

**දෙවියන්වහන්සේ වෙතට හැරීම**

**සේවයට කැඳවීම.**

**එම පුද්ගලයාගේ ජීවිතයෙහි බැරෑරුම් අර්බුදය හෝ හැරනාවු අවස්ථාව :**

**මරණය :**

## හතරවන පියවර : ඔබ ඉගෙන ගත් කාරණා අදාළ කරගන්න :

**මට ගොඩනගා ගතහැකි ඔහු සතුවූ සුබවාදී චරිත ලක්ෂණ මොනවාද?**

**මට මගහැරිය හැකි ඔහු සතුවූ අසුබවාදී චරිත ලක්ෂණ මොනවාද?**

**එම පුද්ගලයාගේ ජීවිතයෙන් ඔබ ඉගෙනගත් අනර්ඝතම සත්‍යය නම් . . .**

# දහඅට වන පරිච්ඡේදය

# දේව ධර්මානුකූල ක්‍රමය

## අරමුණු :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයන ක්‍රමය අර්ථ දැක්වීමට
- දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයනයෙහි පියවර පහ නම් කිරීමට
- දේව ධර්මය යන පදය අර්ථ දැක්වීමට.
- ප්‍රධාන දේව ධාර්මික වචන අර්ථ දැක්වීමට.
- දේව ධර්මානුකූල ක්‍රමය භාවිත කොට බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමට හැකි වනු ඇත.

## ප්‍රධාන පදය:

**ඔබගේ ශික්ෂා ආශ්චර්යමත්ය. එබැවින් මාගේ ආත්මය ඒවා රක්ෂා කරයි.**
**(ගීතාවලිය 119:129)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය දේවධර්මානුකූල බයිබල් අධ්‍යයනය ක්‍රමය අර්ථ දක්වා පැහැදැලි කරදෙයි. මෙම ක්‍රමය සඳහා උදාහරණයක්ද සපයා ඇත. "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසින් ඔබට මෙම ක්‍රමය භාවිත කොට දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමට අවස්ථාව සැපයෙනු ඇත.

## ක්‍රමය අර්ථ දැක්වීම

දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයන ක්‍රමය බයිබලයෙහි මූලික දේව ධර්මයන් අධ්‍යයනය කිරීම කෙරෙහි අවධානය යොමු කරවයි. එය දේව ධර්මය පිළිබඳ තොරතුරු රැස් කිරීමට, සැසඳීමට, සංවිධානය කිරීමට බයිබලයේ එක පොතක් හෝ මුළු බයිබලයම යොදාගෙන සිදු කරන අධ්‍යයනයකි. දේව ධර්මය යනු දෙවියන්වහන්සේ පිළිබඳ අධ්‍යයනයයි. මේ සඳහා පියවූ දෙවියන්වහන්සේ, පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ අධ්‍යයනය ඇතුළත්ය. දේව ධර්මානුකූල ක්‍රමයෙහිදී දෙවියන්වහන්සේ පිළිබඳ ධර්මය එළිදරව් කරන්නාවූ කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. ධර්මනියාම යනු කිසියම් විෂයක් පිළිබඳ ඉගැන්වීම් සමූහයකි. දේව ධර්මානුකූල ක්‍රමය දේව ධර්මයන් (දෙවියන්වහන්සේ හා සම්බන්ධ කාරණා) තුළ ඇති මූලික ධර්මනියාම (සමූහ ඉගැන්වීම්) කෙරෙහි අවධානය යොමු කරයි.

දේව ධර්මානුකූල අධ්‍යයනයකදී සාමාන්‍යයෙන් තෝරාගත් ධර්මනියාමයක් පිළිබඳව කිසියම් පොතක් උගන්වන කාරණා සියල්ල කෙරෙහි අවධානය යොමු කරයි. වැඩි විස්තර සහිතව දේව ධර්මානුකූල අධ්‍යයනයක් කිරීමේදී ධර්මනියාමයක් පිළිබඳව මුළු බයිබලයම උගන්වන කරුණු අවධාරණය කෙරේ. ධර්මනියාමයක් කිසිවිට එක් හුදකලා පදයක් හෝ ඡේදයක් ඇසුරින් නිර්ණය නොවේ. තෝරාගත් බයිබල් පද කිහිපයක් ඇසුරින් තනාගත් ධර්මනියාමයන් ඉගැන්වීමෙන් වැරදි සිදුවේ. මෙය ලබ්ධි ඇදහීම් වලදී සිදුකරන එක් වැරදි පුරුද්දක් වේ.

දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයනයක් සිදු කිරීමෙහිදී දැනටම ඔබ ඉගෙන ගෙන ඇති පොත්, පරිච්ඡේද, ඡේද, පද හා වචනය අධ්‍යයනයන් සියල්ල අදාළ කර ගතහැකිය. ඔබට දේව ධර්මානුකූල ක්‍රමය භාවිතයෙහිදී මෙම සියලු ක්‍රම භාවිත කළ හැකිය.

## ක්‍රමය පැහැදැලි කරදීම

දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයන ක්‍රමයෙහි ප්‍රධාන පියවර පහක් ඇතුළත් වේ.

**පළමු පියවර : මාතෘකාව තෝරා ගන්න** :

පහත සඳහන් බයිබලීය දේවධර්ම දළ සටහනෙහි ඔබහට දේව ධර්මානුකූල බයිබල් අධ්‍යයනය සඳහා මාතෘකාවක් තෝරා ගැනීමට සහාය වනු ඇත.

### බයිබලීය දේව ධර්ම

1. බයිබල් විද්‍යාව : බයිබලය පිළිබඳ ධර්මය අධ්‍යයනය කිරීම.

    අ. මූලාරම්භය
    ආ. එළිදරව්ව
    ඇ. ආනුභාවය
    ඈ. ආධිපත්‍යය
    ඉ. ප්‍රදීපනය (ශුද්ධාත්මයාණෝ දේව වචනය අවබෝධ කර ගැනීම පිණිස අප තුළ ක්‍රියාකිරීම).
    ඊ. පරිවර්තනය

2. දේව ධර්මය - පියවූ දෙවියන්වහන්සේ පිළිබඳ අධ්‍යයනය

    අ. දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග
    ආ. දෙවියන්වහන්සේගේ ක්‍රියා
    ඇ. දෙවියන්වහන්සේගේ නාම
    ඈ. දෙවියන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය

3. ක්‍රිස්තු ධර්මය : යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ධර්මය අධ්‍යයනය

    අ. යේසුස්වහන්සේගේ ගුණාංග
    ආ. යේසුස්වහන්සේගේ ක්‍රියා
    ඇ. යේසුස්වහන්සේගේ නාම
    ඈ. යේසුස්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය
    ඉ. යේසුස්වහන්සේගේ මාංශික ජීවිතය
        1. උපත හා ළමා කාලය
        2. බව්තීස්මය
        3. පරීක්ෂා
        4. අන්වෙසක් වීම
        5. ඉගැන්වීම්
        6. භාස්කම්
        7. දුක්විඳීම හා මරණය
        8. නැවත-නැගිටීම
        9. ස්වර්ගාරෝහණය

    ඊ. යේසුස්වහන්සේ දෙවන වර නැවත පැමිණීම
    උ. මෙසියස්වහන්සේගේ රාජ්‍යය
    ඌ. යේසුස්වහන්සේගේ දිව්‍යමය භාවය : යේසුස්වහන්සේගේ දිව්‍යමය මෙන්ම මිනිසත් බව යන දෙකම සහිතව සිටීම පිළිබඳ අධ්‍යයනය.

එ. පියවු දෙවියන්වහන්සේ සමඟ එතුමා පෙර කල සිටම පැවතිම.
ඒ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ පරණ ගිවිසුමෙහි සංකේත.

4. ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මය : ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මය අධ්‍යයනය කිරීම.

අ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ගුණාංග
ආ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියා සහ මෙහෙය
 1. පැරණි ගිවිසුමෙහි
 2. අලුත් ගිවිසුමෙහි
 3. වර්තමාන සභා යුගයෙහි
ඇ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ නාම
ඈ. පියවු දෙවියන්වහන්සේ සමඟ පෙර කල සිටම ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැවතිම.
ඉ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ත්‍රිත්වයෙහි ස්වභාවය
ඊ. පැරණි ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ හා අලුත් ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ අතර පරස්පරබව
උ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ නාම සංකේත හා අඩයාලම්
ඌ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා
එ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල
ඒ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය.

5. දේව දූතයන් පිළිබද ධර්මය : යහපත් දේව දූතයන්, දෙවියන්වහන්සේගේ දූතයන් පිළිබඳ අධ්‍යයනය.

අ. ඔවුන්ගේ ආකෘතිය සහ සංවිධානය
ආ. දේව දූතයන්ගේ නම්
ඇ. දේව දූතයන්ගේ ක්‍රියා : අතීත, වර්තමාන හා අනාගත.

6. යක්ෂයන් පිළිබද ධර්මය : දුෂ්ට වූ දූතයන් එනම් සාතන්ගේ යක්ෂයන් පිළිබඳ අධ්‍යයනය.

අ. මූලාරම්භය
ආ. ආකෘතිය සහ සංවිධානය
ඇ. නම්
ඈ. ක්‍රියා : අතීත, වර්තමාන හා අනාගත.

7. සාතන් පිළිබද ධර්මය : සාතන් පිළිබඳ අධ්‍යයනය.

අ. මූලාරම්භය
ආ. වැටීම
ඇ. නාම
ඈ. ක්‍රියා : අතීත, වර්තමාන හා අනාගත.
ඉ. විනිශ්චය හා ඉරණම.

8. මානව විද්‍යාව : මිනිසාගේ ආරම්භය හා ස්වභාවය පිළිබඳ අධ්‍යයනය.

අ. මිනිසාගේ මූලාරම්භය
ආ. මිනිසාගේ වැටීම
ඇ. මිනිසාගේ පාපිෂ්ඨ ස්වභාවය
ඈ. මිනිසාගේ පාපය සඳහා දෙවියන්වහන්සේගේ විසඳුම

9. ගැළවීමේ ධර්මය : ගැළවීම පිළිබඳ දේව ධර්ම අධ්‍යයනය.

අ. ගැළවීමේ සැලසුම සංවර්ධනය වූ ආකාරය : ගැළවීම පිළිබඳ බයිබලයෙහි උත්පත්ති 3:15

පළමුවෙනි පොරොන්දුවේ සිට පවතින සියලු මූලාශ්‍ර සොයා බැලීම.

ආ. ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අධ්‍යයනය. (දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන බලන්න. ක්‍රිස්තු ධර්මය).

ඇ. ගැළවුම්කරු විසින් නිම කළ කාර්යය.

ඈ. ගැළවීමෙහි කොන්දේසි.

10. සභා ධර්මය : මෙය සභාව පිළිබඳ දේව ධර්මය අධ්‍යයනය කිරීමකි. එහිදී බයිබලයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික ශරීරය වන සභාව පිළිබඳ ඉගැන්වීම් සියල්ල කෙරෙහි අවධානය යොමු කෙරේ.

අ. සංයුක්තයක් ලෙස සභාව : ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය

ආ. ඉශ්‍රායෙල් සහ සභාව අතර වෙනස.

ඇ. සභාවෙහි සංවිධානය

1. නියෝග
2. පිළිවෙළ
3. ආකෘතිය
4. සේවාව
5. සභාවෙහි ධර්මය

9. අවසාන කාලය පිළිබඳ ධර්මය: සදාකාලය ඇරඹීමට පෙර අවසාන කාලයෙහි අවසාන සිදුවීම් පිළිබඳ අධ්‍යයනය.

අ. සභාව සම්බන්ධ අනාගතකිම්

ආ. ඉශ්‍රායෙල් සම්බන්ධ අනාගතකිම්

ඇ. ලෝකයෙහි අනෙකුත් ජාතීන් සම්බන්ධ අනාගතකිම්

ඈ. මෙසියස්වහන්සේ පිළිබඳව : එතුමාගේ නැවත පැමිණීම හා රාජ්‍යය පිහිටුවීම සම්බන්ධ අනාගත කීම්.

ඉ. මළවුන් නැවත - නැගිටුවීම.

ඊ. විනිශ්චයන්

උ. මහත් පීඩාවේ දවස

ඌ. දහස් අවුරුදු රජකම් කිරීම.

එ. ධර්මිෂ්ඨයන්ගේ හා අධර්මිෂ්ඨයන්ගේ සදාකාලික ඉරණම.

## දෙවන පියවර : ඔබ තෝරා ගත් ධර්මය අර්ථ දක්වන්න.

මූලික දේව ධර්ම සඳහා අර්ථ දැක්වීම්, මීට ප්‍රථම දැක්වූ දළ සටහනෙහි ඇතුලත් විය. මේවා නම් ක්‍රිස්තු ධර්මය, ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මය, ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මය, බයිබල් විද්‍යාව, දේව ධර්මය, දේව දූතයන් පිළිබද ධර්මය, යක්ෂයන් පිළිබද ධර්මය, සාතන් පිළිබද ධර්මය, මානව විද්‍යාව, ගැළවීමේ ධර්මය, සභා ධර්මය, අවසාන කාලය පිළිබද ධර්මය ඇතුලත් වේ.

## තුන්වන පියවර : අධ්‍යයනය සඳහා බයිබල් කොටස තෝරන්න.

ඔබ මෙම ධර්මනියාමය අධ්‍යයනය කිරීමට සැලසුම් කරන පොත හෝ පොත් පිළිබඳ තීරණයක් ගන්න. දේව ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීම සඳහා හොඳම පොත් නම් අලුත් ගිවිසුම් පොත්ය. පැරණි ගිවිසුම වැඩි වශයෙන් අනාගතමය හෝ නාට්‍යානුසාරයෙන් (කතාවක් ලෙස) ලියැවී තිබේ. දේව ධර්මානුකූල අධ්‍යයනය සඳහා බොහෝ කරුණු නව ගිවිසුමෙහි, විශේෂයෙන්ම ශුභාරංචි පොත් හා යැවුම් පත්‍රවල ඇතුලත් වේ.

**හතරවන පියවර : ධර්මය පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.**

ඔබ අධ්‍යයනය කරන ධර්මනියාමයට උපකාර ලෙස මෙතෙක් ඔබ ඉගෙන ගත් පොත්, පරිච්ඡේද, ඡේද, පද හා වචන අධ්‍යයනයන්ගේ කාරණා භාවිත කරන්න. ඔබ කියවන අතරතුර, මෙම ධර්මනියාමය පිළිබඳව ශුද්ධ ලියවිල්ල හෙළිදරව් කරන සියලු කරුණු සලකුණු කරගන්න.

**පස්වන පියවර : ඔබ රැස්කර ගත් තොරතුරු සාරාංශගත කරන්න.**

ඔබගේ බයිබල් අධ්‍යයනයෙහිදී රැස්කර ගත් සියලු විස්තර සාරාංශගත කරන්න. දේව ධර්මය සඳහා මෙම පරිච්ඡේදයෙහි සපයා ඇති දළ සටහන ඔබගේ අධ්‍යයන සටහන් සංවිධානය කොට දළ සටහන සෑදීම සඳහා උපකාර කරගන්න.

## ක්‍රමය පිළිබඳ උදාහරණ

**පළමු පියවර : මාතෘකාව තෝරා ගන්න.**

දේවධර්මානුකූල ක්‍රමයෙහි උදාහරණයක් ලෙසට අප ක්‍රිස්තු ධර්මය යන මාතෘකාව තෝරා ගත්තෙමු.

**දෙවන පියවර : ධර්මනියාමය අර්ථ දක්වන්න**

ක්‍රිස්තු ධර්මය යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ධර්මනියාම අධ්‍යයනයෙහි යෙදීමකි.

**තුන්වන පියවර : අධ්‍යයනය කිරීම සඳහා බයිබල් කොටස තෝරා ගන්න.**

අපි කොලොස්සි පොතෙහි සඳහන් ක්‍රිස්තු ධර්මය අධ්‍යයනය කරමු.

**හතරවන පියවර : ධර්මය පිළිබඳ විස්තර රැස්කර ගන්න.**

මෙම අධ්‍යයනය සඳහා අප පළමුව පොත කියවා දළ සටහනක් සාදාගනිමු.

## කොලොස්සි පොත

I. හැඳින්වීම : 1:1-14

 අ. සුභාශිංසනය 1:1-2

 ආ. ස්තුති දීම 1:3-8

 ඇ. කොලොස්සියෙහි විසූ කිතු බැතියන් වෙත පාවුල්ගේ යාච්ඤාව 1:9-14

II. යේසුස්වහන්සේ නමැති පුද්ගලයා හා ක්‍රියා 1:15-23

 අ. මැවීමෙහි ස්වාමීන්වහන්සේ 1:15-17

 ආ. සභාවෙහි ස්වාමීන්වහන්සේ 1:18-19

 ඇ. සමගි කරන තැනැත්තා 1:20-23

III. පාවුල් : දෙවියන්වහන්සේගේ සමගි කිරීමෙහි සේවකයා 1:24 - 2:7

 අ. දුක් විඳීම් 1:24

 ආ. ක්‍රිස්තුස්වහන්සේගේ අබිරහසෙහි සේවකයා 1:25-29

 ඇ. ක්‍රිස්තුස්වහන්සේ තුළ එකමුතු බව සහ ස්ථායිබව සඳහා ආශාව 2:1-7

IV. බොරු ඉගැන්වීම් වලට එරෙහිව ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීත්වය 2:8 - 3:4

 අ. සියලු බලයන්හි ස්වාමීන්වහන්සේ 2:-8-10

 ආ. නව ජීවනයෙහි සැපයුම් මාධ්‍යය 2:11-14

 ඇ. අධිපතීන්ද බලයලත්තන්ද පරාජය කළ තැනැත්තාය 2:15

 ඇ. ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීත්වය ප්‍රතික්ෂේප කරන ආකාරයෙහි කොලොස්සිවරුන්ගේ ක්‍රියාවන් 2:16 - 3:4

 1. චාරිත්‍ර 2:16 -17
 2. දේව දූත නමස්කාරය 2:18-19
 3. ලෝකයෙහි ගුරුකම් වලට යටත්වීම 2:20-23
 4. ලෞකිකවූත්, තාවකාලිකවූත් ස්නේහය 3:1-4

V. ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීත්වය සහ ක්‍රිස්තියානි ජීවිතය 3:5-4:6

 අ. පරණ ජීවිතය ඉවතලා 3:5-9

 ආ. නව ජීවනය පැළඳගන්න 3:10-17

 ඇ. විශේෂ අවස්ථා 3:18 - 4:6

 1. නිවෙස 3:18-21
 2. රැකියාව 3:22 - 4:1
 3. පොදු උපදෙස් 3:23-25

VI. අවසාන උපදෙස් 4:2-6

 අ. යාච්ඤාව නම් කාර්යභාරය 4:2-4

 ආ. සාක්ෂි දැරීම නම් කාර්යභාරය 4:5-6

VII. අවසානය 4:7-18

 අ. පෞද්ගලික සුබ පැතුම් 4:7-17

 ආ. ආචාරය 4:18

(සටහන : පොතෙහි දළ සටහන සෑදීමට අමතරව, ඔබට පරිච්ඡේද, ඡේද, වාක්‍ය හා වචන අධ්‍යයනය තුළින් එම පොතෙහි සඳහන් ධර්මනියාම පිළිබඳ අධ්‍යයනය කළ හැකිය. ඔබ කුමන ආකාරයේ අධ්‍යයන කරනවාද යන්න රැඳී පවතිනුයේ ඔබ කෙතරම් ගැඹුරු ලෙසට එම අධ්‍යයනයෙහි යෙදීමට තීරණය කරනවාද යන්න මතය. මෙම අරමුණ සඳහා අපි කොලොස්සි පොතෙහි දළ සටහන් පමණක් සැදුවෙමු.)

ඉන්පසු අපි මුළු පොතෙහිම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ සඳහන් සෑම පදයක්ම සටහන් කරගෙන, එම පදයෙන් ඉගැන්වූ කරුණු සාරාංශගත කළෙමු.

**පළමු පරිච්ඡේදය**

1:1 එතුමාගේ නම : යේසුස් ක්‍රිස්තුස්

1:2 සමාදානය පැමිණෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළිනි.
1:3 දෙවියන්වහන්සේ, ස්වාමිවූ යේසුස්වහන්සේගේ පියාණෝය.
1:4 යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල තිබේ.
1:13 එතුමාගේ රාජ්‍යය
1:14 යේසුස්වහන්සේ තුළ අපට මිදීම හා පව් සමාව තිබේ.
1:15 යේසුස්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපය වේ: සියලු මැවීමේ කුළුඳුලාණෝය.
1:16 සියල්ල මවනු ලැබුවේ යේසුස්වහන්සේ තුළිනි.
1:17 යේසුස්වහන්සේ සියලු දේවලට ප්‍රථමව සිටිසේක: සියල්ල උන්වහන්සේ තුළ ඇතුලත්ය.
1:18 යේසුස්වහන්සේ තම ආත්මික ශරීරය වන සභාවෙහි හිසය.
1:18 යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි අය අතර කුළුඳුලාණෝය.
1:19 සියලු සම්පූර්ණත්වය එතුමා තුළ වේ.
1:20 යේසුස්වහන්සේ කුරුසියෙහි තම රුධිරය තුළින් සමාදානය ඇතිකළ සේක.
1:20 යේසුස්වහන්සේ සමගි කරනු ලැබීම ඉටු කළසේක.
1:22 යේසුස්වහන්සේ තුළින් ශුද්ධකම ඇත.
1:24 සභාව එතුමාගේ ආත්මික ශරීරය වේ.
1:27 යේසුස්වහන්සේ අප තුළ සිටින කල අපහට මහිමාන්විත බලාපොරොත්තුවක් තිබේ.
1:28 යේසුස්වහන්සේ අපගේ සර්ව සම්පූර්ණත්වය වේ.
1:29 උන්වහන්සේ අප තුළ බලවත් සේ ක්‍රියා කරන සේක.

**දෙවන පරිච්ඡේදය**

2:3 සියලු දැන ගැන්මේ හා ප්‍රඥාවේ වස්තු එතුමා තුළ නිධාන කොට තිබේ.
2:5 අපගේ ඇදහිල්ලේ බලාපොරොත්තුව යේසුස්වහන්සේය.
2:6 අපි උන්වහන්සේ තුළ හැසිරිය යුතුය.
2:7 අපි උන්වහන්සේ තුළ වර්ධනය විය යුතුය.
2:9 යේසුස්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශාරීරිකව වැඩවසයි.
2:10 යේසුස්වහන්සේ සියලු අධිපතිකම් වල සහ බලයන්හි හිස බැවින් අපි එතුමා තුළ සම්පූර්ණ වී සිටිමු .
2:13 යේසුස්වහන්සේ අපහට පව් සමාකොට ඇත. (හදවත චර්මඡේදනය මගින්)
2:14 යේසුස්වහන්සේ පැරණි ගිවිසුම් නියෝග සියල්ල සම්පූර්ණ කළ සේක.
2:15 යේසුස්වහන්සේ අධිපතිකම් හා බලධාරීන් විනිශ්චය කළ සේක.
2:17 ශරීරය ක්‍රිස්තුස්වහන්සේගේය.
2:19 උන්වහන්සේ ශරීරයෙහි හිසය.
2:20 අපි ක්‍රිස්තුස්වහන්සේ තුළ මැරී සිටිමු නම්, අප ලෝකයෙහි ගුරුකම් ශික්ෂා හා ධර්ම වලට යටත් නොවෙමු.

**තුන්වන පරිච්ඡේදය**

3:1 අපි ක්‍රිස්තුස්වහන්සේ සමග නැගිටුවනු ලැබ සිටිමු.
3:1 උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි වාඩිවී සිටින සේක.
3:4 යේසුස්වහන්සේ අපගේ ජීවිතය වේ.
3:4 යේසුස්වහන්සේ ප්‍රකාශ වන කල අපද එතුමා සමග ප්‍රකාශවනු ඇත. (" ප්‍රකාශවීම " - වචන අධ්‍යයනය සඳහා යහපත් වචනයකි. )
3:10 අපි උන්වහන්සේගේ රූපය ලෙස සම්පූර්ණ දැන ගැනීම උදෙසා අලුත් කරනු ලැබ සිටිමු.
3:11 ක්‍රිස්තුස්වහන්සේ සියල්ල වන සේක. සියල්ලන් තුළ සිටින සේක. වෙන් කිරීමේ තාප්ප බිඳ හෙලන සේක.
3:13 ක්‍රිස්තුස්වහන්සේගේ පව් සමාව දීමේ පදනම මත සහෝදරයන් අතර සමාවීම කළ හැකිය.
3:15 යේසුස්වහන්සේ තුළින් සමාදානය පැමිණේ.
3:16 උන්වහන්සේගේ වචනය අප තුළ සමෘද්ධිමත්ව වාසය කළ යුතුය.
3:17 අපි සියල්ල එතුමාගේ නාමයෙන් කළ යුතුවේ.
3:17 අපි එතුමාගේ නාමයෙන් යාච්ඤා කළ යුතුවේ.
3:24 අපි ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සේවය කළ යුතුවේ.

හතරවන පරිච්ජේදය

4:3 ක්‍රිස්තුස්වහන්සේගේ අබිරහස (ශුභාරංචිය)

## පස්වන පියවර : ඔබ රැස්කර ගත් තොරතුරු සාරාංශගත කරන්න.

පහත සඳහන් දළ සටහන කොලොස්සි පොතින් අප ක්‍රිස්තු ධර්මය පිළිබඳ රැස්කළ තොරතුරු සාරාංශ කොට දක්වා ඇත. මෙම පොතෙහි යේසුස් වහන්සේ පිළිබඳ උගන්වා ඇති දේවධර්ම එහි කැටි කොට දක්වයි.

### කොලොස්සි පොතට අනුව ක්‍රිස්තු ධර්මය පිළිබඳ අධ්‍යයනය

I. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නම් :
- අ. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ 1:1
- ආ. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ 1:3
- ඇ. ශරීරයෙහි හිස 1:18, 24
- ඈ. ප්‍රේමයෙහි පුත්‍රයා 1:13
- ඉ. ස්වාමි වූ ක්‍රිස්තුස්වහන්සේ 3:24

II. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගුණාංග :
- අ. සර්වඥාන : සියල්ල දන්නාවූ (උන්වහන්සේ තුළ සියලු ප්‍රඥාව හා දැනගැන්ම තිබේ) 2:3
- ආ. ප්‍රේමය : උන්වහන්සේ පාපිෂ්ඨ මිනිසා කෙරෙහි දැක්වූ ප්‍රේමය හේතුවෙන් කුරුසියෙහි තම රුධිරය හෙලා සමාදානය ඇති කළ සේක. 1:20
- ඇ. ශුද්ධකම : උන්වහන්සේගේ සම්පූර්ණත්වය 1:29
- ඈ. සර්වවාසි : සැමතැනම වැඩ සිටින්නා වූ: ක්‍රිස්තුස්වහන්සේ සියල්ලන් තුළය. 3:11
- ඉ. අනන්තය : සියල්ලට පළමුවෙන් 1:17, ක්‍රිස්තුස්වහන්සේ සියල්ල වේ. 3:11
- ඊ. සර්වබලධාරී : උන්වහන්සේ සියලු බලයෙන් යුක්තය.
  1. සියලු දේ එතුමා කරණකොටගෙන මවන ලද්දේය. 1:16
  2. සියලු දේ එතුමා විසින් එකමුතුව බැඳ තබයි. 1:17
  3. බලවතුන්ද බලපරාක්‍රමයන්ද එතුමාට යටත්වේ. 2:10
- උ. මැවුම්කරු 1:16
- ඌ. සමාව දෙන තැනැත්තා 2:13
- එ. සාමය 1:2
- ඒ. ඇදහිල්ල 1:4
- ඔ. ප්‍රඥාව හා දැනගැන්ම 2:2-3

III. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය : උන්වහන්සේ මාංශවත් වූ දෙවියන් වහන්සේය.
- අ. උන්වහන්සේ දෙවියන්වහන්සේ සමග දැරූ සම්බන්ධතාවය :
  1. දෙවියන් වහන්සේගේ පුත්‍රයා 1:3,13
  2. උන්වහන්සේගේ අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් සාදන ලද්දේය. 1: 15
  3. උන්වහන්සේ තුළ සම්පූර්ණ දේවත්වය වාසය කළ සේක. 1:19 ; 2:9
- ආ. උන්වහන්සේගේ ක්‍රියා
  1. මැවුම්කරු: 1:16
  2. ජීවිතය පවත්වාගෙන යන තැනැන්වහන්සේ: 1:17
  3. මිනිස් සංහතියේ ගැළවුම්කරු : 1:14, 20, 22 ; 2:13, 14
  4. බලධාරීන් හා අධිපතීන්ගේ විනිශ්චයකරුවා : 2:15
- ඇ. උන්වහන්සේගේ ස්ථානය :
  1. බලධාරීන් හා අධිපතීන්ගේ මූලිකයා 2:10
  2. ඇදහිලිවන්තයාගේ ඇදහිල්ලෙහි බලාපොරොත්තුව: 1:4 ; 2:5
  3. ඇදහිලිවන්තයාගේ සේවය සඳහා හේතුව හා එය ලබන පුද්ගලයා: 3:17
  4. ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේට ළංව සම්පවීමට ක්‍රියා කරන නියෝජිතයා: 3:17

5. උන්වහන්සේගේ ශරීරය වන සභාවෙහි හිසඃ 1:24, 2:17, 19
6. රාජ්‍යයෙහි හිස 1:13
7. දෙවියන්වහන්සේගේ දකුණු පස වාඩිවී හිඳින සේක. 3:1
8. උන්වහන්සේ සියල්ල වේ: 3:11

IV. යේසුස්වහන්සේගේ මිනිසත් බව : උන්වහන්සේ දෙවියන්වහන්සේව සිටි නමුත් මාංසවත්වී මනුෂ්‍යයන් අතර වාසය කළ සේක. සියලු ආකාරයෙන් මිනිසෙකු ලෙස පරීක්ෂාවට හා සීමා වීම් වලට මුහුණ දුන් නමුත් කිසිවිටක පව් නොකළ සේක.

අ. උන්වහන්සේ තම රුධිරය වැගිරවූ සේක. 1:20
ආ. උන්වහන්සේ මළ සේක. 2:15
ඇ. උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ සේක. 2:15 , 1:18

V. එතුමාගේ මරණය :

අ. ව්‍යවස්ථාව සම්පූර්ණ කළේය. 2:17
ආ. බලධාරීන් හා අධිපතීන් විනිශ්චයට ගෙන ආවේය. 2:15
ඇ. මනුෂ්‍ය සංහතිය උදෙසා සාමය හා සමගි කිරීම ඇති කළ සේක. 1:20 , 22
ඈ. පව් සමාව දීමට හැකියාව ලබා දුනි. 2:13 , 3:13

VI. එතුමාගේ උත්ථානය :

අ. මළවුන්ගෙන් උත්ථාන වුවන්ගේ කුළුදුලාය. එනම් මුලින්ම උත්ථාන වූ තැනැත්තාය. 1:18
ඇ. එතුමා අපගේ උත්ථානය සහතික කරයි. 3:1

VII. එතුමාගේ නැවත පැමිණීම :

උන්වහන්සේ අනාගතයෙහිදී ප්‍රකාශ කරනු ලබන අතර අපද එතුමා සමග ප්‍රකාශ වෙනු ඇත. 3:4

## ස්වයං පරීක්ෂණය

1. මෙම පරිච්ඡේදයෙහිදී අපි දේවධර්මයට අදාළ වචන කිහිපයක් අර්ථ දැක්වුවෙමු. මෙම වචන ඔබට හුරුවීම වැදගත් වේ. එවිට අනෙකුත් පුද්ගලයන් එම වචන භාවිත කරන කල ඔබට අවබෝධවීම සඳහාත් බයිබල් අධ්‍යයන මෙවලම් වලදී එම වචන භාවිත කර ඇතිවිට තේරුම් ගැනීමටත් පහසු වනු ඇත.
පළමු ලැයිස්තුවේ ඇති වචන පෙළ බලන්න. දෙවන ලැයිස්තුවේ ඇති අර්ථකථන සලකා බලන්න. පළමු ලැයිස්තුවේ වචන වලට වඩාත් ගැළපෙන අර්ථකථනයෙහි අංකය එය ඉදිරියෙන් සටහන් කරන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ______දේවදූත ධර්මය | 1. බයිබලය පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______යක්ෂ ධර්මය | 2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______ගැළවීමේ ධර්මය | 3. සභාවෙහි දේවධර්මය පිළිබඳ අධ්‍යයනය. |
| ______සභාවෙහි ධර්මය | 4. අවසාන කාලය පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______යුගාන්තවේදය | 5. ගැළවීම පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______ක්‍රිස්තු ධර්මය | 6. මනුෂ්‍යයා පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______බයිබලීය ධර්මය | 7. යහපත් දේවදූතයන් පිළිබඳ දේවධර්ම අධ්‍යයනය. |
| ______මානව විද්‍යා ධර්මය පිළිබඳ දේවධර්ම | 8. නපුරු දේවදූතයන් එනම් යක්ෂයන් හා සාතන් පිළිබඳ අධ්‍යයනය. |
| ______සාතනික ධර්මය | 9. සාතන් පිළිබඳ දේවධර්මය අධ්‍යයනය. |
| ______ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මය | 10. ශුද්ධාත්මය පිළිබඳ දේවධර්මය අධ්‍යයනය. |

2. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

3. දේවධර්මානුකූල බයිබල් අධ්‍යයන ක්‍රමය යනු කුමක්ද?

4. දේවධර්මානුකූල ක්‍රමයෙහි පියවර පහ නම් කරන්න.

5. “දේවධර්මය” යන වචනය අර්ථ දක්වන්න.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

අවසාන කාලය පිළිබඳ ඉගැන්වීම් අධ්‍යයනය කිරීම අවසාන කාල ධර්මය ලෙස හඳුන්වමු. අවසාන කාලය පිළිබඳ කාරණා කිහිපයක් 1 වෙනි හා 2 වෙනි තෙසලෝනික පොත් වල ඇතුලත් වේ. එහි විශේෂයෙන්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම හෙවත් ඔසවා ගැනීම පිළිබඳ අවධානය යොමු කරයි.

ඔසවා ගැනීම නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමාගේ සියලු සැබෑ ඇදහිලිවතුන් තමා වෙතට පිළිගැනීම පිණිස අනාගතයෙහිදී ස්වර්ගයිය වලාකුළු මධ්‍යයට නැවත පැමිණීමය. එවිට කලින් මියගියාවූ ඇදහිලිවතුන් එතුමා හා සමග එක්වීමට මළවුන්ගෙන් නැගිට එනු ඇත. ඒ වනවිටත් පොළොවෙහි ජීවත්ව සිටින ඇදහිලිවතුන් මළවුන් හා එතුමා සමග එක්වන පිණිස ඔසවා ගනු ලැබේ. එනම් මධ්‍යවකාශයෙහිදී හමුවනු ඇත. ඉන්පසු අප සැම සදාකාලයට දෙවියන්වහන්සේගේ අභිමුවෙහි ජීවත්වනු ඇත.

මෙම පරිච්ඡේදයෙහි ඔබට සපයා දුන් නිදර්ශනය උපයෝගී කරගනිමින් 1 හා 2 තෙසලෝනික පොත් ඇසුරින් දේවධර්මානුකූල අධ්‍යයනයක් සිදුකරන්න. අවසාන කාල සිදුවීම් පිළිබඳ විශේෂයෙන්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත-පැමිණීම පිළිබඳ සොයාගත හැකි සියලු තොරතුරු රැස්කර විශ්ලේෂණය කරන්න.

**පළමු පියවර : මාතෘකාව තෝරා ගන්න.**

**දෙවන පියවර : ධර්මනියාමය අර්ථකථනය කරන්න.**

**තුන්වන පියවර : අධ්‍යයනය කිරීම සඳහා බයිබල් කොටසක් තෝරා ගන්න.**

**හතර වන පියවර : ධර්මනියාමය පිළිබඳ තොරතුරු රැස්කරන්න.**

**පස්වන පියවර : ඔබ රැස්කළ තොරතුරු සාරාංශගත කරන්න.**

# දහනව වන පරිච්ඡේදය

# බයිබලීය කාව්‍ය අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- බයිබලයෙහි ඇතුලත් විවිධ කවි වර්ග හඳුනා ගැනීමට
- බයිබලයෙහි ඇතුලත් විවිධ කවි රටා හඳුනා ගැනීමට
- බයිබලයෙහි ඇතුලත් කවි අධ්‍යයනයට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

**ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් නිසා දවසට සත් වරක් ඔබට ප්‍රශංසා කරමි.**
**(ගීතාවලිය 119:164)**

## හැඳින්වීම

බයිබලීය ඒකීය පොත් 66ක සංයුක්තයකි. එහි ඉතිහාසය, නාට්‍යය, ප්‍රේම වෘත්තාන්ත, ත්‍රාසජනක නැවුම් අත්දැකීම් සහ කාව්‍යය ඇතුලත් වේ. බයිබලය ශ්‍රේෂ්ඨ සාහිත්‍යයට ඔබ්බෙන් යන කෘතියකි. එනමුත් එහි ඇතුලත් සාහිත්‍යය අන්තර්ගතයෙන් හා ශෛලියෙන් ශ්‍රේෂ්ඨය. ඔබ කිසියම් පොතක අන්තර්ගතය අධ්‍යයනය කරන කල ඔබ එහි පණිවුඩය අධ්‍යයනය කරයි. එයින් හෙළි කරන ආත්මික සත්‍යයන් ඔබ ඉගෙන ගනී.

ඔබ පොතක ශෛලිය අධ්‍යයනය කරන කල එහි අන්තර්ගතය ඉදිරිපත් කරන පිණිස පොත සංවිධානය කර ඇති ආකාරය පිළිබඳව විමසා බලයි. බයිබලයෙහි වැඩි කොටසක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කොට ඇත. එනම් දෙවියන්වහන්සේගේ සත්‍යය ඉතා පහසුවෙන් අවබෝධවන ආකාරයේ කතා ඇසුරිණි. එහෙත් බයිබලයෙහි පොත් පහක්, එනම්, යෝබ්, ගීතාවලිය, හිතෝපදේශ, දේශනාකාරයා හා සාලමොන්ගේ ගීතිකා යන පොත් පහ කාව්‍යමය ආකාරයෙන් සංවිධානය වී ඇත. මීට අමතරව කාව්‍ය ගණයට ඇතුලත් කර නොමැති වෙනයම් පොත් වලද කාව්‍යයන් ඇතුලත්ව පවතී. උදාහරණ ලෙස සමහර ව්‍යවස්ථා පොත්වල සහ අනාගතවක්තෘවරුන්ගේ පොත් වල කාව්‍යය කොටස් ඇතුලත් වේ.

දෙවියන්වහන්සේගේ සත්‍යයන් කාව්‍යමය අයුරින් ඉදිරිපත් කිරීම බයිබලයෙහි භාවිත කර ඇති නාට්‍යමය ස්වරූපයට (කතාන්දර) වඩා බෙහෙවින්ම වෙනස්ය. බයිබලීය කාව්‍යය රටාව ඔබ ඇසුරු කර ඇති බොහෝ වෙනත් කාව්‍යය රටාවකටද වෙනස් විය හැකිය. එබැවින් ඔබහට මෙම පොත් අධ්‍යයනය සඳහා උපකාරී වීමට විශේෂ උපදෙස් අවශ්‍ය වේ. මෙම පරිච්ඡේදය බයිබලීය කාව්‍යයන්හි ශෛලිය හා රටාව පැහැදිලි කරයි. එම දැනුම ඔබහට බයිබලයෙහි ඇතුලත් මෙම කාව්‍යමය පොත් වල අන්තර්ගත ශ්‍රේෂ්ඨ ආත්මික සත්‍යයන් අවබෝධ කර ගැනීමටත් අදාළ කරගැනීමටත් උපකාරී වනු ඇත.

## කාව්‍යයමය ශෛලිය

බයිබලීය කාව්‍යය ඔබට හුරු පුරුදු කාව්‍යයනට වඩා බෙහෙවින් වෙනස් වේ. බයිබලයෙහි පැරණි ගිවිසුමෙහි වැඩි ප්‍රමාණයක් පොත් ලියා ඇත්තේ හෙබ්‍රෙව් බසිනි. එබැවින් බයිබලීය කාව්‍යයද ලියැවී ඇත්තේ හෙබ්‍රෙව් කාව්‍යය රටාවට අනුවය. බයිබලීය කාව්‍යයන්හි මූලික ප්‍රතිපත්තිය නම් එහි අදහස්වල පවතින "සමාන්තරබවය". "සමාන්තරබව" යනු "සමාන්තර" යන පදයෙන් ගත්

අර්ථය වේ. එනම් එකිනෙකට යාබදව හෝ එකිනෙකට සමානව පැවතීමය. උදාහරණයක් ලෙසට පහත සඳහන් රේඛා සමාන්තර රේඛාය.

කිසියම් කාරණාවක් ඉහත පෙනෙන රේඛාවන් මෙන් සමාන්තර වූ කල එම කාරණා එක හා සමාන වේ. මෙම රේඛා දෙක පෙනුමින් එක හා සමාන වන්නාක් සේ හෙබ්‍රෙව් කාව්‍යය අදහසින් සමාන්තර වේ. කවියෙහි එක පදයක් ඊළඟ පදය හා එකඟතාවයක් දරයි.

හෙබ්‍රෙව් කාව්‍යයෙහි භාවිත කොට ඇති පොදු සමාන්තර ක්‍රම හතරක් පවතී.

## 1. සමාන පද සමාන්තරය :

"සමාන පද" යනු එකම අර්ථය ඇති පදයන් වේ. සමාන පද සමාන්තර කවි වල දෙවෙනි පදය පළමු පදයෙහි අදහස නැවත උච්චාරණය කරයි. උදාහරණ ලෙසට :

> **ස්වාමිනි, මාගේ එදිරිකාරයෝ කොපමණ වැඩිවූද! මට විරුද්ධව නැගිටින්නෝ බොහෝය. (ගීතාවලිය 3:1)**
>
> **ස්වර්ගයෙහි හිඳින තැනැන්වහන්සේ සිනාසෙන සේක. ස්වාමීන් වහන්සේ ඔවුන්ට පරිහාස කරන සේක. (ගීතාවලිය 2:4)**

මෙම උදාහරණ දෙකෙහිදීම පළමු පේළියෙහි ඇති අදහස දෙවන පේළියෙහිදී වෙනත් වචන යොදා ගනිමින් තහවුරු කරයි. දෙවන පේළියෙහි ප්‍රකාශ කර ඇති අදහස පළමු පේළියෙහි ඇති අදහසට සමාන වෙයි.

## 2. විරුද්ධ පද සමාන්තරය :

"විරුද්ධ පද" යනු එකිනෙකට පරස්පර වූ වෙනස් පදය. එබැවින් විරුද්ධ පද භාවිතයෙන් සමාන්තර වූ කාව්‍යයන්හි දෙවන පදය පළමු පදයට විරුද්ධ වූ අදහසක් ප්‍රකාශ කරයි. නමුත් එය තවමත් සමාන්තරව පවතිනුයේ එහි ඇතුලත් සත්‍යය පළමු පදයෙහි සත්‍යයට සමාන බැවිනි. එහිදී සමාන වූ සත්‍යයන් ප්‍රකාශ කිරීම උදෙසා විරුද්ධ පද භාවිත කරයි. එබැවින් මෙම ශෛලිය විරුද්ධ පද සමාන්තරය නමින් හැඳින්වේ.

> **මක්නිසාද ස්වාමින්වහන්සේ ධර්මිෂ්ඨයන්ගේ මාර්ගය දන්නා සේක. නමුත් දුෂ්ටයන්ගේ මාර්ගය විනාශ වන්නේය. (ගීතාවලිය 1:6)**

මෙම උදාහරණයෙහි දෙවන පේළිය පළමු පේළියට විරුද්ධ වූ අදහසක් ප්‍රකාශ කරයි. පළමු පේළිය ධර්මිෂ්ඨ මිනිසාගේ මාර්ගය පිළිබඳව පවසයි. දෙවන පේළිය අධර්මිෂ්ඨයා පිළිබඳව පවසයි. එසේ වුවද පළමු පේළියෙහි සඳහන් කාරණාව එහි ප්‍රතිවිරුද්ධ අදහස දෙවන පේළියෙන් ප්‍රකාශ කිරීම මගින් තහවුරු වන බැවින් පේළි දෙක සමාන්තර වේ.

## 3. ක්‍රමයෙන් ගොඩනැංවෙන ආකාරයේ සමාන්තර බව. (සංයෝගාත්මක) :

මෙම කාව්‍ය සමාන්තර රටාව ගඩොල් බැඳීමක් වැනිය. මෙහිදී පළමු පේළියෙහි ඇතුලත් අදහස දෙවන පේළියෙන් ඊළඟට ඇති පේළිවලින් ද අදහස තහවුරු කරමින් ඉදිරියට ගලා බසියි. මෙම කවියෙහි එක් එක් පේළියෙහි ඊට පළමු පේළියෙහි අදහස මත ගොඩනැගෙමින් එයට යමක් එකතු කරමින් දියුණු වේ.

> **දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමීන්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල් මෙනෙහි කරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය. (ගීතාවලිය 1:1, 2)**

1 වෙනි පදයෙහි පළමු වන පේළියෙහි දුෂ්ඨයන්ගේ මන්ත්‍රණය අනුව නොයන මිනිසා ආශිර්වාද ලද්දෙක් බවට පවසයි. ඊළඟ පේළිවල එම සත්‍යය තව දුරටත් වර්ධනය කරමින් ඔහු දුෂ්ඨයන් සමග සිට ගැනිම හෝ වාඩි විම නොකළ යුතු බව පවසයි. දෙවන පදයෙහි පළමු වන පේළියෙන් කියන්නේ එම මනුෂ්‍යයා ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ බවය. දෙවන පේළියෙහිදී ඔහු රෑ දවල් ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි මෙනෙහි කරන බව එයට එකතු කරයි.

## 4. සංකේතාත්මක සමාන්තර බව :

සංකේතනයක් යනු යමක් නියෝජනය කිරීමට හෝ ආදර්ශකයක් ලෙස භාවිත කරන ලකුණකි. උදාහරණ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ජාතික කොඩියෙහි ඇති තරු 50 නියෝජනය කරනුයේ එරට සෑදී ඇති ප්‍රාන්ත රාජ්‍යය පනහය. සංකේතාත්මක සමාන්තර බවින් යුතු කාව්‍යයන්හි දෙවන හා ඊළඟ පේළි පළමුවන පේළියෙහි සංකේතයක් හෝ නිදර්ශනයක් ලෙස ක්‍රියා කරයි. උදාහරණ ලෙසට

> **දෙවියන්වහන්ස, මුවා දිය දොළවලට ඉතා ආශා වන්නාක්මෙන් මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා ආශා ඇත්තේය. (ගීතාවලිය 42:1)**

මෙහි දෙවෙනි පේළිය, පළමුවෙන පේළිය උදාහරණයක් ලෙස ගෙන දක්වයි. දාවිත් තම ආත්මය දෙවියන්වහන්සේ කෙරෙහි දක්වන ආශාව මුවෙක් දිය පිපාසයෙන් දිය දොළක් වෙතට යන චිත්‍රයෙන් මූර්තිමත් කරයි. පිපාසිත මුවා දාවිත්ගේ ආත්මික පිපාසයෙහි සංකේතය බවට පත් කරයි. හෙබ්‍රෙව් සමාන්තර කාව්‍ය වර්ග තව පැවතියත් එම රටා බයිබලයෙහි පොදු නොවන බැවින් අපගේ අධ්‍යයනයෙහි ඇතුලත් කිරීමට අවශ්‍ය නොවේ.

## අන්තර්ගතය තේරුම් ගැනිම සඳහා රටාව භාවිත කිරීම

මෙම මූලික කාව්‍යය රටා හඳුනා ගැනිම ඔබහට බයිබලිය කාව්‍යය ඉගෙනීමෙහිදී උපකාරීවනු ඇත. ඔබහට අන්තර්ගතය තේරුම් ගැනීමට කාව්‍යයක ප්‍රකාශනය :

### 1. එක හා සමාන ප්‍රකාශන මගින් සත්‍යයක් පැවසීම. (සමාන සමාන්තරය) :

මෙයින් එකම සත්‍යයක් සමාන පද ඇසුරින් ප්‍රකාශ කිරීමෙන් ඔබට අවබෝධ කරගැනීමට උපකාරිවේ. මෙලෙස ප්‍රකාශිත සත්‍යය නැවත උච්චාරණය මගින් ඔබගේ මනසෙහි සහ හදවතෙහි එය ස්ථිර ලෙස තැන්පත් වනු ඇත. මෙය දේව වචනය මෙනෙහි කිරීමට වැදගත් ක්‍රමයකි. කිසියම් හේතුවක් නිසා කවියක මුල් පේළියෙන් කියැවෙන සත්‍යය ඔබට නොවැටහේ නම්, එවිට ඊළඟ පේළි කියැවීමෙන් එම සත්‍යයම ඉදිරිපත් කර ඇති බැවින් ඔබට වටහා ගැනීමට හැකිවනු ඇත.

### 2. එකම සත්‍යයෙහි ප්‍රතිවිරුද්ධ ප්‍රකාශන (ප්‍රතිවිරුද්ධ සමාන්තරය) :

ඔබ ශ්‍රේෂ්ඨ සත්‍යයන් ඉගෙන ගන්නවා පමණක් නොව එහි ප්‍රතිවිරුද්ධ සමාන්තරයද ඉගෙනීමට හැකියාව ලැබේ. ගීතාවලිය 1:6 ඇසුරින් ඔබ ධර්මිෂ්ඨ මනුෂ්‍යයාගේ මාර්ගය පිළිබඳ යමක් ඉගෙන ගත්තා පමණක් නොව අධර්මිෂ්ඨ මිනිසාගේ ජිවිත ක්‍රමය පිළිබඳවද විරුද්ධව සත්‍යය ඉගෙන ගත්තෙහිය. ප්‍රතිවිරුද්ධ සමාන්තරය හඳුනාගැනීමට ඔබ ඉගෙන ගත් කල ඔබගේ ජීවිතයට සුබවාදී සත්‍යය අදාළ කරගැනීමට පමණක් නොව එහි ප්‍රතිවිරුද්ධතාවයෙහි පවතින භයානකකම පිළිබඳව අනතුරු ඇඟවීම්ද ලබනු ඇත. අප භාවිත කළ උදාහරණය ඇසුරින් ඔබ ධර්මිෂ්ඨ නම් ඔබගේ මාර්ගය දෙවියන් වහන්සේ දන්නා බවද එය සුබවාදී කාරණයක් බවද ඉගෙන ගත්තෙහිය. එලෙසම ඔබ අධර්මිෂ්ඨ නම් විනාශවන බවද ඉගෙන ගත්තෙහිය. මෙම ප්‍රතිවිරුද්ධ සිතුවිල්ල වැදගත් අනතුරු ඇඟවීමක් සපයා දෙයි.

### 3. සත්‍යයෙහි ගඩොල් (සංයුක්ත සමාන්තරය) :

පළමු පේළියෙන් ඉදිරිපත් කළාවූ සත්‍යය මත, ඊළඟ පේළි ගොඩනැංවෙන බැවින් එම සත්‍යය මනසෙහි සම්පූර්ණයෙන් ගොඩ නැගෙනු ඇත.

## 4. දෙවියන් වහන්සේ සත්‍යය විදහාපාන සංකේත (සංකේතාත්මක සමාන්තරය) :

එවැනි උදාහරණ ඔබගේ මනසෙහි දෙවියන්වහන්සේගේ සත්‍යය පිළිබඳ චිත්‍රයක් සාදයි.

## කාව්‍යය වර්ග

හෙබ්‍රෙව් කාව්‍යය වර්ග මූලික වශයෙන් තුනකි. මෙම වර්ගීකරණය පදනම්ව ඇත්තේ එහි අන්තර්ගතය හා කාව්‍යය ඉදිරිපත් කොට ඇති ආකාරය අනුවය. ඔබ බයිබල් කාව්‍ය වර්ග හඳුනා ගැනීමට ඉගෙන ගැනීමෙන් ඔබ කියවන කාරණා අවබෝධ කර ගැනීමට සහාය වනු ඇත. බයිබලීය කාව්‍ය වර්ග තුනට ඇතුලත් වනුයේ :

### 1. වීර කතා කාව්‍යය :

මෙය නාට්‍යානුසාරයෙන් කෙරෙන කවියකි. එමගින් කිසියම් විර ක්‍රියාවක් පිළිබඳ කතාව පැවසෙයි. ඉතිහාස පොත් පුරා විහිදී ඇති නාට්‍යානුසාර කවි කිහිපයක් ඇත. ගණන් කථාව 22 සිට 24 දක්වා බාලාම්ගේ කතාව සඳහන් වේ. එය කියවන්න. එහි වීර කතා කාව්‍යය ඇතුලත් වේ.

### 2. රංගන රඟදක්වන කාව්‍යය :

රංගන කාව්‍යය යනු රඟදැක්වෙන්නාවූ කවි වේ. මේ සඳහා හොඳම උදාහරණය යෝබ් පොත වේ. ආරම්භයේදී අපට වේදිකාව පිටුපසට ගොස් යෝබ්ගේ ගැටලුවට හේතුව සාතනික බව හඳුනා ගැනීමට ඉඩ හැර ඇත. ඉන්පසු ඔහුගේ දරුවෝ සහ වස්තුව විනාශ වූ බවට ආරංචිය රැගෙන එන පණිවුඩකරුවන් හමුවේ. ඉන් පසු යෝබ් තනිවම අළු ගොඩක් අසල සිටියි. ඊළඟ දර්ශන වලදී අපට ඔහුගේ මිතුරන් පැමිණ ඔහුගේ දුක් විඳීමට විවිධ හේතු ඉදිරිපත් කරනු දැකිය හැකිය. මෙහි උසස් වූ උච්චස්ථානය වනුයේ යෝබ් හට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමය. ඉන් පසු ඔහුගේ සියලු ලෞකික වස්තු නැවත ඔහුට ලබා දෙනු ඇත. යෝබ් පොත කාව්‍යයමය ආකාරයෙන් නාට්‍යයක් රඟ දක්වන රටාවේ පොතකි.

### 3. ගැයුම් කාව්‍යය :

ගැයුම් කාව්‍යය නම් ගායනා කළ හැකි කාව්‍යය. මේ සඳහා හොඳම නිදර්ශන දෙකක් නම් විනිශ්චයකාරයා 5 හි සඳහන් දෙබෝරාගේ කවිය හා නික්මයාම 15 හි සඳහන් මිරියම්ගේ කවිය වේ. ගැයුම් වල ශෝකය ප්‍රකාශ කිරීමට හෝ දුක ප්‍රකාශ කිරීමට භාවිත කළ කොටස්ද ඇතුලත් වේ. මේ සඳහා උදාහරණ ගීතාවලිය 137, 74, 80 සහ 2 සාමුවෙල් 1:19-27 හි තිබේ. විලාප ගී පොත ද මෙයාකාර දුක ප්‍රකාශ කිරීමේ ගායනා කවියකි. එම පොත නාට්‍යානුසාරයෙන් ලියැවී ඇතත්, දෙවියන්වහන්සේගේ ජනතාවගේ ඉතිහාසයෙහි කිසියම් වකවානුවක සිදු වූ ශෝකජනක සිදුවීමක් විස්තර කරන බැවින් එය ඓතිහාසික පොත් ගොනුවට එක් කොට තිබේ.

## කාව්‍යමය පොත් : ප්‍රගතිය

කාව්‍යමය පොත් පහ ආත්මික ජීවිතයෙහි ප්‍රගතිය පෙන්නුම් කර දෙයි. යෝබ් පොතෙන් මමත්වයට එනම් පැරණි ජීවිතයට මිය යාම පෙන්වාදෙයි. ගීතාවලියෙන් දෙවියන්වහන්සේ තුළ ඇති නව ජීවනය ප්‍රශංසාවෙන්, යාච්ඤාවෙන්, වර්ණනාවෙන්, කන්නලව්වෙන්, පාපොච්චාරණයෙන් හා මැදිහත්කාර කමින් ප්‍රකාශනය කරයි. හිතෝපදේශ පොතෙහිදී අපි දෙවියන්වහන්සේගේ පාසැලෙහි සිට ස්වර්ගයීය වුත් මිහිපිට දී ජීවිතයට භාවිත කළ හැකිවුත් ප්‍රායෝගික පුහුණුව ඉගෙන ගනිමු. දේශනාකාරයාගේ පොතෙන් දෙවියන්වහන්සේගෙන් තොරවූ සියල්ල හිම්කර ගැනීමට දැරූ ප්‍රයත්නය "අහස යට ඇති සියල්ල" නිෂ්ඵලකම බව පෙන්වා දෙයි. සාලමොන්ගේ ගීතයෙන් යේසුස්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවයකින් හිම්කර ගත හැකි අර්ථවත් ජීවිතය පිළිබඳ කතා කරයි.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කට පාඩමින් ලියන්න.

________________________________________

________________________________________

2. බයිබල් කාව්‍යය ශෛලියන් වල ලැයිස්තුවක් අංක 1 යටතේ ඇත. අංක 2 යටතෙහි අර්ථ දැක්වීම් දී ඇත. පළමු ලැයිස්තුවේ ශෛලියට සුදුසු අර්ථ දැක්වීමේ අංකය එය ඉදිරියෙන් ලියන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ______ රංගන කාව්‍යය | අ. මෙම කාව්‍යය ගායනා කළ හැකිය. |
| ______ වීරකතා කාව්‍යය | ආ. මෙම කාව්‍යය රඟ දැක්විය හැකිය. |
| ______ගැයුම් කාව්‍යය | ඇ. මෙම කාව්‍ය නාට්‍යානුසාරයෙන් හෝ කතාවක් ලෙස, විශේෂයෙන්ම විර ක්‍රියා පිළිබඳ පවසයි. |

3. බයිබලිය කාව්‍යයන් හි විවිධ රටා පළමු ලැයිස්තුවේ දී ඇත. දෙවන ලැයිස්තුවේ එහි අර්ථකථන දී ඇත. ගැළපෙන අර්ථකථනයෙහි අංකය පළමු ලැයිස්තුවේ නිවැරදිව සටහන් කරන්න.

| පළමු ලැයිස්තුව | දෙවන ලැයිස්තුව |
|---|---|
| ______ සමාන සමාන්තරය | අ. පළමු පේළියෙහි ඇති සත්‍යය විදහා දැක්වීමට දෙවන පේළියෙහි හා පසු පේළි වලින් සංකේතයක් ඉදිරිපත් කරයි. |
| ______ සංකේතාත්මක සමාන්තරය | ආ. පළමු පේළියෙහි සඳහන් සත්‍යයට ප්‍රතිවිරුද්ධ පද ඊළඟ පේළිවල යොදා ගනී. |
| ______ ප්‍රතිවිරුද්ධ සමාන්තරය | ඇ. දෙවන හා ඊළඟ පේළිවලින් පළමු පේළියෙහි සඳහන් සත්‍යයට සමාන කාරණය පැවසේ. |
| ______ සංයුක්ත සමාන්තරය | ඈ. දෙවන හා ඊළඟ පේළිවලින් පළමු පේළියෙහි සඳහන් සත්‍යය මත ක්‍රමයෙන් ගොඩ නැගෙයි. |

4. ඔබගේ බයිබලයෙන් ගීතාවලිය 3:1 බලන්න. මෙම පදය ලියැවී ඇත්තේ ______________ සමාන්තරයෙනි.

5. ඔබගේ බයිබලයෙන් ගීතාවලිය 1:6 බලන්න. මෙම පදය ලියැවී ඇත්තේ ______________ සමාන්තරයෙනි.

6. ඔබගේ බයිබලයෙන් ගීතාවලිය 1:1-2 බලන්න. මෙම පදය ලියැවී ඇත්තේ ______________ සමාන්තරයෙනි.

7. ඔබගේ බයිබලයෙන් ගීතාවලිය 42:1 බලන්න. මෙම පදය ලියැවී ඇත්තේ ______________ සමාන්තරයෙනි.

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

කාව්‍යයමය පොත් වලට අමතරව, බයිබලයෙහි පැරණි ගිවිසුමෙහි මෙන්ම අලුත් ගිවිසුමෙහිද විවිධ ස්ථාන වල විසිරී පවතින කාව්‍යයමය කොටස් ඇත. පහත සඳහන් වනුයේ ඉන් කිහිපයකි. බයිබලීය කාව්‍යය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා මෙම පද විමසා බලන්න.

| | |
|---|---|
| උත්පත්ති 4:23-24 | ලාමෙක් තම භාර්යාවනට |
| නික්මයාම 15:1-21 | මිරියම් / මෝසෙස්ගේ ගීතය. |
| ගණන් කථාව 21:27-30 | බලාඩි ගායකයන්ගේ ගීතය. |
| ගණන් කථාව 23:7-10 | බාලාම්ගේ ගීතය. |
| ද්විතිය කථාව 33:1-47 | මෝසෙස්ගේ ගීතය. |
| යොෂුවා 10:12-14 | යොෂුවාගේ ගීතය. |
| විනිශ්චයකාරයා 5:1-31 | දෙබෝරාගේ හා බාරාක්ගේ ගීතය. |
| රූත් 1:16-17 | රූත්ගේ ගීතය. |
| 1 සාමුවෙල් 2:1-10 | හන්නාගේ ගීතය. |
| 2 සාමුවෙල් 3:33-34 | දාවිත් අබ්නේර් වෙනුවෙන් ගැයූ ශෝක ගීතය. |
| 2 සාමුවෙල් 1:17-27 | සාවුල් හා යොනාතන් උදෙසා ගීතය. |
| 2 සාමුවෙල් 22:2-51 | දාවිත්ගේ ජයග්‍රහණයේ ගීතය. |
| 2 සාමුවෙල් 23:1-7 | දාවිත්ගේ අවසාන වචන. |
| 1 ලේකම් 16:8-36 | දාවිත්ගේ ස්තුති දීම. |
| යෙරමියා 9:17-22 | පරාජිත ජාතිය පිළිබඳ ලතැවීම. |
| විලාප ගී 1,2,3,4,5 | පරාජිත ජාතිය පිළිබඳ ලතැවීම. |
| එසකියෙල් 27:25 - 28:23 | තිර්ට එරෙහිව අනාගතකීම් කාව්‍යමය. |
| එසකියෙල් 19:1-14 | ඉශ්‍රායෙල්හි කුමාරවරු උදෙසා විලාපය. |
| හොෂෙයා 2:1-15 | ඉශ්‍රායෙල් කෙරෙහි දඬුවම පිළිබද ගීතය. |
| හබක්කුක් 3:1-19 | හබක්කුක්ගේ යාච්ඤාව. |
| ලූක් 1:46-55 | මරියාගේ ගීතය. |
| ලූක් 1:68-79 | සෙකරියස්ගේ ගීතය. |
| ලූක් 2:29-32 | සිමොන්ගේ ආශිර්වාදය. |

# විසි වන පරිච්ඡේදය

# බයිබලීය අනාගතවාක්‍ය අධ්‍යයනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් ඔබට :

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කළ යුතු වැදගත් හේතු තුනක් නම් කිරීමට
- බයිබලීය අනාගතවාක්‍යය වල සැපයුම් මාධ්‍යය හඳුනා ගැනීමට
- බයිබලීය අනාගතවාක්‍යය අර්ථ දැක්වීමට
- දෙවියන්වහන්සේ අනාගතකිම් සැපයූ ක්‍රම දෙකක් නම් කිරීමට
- සත්‍ය හා අසත්‍ය අනාගතවාක්‍ය අතර වෙනස හඳුනා ගැනීමට
- අනාගතවාක්‍යයන්හි පරමාර්ථ තුනක් නම් කිරීමට
- බයිබලීය අනාගතවාක්‍යය තේරුම් ගැනීම සඳහා ප්‍රධාන යතුරු පහක් නම් කිරීමට

හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක් : මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ විය යුතුයයි මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේයයි කීසේක. (ලූක් 24 : 44)**

## හැඳින්වීම

මෙම පාඩමාලාවෙහි මීට පෙර ඔබ ඉගෙන ගත් පරිදි දේව වචනයෙහි අනාගතවක්තෘවරුන්ගේ පොත් ලෙසට නම් කරන ලද පොත් කිහිපයක් ඇත. මෙම පරිච්ඡේදයෙන් බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කිරීමට හා වටහා ගැනීමට අවශ්‍ය මූලික උපදෙස් ඔබහට සපයනු ඇත.

## අනාගතවාක්‍යය සහිත පොතක්

ලිඛිත දේව වචනය වන ශුද්ධ වූ බයිබලය, අන් සියලු ආගමික ශුද්ධ ලියවිලි වලින් බොහෝ සේ වෙනස් වෙයි. ඒ අතුරින්ද එක් වැදගත් කාරණාවක් හේතුවෙන් එය අන් සියල්ලෙන් වෙනස් වෙයි. එනම් සියලුම ශුද්ධ ග්‍රන්ථ අතුරින් නිවැරදි අයුරින් සම්පූර්ණ වූ අනාගතකිම්, එම එක ග්‍රන්ථයකවත් ඇතුලත් නොවීමය. බයිබලයෙහි ඇතුලත් අනාගතවාක්‍යයන්ගෙන්, දැනටමත් ඉන් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ වී ඇත. ශුද්ධ ලියවිල්ලෙහි දිව්‍යමය ආනුභාවය තහවුරු කරන එක් වැදගත් ප්‍රබල සාක්ෂියක් මෙය වේ.

## අනාගතවාක්‍යයෙහි අර්ථකථනය

“අනාගතවාක්‍යය” යන වචනයෙහි අර්ථය නම් “ප්‍රකාශ කිරීමය”. මෙලෙස ප්‍රකාශ කිරීමේ මූලික ක්‍රම තුනක් බයිබලීය අනාගතකීම් අතර පවතී. ඒවා නම් :

1. දේවානුභාවයෙන් යුක්ත වූ දෙවියන්වහන්සේගෙන් ලද පණිවුඩයක්.
2. දෙවියන්වහන්සේගේ සදාකාලික සැලැස්මෙහි ඇතුලත් අනාගත සිද්ධියක් පිළිබඳව කලින් පැවසීමක්.
3. දෙවියන්වහන්සේගේ ක්‍රියා පිළිබඳව මිනිසා හට පරිවර්තනය කරන ලද අදහසක්.

## අනාගතවක්තෘවරු

දෙවියන්වහන්සේ බයිබලයෙහි සඳහන් එක් එක් අනාගතවක්තෘවරයා හට එතුමාගේ සැලැස්මෙහි විශේෂිත වූ එක් කාර්යභාරයක් සම්පූර්ණ කිරීමට පැවරූ සේක.

- පරිවර්තනයක් විලසින් ඔවිහු දෙවියන්වහන්සේගේ ක්‍රියා මිනිසාට පැහැදිලි කර දුන්හ.

- ප්‍රකාශකයින් විලසින් ඔවිහු දෙවියන්වහන්සේගේ සත්‍යය ප්‍රකාශ කළෝය. ඔවිහු දිරිගැන්විමේ හා බලාපොරොත්තුවේ පණිවුඩ ප්‍රකාශ කළෝය.

- අනාගතවක්තෘවරු විලසින්, දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි අනාගතය උදෙසා ඇති සමහර සිදුවීම් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුනට එළිදරව් කර දීම හේතුවෙන් ප්‍රකාශයට පත් කළහ.

බයිබලීය අනාගතවාක්‍යයන් කලින් ප්‍රකාශ කිරීම් මිනිසාගේ හැකියාවෙන් කළ නොහැක්කකි. ඒවායෙහි සැකය දුරු කරන හා මනඃකල්පනය කළ යුතුවීමට ඉඩ නාරින සෑහෙන ප්‍රමාණයක් විස්තර ඇතුලත් කර තිබේ.

## අනාගතවාක්‍යයෙහි ක්‍රමය

දෙවියන් වහන්සේ අනාගතවක්තෘවරුන් තුළින් කතා කිරීමට භාවිත කළ මූලික ක්‍රම දෙකක් ඇත.

### පැවසූ වචනය :

බොහෝ අවස්ථා වලදී භාවිත කළ ක්‍රමය නම් දෙවියන්වහන්සේ විසින් පැවසූ වචනයයි. දෙවියන්වහන්සේ අනාගතවක්තෘවරයාට කතා කළ යුතු වචන පවසයි. උදාහරණ ලෙස, දෙවියන්වහන්සේ යෙරෙමියා අනාගතවක්තෘට කතාකොට,

> “ . . .**මා විසින් නුඹ යවන සියල්ලන් ළඟට ගොස්, මා නුඹට අණකරන සියල්ල කියාපන්න**” **(යෙරෙමියා 1:7)**

යෙරෙමියා පොත පුරා දෙවියන්වහන්සේ ඔහුට උපදෙස් දුන්නේ . . . .

> **නුඹ ගොස්, ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේකැයි යෙරුසලම් වැසියන්ට ඇසෙන ලෙස ප්‍රකාශකර කියාපන්නැයි කිය. (යෙරෙමියා 2:2)**

යෙරෙමියා ගොස් දෙවියන්වහන්සේ ඔහුට පැවසූ වචන ප්‍රකාශ කළේය.

## රඟදක්වන ලද අනාගතවාක්‍යය :

ප්‍රකාශිත අනාගතවාක්‍යය වලට අමතරව, දෙවියන්වහන්සේ අනාගතවක්තෘවරුන් මගින් පණිවුඩය රඟ දක්වා ප්‍රකාශ කරන ලදි. උදාහරණ ලෙසට දෙවියන්වහන්සේ යෙරෙමියා අමතා, මෙසේ කරන ලෙස පැවසූ සේක.

> **. . . නුඹ වියබාන් සහ වියගස් සාදාගෙන නුඹේ බෙල්ලේ තබා ගනින්න . . . (යෙරෙමියා 27:2)**

මෙම වියගස් දෙවියන්වහන්සේගේ ජනතාව තමුන්ගේ පාපය හේතුවෙන් වහල්කමට ගොස් ලබන බැදුම්වල වියගස් ලෙස යෙරෙමියා දෙවියන්වහන්සේගේ අනාගතමය දර්ශනයක් රඟදක්වා පෙන්වීමක් විය.

## අනාගතවාක්‍යය වල සැපයුම් මාධ්‍යය

බයිබලීය අනාගතවාක්‍යයන්හි සැපයුම් මාධ්‍යය නම් දෙවියන්වහන්සේය. එතුමා ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් මිනිසාට තම පණිවුඩය හෙළි කරන සේක.

> **මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොලඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථාකළෝය. (2 පේතෘස් 1:21)**

> **නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළ සේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසන සේක. (1 කොරින්ති 2:10)**

දෙවියන්වහන්සේට නිවැරදිව අනාගතය පිළිබඳ ප්‍රකාශ කළ හැකි වනුයේ :

> **ලෝකයේ පටන් ගැන්මේ සිට මේ සියල්ල දන්වන්නාවූ ස්වාමීන්වහන්සේ කියනසේකැයි ලියන ලද්දේය. (ක්‍රියා 15:18)**

> **පුරාණයේ පළමු කාරණා සිහිකරපල්ලා. මක්නිසාද මමම දෙවියන් වහන්සේය, වෙන කෙනෙක් නැතඃ මම දෙවියන් වහන්සේය, මා සමාන කෙනෙක් නැත. මම වනාහි අන්තිමය මුල පටන්ද තවම සිද්ධනුණ දේ පුරාණයේ පටන්ද දන්වන්නාවූ: මාගේ මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ට කරන්නෙමියි කියාත් කියන්නාවූ තැනැන්වහන්සේය. (යෙසායා 46:9-10)**

දෙවියන්වහන්සේ සැබෑ අනාගතවක්තෘවරු නැගිටුවනු ඇත.

> **මා සමාන අනාගතවක්තෘ කෙනෙකු නුඹලා අතරෙන් නුඹේ සහෝදරයන්ගෙන් නුඹේ දෙවිවූ ස්වාමීන් වහන්සේ නුඹට නැගිටුවා දෙනවා ඇත. (ද්විතීය කථාව 18:15)**

දෙවියන්වහන්සේ මෙම අනාගතවක්තෘවරුනට එතුමාගේ අනාගත සැලසුම් හෙළි කරන සේක.

> **සැබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන්වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරන සේක. (ආමොස් 3:7)**

## බොරු අනාගතවක්තෘවරු

සාතන් සැබෑ අනාගතකීම් අනුකරණය කරමින් බොරු අනාගත ප්‍රකාශන, සාත්තර කියන අය තුළින්, යන්ත්‍ර මන්ත්‍ර කරන අය තුළින් හා ජොතිෂ්‍යවේදීන් තුළින් ප්‍රකාශ කරයි. මෙම ක්‍රම දෙවියන්වහන්සේගෙන් නොවේ. දානියෙල් පැවසුයේ:

**දානියෙල් රජු ඉදිරියේ උත්තර දෙමින් : රජු විචාළ රහස රජුට පෙන්වන්ට ශාස්ත්‍රවන්තයන්ටවත් අනවිනකාරයන්ටවත් මන්ත්‍රකාරයන්ටවත් ජෙනකියන්නන්ටවත් නුපුළුවන; නමුත් රහස් එළිදරව් කරන දෙවිකෙනෙක් ස්වර්ගයෙහි සිටිනසේක, උන්වහන්සේ මතු දවස්වල සිද්ධවෙන්ට තිබෙන කාරණා නෙබුකද්නෙසර් රජුට දන්වා තිබේ. ඔබගේ ස්වප්නයද ඔබගේ යහනේදී පැමුණුණ ඔබගේ හිසේ දර්ශනයද මෙසේය:**
**(දානියෙල් 2:27-28)**

සත්‍ය අනාගතකීම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අවධානය යොමු කරවයි.

**එබැවින් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන කථාකරන්නාවූ කිසිවෙක්: යේසුස්වහන්සේ ශාපලත් කෙනෙකැයි නොකියන බවත්, ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන මිස: යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේයයි කියන්ට කිසිවෙකුට නුපුළුවන් බවත් නුඹලාට දන්වමි. (1 කොරින්ති 12:3)**

බයිබලය බොරු අනාගතවක්තෘවරුනට එරෙහිව අනතුරු අගවයි. (මතෙව් 24:11, 24; මාර්ක් 13: 22)

"බොරු අනාගතවක්තෘවරු" නමින් හැඳින්වෙන පුද්ගලයෙක් ලෝකාන්තිමයෙහි සිදුවන සිදුවීම් වලදී දකින්නට ලැබෙනු ඇත (එළිදරව් 13:11-17; 16:13; 19:20; 20:10). බොරු අනාගතවක්තෘවරු හඳුනා ගැනීමට ක්‍රම කිහිපයක් බයිබලය එළිදරව් කර දෙයි.

- ඔව්හු ලිංගික අශීලාචාරකම සහ කාමමිථ්‍යාචාරය උගන්වති. 2 පේතෘස් 2:14
- ඔව්හු මනුෂ්‍යයන්ව දේව වචනයට කීකරු වීමෙන් ඉවතට හැරවීමට උත්සාහ දරති : ද්විතිය කථාව 13:1-5
- ඔව්හු බොරු ප්‍රකාශන කරති : මතෙව් 24:23-24
- ඔව්හු මහත් ලකුණු මගින් ජනතාව මුළා කරති : මතෙව් 24:11 , 24
- ඔව්හු ඇදහිල්ලේ ප්‍රමාණයට අනුකූලව (දේව වචනයට අනුකූලව සම්බන්ධතාවයෙන් යුතුව) අනාගතවාක්‍ය ප්‍රකාශ නොකරති : රෝම 12:6
- බොරු අනාගතවක්තෘවරුන්ගේ ජීවිතවල ශුද්ධාත්මයාණන්ගේ ඵල නොමැත : මතෙව් 7:15-16; ගලාති 5:22-23
- ඔවුන්ගේ අනාගතකීම් සැබෑ නොවේ : ද්විතිය කථාව 18:20-22

## අනාගතවාක්‍ය වල පරමාර්ථය

දෙවියන්වහන්සේ අනාගතවාක්‍ය මගින් මිනිසාට කතා කිරීමේ විශේෂ පරමාර්ථ කුමක්දැයි බයිබලය එළිදරව් කරදෙයි.

### දෙවියන්වහන්සේගේ පණිවුඩයෙහි සත්‍යභාවය තහවුරු කිරීම සඳහා :

සම්පූර්ණ වූ අනාගතවාක්‍යය, දෙවියන්වහන්සේගේ පණිවුඩය සත්‍ය බව (නිවැරදි බව) තහවුරු කරයි. යෙසායා 41:21-23 දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ගේ දෙවිවරුනට අභියෝග කරමින් අනාගතයෙහි සිදුවීමට ඇති සිදුවීම් පවසා ඔවුන්ගේ බලය ඔප්පු කරන ලෙස ප්‍රකාශ කරයි. ඔව්හු බොරු දෙවිවරු බැවින් ඔවුනට එය කළ නොහැකි විය.

**නුඹලාගේ පැමිණිල්ල ඉදිරියට ගෙනෙල්ලායයි ස්වාමින්වහන්සේ කියන සේක: නුඹලාගේ බලවත් කාරණා පෙන්වාපල්ලායයි යාකොබ්ගේ රජ්ජුරුවෝ කියනසේක. ඔව්හු ඒවා ඉදිරිපත් කොට, සිද්ධවෙන්ට තිබෙන දේවල් අපට දන්වත්වා. ඉස්සර දේවල් මොනවාදැයි අප විසින් කල්පනා කොට ඒවායේ කෙළවර දැනගන්නා පිණිස ඒවා අපට දන්වාපල්ලා; නොහොත් මතු පැමිණෙන්ට තිබෙන දේවල් අපට ප්‍රකාශ කරපල්ලා. මතු සිද්ධවෙන්ට තිබෙන දේවල් දන්වාපල්ලා, එවිට නුඹලා දෙවිවරුන් බව අපට දැනගන්ට ලැබෙනවා ඇත. එසේය, අප එක්ව තැතිගෙන බලන පිණිස හොඳක් හෝ නරකක් කරපල්ලා. (යෙසායා 41:21-23)**

## දෙවියන්වහන්සේගේ පණිවුඩකරු තහවුරු කරන පිණිස:

අනාගතවාක්‍යය දෙවියන්වහන්සේගේ සැබෑ පණිවුඩකරුව තහවුරු කරයි.

**සමාදානය ගැන අනාගතවාක්‍යය කියන අනාගතවක්තෘ කෙනෙක් ඇද්ද, ඒ අනාගතවක්තෘගේ වචනය ඉෂ්ටවුණාම ඔහු සැබැවින් ස්වාමින්වහන්සේ විසින් එවූ අනාගතවක්තෘ කෙනෙකු බව පෙනී යන්නේයයි අනාගතවක්තෘවූ යෙරමියා කීවේය. (යෙරමියා 28:9)**

## ඇදහිලිවතුනට උපදෙස් දෙන පිණිස:

ඇදහිලිවතුන් අනාගතවාක්‍යය තුළින් උපදෙස් ලබා එයට අවධානය යොමු කළ යුතුවේ.

**. . . ඊට වඩා ස්ථිරකරන ලද්දාවූ අනාගතවාක්‍යය අපට තිබේ. . . . . අලුයම පැමිණ පහන් තාරකාව නුඹලාගේ සිත් තුළෙහි පායනතුරු අඳුරු තැනක බබලන පහනක් මෙන් එය සලකන්නහු නම් යහපත්ය. (2 පේතෘස් 1:18,20)**

## අනාගතවාක්‍යය අධ්‍යාපනයෙහි වැදගත්කම

බයිබලිය අනාගතවාක්‍යය අධ්‍යායනය කිරිම සඳහා වැදගත් හේතු තුනක් ප්‍රධාන වේ.

1. සියලු ශුද්ධ ලියවිලි දේවානුභාවයෙන් ලද බැවින් අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත්ය.

   **දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16-17)**

2. අනාගතවාක්‍යය මගින් දෙවියන්වහන්සේගේ සැලසුමෙහි අතිත, වර්තමාන හා අනාගත සිදුවීම් පිළිබඳද අවබෝධය සපයා දෙයි.

   **එබැවින් නුඹ දුටු දේද දැන් තිබෙන දේද මින්පසු සිදුවන්නට තිබෙන දේද වන, (එළිදරව් 1:19)**

3. දෙවියන්වහන්සේගේ අනාගත සැලසුම අවබෝධ කරගැනිම සාතන්ගේ රැවටීමෙන් වළකාලයි.

   **එකල යමෙක් කථාකොට: බලව, ක්‍රිස්තුස්වහන්සේ මෙතනය නොහොත් එතනයයි නුඹලාට කියන්නේ නම් විශ්වාස නොකරල්ලා. මක්නිසාද බොරු ක්‍රිස්තුවරුද බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන්නම් තෝරාගනු ලැබූවන් පවා මුළාකරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය. බලව, මම නුඹලාට කලින් කීවෙමි. එබැවින් ඔව්හු නුඹලාට කථාකොට: අන්න, උන්වහන්සේ වනාන්තරයෙහි සිටිනසේකැයි කියත් නම්, පිටත්ව නොයන්න, උන්වහන්සේ ඇතුල් ගෙවල සිටිනසේකැයි කියත්නම්, විශ්වාස නොකරල්ලා. (මතෙව් 24:23-26)**

යමක් සිදුවීමට පෙර දෙවියන්වහන්සේ තම අනාගත සැලසුම අප සමග බෙදාගෙන තිබෙන බැවින් අප සාතන්ගේ රැවටීමට හසු නොවනු ඇත.

4. බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කරන පුද්ගලයන් උදෙසා ප්‍රකාශිත විශේෂ ආශිර්වාදයක් පවතී.

> **මේ අනාගතවාක්‍යයේ වචන කියන්නාද ඒවා අසන්නෝද එහි ලියන ලද කාරණා පවත්වන්නෝද ආශිර්වාද ලද්දෝය. මක්නිසාද කාලය ළගය. (එළිදරව් 1:3)**

## අනාගතවාක්‍යය අධ්‍යයනය

බයිබලීය අනාගතවාක්‍යය, දේවවචනයෙහි ඇතුලත් "මස්" වලින් කොටසකි. මීට පෙර පරිච්ඡේදයක අපි දේව වචනයෙහි ඇති මස් සහ "කිරි" පිළිබඳ සඳහන් කළෙමු. ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි මූලික සංකල්ප ඇතුලත් "කිරි" ආහාර අවබෝධ කර ගැනිමට වඩා අනාගතවාක්‍යය නම් "මස්" අවබෝධ කර ගැනිම අපහසුය.

ඔබ නවක කිතුනුවෙකු නම්, බයිබලීය පසුබිම පිළිබඳ එතරම් අවබෝධයක් නොමැති නම්, දේව වචනයෙහි අනාගතවාක්‍යය පොත් ඉගෙනිමට උත්සාහ දැරීමට පෙර, අනෙකුත් අංශ ඉගෙන ගත යුතුය. ඒ සඳහා ශුභාරංචි පොත්, ක්‍රියා පොත, අලුත් ගිවිසුම් ලිපි, ආදිය පළමුව අධ්‍යයනය කරන්න.

පැරණි ගිවිසුමෙහි කාව්‍යය, ව්‍යවස්ථාව සහ ඉතිහාසය කොටස් අධ්‍යයනය කරන්න. ඔබ අධ්‍යයනය කරන අතර මෙම පාඨමාලාවෙහි පොත්, පරිච්ඡේද, ජේද, පද හා වචන අධ්‍යයනය පිළිබඳ ඔබ ඉගෙන ගත් කරුණු භාවිත කරන්න.

මෙලෙස ඔබ බයිබලයෙහි එම අංග පිළිබඳ මූලික දැනුමක් ලබාගත් පසුව, අනාගතවාක්‍යය පොත් ඉගෙන ගන්න. බයිබලයෙහි සඳහන් සියලු අනාගතවාක්‍යය ඔබට නොතේරෙයි නම් ඒ පිළිබඳව කරදර නොවන්න. බොහෝ ශ්‍රේෂ්ඨ බයිබල් විශාරදයින් පවා වසර ගණනක් පුරා සමහර අනාගතවාක්‍යය වල කොටස්හි අර්ථය පිළිබඳ තවමත් වාද කරමින් සිටිති.

## අනාගතවාක්‍යයමය පොත්

අනාගතවාක්‍යයමය පොත් වලට අමතරව බයිබලය පුරා විහිදී ඇති අනාගතවාක්‍යයමය පරිච්ඡේද හා පද පවතී.

බයිබලයෙහි මුල්ම වාර්තාගත අනාගතවාක්‍යය ඇත්තේ උත්පත්ති පොතෙහිය.

> **මම තා සහ ස්ත්‍රිය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි; ඒ වංශය තාගේ හිස පොඩිකරන්නේය, තෝ ඔහුගේ විලුඹ පොඩිකරන්නෙහියයි කීසේක. (උත්පත්ති 3:15)**

මෙම පදයෙන් මතු පැමිණීමට සිටින යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිනිසාගේ පාපය උදෙසා තම දිවි පුද කිරීම තුළින් සතුරා වන සාතන් පොඩි කර දැමීම පිළිබඳව අනාගතවාක්‍යය පවසයි.

දේව වචනයෙහි සඳහන් සියලුම අනාගතවාක්‍යය මෙම අධ්‍යයන පොතට ඇතුලත් කළ නොහැකිය. මුළු බයිබලය පුරාවට අනාගතවාක්‍යය ඇති බව ඔබ දැන සිටීම අවශ්‍යයයි. අනාගතවාක්‍යය, අනාගතවාක්‍යයමය පොත්වලට පමණක් සීමා වී නොමැත. වැඩියෙන් අධ්‍යයන කිරීමෙන් හා අත්දැකීම් ඇසුරින් මුළු බයිබලය පුරා දිවෙන අනාගතවාක්‍යයමය තේමාව හඳුනා ගැනීමට ඔබට හැකිවනු ඇත.

## අනාගතවාක්‍යය තේරුම්ගැනීම

සමහර මනුෂ්‍යයෝ බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කිරීමට උත්සාහ කිරීමෙන් අසහනයට පත්වෙති. අනාගතවාක්‍යය බයිබලයෙහි අනෙකුත් කොටස් වලට වඩා අපහසු බැවින්, සැබැවින්ම දෙවියන්වහන්සේ අප එය වටහාගනීවි යැයි විශ්වාස කළාද කියා පවා සැක සිතති. සැබැවින් අනාගතවාක්‍යයන් තේරුම්ගත හැකිය. දෙවියන්වහන්සේට දානියෙල් විසින් අනාගතවාක්‍යය තේරුම් ගනු ලැබීම කෙතරම් අවශ්‍යවීද යත් ඒවා පැහැදිලි කරදීම උදෙසා උන්වහන්සේ දානියෙල් වෙත දේව දූතයෙකු එවූ සේක. දේව දූතයා දානියෙල් අමතා :

> **එම්බා දානියෙල්, තේරුම්ගැනීමේ දක්ෂකම නුඹට දෙන්ට දැන් පිටත්ව ආවෙමි. (දානියෙල් 9:22)**

යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැරණි ගිවිසුමෙහි අනාගතවාක්‍යය තේරුම් කර දීමට කාලය වැය කළ සේක.

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: මා ගැන මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියනලද සියල්ල සම්පූර්ණ විය යුතුයයි මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේයයි කීසේක. (ලූක් 24:44)**

ගෝලයෝ යේසුස්වහන්සේගෙන් ලෝකාන්තිමය පිළිබඳ විමසූ විට ඒ සඳහා බලා සිටිය යුතු අනාගත කාරණා පිළිබඳ ලැයිස්තුවක් යේසුස්වහන්සේ ඉදිරිපත් කළ සේක. ඔව්හු අනාගත සිදුවීම් තේරුම් ගැනීම උන්වහන්සේ අපේක්ෂා කළ සේක. යේසුස්වහන්සේ පැවසුවේ :

> **එසේම නුඹලා මේ සියල්ල දකින කල, උන්වහන්සේ දොරටු සමීපයෙහිම බවත් දැනගනිල්ලා. (මතෙව් 24:33)**

සමහරු තේරුම් ගැනීමට අපහසු බවට සලකන, එළිදරව් පොතෙහි ආරම්භයේදී දෙවියන්වහන්සේ තම ජනතාව අනාගතවාක්‍යය වටහා ගනීවි යැයි බලාපොරොත්තු වන බවට පෙන්වා දී තිබේ.

> **ඉක්මනින් වෙන්ට ඕනෑ දේවල්, එනම් දෙවියන්වහන්සේ තමන්ගේ දාසයන්ට දක්වන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේට දුන්නාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් කිරීමය. උන්වහන්සේ තමන් දූතයා කරණකොටගෙන තමන් මෙහෙකරුවූ යොහන්ට එය දන්වා එවූසේක. (එළිදරව් 1:1)**

## තේරුම් ගැනීමට යතුරු (උපකාරක)

බයිබලීය අනාගතකීම් නියමාකාරයෙන් වටහාගැනීමෙන් පරිවර්තනය කිරීමෙන් ඔබට සහය වන මූලික යතුරු (උපකාරක) කිහිපයක් තිබේ.

### පළමුවැන්න : අනාගතවාක්‍යයෙහි මූලික තේමාව

බයිබලීය අනාගතවාක්‍යයන්හි මූලික තේමාව ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. මීට අමතරව තව නොයෙකුත් විෂයයන් සම්බන්ධයෙන් බයිබලීය අනාගතවාක්‍යය පවතී. උදාහරණ ලෙසට දුෂ්ඨ ජාතීන් දෙවියන්වහන්සේ විනිශ්වය කිරීම පිළිබඳ අනාගතවාක්‍යය ඇත. එනමුත් මුළු බයිබලීය අනාගතවාක්‍යයන්හි ගැබ්වී ඇති මූලික තේමාව නම් යේසුස්වහන්සේගේ සහ එතුමා උදෙසා දෙවියන්වහන්සේගේ පරමාර්ථය යන්න එකට සම්බන්ධ වී ඇති ආකාරය වේ.

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

සියලු බයිබලීය අනාගතකිම්, සමහරවිට ඒවා ජාතීන් පිට ඇති විනිශ්චය කිරීම් වුවද, දෙවියන්වහන්සේගේ සම්පූර්ණ සැලැස්මට සම්බන්ධව පවතී. එම සැලැස්ම නම්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් සියලු මිනිස් සංහතියට දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවයකට රැගෙන ඒමය. පරමාර්ථය නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ල එකට රැස් කිරීමය.

බයිබලීය අනාගතවාක්‍යයන්හි තේමාව හෝ “ආත්මය”, යේසුස්වහන්සේ බව බයිබලය ප්‍රකාශ කරයි.

> **“. . . මක්නිසාද යේසුස්වහන්සේගේ සාක්ෂිය අනාගතවාක්‍යයේ ආත්ම යයි මට කීසේක” (එළිදරව් 19:10)**

ඔබ බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කරන කල, එය මෙම ප්‍රශ්නයට අදාළව සලකා බලන්න: මෙම අනාගතවාක්‍යය යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වන්නේ කෙසේද (අනාගතවාක්‍යයෙහි ආත්මය) එතුමා සම්බන්ධව දෙවියන්වහන්සේගේ සම්පූර්ණ සැලැස්මට එය දක්වන සම්බන්ධතාවය කුමක්ද?

## දෙවැන්න : බයිබලය මගින්ම බයිබලය පරිවර්තනය කර දෙයි

තේරුම් ගැනීමට දෙවන යතුර (උපකාරය) නම්, බයිබලය එහි ඇති අනාගතවාක්‍යය පැහැදිලි කර දෙන බව අවබෝධ කර ගැනීමය. මේ සඳහා උදාහරණයක් දානියෙල් 2 පරිච්ජේදයෙන් දැකිය හැකිය. නෙබුකද්නෙශර් නම් රජෙක් විය. දෙවියන්වහන්සේ ඔහුට සිහිනයක් දුන් සේක. නින්දෙන් අවදිවූ රජහට සිහිනය අමතකය. එබැවින් රජ සියලු මන්ත්‍රකාරයින් හා ජ්‍යෙතිෂවේදීන් අමතා සිහිනය සහ එහි අර්ථය පවසන ලෙස අණ කරයි. ඔවුනට එය කළ නොහැකි වේ. එවිට දෙවියන්වහන්සේ දානියෙල් අනාගතවක්තෘ යොදාගෙන රජුට ඔහු දුටු සිහිනය සහ එහි අර්ථය පැවසීමට සලස්වයි. දානියෙල් විසින් 31-35 පදය දක්වා සිහිනය විස්තර කරයි. එහි අර්ථය 36-45 පදවල ප්‍රකාශ වේ. බයිබලය එහි ඇති බොහෝ අනාගතවාක්‍ය එම කොටසෙහිම පරිවර්තනය කොට ඇති ආකාරය පෙන්වීමට මෙය එක් නිදසුනකි.

පැරණි ගිවිසුමෙහි සඳහන් බොහෝ අනාගතවාක්‍යය අලුත් ගිවිසුමෙහි සම්පූර්ණ වී ඇති බැවින් අලුත් ගිවිසුම අනාගතවාක්‍යයන් බොහෝ ගණනාවක් පරිවර්තනය කොට දෙයි. උදාහරණයක් ලෙසට මෙම පැරණි ගිවිසුම් අනාගතවාක්‍යය සහ අලුත් ගිවිසුම් සම්පූර්ණ වීම සංසන්දනය කොට සලකා බලන්න.

> **මාගේ සෙනඟ නොවූවන්ට : නුඹ මාගේ සෙනඟයයි කියන්නෙමි; ඒ අයද : ඔබ මාගේ දෙවියන් වහන්සේයයි කියනවා ඇත. (හොෂෙයා 2:23)**
>
> **යුදෙව්වරුන්ගෙන් පමණක් නොව අන්‍යජාතීන්ගෙන්ද කැඳවන ලද අප කෙරෙහි, තමන් වහන්සේගේ මහිමයේ සම්පත ප්‍රකාශ කරන්ට කැමතිවූ සේක් නම් කිමෙක්ද? එසේම උන්වහන්සේ හොෂෙයාගේ පොතෙහි ; මාගේ සෙනඟව නොසිටියවුන්ට මාගේ සෙනඟය කියාත් ප්‍රිය නොවූ තැනැත්තියට ප්‍රිය තැනැත්තිය කියාත් කියන්නෙමියි කියාද නුඹලා මාගේ සෙනඟ නොවන්නහුයයි ඔවුන්ට කියා තිබෙන තැන නුඹලා ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය කියනු ලබන්නහුයයි කියාද කීසේක. (රෝම 9:24-26)**

අලුත් ගිවිසුමෙහි සම්පූර්ණ වූ අනාගතකිම් අතර, පැමිණීමට නියමිත මෙසියස්වහන්සේ, එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අනාවැකි බොහෝ විය.

## තුන්වැන්න : දෙවරක් යොමුවීමේ නීතිය

බයිබලීය අනාගතවාක්‍යය තේරුම් ගැනීම සඳහා තවත් යතුරක් නම් “දෙවරක් යොමුවීමේ නීතිය” වේ. මෙම නීතියෙන් කියැවෙන්නේ බයිබලීය අනාගතවාක්‍යයක් අර්ථකතනය කිරීමෙහිදී එම අනාගතවාක්‍යය (එම මොහොතෙහිම) ක්ෂණිකව ඉටුවීම, ඉදිරියෙහිදී සිදුවීමට යන සිද්ධියක පෙර පැවසීමක් හෝ ගැඹුරු සත්‍යයක් ඉගැන්වීමේ මාධ්‍යයක් ලෙස භාවිත කිරීමක් බවය.

බයිබලයෙහි බොහෝ අනාගතවාක්‍යයන් දුන් සැණින් ඉටුවී තිබේ. එනමුත් එම අනාගතවාක්‍යයම එම මොහොතෙහිම ක්ෂණිකව ඉටුවීම පමණක් නොව ඉදිරි අනාගතයෙහිදී ඉටු වීමට ගන්නාවූ සිදුවීමක් සම්බන්ධවද අදාළ වෙයි.

උදාහරණයක් ලෙස, එසකියෙල් 28:1-9 දක්වා එවකට තීර්හි රජ වූ එත්බාල් අමතා දුන් අනාගතවාක්‍යයක් ඇත. ඔහු දුෂ්ඨ රජෙකි. ලෝකාන්තිමයෙහි පැමිණීමට සිටින අන්ත ක්‍රිස්තුස්ගේ "සංකේතයකි". එත්බාල්, අන්ත ක්‍රිස්තුස්ගේ "සංකේතයක්" යනුවෙන් අප පවසන විට එයින් තේරුම් යන්නේ ඔහු ස්වභාවයෙන් හා ක්‍රියාවෙන් අනාගතයේ පැමිණීමට සිටින අන්ත ක්‍රිස්තුස්ට සමාන බවය. (මීළඟ පරිච්ඡේදයේදී "සංකේත" පිළිබඳ වැඩිදුර ඉගෙන ගනු ඇත) දෙවියන්වහන්සේ එසකියෙල් තුළින් අනාගතවාක්‍යය පැවසූ කල එත්බාල්ගේ ජීවිත කාලයෙහි, එනම් එම වකවානුවෙහිම අනාගතවාක්‍යය සැබෑ විය. එහෙත් එම අනාගතවාක්‍යයම අදාළ වන අනාගත සිදුවීමක් තවත් පවතී. එනම් දුෂ්ඨ වූ අන්ත ක්‍රිස්තුස් නම් පාලකයා විසින් පාලනය කරන්නාවූ කාලය වේ.

ඔබ බයිබලීය අනාගතවාක්‍යය අධ්‍යයනය කරන විට මෙම දෙවරක් යොමුවීමේ නීතිය මතක තබා ගන්න. ඔබගෙන් ප්‍රශ්න දෙකක් අසන්න.

1. මම අනාගතවාක්‍යය දෙන කාලයේ මෙය දෙනු ලැබූ එම ජනතාවට මෙහි අර්ථය කුමක්වීද?
2. මම අනාගතවාක්‍යයෙහි අනාගතමය වූ දෙවෙනි කරුණක් ඇතුලත් වේද?

මෙම ප්‍රශ්න ඇසීම මගින් ඔබහට එම අනාගතවාක්‍යය එහි සම්පූර්ණ ප්‍රමාණයටම අර්ථකතනය කිරීමට උපකාරී වනු ඇත.

## හතරවැන්න : අනාගතමය නියමිත අනුපිළිවෙළ

අනාගතවක්තෘවරු අනාගත සිදුවීම් අඛණ්ඩවත්, ක්ෂණිකවත් සිදුවන විලසින් විස්තර කරති. උදාහරණ ලෙස යෙසායා අනාගතවක්තෘ අනාගතය පවසමින් මෙසේ පවසයි.

> **ස්වාමි වූ දෙවියන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට ස්වාමින්වහන්සේ මා ආලේප කළසේක: බිඳුණු සිත් ඇත්තන් සුවකරන්ටද, වහලුන්ට නිදහසත් හිරකාරයන්ට හිරගෙයින් මිදීමත් ප්‍රකාශකරන්ටද, ස්වාමින්වහන්සේගේ කරුණාවේ අවුරුද්ද සහ අපේ දෙවියන්වහන්සේගේ පළිගැනීමේ දවසත් ප්‍රකාශකරන්ටද, වැලපෙන සියල්ලන් සනසන්ටද, සියොන්හි වැලපෙන්නන් පළඳවමින්, අළු වෙනුවට මාලාවකුත් වැලපීම වෙනුවට ප්‍රීතිය නැමති තෙලයත් ක්ලාන්ත සිතක් වෙනුවට ප්‍රශංසාව නමැති වස්ත්‍රයක් ඔවුන්ට දෙන්ටද උන්වහන්සේ මා එවූ සේක. මෙසේ කළේ ස්වාමින්වහන්සේට ගෞරව ලැබීමට උන්වහන්සේ විසින් හිටෙවුවාවූ ධර්මිෂ්ඨකමේ අලෝන ගස්ය කියා ඔවුන් ගැන කියනු ලබන පිණිසය. (යෙසායා 61:1-3)**

යේසුස්වහන්සේ ලූක් 4:17-20 සඳහන් පරිදි එම කොටස කියවූ කල " 'වාමින්වහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශ කරන්ටද උන්වහන්සේ මා එවූ සේක" යන කොටස කියවා නතර කළ සේක. ඉන්පසු පොත අකුලා දමා තමා තුළ එදින එම අනාගතකීම සම්පූර්ණ වූ බව පැවසූ සේක. එයින් එතුමා අර්ථවත් කළේ එතුමා එදින එම අනාගතවාක්‍යය සම්පූර්ණ කළ බවය. ශුභාරංචිය ප්‍රකාශ කරන පිණිස, කැඩුණාවූ බිඳුණාවූ සිත් ඇත්තන් සුවකිරීමට, නිදහස ප්‍රකාශ කිරීමට සිරගෙවල් විවෘත කිරීමට, දෙවියන්වහන්සේගේ ආත්මය තිබුණේ උන්වහන්සේ පිටය.

යේසුස්වහන්සේ එම ජේදය කියවීමෙහිදී "පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශ කරන්ට" යන කොටසින් නතර කිරීම ඉතා සුවිශේෂිය. උන්වහන්සේ "දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි දිනය" පිළිබඳ පදය කියවූයේ නැත. එයට හේතුව විනිශ්චයෙහි දිනය තවම පැමිණ නැති බැවිනි. යේසුස්වහන්සේ මෙම ජේදය කියවා දැනට වසර 2000කට වඩා ගෙවී ගොස් ඇත. දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි දිනය තවම පැමිණ නැත.

අනාගතවාක්‍යමය දෘෂ්ටි කෝණය අනුව සිදුවීම් එකෙණෙහිම සිදුවන්නාක් මෙන් වාර්තා කරයි. ශුද්ධාත්මයාණන් විසින් හෙළිදරව් කරදීමෙන් යෙසායා දෙවියන්වහන්සේගේ සම්පූර්ණ සැලැස්ම දුටුවේය. ඔහු යේසුස්වහන්සේ දේශනා කිරීමට පැමිණෙනු දුටුවේය: බැඳීමට, නිදහස ප්‍රකාශ

කිරීමට, සිරගෙවල් විවර කිරීමට, දෙවියන්වහන්සේගේ පිළිගත යුතු වූ වසර ප්‍රකාශ කිරීමට, දෙවියන්වහන්සේගේ විනිශ්චය දවස ඇතිකිරීමට යේසුස්වහන්සේ පැමිණෙනු යෙසායා දුටුවේය.

ඔබ ඈත පිහිටි කඳු පෙළක් දකින්නාක් මෙන් යෙසායා මෙම සිදුවීම් දුටුවේය. කඳු අතර පිහිටි මිටියාවත්, ඔබ ළඟම ඇති කඳු පෙළෙහි මුදුනට නගින තුරු ඔබට නොපෙනෙයි. අනාගතවාක්‍යමය දෘෂ්ටි කෝණය දෙවියන්වහන්සේගේ මුළු සැලසුම දුරින් සිට එළිදරව් කරයි. සමහර සිදුවීම් පෙනෙන්නේ ක්ෂණයකින් එකකට පසුව එකක් සිදුවන්නාක් මෙන්ය. එහෙත් සැබැවින්ම එම එක් එක් අනාගතවාක්‍යමය සිදුවීම් සම්පූර්ණ වනවිට සමහර විට නොපෙනෙන මිටියාවත් වැනි කාල පරිච්ඡේදවලින් වෙන්වී තිබිය හැකිය. යෙසායා පොතේ මේ කොටසින් මේ සඳහා නිදර්ශනයක් ඉදිරිපත් කර ඇත. යේසුස්වහන්සේ තවමත් පළිගැනීමේ දිනය පිළිබඳ අනාගතවාක්‍යය සම්පූර්ණ කොට නොමැත.

## පස්වැන්න : අනාගතවාක්‍යයෙහි කොන්දේසි සහිත ස්වභාවය

බොහෝ බයිබලීය අනාගතවාක්‍යය ස්වභාවයෙන් කොන්දේසි සහිතය. එහි අර්ථය නම්, දෙවියන්වහන්සේ කිසියම් කාරණා සිදුකරන්නේ මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය මත බවය. මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ පණිවුඩයකට ඇහුම්කන් <u>නොදෙයි</u> නම් සමහර කාරණා සිදුවනු ඇත. මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ පණිවුඩයකට <u>ඇහුම්කන් දී</u> එයට නියමාකාරයෙන් <u>ප්‍රතිචාර</u> දක්වයි නම්, එවිට වෙන කිසියම් කරුණක් සිදුවේවි.

දෙවියන් වහන්සේ පවසනුයේ :

> **උදුරා කඩාදමා නැතිකරන්නෙමියි මම කිසියම් ජාතියක් හෝ රාජ්‍යයක් ගැන කී කල, මා විසින් එසේ කථාකල ඒ ජාතිය තමුන්ගේ නපුරුකමෙන් අහක්වුණොත්, මම ඔවුන්ට පමුණුවන්ට සිතූ විපත්තිය ගැන පසුතැවිලි වන්නෙමි. ගොඩනගා හිටවන්නෙමියි මා විසින් යම් ජාතියක් ගැනවත් රාජ්‍යයක් ගැනවත් කී කල්හි, ඔවුන් මාගේ හඬට කීකරු නොවී, මාගේ ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ කළොත්, ඔවුන්ට කරන්නෙමියි මා කී යහපත ගැන පසුතැවිලි වන්නෙමි.** (යෙරෙමියා 18:7-10)

බොහෝ බයිබලීය අනාගතවාක්‍යය වලදී, ඒ සඳහා මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය කුමක්දැයි අධ්‍යයනය කළ යුතු වන්නේ බොහෝ අවස්ථා වලදී අනාගතවාක්‍යයෙහි සම්පූර්ණවීම මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය මත සීමා වී පවතින බැවිනි. මෙම මූල ධර්මය සඳහා හොඳ උදාහරණයක් ලෙස යෝනා පොත කියවා බලන්න.

නිනිවයේ වැසියන් පසුතැවිලි <u>නොවුවහොත්</u> දෙවියන්වහන්සේ එම නගරය දින තුනකින් විනාශ කරන බව යෝනා අනාගතවක්තෘ එළිදරව් කළේය. එනමුත් විනාශය නොපැමිණියේය. එයට හේතුව වුයේ නිනිවයේ වැසියන් දෙවියන්වහන්සේගේ පණිවුඩය අසා එයට සුදුසු ප්‍රතිචාර ලෙස තම පාපය පිළිබඳ පසුතැවිලි වීමය.

## පැරණි ගිවිසුම් අනාගතවාක්‍යය

පැරණි ගිවිසුමේ අනාගතවාක්‍යය කේන්ද්‍රිය වී ඇත්තේ :

1. ඉශ්‍රායෙල් ජනතාවට වටා - ලෝකයට දෙවියන්වහන්සේ එළිදරව් කිරීම පිණිස දෙවියන්වහන්සේ විසින් එසවූ ජාතිය ඉශ්‍රායෙල් විය. ඉශ්‍රායෙල් ජාතිය ඉශ්‍රායෙල් සහ යුදා ලෙස වෙන්වී සිටි වකවානුවෙහි මෙම අනාගතවාක්‍යය එම රාජ්‍යයන් දෙක වෙතම යොමු විය. ඉශ්‍රායෙල් උදෙසා වූ අනාගතවාක්‍යය සඳහා උදාහරණයක් නම් හොෂෙයා පොත වේ. යුදා උදෙසා අනාගතවාක්‍යය සඳහා උදාහරණය යෝවෙල් පොතය.

2. ඉශ්‍රායෙල් අවට සිටි අනෙකුත් ජාතීන් උදෙසා දුන් අනාගතවාක්‍යයන් වලට නිදසුන් ලෙස බබිලෝනිය, මිසරය, තීර්, ඒදොම් යනාදී රටවලට දෙනු ලැබූ අනාගතවාක්‍ය, එදොම්ය ජාතිය උදෙසා ඔබදියා විසින් යොමු කළාවූ අනාගතවාක්‍යය දැක්විය හැකිය.

3. පැමිණීමට නියමිත, මෙසියස්වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධ අනාගතවාක්‍යය. මෙම අනාගතවාක්‍යය එසේ පොතකට ගොනුවී නැත. ඒවා මුළු පැරණි ගිවිසුම පුරා විහිදී පවති. හොඳ උදාහරණයක් නම්, යෙසායා 7:14 ය.

4. මුළු ලෝකය පිළිබඳ අනාගතවාක්‍යයන් එනම් එහි ඉරණම, අනාගත සිදුවීම්, ලෝකාන්තිමය, අප දන්නා පරිදි අවසාන කාලය පිළිබඳ දානියෙල් පොත මේ සඳහා අගනා නිදසුනකි. පහත සඳහන් වගුව පැරණි ගිවිසුමෙහි අනාගතවාක්‍යය පොත්වල අන්තර්ගතය කැටිකොට දක්වයි. ඔබ මෙය භාවිත කිරීමේදී දෙවෙනි වර යොමුව නම් නීතිය පිළිබඳව මතක තබා ගන්න. බොහෝ අවස්ථා වලදී අනාගතවාක්‍යය කිසියම් ජාතියක් වෙත යොමු වූවද, එය එකෙණෙහිම ඉටු වූවද, බොහෝ අනාගතවාක්‍යය ඊටත් වඩා අනාගතයෙහිදී සිදුවන මහත් සිදුවීම් පිළිබඳ පවසයි.

| පැරණි ගිවිසුමෙහි අනාගතවක්තෘවරුන් | | |
|---|---|---|
| අනාගතවක්තෘ | පණිවුඩය | කාල වකවානුව |
| යෝනා<br><br>නාහුම් | දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ට ප්‍රේම කරන සේක.<br>නිනිවයෙහි දුෂ්ඨකම නිසා විනාශය. | අසරියා වහල්බවට හසුවීමට පෙර<br>(ක්‍රි. පූ. 800-650) |
| ඔබදියා | ඒදොම්හි විනාශය, එහි දූෂ්‍ය බව | ඒදොම් වහල්බවට හසුවීමට පෙර<br>(ක්‍රි. පූ. 750) |
| හොෂෙයා<br>ආමොස් | කාමමිථ්‍යාචාරී ඉශ්‍රායෙල් සඳහා දේව ප්‍රේමය<br>දෙවියන්වහන්සේගේ ජනතාව දඬුවම සඳහා පරිණත වීම | ඉශ්‍රායෙල් වහල්බවට හසුවීමට පෙර<br>(ක්‍රි. පූ. 750) |
| යෙසායා<br>යෙරෙමියා<br>විලාප ගී<br>යෝවෙල්<br>මීකා<br>හබක්කුක්<br>ශෙපනියා | මෙසියස්වහන්සේ පැමිණෙන සේක.<br>විනිශ්චය දැන්, මහිමය පසුව<br><br>විනිශ්චය පිඩාවක් මෙන් පැමිණේවි.<br>දෙවියන්වහන්සේගේ ජනතාව නඩු ඇසීම.<br>ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ.<br>දෙවියන්වහන්සේගේ දිනය පැමිණෙනු ඇත. | යුදා වහල්බවට හසුවීමට පෙර<br>(ක්‍රි. පූ. 800 - 606) |
| එසකියෙල්<br>දානියෙල් | දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සමග ගනුදෙනු කර ඉවර නැත.<br>ලෝක සිදුවීම් කෙරෙහි දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් | වහල්කම තුළ යුදාහට<br>(ක්‍රි. පූ. 606 - 536) |
| හග්ගයි<br>සෙකරියා<br>මලාකි | උදාසීනව සිටීමේ භයානකකම<br>මෙසියස්වහන්සේගේ මහිමය<br>හදවත දැඩිකර ගැනීමේ භයානකකම | වහල්කමෙන් පසුව යුදා වෙත<br>(ක්‍රි. පූ. 536 - 400) |

## නව ගිවිසුම් අනාගතවාක්‍යය

නව ගිවිසුම පුරා විහිදී පවතින බොහෝ අනාගතවාක්‍ය ඇත. මින් බොහෝමයක් අනාගතයෙහිදී, විශේෂයෙන්ම ලෝකාන්තිමයට පෙර සිදුවීමට නියමිත සිද්ධීන් වේ. උදාහරණ ලෙසට මතෙව් 24 පරිච්ඡේදයේ සඳහන් අනාගතවාක්‍යය කියවා බලන්න.
නව ගිවිසුමෙහි අනාගතවාක්‍යයම පොත් කාණ්ඩයට අයත් වන්නේ එක පොතකි: එනම් එළිදරව් පොතය. යේසුස්වහන්සේගේ ගෝලයෙකු වෙත, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ මෙම එළිදරව් වීම සපයා දෙන ලදි. එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ එළිදරව්වකි.

> **ඉක්මනින් වෙන්ට ඕනෑ දේවල්, එනම් දෙවියන්වහන්සේ තමන්ගේ දාසයන්ට දක්වන පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේට දුන්නාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් කිරීමය.**

**උන්වහන්සේ තමන් දූතයා කරණකොටගෙන තමන් මෙහෙකරුවූ යොහාන්ට එය දන්වා එවූසේක. (එළිදරව් 1:1)**

යොහන් හට මෙසේ කිරීමට පවසන ලදි . . .

**එබැවින් නුඹ දුටු දේද දැන් තිබෙන දේද මින් පසු සිදුවන්නට තිබෙන දේද වන, (එළිදරව් 1:19)**

දානියෙල් පොත සහ එළිදරව් පොත එකිනෙකට සම්බන්ධ බැවින් එම පොත් එකට අධ්‍යයනය කළ යුතුවේ.

එළිදරව් පොතෙහි ඇතුලත් අනාගතවාක්‍යය සඳහා විවිධාකාර වූ අර්ථකථනයන් සපයා දී ඇත. මෙයින් වැඩි ප්‍රමාණයක් කේන්ද්‍රගතව ඇත්තේ සමහර සිදුවීම් සම්පූර්ණ වන කාලය හෝ සිදුවීමෙහි විශේෂ විස්තර වටාය. කෙසේවෙතත් අනාගතයේදී සිදුවේයැයි බයිබලය පවසන කාරණා පිළිබඳ පොදු සාමාන්‍ය දැනුමක් ඇතිව සිටීම වැදගත්ය. ප්‍රධාන සිදුවීම් තේරුම් ගැනීමට උපකාරී වන කටු සටහනක් පහතින් දී ඇත.

## අනාගතයේදී සිදුවන ප්‍රධාන සිදුවීම්

1. යේසුස්වහන්සේ තම ඇදහිලිවතුන් උදෙසා පොළොවට නැවත-පැමිණෙන බව බයිබලය උගන්වයි : යොහන් 14:2-3

   අ. ඔසවාගැනීම : I තෙසලෝනික 4:13-18 හි ඇදහිලිවතුන් උදෙසා යේසුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි. එම පැමිණීම ඔසවා ගැනීම නම් වේ.
   1. ක්‍රිස්තුස් වහන්සේම නැවත පැමිණෙනු ඇත. 16 පදය
   2. ඇදහිලිවතුන් ලෙස මියගියා වූ අය සොහොනින් නැවත - නැගිටිනු ඇත. 16 පදය
   3. ඉන්පසු ඔසවා ගැනීම සිදුවේ. එනම් “කිසියම් පුද්ගලයෙකු එක ස්ථානයක සිට වෙන ස්ථානයකට ගෙන යාමේ ක්‍රියාවය”. ජීවත්ව සිටින ඇදහිලිවන්තයෙක් මිහිපිට සිට යේසුස්වහන්සේ හමුවීමට රැගෙන යනු ඇත. 17 පදය
   4. මෙහිදී නැවත මුණගැසීමේ සුහද හමුවක් ඇතිවේ. එනම්, ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමට පෙර මිය ගියාවූ ඇදහිලිවන්තයෝ, එවකට ජීවත්ව සිටින්නා වූ ඇදහිලිවන්තයන් හා ක්‍රිස්තුස්වහන්සේ එකට හමුවනු ඇත. 17 පදය

   ආ. පීඩා කාලය : පොළොවෙහි මහත් භයංකර කාලයක් ඇතිවන බව බයිබලය පවසයි. එය පීඩා කාලය ලෙස නම් කෙරේ.

   1. පීඩා කාලය මාස 42ක් හෝ දින 1,260ක් පුරා පවතිනු ඇත. දානියෙල් 9:24-27
   2. එය ඉතා අමාරු කාලයක් වනු ඇත. ලෝකයෙහි නොයෙකුත් අමාරු කාලයන් පැවත තිබේ. නමුත් මෙම පීඩා කාලය අනෙකුත් සියලු අමාරු කාලවලින් වෙන්කොට තබන විශේෂ කාරණා 3ක් ඇත.
      අ. පළමුව, එය මුළු ලොව පුරා පවතී. එක් රටකට හෝ ප්‍රදේශයකට සීමා නොවේ. එළිදරව් 3:10
      ආ. දෙවනුව, ලෝකාන්තිමය ආසන්න බව ජනතාව දැනගනු ඇත. එළිදරව් 6:16
      ඇ. තුන්වෙනුව, කරදර ප්‍රමාණය හා දරුණු බව මින් පෙර අත්දුටු කිසිවකට වඩා වැඩිවනු ඇත. මතෙව් 24:4-14
   3. එහි විස්තරය : පීඩා කාලය තුළ ලෝකයෙහි විනිශ්චය කිරීම් මාලාවක් සිදුවනු ඇත. මෙය එළිදරව් 6, 8-9, සහ 16 පරිච්ඡේදයන්හි සහ මතෙව් 24:4-14 විස්තර කරදී තිබේ.
   4. පීඩා කාලය සඳහා හේතුව : මිනිසාගේ දුෂ්ඨකමට දඬුවම් ලැබිය යුතුය, සාතන් පරාජය විය යුතුය, යේසුස්වහන්සේ සියල්ලන්ගේ ස්වාමියා ලෙස පිළිගත යුතුය. මෙයින් එපිස 1:8-9 සඳහන් පුරාතනයේ සිට තිබූ දෙවියන්වහන්සේගේ සැලසුම සම්පූර්ණ වේ.

ඈ. ඔසවා ගැනීමේ කාලය: සමහර පුද්ගලයන් විශ්වාස කරන්නේ ඔසවා ගැනීම, පීඩා කාලයට පෙර සිදුවන බවත් ඇදහිලිවතුනට මිහිපිට මෙම අධික දරුණු පීඩාවලට මුහුණ දීමට සිදු නොවනු ඇත කියා වේ. තව සමහරු විශ්වාස කරනුයේ ඔසවා ගැනීම පීඩා කාලය මැද භාගයෙහි සිදුවන බවය. තවත් සමහරු ඔසවා ගැනීම පීඩා කාලයට පසුව සිදුවේයැයි විශ්වාස කරති. වැඩි දෙනාගේ පොදු මතය නම් ඔසවා ගැනීම, පීඩා කාලයට පෙර සිදුවන බවය. මෙලෙස ඔසවා ගැනීම සඳහා විවිධ කාල ඉදිරිපත් කිරීමට හේතු පාදක වනුයේ එළිදරව් පොතෙහි මෙන්ම බයිබලය පුරා සපයා ඇති අනාගතකීම් විවිධාකාරයෙන් අර්ථකථනය කිරීම නිසාවෙනි. වඩා වැදගත් වනුයේ ඔසවා ගැනීම සිදුවන කල, යේසුස්වහන්සේ සමග යන පිණිස ඔබ සත්‍ය ඇදහිලිවන්තයෙකු ලෙසට සූදානම්ව සිටීද කියා නිසැකව දැන සිටීමය.

ඈ. දහස් අවුරුදු රජකම් කිරීම : දහස් අවුරුදු රජකම් කිරීමේ කාලය නම් පීඩා කාලයට පසුව යේසුස්වහන්සේ ධර්මිෂ්ඨකමින් මිහිපිට අවුරුදු 1000ක් පාලනය කිරීමේ යුගයය (සෙකරියා 14:9 ; දානියෙල් 7:14). රජකම් කිරීමේ පාලක මධ්‍යස්ථානය වනුයේ යෙරුසලම් නගරයයි (යෙසායා 2:3). මෙම යුගය අවසන් වනුයේ සාතන් දෙවියන්වහන්සේට එරෙහිව අවසාන වරට කැරලි ගැසීමත් සමගය (එළිදරව් 20:7-9). දෙවියන්වහන්සේ අහසින් ගිනි එවා සියලු විරුද්ධවාදිකම් අවසන් කරනු ඇත. සාතන් සදාකාල ගිනිවිලට හෙලනු ලැබේ. (එළිදරව් 20:10).

ඉ. විනිශ්චය : මවන ලද සියල්ලෝ දෙවියන්වහන්සේ විසින් විනිශ්චය කරනු ඇත. මෙය සදාකාල විනිශ්චයේ කාලය ලෙස හඳුන්වයි. ඇදහිලිවතුන් නොවී මියගිය සියලු දෙනා විනිශ්චයට මුහුණදෙන පිණිස නැගිටවනු ලැබේ. ඔව්හු තම පාපය පිළිබඳ පසුතැවිලි නොවූ බැවින්ද යේසුස්වහන්සේ තමුන්ගේ ගැළවුම්කරු ලෙස පිළිනොගත් බැවින් ද සදාකාලයට පාතාලයට නියම කරනු ලැබේ (එළිදරව් 20:12-15). තම පාපය උදෙසා පසුතැවිලි වූ යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත් සැබෑ ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගේ අභිමුවෙහි ස්වර්ගයෙහි සදාකාලය ගෙවනු ඇත. (එළිදරව් 21)

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. බයිබලිය අනාගතවාක්‍යය සඳහා පරමාර්ථ තුනක් ලියන්න.

3. අනාගතවාක්‍යය අධ්‍යයනයට වැදගත්වන හේතු කාරණා හතරක් නම් කරන්න.

4. බයිබලිය අනාගතවාක්‍යය වටහාගැනීමට උපකාරවන යතුරු පහක් නම් කරන්න.

5. බයිබලිය අනාගතවාක්‍යයන්හි සැපයුම් මාධ්‍යය කවුද?

6. “අනාගතවාක්‍යය” යන පදය අර්ථ දක්වන්න.

7. බයිබලීය අනාගතවාක්‍යයන්හි “ප්‍රකාශ කිරීමේ” පැවසීමේ ආකාර තුන හඳුන්වන්න.

8. මනුෂ්‍යයා හට අනාගතමය පණිවුඩ දීම සඳහා බයිබලයෙහි දෙවියන්වහන්සේ භාවිත කළ ක්‍රම දෙක මොනවාද?

9. බයිබලයෙහි ඇතුලත් පළමුවන අනාගතවාක්‍යය ඇත්තේ කොහේද?

10. බොරු ගුරුවරු හඳුනාගත හැකි ආකාර කිහිපයක් බයිබලයෙහි සඳහන් වේ. එයින් කාරණා තුනක්වත් සඳහන් කරන්න

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පහත සඳහන් අනාගතමය පොත් අධ්‍යයනය සඳහා ඔබ මෙතෙක් ඉගෙන ගත් කරුණු අදාළ කරගන්න.

**පැරණි ගිවිසුම :**

_____යෙසායා _____යෙරෙමියා _____විලප ගී _____එසකියෙල් _____දානියෙල් _____හොෂෙයා
_____යෝවෙල් _____ආමොස් _____ඔබදියා _____යෝනා _____මීකා _____නාහුම් _____හබක්කුක්
_____ශෙපනියා _____හග්ගයි _____සෙකරියා _____මලාකි

**අලුත් ගිවිසුම :**_____එළිදරව්

2. දෙවියන්වහන්සේ බයිබලයෙහි අනාගතවාක්‍යය තුළින් තම ජනතාවට කතා කරයි. එසේම උන්වහන්සේ සභාවෙහි සිටින අනාගතවක්තෘවරු තුළින් තම ජනතාවට කතා කිරීමට භාවිත කරන සේක.

   **මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළගට ආශ්චර්ය කරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද සභාවෙහි පිහිටෙවූ සේක. (1 කොරින්ති 12:28)**

   වර්තමානයේ අනාගතවක්තෘවරු දෙන පණිවුඩ ලිඛිත දේව වචනයෙහි කොටසක් බවට පත් නොවේ. ඔවුන්ගේ පණිවුඩ ලිඛිත දේව වචනයට එකඟතාවයෙන් එය තහවුරු කිරීම පිණිස දෙනු ලැබේ. ඔව්හු පවසන දෙය බයිබලයෙහි නිරවද්‍යතාවය සමග සම්බන්ධ කරගෙන ඒ අනුව විනිශ්චය කර බැලිය යුතුවේ.

   නූතනයෙහි සභාවෙහි අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා භාවස්ටයිම් ජාත්‍යන්තරයෙහි "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නම් පාඨමාලාව ලබාගන්න. මෙම පාඨමාලවෙහි මෙම ආත්මික දීමනාව පිළිබඳ විස්තරාත්මක සාකච්ඡා ඇතුලත් වන අතර බයිබලයෙහි සියලු අනාගතවක්තෘවරු පිළිබඳ ලේඛණයක්ද ඇතුලත් වේ. ඔබගේ වැඩිදුර අධ්‍යයනය සඳහා එය පිටුවහලක් වනු ඇත.

# විසිඑක් වන පරිච්ඡේදය

# සංකේතාත්මක ක්‍රමය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් ඔබහට

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීම.
- සංකේතාත්මක ක්‍රමය අර්ථ දැක්වීමට
- සියලුම බයිබලිය සංකේත වර්ගීකරණය වන්නාවූ පොදු කාණ්ඩ හතර නම් කිරීමට
- සංකේතාත්මක බයිබල් අධ්‍යයනයක් සිදුකිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මක්නිසාද ව්‍යවස්ථාව මතු පැමිණෙන යහපත් දේවල ජායාවක් මිස නියම රූපයම නොවන බැවින්, ඔවුන් අවුරුදුපතා නිතර ඔප්පු කරන ඒ පූජා වලින්, ළගාවෙන්නන් සම්පූර්ණ කරන්ට කිසිකලක නුපුළුවන. (හෙබ්‍රෙව් 10:1)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය සංකේතාත්මක ක්‍රමය භාවිතයෙන් සිදුකරන බයිබලය අධ්‍යයනය ක්‍රමය පැහැදිලි කරදෙයි. මෙය “සංකේත” ඇසුරින් බයිබලය අධ්‍යයනය කිරීම යනුවෙන්ද හැඳින්වේ. එම ක්‍රමය අර්ථ දක්වා, පැහැදිලි කොට උදාහරණයක්ද සපයා තිබේ. “තවදුරටත් අධ්‍යයනය සඳහා” කොටසෙහිදී ඔබට සංකේතාත්මක ක්‍රමය ඇසුරින් බයිබල් අධ්‍යයනයක් ඉටු කිරීමට අවස්ථාව සැපයෙනු ඇත.

## ක්‍රමය අර්ථ දැක්වීම

සංකේතාත්මක බයිබල් අධ්‍යයනයක් කරන ක්‍රමය අවබෝධකර ගැනීමට නම් පළමුව ඔබ “සංකේත” යන්නෙන් අදහස් කරන දෙය වටහාගත යුතු වේ. බයිබලිය සංකේත යන්නෙහි අදහස පැහැදිලි කර දෙන බයිබල් පද කිහිපයක් ඇත. මෙම පරිච්ඡේදයෙහි ප්‍රධාන පදය වූ හෙබ්‍රෙව් 10:1 හි, ව්‍යවස්ථාව මතු පැමිණෙන යහපත් දේවල “ජායවක්” බව පවසයි. බයිබලිය සංකේත විස්තර කරන එක පදයක් නම් “ජායාව”ය. “ජායාව” යම් දෙයක නියමිත පිටස්තර සීමාවන් පෙන්නුම් කරයි, නමුත් එහි විස්තර අදුරු වූත් සමහර විට සෙවනැල්ල සාදන දෙයට පරස්පර වූත් දෙයකි.
සංකේත විස්තර කරන්නා වූ තව පදයක් නම් “ආදර්ශය” වේ.

> **එසේ වී නමුත්, ආදම් පටන් මෝසෙස් දක්වා, අදම්ගේ වරද කිරීමේ ආකාරයෙන් පව් නොකළ වුන් කෙරෙහි පවා මරණය රජකම් කළේය. ඒ ආදම් වනාහි එන්නා වූ තැනැන්වහන්සේගේ ආදර්ශයක්ය. (රෝම 5:14)**

මෙම පදයට අනුව ආදම්, පැමිණීමට සිටි වෙන කෙනෙකුගේ “ආදර්ශය” විය. ආදර්ශය යන වචනයෙහි අර්ථය සංකේතය යන වචනයට බොහෝ සමානය. ආදම්, මතු පැමිණීමට සිටියා වූ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශයකි.

පැරණි ගිවිසුමේ සඳහන් පාපය සඳහා පාපපූජා ඔප්පු කිරීම අලුත් ගිවිසුමෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් පාපය උදෙසා ඔප්පු කරන අවසාන පාප පූජාව සංකේතවත් කිරීමකි.

> **මෙයින් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් හඟවන්නේ ඒ පළමුවෙනි මණ්ඩපය තිබෙන තුරු ශුද්ධස්ථානයට පැමිණෙන මාර්ගය ප්‍රකාශ වී නැති බවය. ඒ මණ්ඩපය වර්තමාන කාලයට**

**උප හැරණයක්ය. ඒ ප්‍රකාරයට හෘද සාක්ෂිය සම්බන්ධව සේවය කරන්නා සම්පූර්ණ කරන්ට නොහැකි වූ පඬුරු සහ පූජා ඔප්පු කරනු ලබන්නේය. (හෙබ්‍රෙව් 9:8-9)**

බයිබලිය සංකේත විස්තර කිරීමට යොදාගත් තවත් වචනයක් නම් රටාවය. (සිංහල බයිබලයේ සඳහන් වන්නේ ආදර්ශය ලෙසය.)

**එහෙත් ව්‍යවස්ථාව ප්‍රකාර පඬුරු ඔප්පු කරන්නන් සිටින බැවින් උන්වහන්සේ (තවමත්) පොළොවේ සිටි සේක් නම්, උන්වහන්සේට කිසි සේත් පූජකයෙක්ව සිටින්ට නුපුළුවන. මෝසෙස් මණ්ඩපය සාදන්ට යන කල: කන්දේදී නුඹට පෙන්වන ලද ආදෘශය ලෙස සියල්ල සාදන්ට බලාගනින්නැයි දෙවියන්වහන්සේ ආඥා කළ හැටියට, ඒ පූජකයෝ ස්වර්ගිය වූ දේවල සටහනක්ව ජායාවක්ව තිබෙන දෙයට සේවය කරති. (හෙබ්‍රෙව් 8:4-5)**

මෙම වචන සියල්ලම එනම් ජායාව ආදර්ශය සහ රටාව යන වචන අප සංකේත යනුවෙන් පවසන කළ එකම අදහසක් දරන ලෙසට ගණන් ගනිමු. සංකේතයක් යනු බයිබලයෙහි සඳහන් පුද්ගලයෙක් හෝ දෙයක්, දෙවියන්වහන්සේ අනාගතයේදී සිදුවීමට නියමිත සිද්ධියක්, පැමිණීමට නියමිත පුද්ගලයෙක් හෝ දෙයක් නියෝජනය කිරීම සඳහා භාවිත කළා වූ පුද්ගලයෙක් හෝ දෙයකි. එය පැමිණීමට නියමිත කාරණාවෙහි ජායාවකි, ආදර්ශයකි නැත්නම් රටාවකි.

## ක්‍රමය පැහැදිලිකර දීම

අප මෙම සංකේත අධ්‍යයනය කරන විට එයට සංකේතාත්මක බයිබල් අධ්‍යයනය යැයි කියනු ලැබේ. අප පුද්ගලයෙක්, ස්ථානයක් සිදුවීමක් හෝ දෙයක් පිළිබඳ අධ්‍යනය කර ඉන්පසුව එයින් නියෝජනය වන දෙය අධ්‍යයනය කරමු. එක් ආකාරයකින් බලන කළ සංකේත අනාගතවාක්‍යයන් මෙන් වේ. එමගින් දෙවියන්වහන්සේගේ අනාගත සැලැස්මෙහි පැමිණීමට ඇති කාරණා පිළිබඳ පෙර දැක්මක් සලසා දෙයි. අනාගතවාක්‍යයන් මෙන්ම සමහර සංකේත දැනටම සමපූර්ණ වී තිබේ. අනෙක් කරුණු ඉදිරියේදී සම්පූර්ණ වීමට නියමිතය.

සංකේත ඉතා වැදගත් කමක් දරන අතරම, එය නියෝජනය කරන්නා වූ අනාගත පුද්ගලයා හෝ එම සිදුවීම එයට වඩා සුවිශේෂිය. සංකේත නම් ආත්මික සත්‍යතාවයන් පිළිබඳ භෞමික පින්තූරයකි. උදාහරණයක් ලෙස ඉශ්‍රායෙල් ජනතාව සර්පයන් විසින් සපා කෑමට ලක් වූ කල, සුවය ලැබීම සැබවින්ම පැරණි ගිවිසුම් කාලයේ සිදු වූ සිද්ධියකි. ගණන් කථාව 21:6-9 හි පවසනුයේ සර්පයන් ජනතාවට දෂ්ඨ කළ බවත් ඉන් බොහෝ දෙනෙකු මිය ගිය බවත්ය. මෝසෙස් පිත්තල සර්පයෙක් සාදා එය රිටක සවි කළේය. එම රිටෙහි ඔසවා තිබූ සර්පයා දෙස බැලූ සැම දෙනෙක්ම සුවපත් වූහ. මෙම සිදු වීම යේසුස්වහන්සේගේ මරණය සඳහා සංකේතයකි.

**මොසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැම දෙනම, සදාකාල ජීවනය ලබන පිණිස ඔසවනු ලබන්ට ඕනෑ යයි කී සේක. (යොහන් 3:14-15)**

බයිබලයේ බොහෝ සත්‍යයන් දරුවෙකුට පවා වටහා ගැනීමට පහසු වන පරිදි ඉතා සරලව ඉදිරිපත් කොට තිබේ. එහෙත් තව සමහර සත්‍යයන්, "රහස් ස්ථානයන් හි සඟවා තිබෙන වස්තු සමහරක්" වැනිය ඒවා වටහා ගැනීමට දැඩි වෙහෙසින් යුතුව අධ්‍යයනය කළ යුතුය. බයිබලයෙහි ඉගැන්වීම් සැඟවුණු වස්තු සම්භාරයක් වැනිය. එබැවින් දේව වචනයේ අන්තර්ගත රහස් වස්තු සොයා ගැනීම සඳහා ඔබ කාලය වැය කොට සත්‍ය සොයා බැලිය යුතුය.

සියලු සංකේත පොදු වර්ගිකරණ කාණ්ඩ හතරකට වෙන් කළ හැක.

1. පුද්ගලයන්
2. ස්ථාන
3. සිදුවීම් (ඓතිහාසික, චාරිතනුකුල යනාදී.)
4. භෞතික භාණ්ඩ

## ක්‍රමය සඳහා උදාහරණය

පරණ ගිවිසුමේ සඳහන් යෝසෙප් නම් චරිතය මේ සඳහා අනර්ඝතම උදාහරණයකි. උත්පත්ති 37-50 දක්වා සඳහන් වන යෝසෙප්ගේ ජීවිත කතාව කියවන්න. යෝසෙප් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සංකේතයකි. ඔහුගේ ජීවිතයෙහි බොහෝ කරුණු යේසුස්වහන්සේගේ ජීවිතයෙහි කරුණු වලට බොහෝ සේ සමාන රටාවක් ගන්නේය. පහත සඳහන් වගුවෙහි ඒවා ඇතුලත් කර තිබේ.

### සංකේතාත්මක බයිබල් අධ්‍යනය

| යෝසෙප් පිළිබඳ අධ්‍යයනය | සංකේතවත් කරනුයේ | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ |
|---|---|---|
| උපුටා ගැනිම | සිදුවීම | උපුටා ගැනිම |
| උත්පත්ති 37:2 | ඔහු එඬේරෙක් විය. | යොහන් 10:11 |
| උත්පත්ති 37:3 | ඔහු පියාගේ ප්‍රේමණීය පුත්‍රයා විය. | |
| උත්පත්ති 37:4 | තමාගේම සොහොයුරන් විසින් ද්වේෂ කරනු ලැබීය. ඔහුගේ පාලන බලය සහෝදරයෝ ප්‍රතික්ෂේප කළෝය. | |
| උත්පත්ති 37:8 | ඔහුගේ පියා අනාගත සැලසුම් පිළිබඳ සැලකිලිමත් විය. මරියාද යේසුස්වහන්සේ පිළිබඳ එසේම කළාය. | |
| උත්පත්ති 37:13 | ඔහුගේ පියා ඔහුව සහෝදරයන් වෙත යැවීය. | |
| උත්පත්ති 37:13 | ඔහු තම පියාගේ කැමැත්ත ඉටු කිරීමට කැමැති විය. | |
| උත්පත්ති 37:18 | ඔහුගේ සහෝදරයන් ඔහුට එරෙහිව කුමන්ත්‍රණය කළෝය. | |
| උත්පත්ති 37:22 | යේසුස්වහන්සේ සම්බන්ධව පිලාත් කළ ලෙසම, නායකයෙක් (රූබන්) ඔහුව මුදා ගැනීමට උත්සාහ කළේය. | |
| උත්පත්ති 37:23 | ඔහුගේ අලංකාර වස්ත්‍රය ඔහුගෙන් උදුරාගෙන අහිමි කරන ලදි. | |
| උත්පත්ති 37:28 | ඔහුව රිදී මිලට විකුණන ලදි | |
| උත්පත්ති 37:26-28 | යුදා (ග්‍රීක බසින් යුදස්) විසින් ඔහුව විකුණන ලදි | |
| උත්පත්ති 39:2 | ඔහු සේවකයෙක් විය. | |
| උත්පත්ති 39:7-23 | ඔහු පරීක්ෂාවට විරුද්ධ වීය. | |
| උත්පත්ති 39:13-20 | බොරු සාක්ෂි මගින් වරදකරු බවට පත් විය. | |
| උත්පත්ති 39:20 | නිර්දෝෂී වුවද වද වින්දේය | |
| උත්පත්ති 40:1-3 | ඔහු වද වින්දේ පව්කරුවන් දෙදෙනෙකු සමගිනි. එක් අයෙක් විශ්වාස කළ අතර අනෙකා විශ්වාස නොකළේය. | |
| උත්පත්ති 41:14 | ඔහු සිරගෙය නම් සොහොනින් එළියට පැමිණියේය. | |
| උත්පත්ති 41:57 | ඔහු ලෝකය මරණින් බේරා ගත්තේය. | |
| උත්පත්ති 47:1-2 | ඔහුගේ සහෝදරයෝ ඔහු තුළින් රජ වෙතට ළඟාවූහ | |
| උත්පත්ති 41:50 | ඔහුට අන්‍යජාතික මනාලියක් විය. | |
| උත්පත්ති 50:14-21 | ඔහු සමා වීමේ ආත්මයක් පෙන්නුම් කළේය. | |

යෝසෙප්ගේ ජීවිතය ඉතා වැදගත් විය. නමුත් එය පැමිණීමට සිටින වඩා ශ්‍රේෂ්ඨ ජීවිතයක ආදර්ශයක් විය. එම ශ්‍රේෂ්ඨ ජීවිතය නම් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයයි. වගුවෙහි යේසුස්වහන්සේ යටතෙහි උපුටා ගැනීම් තීරය හිස්ව ඇති බව ඔබට පෙනී යන්නට ඇත. ශුභාරංචි පොත් කියවා බලා යේසුස්වහන්සේගේ ජීවිතයෙහි සඳහන් වන උපුටා ගැනීම් ඒ යටතෙහි සඳහන් කර ඔබගේ සංකේතාත්මක බයිබල් අධ්‍යනය සම්පූර්ණ කරන්න. පළමු වැන්න සම්පූර්ණ කොට ඔබට උදාහරණයක් සපයා තිබේ. මෙහි සපයා ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා

සංකේතයක් ලෙස පැමිණි යෝසේප්ගේ කතාව ඇසුරින් සිදු කළ සංකේතාත්මක බයිබල් අධ්‍යයනයට නිදසුනකි. ඔබ ස්වයං පරීක්ෂණය අවසන් කළ පසුව, "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස ඇසුරින් ඔබගේම සංකේතාත්මක බයිබල් අධ්‍යයනය සිදු කරන්න.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. සංකේතාත්මක බයිබල් අධ්‍යයන ක්‍රමය අර්ථ දක්වන්න.

3. සංකේතය සඳහා බයිබලයෙහි භාවිත කර ඇති අනෙකුත් වචන මොනවාද?

4. බයිබලීය සංකේත වර්ගීකරණය කර ඇති පොදු කාණ්ඩ හතර මොනවාද?

5. මෙම පරිච්ඡේදයෙහිදී පැරණි ගිවිසුමේහි සඳහන් කුමන පුද්ගලයා බයිබලීය සංකේතයක් ලෙස භාවිත කළේ ද?

6. ඔහු සංකේතවත් කළේ කවුරුන්ද ?

(මෙම පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

ඔබ හට සංකේතාත්මක බයිබල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ආදර්ශ කිහිපයක් පහතින් සපයා දී තිබේ. මෙම කොටස අධ්‍යයනයෙහි සංකේතාත්මක බයිබල් අධ්‍යයනය සඳහා භාවිත කිරීමට අධ්‍යයනය කුපනයක් සපයා ඇත.

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සංකේතයක් ලෙස ඊසාක් අධ්‍යයනය කරන්න (උත්පත්ති 21-28) විමසා බැලීමට කරුණු: ඊසාක් තම පියාගේ ඒකජාතක පුත්‍රයා විය. කන්දක් මුදුනකදී ඔහු තම ජීවිතය පූජා කිරීමට කැමති විය. ඔහු මනාලියක් ලෙස රෙබෙකා තෝරා ගත්තේය.

2. රෙබෙකා සභාවෙහි සංකේතයක් ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය ලෙස අධ්‍යයනය කරන්න. (උත්පත්ති 24)
ඇය ආබ්‍රහම්ගේ පවුලට අයිති වීමෙන් සුදුසුකම් ලත් කෙනෙකු වීමට සිදු විය. ඇයට තමා ඊසාක් වෙත යනවාද කියා තිරණයක් ගැනීමට සිදු විය. ඇගේ පුරුදු වටපිටාව හැර දමා යාමට සිදුවිය. දිගු ගමනකට පසු ඇය ඊසාක් මුහුණට මුහුණලා දුටුවාය.

3. නෝවාගේ නැව, ගැළවීමේ සංකේතයක් ලෙස අධ්‍යයනය කරන්න (උත්පත්ති 6-8).
පාපයට වන්දිය මරණය බව සලකා බලන්න. ජල ගැල්ම දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි සංකේතයකි. නැව සැලසුම් කර තිබුනේ ආරක්ෂාව සැපයීම සඳහා වේ. එහි තිබුනේ එක් දොරක් පමණක්ය. සියලු දෙනාටම සෑහෙන පමණ ඉඩකඩ තිබීය. නැවට ජලය කාන්දු වීම වළකා තැබීම සඳහා එහි කීල් තවරා තිබිනි. "කීල්" යන වචනය හෙබ්‍රෙව් භාෂාවේ "ආවරණය කිරීම" නම් වචනයෙන් බිදී එන්නකි. එම මුල් වචනය පැරණි ගිවිසුමෙහි "ආදේශ පූජාව" සඳහාද භවිත කර ඇත. මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ගැළවීමේ සංකේතයක් වන්නේ කෙලෙසද ?

4. ඉශ්‍රායෙල් ජනතාව කාන්තාරයෙහි අතරමංව ගෙවූ ගමන, නික්මයාම, ගණන් කතාව හා ද්විතිය කතාවෙන් අධ්‍යයනය කරන්න.

   1 කොරින්ති 10:11 පවසන ආකාරයට "... ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුණේය, ඒවා ලියා තිබෙන්නේ කාලවල කෙළවරට පැමිණ සිටින්නා වූ අපට අවවාද පිණිසය". මිසරය හැර දමා පැමිණිම පාපය හැර දැම්මකට සංකේතයකි. කාන්තාරයේ අතරමංව ගමන් කිරීම, තමන්ගේම මමත්වයෙන් පාලනය වන්නා වූ ආත්මාර්ථකාමී, මාංශික කිතුබැතියෙකුගේ ජීවන රටාව සංකේතවත් කරයි. ඔහු දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප නොකරයි. එනමුත් ඔහුගේ ජීවිතය උදෙසා ඇති දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්තට ඇතුළත් නොවේ. කාන්තාරයේදී ඉශ්‍රායෙල් අත්දුටු අසමත්කම් අධ්‍යයනය කරන්න. 1 කොරින්ති 10 පෙන්වා දෙන්නේ ඔවුන්ගේ අසමත්කම් වල කිසියම් ආත්මික සුවිශේෂි බවක් තිබූ බවය. අපද ප්‍රවේශම් නොවුවහොත් ඔවුන්ගේ උදාහරණය මෙන් අපද අසමත් විය හැකිය.

5. පහත සඳහන් උපුටා ගැනීම් ඔබට වෙනත් සංකේත හඳුනා ගැනීමට සහ අධ්‍යයනයට උපකාරි කර ගන්න. මෙය බයිබලයෙහි ඇතුළත් සංකේතවලින් කොටසක් පමණක් ඇතුලත් ලැයිස්තුවකි.

## සංකේත සඳහා උපුටා ගැනීම් මගපෙන්වීම

**පුද්ගලයෝ :**

| | |
|---|---|
| ආරෝන්/පූජක | යේසුස්වහන්සේ අපගේ උත්තම පූජකයා ලෙසට |
| ආබ්‍රහම් | පියවූ දෙවියන්වහන්සේ |
| දාවිත් | ක්‍රිස්තුස්වහන්සේ රජ ලෙස |
| ඒසව් | සංවේදී, ස්වභාවික මිනිසා (ඉන්ද්‍රිය ගෝචර) |
| ඊසාක් | ක්‍රිස්තුස්වහන්සේ, කීකරු පුත්‍රයා |
| යාකොබ් | ඒසව් හා සංසන්දනය කළ විට ආත්මික මිනිසා |
| යෝනා | ක්‍රිස්තුස්වහන්සේගේ මරණය, භූමදානය හා නැවත-නැගිටීමේ සංකේතය |
| යෝසෙප් | යේසුස්වහන්සේ අපගේ නායකයා ලෙසට |
| මෙල්කිසදෙක් | අපගේ පූජක හා රජ වූ යේසුස්වහන්සේ |
| මෝසෙස් | අපගේ ගැලවුම්කරු හා අධිපති ලෙස යේසුස්වහන්සේ |
| රෙබෙකා | සභාව ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය |
| එඬේරා | යේසුස්වහන්සේ යහපත් එඬේරා ලෙස |

**ස්ථාන**

| | |
|---|---|
| කාන්තාරය | පරීක්ෂාව |
| මිසරය | මාංශික කිතු බැතියෙකුගේ ජීවිතය |
| වනාන්තරය | පාපය |
| කානාන් | ආත්මයේ පූර්ණ ජීවිතය |
| සොදොම/ගොමෝරාව | දුෂ්ටකම |
| යෙරුසලම | ස්වර්ගය |
| ආරක්ෂාවේ නුවර | යේසුස්වහන්සේ අපගේ ආරක්ෂාව ලෙසට |
| රෙෆිඩිම් | ආත්මයාණන් තුළ ජීවිතය |

**සිදුවීම්**

**ඓතිහාසික සිදුවීම්**

| | |
|---|---|
| රතු මුහුද | ලෝකය පස්සට දමා හැර යාම |

**පොදු සිදුවීම්**

| | |
|---|---|
| බව්තිස්මය | යේසුස්වහන්සේගේ මරණය, භූමදානය හා නැවත-නැගිටීම |
| යුද්ධ | ආත්මික ගැටුම |
| සේදීම | පවිත්‍ර කිරීම |

**ස්වාභාවික සිදුවීම්**

| | |
|---|---|
| ගින්න | දෙවියන්වහන්සේගේ ප්‍රියමනාප අභිමුඛය හෝ විනිශ්චය |
| ජලගැල්ම | විනිශ්චය |
| වර්ෂාව | ආශිර්වාදය |
| හිම | පවිත්‍රතාවය |
| සුළඟ | බලය, පරාක්‍රමය |

**චාරිත්‍රනුකුල සිදුවීම් :**

ඉශ්‍රායෙල්හි පූජාවන් :

- පාප පූජාව : ලෙවී 4:1-6, යේසුස්වහන්සේගේ රුධිරය වැගිරීම මගින් සිදු කළා වූ පාප පූජාවෙහි සංකේතයකි.

- දවන පූජාව : එය ඔප්පු කරන තැනැත්තා, යේසුස්වහන්සේට නමස්කාර කිරීම සඳහා කැපවීම අවශ්‍ය බව පිළිගනී. කැපවීම නිරන්තරයෙන් අලුත් කළ යුතුය. ලෙවී 1:1-4

- සමගි කිරීමේ පූජාව : දෙවියන්වහන්සේ සමග සමාදානය හා සහභාගිකම ප්‍රකාශ කරයි. පූජාවෙන් කොටසක් දෙවියන්වහන්සේ සඳහා පූජාසනය මත දවනු ලබයි. කොටසක් පූජකයාට දෙනු ලබයි. අනෙක් කොටස එය ඔප්පු කළා වූ පුද්ගලයාට භුක්ති විඳීම පිණිස දෙනු ලබයි.

ඉශ්‍රායෙල්හි මංගල්‍යයන්:

- පාස්කුව : බැටළු පැටවා යේසුස්වහන්සේගේ සංකේතයකි. රුධිරය පාපය උදෙසා හැලූ ආදේශ පූජාවය. නික්මයාම 12:3-5, 11-13.

- පෙන්තකොස්තය : පෙන්තකොස්ත මංගල්‍යයෙහි නියම අරුත, උඩුමහල් මැදුරේදී ගෝලයන් මතට ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැගිරීම සිදු වූ පෙන්තකොස්ත දින සම්පූර්ණ විය. ලෙවී 23:15-17 සහ ක්‍රියා 4 බලන්න.

- කූඩාරම් මංගල්‍යය : මෙය තවමත් සංකේතාත්මකව ඉටු වී නොමැත. එය දෙවියන්වහන්සේගේ සිහසුන වටා සියලු වයස් හි මුදනු ලැබූවන් ස්වර්ගයෙහි එක්රැස් වූ කළ ඇති වන මහත් ප්‍රීතිය චිත්‍රයක් ලෙස පෙන්නුම් කරයි. ද්විතිය 16:13-15

**භාණ්ඩමය ද්‍රව්‍යය:**

**කූඩාරම් මණ්ඩපය:**

දෙවියන්වහන්සේ තම ජනතාව සමග හමුවීමට හැකි ස්ථානයක් ලෙස මණ්ඩපය සැපයූ සේක.

- පිට මළුව : මෙය පූජකයෝ හා මහ ජනතාව හමු වූ ස්ථානයයි. එය වටා තිබූ තිර, පාපය හේතුවෙන් වෙන් කර තැබීම සංකේතවත් කළේය. එනමුත් එම වෙන් කිරීමේ බිත්ති තිර රෙදි වලින් සාදා තිබීම මගින් එය තාවකාලික වෙන් වීමක් බව සනිටුහන් කරයි. පිට මළුව කරා යාමට තිබූ දොරටුවෙන් දෙවියන්වහන්සේ සමීපයට යා හැකි ප්‍රවේශයක් වූ බව උගන්වයි. පිත්තල පූජාසනය නියෝජනය කළේ පාපය උදෙසා පූජා වීමක් අවශ්‍ය බවය. පිත්තලින් සෑදූ පවිත්‍ර කිරීමේ භාජන සේවයට පෙර පවිත්‍ර වීමේ අවශ්‍යතාවය මතක් කර දෙයි.

- ශුද්ධ ස්ථානය : එය පූජක සේවාව නියෝජනය කරයි. එහි රන් පහන් තරුවක් වූ අතර එය සාක්ෂිය සංකේතවත් කරයි. පිදීමේ රොටි සහිත මේසය ආත්මික පෝෂණය හා සහභාගිකම සංකේතවත් කරයි. රනින් සෑදූ පූජාසනය හා සුවඳ දුම් පූජා නමස්කාරය හා මැදහත්කාරකම සංකේතවත් කරයි.

- අතිශුද්ධ ස්ථානය : මෙය දෙවියන්වහන්සේ වැඩ විසූ විශේෂ ස්ථානය වේ. ශුද්ධ ස්ථානයේ සිට එම අතිශුද්ධ ස්ථානය වෙන් කොට තැබූ තිරයෙන් පෙන්නුම් කරනු ලැබුවේ දෙවියන්වහන්සේ වෙතට සම්පූර්ණයෙන් ළඟා වීමට තවමත් නොහැකි වී ඇති බවය. ව්‍යවස්ථාව අන්තර්ගත වූ ගිවිසුම් පෙට්ටිය, දෙවියන්වහන්සේගේ සාධාරණ ධර්මිෂ්ඨ බව නියෝජනය කරයි. කරුණාවේ සිංහාසනයෙන් උගන්වන්නේ ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ හට රුධිරය වැගිරීම හේතුවෙන් කාරුණික විය හැකි බවය. දෙවියන්වහන්සේ මණ්ඩපය තුළින් අනාගතයෙහිදී උන්වහන්සේ කිරීමට යන කාරණා පෙන්වා දුන් සේක. උන්වහන්සේ යේසුස්

ක්‍රිස්තුස්වහන්සේ විසින් මනුෂ්‍යයා සමග සර්ව සම්පූර්ණ සහභාගිකමකට මාර්ගය පහදා දෙනු ඇත. දෙවියන්වහන්සේ සභාව නම් ආත්මික මණ්පයෙහි වාසය කරනු ඇත. එසේම උන්වහන්සේ එක් එක් ඇදහිලිවන්තයා තුළද වාසය කරනු ඇත. එමනිසා මණ්ඩපයෙන් අපට සපයන සංකේතවත් පාඩම පවසන්නේ යේසුස්වහන්සේ, එතුමාගේ සභාව හා ඇදහිලිවන්තයා පිළිබඳවය.

**නියමිත ලෝහ :**

| | |
|---|---|
| පිත්තල | විනිශ්චය |
| රන් | මහිමය |
| රිදී | මිදීම |

**නියමිත වර්ණ :**

| | |
|---|---|
| නිල් | ස්වර්ගීය කාරණා |
| රතු පාට, තැඹිලි පාට, ලේ රතු | දුක්වීම හෝ පූජා වීම |
| සුදු | පවිත්‍රතාවය |

**නියමිත ආහාර :**

| | |
|---|---|
| රොටි | ජීවයෙහි පැවැත්ම |
| පළතුරු | වැඩි වීම හෝ ගුණනය වීම |
| මී පැණි | ස්වභාවික මිහිරි රසය |
| මන්නා | ජීවනදායක රොටි වන යේසුස්වහන්සේ, |
| මස් | දැඩි ආත්මික ආහාර |
| කිරි | ලාබාල කිතුනුවන් සඳහා ආහාර |
| ලුණු | නරක් නොවීම, කල් තබා ගැනීම |
| මුද්‍රික පානය | ඉගැන්වීම් : පැසුණු මුද්‍රික පානය නියෝජනය කරනුයේ බොරු ඉගැන්වීම්ය. නොපැසුණ මුද්‍රිකපානය සත්‍යය ඉගැන්වීම නියෝජනය කරයි. |

**සතුන් :**

| | |
|---|---|
| පක්ෂීන් | දුෂ්ඨ ආත්ම |
| ගවයන් | ශක්තිය හෝ සේවාව |
| මාළු | මිනිසුන් |
| එළුවෝ | පාපය හෝ පාපිෂ්ඨයා |
| බැටළුවා | යේසුස්වහන්සේ, සම්පූර්ණ පූජාව |
| සිංහයා | පාලකයා |
| සර්පයා | සාතන් |
| බැටළුවෝ | දෙවියන්වහන්සේගේ ජනතාව |

## සංකේතාත්මක බයිබල් අධ්‍යයනය.

_________________________ පිළිබඳ අධ්‍යයනය _______________________ සංකේතයක් ලෙස

| | | |
|---|---|---|
| **උපුටාගැනීම්** | **සිදුවීම්** | **උපුටාගැනීම්** |

# උපග්‍රන්ථය

## අමතර බයිබල් අධ්‍යයන ක්‍රම

මෙම පාඨමාලාවෙහිදී නිර්මාණශීලි බයිබල් අධ්‍යයන ක්‍රම ලෙස ඉදිරිපත් කරනු ලැබුයේ ජීවිතයටත්, සේවයටත් වැඩිපුරම ආත්මික ප්‍රයෝජනයක් ලබා දිය හැකි අදාළ කර ගත හැකි අධ්‍යයන ක්‍රම පමණකි. උපග්‍රන්ථයෙහි මීට අමතරව තව ක්‍රම කිහිපයක් ඉදිරිපත් කරමු. මෙම ක්‍රම උනන්දුව හොඳින් පුබුදු කරවන මෙන්ම බයිබලය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරන ක්‍රම උවද, මින් පෙර විස්තර කළා වූ ක්‍රම මෙන් ඔබගේ ප්‍රයෝගික ක්‍රිස්තියානි ජීවිතයට බොහෝ සේ අදාළ කර ගත හැකි ක්‍රම නොවේ. එබැවින් එම ක්‍රම පිළිබඳව අප ඔබට කෙටි විස්තරයක් පමණක් සපයමු.

### දේශාපලන ක්‍රමය

දේශාපලනමය ක්‍රමයෙහිදී බයිබලයෙහි සඳහන් ජාතීන්ගේ දේශාපලනයට අයත් කාරණා පිළිබඳව අධ්‍යනයක යෙදේ. එමගින් බයිබලීය සිදුවීම් සිදු වූ ජාතියේ රජයෙහි දේශාපාලනමය පසුබිම පිළිබඳ අවබෝධයක් සපයනු ඇත. එවැනි අධ්‍යනයක් සිදු කිරීම් සඳහා ඔබ විසින් හඳුනා ගත යුතු කරුණු නම්:

I. රජයෙහි ස්වභාවය: උදා: ලෙස එය ඒකාධිපති පාලනයක් වීද? නැත්නම් ව්‍යවස්ථානුකූල සහිත රජයක් වීද?

II. රජයෙහි චින්තනය: එය ප්‍රජාතන්ත්‍රවාදීද? වෙනයම්?

III. රජයෙහි භූගෝලීය විස්තර:

- අ. පාලනය කළා වූ ප්‍රදේශය.
- ආ. උප-බෙදීම් සංවිධානය වූ ක්‍රමය.
- ඇ. රජයෙහි ආසන.
- ඈ. භූගෝලීය පිහිටීම රජය කෙරෙහි බලපෑම.

IV. රජයෙහි නායකයෝ.

V. රජයෙහි ක්‍රියාකාරීත්වය.

- අ. පරිපාලනය.
- ආ. මහජන මුදල්.
- ඇ. යුද්ධය සහ ජාත්‍යන්තර සම්බන්ධකම්.
- ඈ. නීතිමය කාරණා.

VI. රජය කෙරෙහි ආගමික කණ්ඩායම් ඇති කළ බලපෑම.

VII. ඔබ අධ්‍යයනය කරන බයිබලීය සිදුවීමට මෙම රජය කෙලෙස බලපෑවේද?

### මනෝවිද්‍යාත්මක ක්‍රමය:

මනෝවිද්‍යාත්මක ක්‍රමයෙහිදී බයිබලයෙහි සඳහන් පුද්ගලයන්ගේ හැසිරීම, පුරුදු, හැඟීම් සහ ආකල්ප අධ්‍යයනය කරනු ලබයි. ඔවුන්ගේ හැසිරීම් පසුපස පවතින හේතුව හෝ අරමුණ තීරණය

කිරීමට උත්සාහ දරයි. මනෝවිද්‍යාත්මක අධ්‍යයනය සඳහා පහත සඳහන් උදාහරණද ඇතුළත් වෙයි. එනම්:

1. ක්‍රිස්තියානි සේවය සඳහා අරමුණු සොයා බැලීම. පිලිප්පි 1:14-19
2. සාලමොන්ගේ දේශපාලනමය ප්‍රතිපත්ති කෙරෙහි ඔහුගේ පරිසරය බලපෑ ආකාරය අධ්‍යයනය කිරීම.
3. යේසුස්වහන්සේ අත්දුටු මානුෂික හැඟීම් (චිත්තාවේගයන්) පිළිබඳ අධ්‍යයනය.
4. යේසුස්වහන්සේ කෙරෙහි ඵරිසිවරු දැක්වූ ක්‍රියා හා ප්‍රතික්‍රියා ගවේෂණය කර බැලීම.
5. කර්මෙල් කන්දෙහි සිදුවීමෙන් පසුව එලියාගේ ක්‍රියාවන් හා ආකල්ප පිළිබඳ අධ්‍යයනය.
6. නෙහෙමියා යෙරුසලමෙහි පවුරු නැවත ගොඩනැඟීමෙහිදී ඔහුට විරුද්ධ වූ අයගේ අරමුණු පිළිබඳ අධ්‍යයනය.

## විද්‍යාත්මක ක්‍රමය :

විද්‍යාත්මක ක්‍රමයෙහිදී බයිබලයෙහි ඇතුළත් විද්‍යාත්මක විෂයන් පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ. උදා: ලෙස බයිබලයෙහි සඳහන් පැලෑටි, සතුන් හෝ ඛණිජ වර්ග අධ්‍යයනය කළ හැකිය. මෙවන් අධ්‍යයනයක් සඳහා ඔබ අධ්‍යයනය කිරීමට යන විෂය හඳුනාගෙන එයට අදාළ නිර්දේශයන් සොයා බලන්න. ඉන් පසු එහි ඇති ආත්මික සුවිශේෂී බව සොයා බලන්න. එවන් අධ්‍යයනයකින් බයිබලීය සත්‍යයක් පිළිබඳ ඔබගේ පසුබිම් දැනුම වැඩි කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැකිය හැකිය.

**විෂය:** අබ (ඇට සහ පැලෑටිය)

**ශුද්ධ ලියවිල්ලෙහි භාවිත කර ඇති ස්ථාන :** මතෙව් 13: 31; 17: 20; මාර්ක් 4: 31; ලූක් 13:19 ; 17:6

**ආත්මික අදාළ කර ගැනීම:** අබ පැලෑටිය සමහර විට අඩි 12ක් දක්වා උසට වැඩේ. යේසුස්වහන්සේ දේව රාජ්‍යය හා ඇදහිල්ල නිදර්ශනය කිරීම සඳහා මෙම පැලෑටිය භාවිත කළ සේක. දේව රාජ්‍යයෙහි සුළු ආරම්භය පෙන්වා දෙන්නේ කුඩා අබ ඇටයෙන් වේ. ආරම්භයේදී අබ ඇටය කුඩාව පැවතියෙන් අවසානයෙහි එය විශාල ගසක් බවට පත් වෙයි. මෙය දේව රාජ්‍යයෙහි වර්ධනයට නිදර්ශනයකි. එසේම යේසුස්වහන්සේ පැවසුයේ මිනිසා සතුව අබ ඇටයක ප්‍රමාණයෙහි ඇදහිල්ලක් පවතී නම්, ඔහුට මහත් දේ කළ හැකි බවයි.

## සමාජ විද්‍යාත්මක ක්‍රමය :

සමාජ විද්‍යාත්මක ක්‍රමය නම් සමාජය පිළිබඳ අධ්‍යයනයි. එය කණ්ඩායමක්, කණ්ඩායමක හැසිරීම හා කණ්ඩායම ඇතුළත සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයකි. සමාජ විද්‍යාත්මක අධ්‍යයනය ක්‍රමය සඳහා පහත සඳහන් කාරණා පිළිබඳ අධ්‍යයනය ඇතුළත්ය. එනම්: පවුල, සමාජය, ප්‍රජාව, රජය, සමාජ ආයතන, සන්නිවේදනය, සංචාරය භාණ්ඩ බෙදා හැරීම, කම්කරු හා සම්බන්ධතා කළමණාකාරිත්වය, ජාතිය, ආගම, අධ්‍යාපනය ක්‍රීඩා සහ සෞන්දර්යය වේ. මෙවන් අධ්‍යයනයක් සඳහා උදාහරණයක් නම් එපීස 25: 21 - 6: 9 හා කොලො: 3: 18 - 4: 1 පැවති සමාජ සම්බන්ධතා සංසන්දනය කර බැලීමකි. තව උදාහරණයක් නම්, විවිධ බයිබලීය සමාජයන්හි කාන්තාව සතු වූ කාර්යයන් පිළිබඳ අධ්‍යයනයකි.

## මානව විද්‍යාත්මක ක්‍රමය

මානව විද්‍යාව යනු මිනිසා, ඔහුගේ භාෂාව, සංස්කෘතිය, ශාරීරික වර්ධනය හා ඉතිහාසය පිළිබඳ සිදුකරන අධ්‍යයනයයි. මනුෂ්‍යය ඉතිහාසය සාමාන්‍යයෙන් අධ්‍යයනය කරනු ලබන්නේ පුසගිය


සංස්කෘතියෙහි නටබුන් ඇසුරින් කරනු ලබන පුරාවිද්‍යාත්මක ගවේෂණ මගිනි. භාෂා පිළිබඳ අධ්‍යයනයකට උදාහරණයක් නම් බාබල් කොත ගොඩනඟන සමයෙහි තිබූ භාෂාවක් (උත්: 11) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දීමනාවෙන් ලත් භාෂාවන් (ක්‍රියා 2) සමග සංසන්දනාත්මකව අධ්‍යනය කිරීමකි. බයිබලීය සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයක් සඳහා බයිබල් සමයෙහි පැවති ආගම්, සෞන්දර්යය, සංගීතය, විද්‍යාව හා සාහිත්‍යය අධ්‍යයනය කළ යුතුවේ. උදා: ඔබට ඉශ්‍රායෙල්හි පැවති සංගීතය සහ සංගීත භාණ්ඩ ඇසුරින් අධ්‍යයනයක් කළ හැකිය.

## බයිබල් අධ්‍යයන ලිපි ගොනු


ඔබගේ බයිබල් අධ්‍යයන සටහන් සංවිධානය කොට තබා ගැනීම වැදගත්ය. ඔබ හට සමහර විට එකම පොතම, පරිච්ඡේදයම නැවත වතාවක් පසු දිනකදී අධ්‍යයනය කිරීමට අවශ්‍ය විය හැකිය. එසේම ඔබ ඉගෙන ගත් කරුණු අන්‍යයන් සමග බෙදා ගැනීමට අවශ්‍ය විය හැකිය.

ඔබගේ බයිබල් අධ්‍යයන සටහන් සංවිධානය කළ හැකි පහසුම ක්‍රමය නම් බයිබල් අධ්‍යයන ගොනු සෑදීමයි. ගොනුවක් යනු ඔබගේ සටහන් එක්රැස් කර තැබීමට භාවිත කරන කඩදාසියක් හෝ කාඩ්බෝඩ් එකකින් සාදන ලද ෆෝල්ඩරයකි. මෙයට ඔබගේ සටහන් වලට අමතරව ප්‍රවෘත්ති පත්‍ර වලින් හා සගරාවලින් ගත් ලිපි, අනෙකුත් පුද්ගලයන් මෙම විෂය සම්බන්ධව උග්නවන කළ ඔබ රැස් කර ගත් සටහන් යනාදිය ඇතුළු කළ හැකිය.

පොත් හළකින් ඔබට මෙම ෆයිල් කවර මිළදී ගැනීමටද හැකිය. ඔබට එලෙස ලබා ගත නොහැකි නම් ඔබට එය සෑදිය හැකිය. කඩදාසි හිඟ නම් පරණ ප්‍රවෘත්ති පත්තර පිටු භාවිත කළ හැකිය. ෆයිල් කවරයක් සෑදීම සඳහා අඟල් 16 පළල අඟල් 22 දිග කොළයක් ගන්න. පහත පෙන්වා දී ඇති ආකාරයට නමන්න.




ඔබගේ ෆයිල් කවරය නියම ලෙස නැමූ විට එක් කෙළවරක් අනිකට වඩා එළියට පෙනෙනු ඇත.




ෆයිල් කවරයේ ඉහළ මාතෘකාව සඳහන් වේ. ---------------

(මිළ දී ගන්නාවූ ෆයිල්වල මේ සඳහා කොටසක් වෙන් කොට ඇත.)

පහත කොටස උඩට නමා ඇත. -------------

--------- නැම්ම තිබූ ස්ථානය.

ඔබගේ ෆයිල් කවර නියම ලෙසට ගබඩා කරන්න. ඔබට ෆයිලින් කැබිනෙට්ටුවක් මිළ දී ගත නොහැකි නම් ලී පෙට්ටි හෝ කාඩ්බෝඩ් පෙට්ටි සොයා ගෙන එහි ගබඩා කරන්න. ඔබ සෑදිය යුතු හා සංවිධානය කළ යුතු ෆයිල් වර්ග ප්‍රධාන කොටස් තුනක් ඇත.

1. **බයිබලයෙහි පොත් :** බයිබලයේ එක් එක් පොත සඳහා ෆයිල් එක බැගින් සාදන්න. මෙම ෆයිල්වල ඔබ අධ්‍යයනය කරන පොතෙහි අධ්‍යයන සටහන්, පරිච්ඡේද, පද සහ වචන අධ්‍යයන සටහන් ඇතුළත් කරන්න. බයිබලයෙහි පොත් පිහිටා ඇති අනු පිළිවෙළටම ඔබගේ ෆයිල් කවරද සංවිධානය කර ගබඩා කරන්න. ඔබ බයිබලයෙහි එක් එක් පොත සඳහා එක ෆයිල් කවරය බැගින් සාදනු ඇත.

2. **මාතෘකා :** ඔබ විවිධ මාතෘකා අධ්‍යයනය කරන අතර ඒ සඳහා විෂය අනුව ෆයිල් සාදන්න. උදා: ඔබ යාච්ඤාව, යේසුස්වහන්සේගේ උපමා කතා, දෙවියන්වහන්සේගේ නාම වැනි මාතෘකා අධ්‍යනය කළ හැකිය. ඔබ ඉගෙන ගන්නා වූ එක් එක් මාතෘකාව සඳහා ෆයිල් එක බැගින් සාදා සටහන් එහි තැන්පත් කරන්න. ඔබගේ ෆයිල් ගොනුවෙහි සිංහල හෝඩියේ අක්ෂර අනුකුලව මාතෘකා යටතෙහි සංවිධානය කරන්න.

3. **පුද්ගලයන් :** මෙම ෆයිල් වල චරිතාපදාන අධ්‍යයනයන් ඇතුලත් වේ. එම ෆයිල් “නම්” අනුව වර්ග කරන්න. උදා: “මෝසේස්”, “දාවිත්”, “යෝසෙප්” යනාදී ලෙස. මෙම ෆයිල් හෝඩියේ අක්ෂර අනුව සංවිධානය කරන්න.

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමු වන පරිච්ඡේදය

1. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16-17)

2. "බයිබලය" යන වචනයෙහි තේරුම "පොත්" වේ.

3. "ශුද්ධ ලියවිල්ල" යන්නෙහි තේරුම "දේව වචනය" යන්නය.

4. පැරණි ගිවිසුම හා නව ගිවිසුම

5. 66

6. ව්‍යවස්ථාව , ඉතිහාසය, කාව්‍ය, හා අනාවැකි වශයෙනි.

7. ශුභාරංචි, ඉතිහාසය, ලිපි හා අනාවැකි

8. "ගිවිසුම" යන වචනයෙහි තේරුම "ගිවිසුම" වේ.

9. ඉගැන්වීමට, තරවටුවට, නිවැරදි කිරීමට, ධර්මිෂ්ඨකමේ උපදෙස්වලටද වේ.

10. බයිබලයේ පරස්පර විරෝධී දේ නැති අතර ප්‍රධාන තේමාව තුළ එය එක්සත්ය.

11. බයිබලයේ විවිධත්වයක් ඇත.

12. අ. ස ආ. ස ඇ. අ ඈ. අ ඉ. අ

13. ජේසුස්වහන්සේ, ලූක් 24:44-48

## දෙවන පරිච්ඡේදය

1. ස්වාමිනි, මාගේ මොරගැසීම ඔබ ඉදිරියට පැමිණේවා! ඔබේ වචනය පරිද්දෙන් මට නුවණ දුන මැනව. (ගීතාවලිය 119:169).

2. 39

3. 27

4. එහි අන්තර්ගතය අවබෝධ කරගැනීමට ඔබ එය ක්‍රමානුකූලව කියවිය යුතුය.

5. දිනපතාම කියවන්න, තෝරාගෙන කියවන්න, යාච්ඤාවෙන් යුතුව කියවන්න, ක්‍රමානුකූලව කියවන්න.

## තුන් වන පරිච්ඡේදය

1. සමිඳුණෝ අණ දුන් සේක. බොහෝ දූතයෝ ආරංචිය පතුරුවා හළහ (ගීතාවලිය 68:11)

2. අනුවාදයක් යනු, දේව වචනය මුලින්ම ලිවූ භාෂාවන්ට වඩා වෙනස් භාෂාවකින් ලියන ලද බයිබලයකි.

3. පරිවර්තනයක් යනු, ග්‍රීක, හෙබ්‍රෙව් හා අරාමීය වචන, වචනයෙන් වචනයට කරන ලද පරිවර්තනයකි. අර්ථෝද්ධාරයක් යනු වචනයෙන් වචනයට කරන ලද පරිවර්තනයක් නොව අදහසින් අදහසට කරන ලද පරිවර්තනයකි.

4. King James අනුවාදය

5. භාෂාවන් දෙකක් සෑම අතින්ම එක හා සමාන නොවන බැවින් පරිවර්තනයක් කළ විට වෙනස්කම් ඇතිවේ.

6. හෙබ්‍රෙව්, අරාමීය හා ග්‍රීක

## හතර වන පරිච්ඡේදය

1. දෙවියන්වහන්සේගෙන්වූ තැනැත්තේ දෙවියන්වහන්සේගේ වචන අසයි. නුඹලා දෙවියන්වහන්සේගෙන් නොවන බැවින් ඒවා අසන්නේ නැතැයි කීසේක. (යොහන් 8:47)

2. ඔවුන් වෙනත් පොත් කියවන ආකාරයටම එයද කියැවීමට උත්සාහ කරන නිසා.

3. යමක් කිරීමට පෙර ඔබ විසින් කළ යුතු යමක්.

4. දෙවියන්වහන්සේ දැන ගැනීම හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම.

5. ගුරුවරු ලෙස කැඳවා ඇති ඇදහිලිවන්තයන්. ශුද්ධාත්මයාණන්වහන්සේ.

6. ශුද්ධාත්මයාණන්වහන්සේ.

7. කිරි යනු දේව වචනයේ සරල සත්‍යතාවයන්ය.

8. මාංස යනු බයිබලයේ ඇති පහසුවෙන් තේරුම්ගත නොහැකි ගැඹුරු සත්‍යතාවයන්ය.

9. - කිරිවලට ආශා කරන්න.
   - දේව වචනයට කීකරුවන්න.
   - මාංස සොයා යන්න.

10. - විශේෂ වේලාවක් වෙන් කර ගන්න
    - විශේෂ ස්ථානයක් තෝරාගන්න
    - සෑම අධ්‍යයන සැසිවාරයක්ම යාච්ඤාවෙන් ආරම්භ කරන්න.

## පස් වන පරිච්ඡේදය

1. ඔබගේ ආඥා මාගේ සතුරන්ට වඩා මා නැණවත්කරයි. මක්නිසාද ඒවා නිතර මා සමගය. මාගේ සියලු ගුරුවරුන්ට වඩා මට නුවණ ඇත්තේය. මක්නිසාද මාගේ භාවනාව ඔබගේ ශික්ෂා ගැනය. මා ඔබගේ නියෝග රක්ෂාකළ බැවින් වැඩිමහල්ලන්ට වඩා මට තේරුම් ඇත්තේය. (ගීතාවලිය 119:98-100)

2. එක් බයිබල් වචනයක් පෙන්නුම් කරන සියලුම ස්ථානයන් බලා ගැනිමට.
විශේෂිත බයිබල් කොටසක් සොයා ගැනීමට.
වචනයක අර්ථය සොයාගනු පිණිස

3. 4,2,6,1,3,5,

## හය වන පරිච්ඡේදය

1. සැබෑවේ වචනය හරි ආකාර පහදාදෙන්නාවූ, ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තුවුණාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරන්න. (2 තිමෝති 2:15)

2. මෙහිදී අදහස නම් පවසා ඇති දෙය හා එය පවසා ඇත්තේ කවුරුන් හටද යන වග ඔබ දැනගත යුතු බවයි. ඔබ විසින් අදහස නිසි ලෙස අර්ථ නිරූපණය කර අදාළ කරගත යුතුවේ.

3. වාචික ආනුභාවය යනුවෙන් අදහස් කරනුයේ මුල් පිටපත් වල ඇති සෑම වචනයක්ම දෙවියන්වහන්සේගේ ආනුභාවයෙන් ලියවී ඇති බවයි.

4. සම්පූර්ණ ආනුභාවය තුලින් අදහස් කරනුයේ කොටස් වශයෙන් නොව සියලු ශුද්ධ ලියවිලි දේවානුභාවයෙන් ලියවී ඇති බවයි. බයිබලයේ සෑම කොටසක්ම දේවානුභාවයෙන් ලියවී තිබේ.

5. රීතින් හා පැහැදිලිකිරීම් පහත පරිදි වේ :

    1. දිව්‍යමය ආධිපත්‍යය පිළිබඳ රීතිය. බයිබලය දේවානුභාවයෙන් ලියැවී ඇති බැවින් එය පරම අධිකාරිය වශයෙන් පිළිගැනීමයි.

    2. වචනාර්ථ අර්ථ නිරූපණ රීතිය. බයිබලයෙන් පැවසෙන දෙයම එයින් අදහස් කර ඇති බව විශ්වාස කිරීමයි.

    3. සන්දර්භය සැලකිල්ලට ගැනිමේ රීතිය. සෑම පදයක්ම එහි සන්දර්භය තුළ සිට අධ්‍යයනය කළ යුතුවේ.

    4. පළමුව සඳහන් කරන ලද අවස්ථාව පිළිබඳ රීතිය. බයිබලයේ යම් වචනයක්, වාක්‍ය ඛණ්ඩයක්, වස්තුවක් හෝ සිදුවීමක් ගැන සඳහන් වන පළමු අවස්ථාවේදී එය සඳහන්වන අනෙකුත් අවස්ථාවලදී එහි අර්ථය පිළිබඳව ප්‍රධාන කරුණක් ඉදිරිපත් කරයි.

    5. නැවත නැවත පැවසීමේ රීතිය. බයිබලය තුළ යමක් නැවත නැවත පවසා ඇති විට එය වැදගත් වන බැවින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වේ.

    6. සමස්ත එළිදරව්ව පිළිබඳ රීතිය. යම් විෂයක් පිළිබඳව දේව වචනයේ ඇත්තාවූ සමස්ථ සත්‍යතාවය තනිව ගත් බයිබල් කොටසකින් රැස්කරගත යුතු නොවේ. අදාළ සත්‍ය පිළිබඳව සමස්ත බයිබලයේම පවසන්නා වූ සත්‍යතාවය සැළකිල්ලට ගත යුතු වේ.

## හත් වන පරිච්ඡේදය

1. ඔබගේ ශික්ෂා සදාකාලේටම පිහිටෙවු බව පෙර සිට එයින් දැනගතිමි. (ගීතාවලිය 119:152)

2. ඔ, ඕ, ඇ, ඈ, ඉ, උ, ඊ, ඒ, ඌ , එ, ආ, අ

3. කවදාද

4. බයිබල් පුරාවිද්‍යාව යනු බයිබලයේ සඳහන් දේශයන්හි ශේෂ වී ඇති දේවල් ඇසුරෙන් කරන්නාවූ අධ්‍යයනයයි. බයිබල් කාලයන්හි ශේෂ වී ඇති දේවල් ඇසුරෙන් ඔවුන්ගේ ශිෂ්ටාචාරය පිළිබඳව අධ්‍යයනය කිරීමේ විද්‍යාවයි.

## අට වන පරිච්ඡේදය

1. ඔබගේ ශික්ෂා සදාකාලෙටම ධර්මිෂ්ඨය. මා ජීවත්වන පිණිස මට නුවණ දුන මැනව. (ගීතාවලිය 119:144)

2. දෙවන ප්‍රධාන කරුණ පළමු ප්‍රධාන කරුණ (I- යටතේ තිබිය යුතු නොවේ. එය වෙනම කරුණක් විය යුතු අතර රෝම ඉලක්කම් II මගින් දැක්විය යුතු වේ. මෙම පරිච්ඡේදය තුළ දී ඇති පෙළගැස්වීම පිළිබඳ උපදෙස් නැවත කියවා බලන්න.

3. සිරස් හා තිරස්

4. ලකුණු කිරීම යනු ප්‍රධාන බයිබල් කොටස් ඉස්මතු කර පෙන්වීමේ ක්‍රමයකි. එහිදී ඔබ තෝරාගත් පද යටින් ඉරි ඇඳීම හෝ එවා අසල යම් සළකුණක් යෙදීම සිදු කරයි.

## නව වන පරිච්ඡේදය

1. ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යවත් දේ දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව. (ගීතාවලිය 119:18)

2. නව වන පරිච්ඡේදයේ ලැයිස්තුගත කර ඇති සළකුණු බලන්න.

3. නව වන පරිච්ඡේදයේ ලැයිස්තුගත කර ඇති පරමාර්ථ බලන්න.

4. දේව වචනය කතා කරන බව පවසන්නා වූ හැම කෙනෙක්ම එසේ නොකරයි. බොරු ගුරුවරුද සිටිති.

5. දේව වචනය තුළ ලියා ඇති වසංගත දෙවියන්වහන්සේ විසින් ඔවුන්ට එකතු කරනු ඇත. එළිදරව් 22:18-19

6. දෙවියන්වහන්සේගේ ජීවන පොතෙහි ලියා ඇති ඔවුන්ගේ නම් ඉවත් කරනු ලබනු ඇති අතර ශුද්ධ වූ නගරයෙන් හා දේව වචනයේ ලියා ඇති දේවල් වලින් ඔවුන්ගේ නම් ඉවත් කරනු ලබනු ඇත. එළිදරව් 22:18-19

7. දෙවියන්වහන්සේ

8. දෙවියන්වහන්සේගේ වචන

9. කිරි සහ මාංශ

10. මෝසෙස්

## දහ වන පරිච්ඡේදය

1. ඔබගේ වචනය භාවනාකරන පිණිස රෑ යාම්වලට පළමුවෙන් මාගේ ඇස් ඇරුණේය. (ගීතාවලිය 119:148)

2. මෙම ක්‍රමය ඉස්මතු කර පෙන්වනුයේ ජීවිතයට හා සේවයට දැනුම අදාළ කර ගැනීමයි. එහි ප්‍රතිඵලය දෙවියන්වහන්සේට ඇති කැපවීම වර්ධනය කිරීමයි.

3. - බයිබල් කොටසේ තොරතුරු වාර්තා කරන්න.
   - ප්‍රධාන පදය හඳුනාගන්න.
   - මෙනෙහි කරන්න.
   - විෂය හඳුනාගන්න
   - සාරාංශගත කරන්න.
   - අදාල කරගන්න.

4. වචනය ඇසීම පමණක් ප්‍රමාණවත් නොවේ. එම වචනය ඔබගේ ජීවිතයට අදාළ කරගැනීමටද කළ යුතුය. යාකොබ් 1:22-25

5. ආත්මික ජීවිතය තුළ ධනාත්මක වෙනස්කම් ඇති කරන්නාවූ අදාළ කරගැනීම් සහිත බයිබල් අධ්‍යයනයන් කෙරෙහි සාතන් බොහෝ සෙයින් සැලකිලිමත් වන බැවින්, මෙම ක්‍රමයේ භාවිතයට එරෙහිව ඔහු සටන් කරයි.

## එකොළොස් වන පරිච්ඡේදය

1. තරුණයෙක් තමාගේ මාර්ගය පවිත්‍ර කරගන්නේ කුමකින්ද? ඔබගේ වචනය ප්‍රකාර පැවැත්මෙනි. (ගීතාවලිය 119:9)

2. 2,1

3. - මූලික සමීක්ෂණය
   - පොතක අධ්‍යයන වගුව
   - පොතෙහි දළ සටහන

4. - පොතෙහි මාතෘකාව
   - තේමාව
   - කතෘ
   - ලියන ලද්දේ
   - පරමාර්ථය
   - ජීවිත හා සේවා ප්‍රතිපත්ති

## දොළොස් වන පරිච්ඡේදය

1. ඔබට විරුද්ධව පව් නොකරන පිණිස ඔබගේ වචනය මාගේ සිතේ නිධාන කර ගතිමි. (ගීතාවලිය 119:11).

2. දේව වචනය පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට ඉගෙනීමය

3. - පරිච්ඡේදයට මාතෘකාවක් තෝරා ගන්න.
   - ඡේද වෙන් කිරීම සලකුණු කරන්න.
   - පරිච්ඡේද අධ්‍යයන වගුවක් සාදන්න.
   - පරිච්ඡේද දළ සටහනක් සාදන්න.

## දහතුන් වන පරිච්ඡේදය

1. ඔබගේ වචනය එළිදරව්වීමෙන් ආලෝකය ලැබේ. එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ. (ගීතාවලිය 119:130)

2. - පරිච්ඡේද අධ්‍යයනයක් කරන්න.
   - ඡේදයක විස්තර නිරික්ෂණය කරන්න.
   - පරිච්ඡේද අධ්‍යයන වගුවක් සාදන්න
   - පරිච්ඡේද අධ්‍යයන දළ සටහනක් සාදන්න

3. 3, 2, 4, 1

4. 4, 5, 1, 2, 3

5. 3, 2, 4, 1

## දහහතර වන පරිච්ඡේදය.

1. ඔබගේ සියලු ආඥා ධර්මිෂ්ඨකම වන බැවින් මාගේ දිව ඔබගේ වචනය ගැන ගී කියවා. (ගීතාවලිය 119: 172)

2. සන්දර්භය

3. - පදය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න.
   - සම්බන්ධ පද අධ්‍යයනය කරන්න.
   - පද අධ්‍යයන වගුවක් සාදන්න.
   - පද අධ්‍යයන දළ සටහනක් සාදන්න.

## පහළොස් වන පරිච්ඡේදය.

1. සැබවක් නුඹලාට කියමි. අහසත් පොළවත් පහව යනතෙක්, සියල්ල සිදු වන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බිංදුවක්වත් පහව නොයන්නේය. (මතෙව් 5:18)

2. - වචනය තෝරා ගන්න.
   - වචනය එහි සන්දර්භය තුළ අධ්‍යයනය කරන්න.
   - අර්ථය තීරණය කරන්න.
   - ඔබගේ අධ්‍යයනය සාරාංශ ගත කරන්න.

3. ප්‍රධාන වචනයක් නම් එම පදයෙහි අර්ථයට මූලික වන වචනයකි. සමහර විට එය තේරුම් ගැනීමට අපහසු වචනයක් හෝ අවධාරණය සඳහා කිහිප වතාවක් නැවත උච්චාරණය කළ හැකි වචනයක" පමණ දැන ක්‍රියා කිරීම" වචන අධ්‍යයනය සඳහා සුදුසු වචනයකි. (ඉංග්‍රීසියෙන් මෙය එක් පදයකි. Temperance). අනෙකුත් වචන ප්‍රධාන වචන නොවේ.

4. බයිබල් වචන අධ්‍යයන පොතක් සහ සමපද අකාරාදියකි.

## දහසය වන පරිච්ඡේදය.

1. එබැවින් රනට වඩා, එසේය, පවිත්‍ර රනට වඩා, ඔබගේ ආඥාවලට ප්‍රේම කරමි. එබැවින් සියලු දේ ගැන ඔබගේ නියෝග සියල්ල හරියයි සලකමි. සියලු වංක මාර්ග නුරුස්සා හරිමි. (ගීතාවලිය 119:127-128)

2. මාතෘකානුගත ක්‍රමය තෝරාගත් විෂයක් කෙරෙහි යොමු වෙයි. මෙම අධ්‍යයනය ක්‍රමයෙහි ඉලක්කය නම් බයිබලය මෙම විෂය පිළිබඳ උගන්වන සියල්ල සොයා දැන ගැනීමය.

3. - මාතෘකාවක් තෝරා ගන්න.
- ශුද්ධ ලියවිලි කොටස තෝරා ගන්න.
- තොරතුරු රැස් කර ගන්න.
- විස්තර සාරාංශ ගත කරන්න.

## දහහත් වන පරිච්ඡේදය

1. ඒ සියල්ල ආදර්ශයක් වශයෙන් ඔවුන්ට සිද්ධ වුනේය. ඒවා ලියා තිබෙන්නේ අපට අවවාද පිණිසය. (1 කොරින්ති 10:11 ).

2. චරිතාපදාන අධ්‍යයන ක්‍රමය බයිබලයෙහි සඳහන් පුද්ගලයන්ගේ ජීවිත කෙරෙහි අවධානය යොමු කරයි. ඔවුන්ගේ ජීවිත අධ්‍යයනය තුළින් ඔවුන් ලද අත්දැකීම් ඇසුරින් අප ඉගෙන ගනිමු.

3. - අධ්‍යයනය කිරීමට පුද්ගලයෙකු තෝරා ගන්න.
- තොරතුරු රැස් කර ගන්න.
- තොරතුරු විශ්ලේෂණය කරන්න.
- ඔබ ඉගෙනගත් කරුණු අදාළ කර ගන්න.

## දහඅට වන පරිච්ඡේදය

1. 7,8,5,3,4,2,1,6,9,10.

2. ඔබගේ ශික්ෂා ආශ්චර්යමත්ය. එබැවින් මාගේ ආත්මය ඒවා රක්ෂා කරයි. (ගීතා 119:129)

3. දේව ධර්මානුකූල ක්‍රමය නම් දෙවියන්වහන්සේ පිළිබඳ බයිබලයෙහි සඳහන් මූලික ධර්ම ඉගෙන ගැනීමය. එම ක්‍රමයට දේවධර්මයෙහි ප්‍රකාශන එක්රැස් කිරීම, සංසඳනය කිරීම හා සංවිධානය කිරීම ඇතුලත්ය.

4. - අධ්‍යනය සඳහා මාතෘකාවක් තෝරා ගන්න.
- තෝරා ගත් ධර්මය අර්ථ දක්වන්න.
- අධ්‍යයන කිරීම සඳහා බයිබල් කොටසක් තෝරා ගන්න.
- එම ධර්මය පිළිබඳ විස්තර රැස් කරගන්න.
- ඔබ රැස් කළ විස්තර සාරාංශගත කරන්න.

5. "ධර්මය" යනු කිසියම් නිශ්චිත මාතෘකාවක් පිලිබඳව ඉගැන්වීම් කාණ්ඩයකි. එයට බයිබලයෙහි කිසියම් විෂයක් පිළිබඳව උගන්වන සියල්ල ඇතුලත්ය.

## දහනව වන පරිච්ඡේදය

1. ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයන් නිසා දවසට හත් වරක් ඔබට ප්‍රකාශ කරමි. (ගීතා 119-164)

2. ආ, ඇ, අ.

3. ඇ, අ, ආ, ඈ.

4. සමාන පද සමාන්තරය

5. විරුද්ධ පද සමාන්තරය

6. සංයෝගාත්මක පද සමාන්තරය

7. සංකේතාත්මක පද සමාන්තරය

## විසි වන පරිච්ඡේදය

1. උන්වහන්සේ ඔවුන්ට කියනසේක් : මා ගැන මොසෙස්ගේ ව්‍යවස්ථාවෙහු අනාගතවක්තෘ වරුන්ගේ ලියවිලිවලද ගීතිකාවලද ලියන ලද සියල්ල සම්පූර්ණ විය යුතු යැයි මා නුඹලා සමග සිටියදීම නුඹලාට කී වචන මේ යැයි කී සේක. (ලූක් 24:44)

2. - දෙවියන්වහන්සේගේ පණිවුඩයෙහි නිවැරදි බව තහවුරු කිරීමට.
- දෙවියන්වහන්සේගේ පණිවුඩය ස්ථිර කිරීම.
- ඇදහිලිවතුනට උපදෙස් දීමට.

3. සියලුම ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් යුක්ත වන අතර අධ්‍යයනය සඳහා ප්‍රයෝජනවත්ය. අනාගතවාක්‍ය මගින් දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි අතීත, වර්තමාන හා අනාගත සිදුවීම් පිළිබඳ නියත දැක්මක් ලබා දෙයි. දෙවියන්වහන්සේගේ අනාගත සැලසුම් තේරුම් ගැනීමෙන් සාතන්ගේ රැවටිලි වලින් බේරිය හැකිය. අනාගතවාක්‍යය අධ්‍යයනය කරන අය මත විශේෂ ආශිර්වාදයක් ප්‍රකාශ කොට තිබේ.

4. - අනාගතවාක්‍යවල මූලික තේමාව යේසුස්වහන්සේ බව හඳුනාගන්න.
- බොහෝ අවස්ථාවලදී බයිබලය එකම පරිවර්තනය කර දෙන බව වටහා ගන්න.
- දෙවරක් යොමු වීමේ නීතිය අවබෝධ කර ගන්න.
- අනාගතමය දැක්ම අවබෝධ කර ගන්න.
- අනාගත වාක්‍යය ස්වභාවයෙන් කොන්දේසි සහිත බව වටහා ගන්න.

5. දෙවියන්වහන්සේ

6. අනාගතවාක්‍යය යනු දෙවියන්වහන්සේගේ ආනුභාවයෙන් යමක් ප්‍රකාශ කිරීමය.

7. - දෙවියන්වහන්සේගෙන් ලැබෙන දිරිගැන්වීමේ පණිවිඩයක්.
- දෙවියන්වහන්සේගේ සැලසුමෙහි ඇති අනාගත සිදුවීමක් පිළිබඳව කලින් ප්‍රකාශ කිරීමකි.
- දෙවියන්වහන්සේගේ ක්‍රියා පිළිබඳ මිනිසා සඳහා පරිවර්තනය කර දීමක්.

8. වාචික/ප්‍රකාශ කරන ලද වචනය සහ ක්‍රියා කරන ලද අනාගතවාක්‍යය.

9. උත්: 3:15, එය මෙසියස්වහන්සේ පිළිබඳ පොරොන්දුව වේ.

10. විසිවන පරිච්ඡේදයෙහි සාකච්ඡා කරන ලද බොරු අනාගතවක්තෘවරු හඳුනාගන්න ක්‍රමය බලන්න.

## විසිඑක් වන පරිච්ඡේදය

1. මක්නිසාද ව්‍යවසථාව මතු පැමිණෙන යහපත් දේවල ජායාවක් මිස නියම රූපයම නොවන බැවින්, ඔවුන් අවුරුදුපතා නිතර ඔප්පුකරන ඒ පූජාවලින්, ළඟාවෙන්නන් සම්පූර්ණකරන්ට කිසිකලක නුපුළුවන. (හෙබ්‍රෙව් 10:1)

2. සංකේතාත්මක අධ්‍යයනය නම් කිසියම් පුද්ගලයෙක්, ස්ථානයක්, සිදුවීමක් හෝ දෙයක් වෙනයම් කිසිවක සංකේතයක් ලෙසට අධ්‍යයනය කිරීමයි. දෙවියන්වහන්සේගේ අනාගත

සැලසුමෙහි සිදුවීමට නියමිත කාරණාවක් පිළිබඳ කිසියම් දැක්මක් සංකේත මගින් අපට දකින්නට හැකිය. සංකේතය විශේෂ වන ලෙසම ඉදිරියේදී එයින් නියෝජනය වන තැනැත්තා හෝ සිදුවීම ඊට වඩා සුවශේෂී බවක් දරයි.

3. ආදර්ශය, ජායාව, රටාව (සිංහල බයිබලයෙහි උපහරණය යන වචනයද භාවිත කොට ඇත.)

4.
   - පුද්ගලයන්
   - ස්ථාන
   - සිදුවීම්
   - භෞමික භාණ්ඩ

5. යෝසෙප්

6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.